# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2012 දෙසැම්බර් 05 වන බදාදා**
2012 டிசெம்பர் 05 புதன்கிழமை
Wendesday 05th December 2012

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல.204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்.

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.01 පළාත් සභාව රැස් විය.**
*மு.ப.09.01 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.01 a.m.*

**ගරු සභාපතිතුමා [ සුනිල් විජේ රත්න මහතා ] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர்[ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබ සැමට සුභ උදෑසනක් වේවා. විශේෂයෙන්ම මම ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. ඉතාමත් වටිනා මේ අයවැය විවාදය අවස්ථාවේදී හැකිතාක් දුරට අනවශ්‍ය රීති ප්‍රශ්නවලින් සහ අනවශ්‍ය වරප්‍රසාද ප්‍රශ්නවලින් වැළකී සිටින්න කියලා. මොකද, කාලය පිළිබඳ ප්‍රශ්නයක් අපට තිබෙනවා. හරියටම නියමිත වේලාවට අපට විවාදය අවසන් කරන්නට තිබෙනවා. ඒ නිසා මම ඉතාමත් ගෞරවයෙන් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, මෙම අයවැය විවාදයේ කටයුතු කරගෙන යන්නට ඔබතුමන්ලාගේ සහාය මට ලබා දෙන්න කියලා.

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පහත සඳහන් කාරක සභා වාර්තා මම පිළිගන්වනවා.

i. 2012.11.20 වන දින පැවැති ගෘහ කාරක සභා රැස්වීම් වාර්තාව සහ

ii. 2012.11.21 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
## PETITIONS

****[සභා මේසය මත තබන ලද පෙත්සම්]***
*[Tabled petitions]*

විකුම් ගුණසේකර ගරු මන්ත්‍රීතුමාගේ අත්සනින් යුත්,

පානදුර, හිරණ, පන්සල ඉදිරිපිට, සමරසිරි හි පදිංචි එස්.ඒ. සඳරුවන් යන අයගේ පෙත්සම සහ

පානදුර, කෙසෙල්වත්ත, ගාලු පාර, අංක 147 හි පදිංචි ලක්ෂ්මන් ජයවර්ධන යන අයගේ පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රශ්නය ගරු ප්‍රවාහන අමාත්‍යතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව. ප්‍රශ්නය යොමු කරන්න. එතුමා මේ වෙලාවේ සභාවේ නැහැ නේ? එතුමා මා වෙත ලිඛිතව ඉල්ලීමක් කර නැහැ. එම ප්‍රශ්නය අපි ඊළඟ සභාවට යොමු කරනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government, Provincial Administration, Manpower and Employment, Economic Promotion, Power and Energy and Trade Affairs)

ඒක නීත්‍යානුකූලව අහෝසි වෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, සභාව පවත්වාගෙන යන්න ගණ පූරණය නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

මේ අවස්ථාවේදී විපක්‍ෂයේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ගණ පූරණය පිළිබඳ ප්‍රශ්නය නිසා සීනුව නාද කළ පසුවත් සභාවේ අදාළ ගණ පූරණය සම්පූර්ණ නොවූ නිසා ගණ පූරණය සම්පූර්ණ වනතුරු මම මෙම සභාව කල් තබනවා.

***සභාවේ ගණපූරණය නොමැති බව පෙනී ගියෙන් කැඳවීම් සීනුව නාද කරවීමට නියෝග කරන ලදී.***

***පසුව ගණපූරණය ඇති නොවූයෙන් ගරු සභාපතිතුමා විසින් රැස්වීම තාවකාලිකව අත් සිටුවන ලදින් පූ.භා. 10.00 ට යළිත් රැස්විය.***

*Committee counted, and a Quorum not being present, the Division bells were ordered to be rung,*

*Later, It found no quorum Mr. Chairman, suspended the sitting and it resumed at 10.00 a.m.*

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

## බ.ප. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය : මගීන්ට සිදු වන අසාධාරණය
ROAD PASSENGER TRANSPORT AUTHORITY (W.P.): INJUSTICES METED OUT TO PASSENGERS

**02.**

**සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු සමූපකාර සංවර්ධන ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන විෂයය භාර අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/V/(1)12/27)**

අ. බ.ප මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් බස් මගීන්ට සිදුවන අසාධාරණ සිදුවීම් පිළිබඳව කරන ලද පැමිණිලි භාර ගනු ලබන්නේද?

ආ. පසුගිය ඔක්තෝබර් 26 දින බත්තරමුල්ල පැලවත්තේ පදිංචි විජිත සමරකෝන් මහතා බස් කොන්දොස්තරවරයෙකුට විරුද්ධව කරන ලද පැමිණිල්ලක් ප්‍රවාහන අධිකාරියට ලැබී තිබේද?

ඇ. මාර්ග අංක 163 JI-5130 බස් රථයේ කොන්දොස්තරවරයා විසින් කරන ලද පහර දීමකදී ඉහත නම් සඳහන් මහියාට හිසට මැහුම් 06 ක් දමන තරම් බරපතළ පහරදීමක් සිදු කර ඇති බව ඔබතුමා දන්නේද?

ඈ. මෙම බරපතළ පහරදීම පිළිබඳව කරන ලද පැමිණිල්ලට මගී ප්‍රවාහන අධිකාරිය සාධාරණ පරීක්‍ෂණයක් සිදු නොකරන්නේ ඇයිද? යන්න මෙම ගරු සභාවට පැහැදිලි කරන්නේද?

**ගරු උපාලි කොඩිකාර** (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

අ. භාර ගනු ලැබේ.

ආ. පැමිණිල්ල ප්‍රවාහන අධිකාරියට ලැබී ඇත.

ඇ. මගියාගේ හිසට මැහුම් 06 ක් දමන තරම් බරපතළ පහරදීමක් බව පිළිගනිමි.

ඈ. (A) මෙම සිද්ධිය සම්බන්ධව පහරදීමට ලක් වූ මගියාගේ දරුවන් දෙදෙනා, බිරිඳ 2012/10/26 වෙනි දින ප්‍රවාහන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ පැමිණිලි අංශයට පැමිණ පැමිණිල්ල ඉදිරිපත් කරන ලදී.

අසන්ති අමරකෝන් දියණියගෙන් සිද්ධිය පිළිබඳ ප්‍රකාශ ලබා ගන්නා ලදී.

(B) ප්‍රවාහන අධිකාරිය විසින් එදින බස් හිමියාට පරීක්‍ෂණයට පැමිණෙන ලෙස දුරකථනයෙන් දැනුම් දෙනු ලැබිය. එදිනට පහර දෙන ලද කොන්දොස්තරවරයාගේ සේවය නැවත දන්වන තුරු අත්හිටුවන ලදී.

(C) 2012/11/02 දින පහර කෑමට ලක් වූ මගියා නිසා බස් රථයේ අයිතිකරු පරීක්ෂණයට කැඳවන ලදි. එදින දෙපාර්ශවයම පැමිණ පරීක්‍ෂණයට ඉදිරිපත් විය. මෙහිදී බස් හිමියා පවසා සිටියේ, මෙම සිද්ධිය ගැන පොලිසියේ පැමිණිල්ලක් කර උසාවියට ඉදිරිපත් කර ඇති බැවින් උසාවියේ දී පහර කෑමට ලක් වූ අයට වන්දියක් ඉල්ලා සිටිය හැකි බවයි.

(D) පහර දීමට සම්බන්ධ කොන්දොස්තරවරයාගේ සේවය තවම අත්හිටුවා ඇත.

(E) ප්‍රවාහන අධිකාරියට පැවරී ඇති බල සීමාව ඇතුළත ඉහත දඬුවම ලබා දිය හැක. මේ සම්බන්ධව අධිකරණ කටයුතුවලදී අදාළ සහයෝගය ලබා දිය හැක.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, අතුරු ප්‍රශ්නයක් විමසීමට අවසර ඉල්ලා සිටිනවා. ගරු ඇමැතිතුමාගෙන් දැන ගන්න කැමැතියි. මේ පිළිබඳව ඉතාමත් දීර්ඝ වශයෙන් උපදේශක කාරක සභාවේදීත් මම කරුණු ඉදිරිපත් කළා. පසුගිය 26 දා පැවැති උපදේශක කාරක සභාව වන විටත් මේ පිළිබඳව සාධාරණ පරීක්‍ෂණයක් සිද්ධ වුණේ නැහැ. පරීක්‍ෂණයක් සිදු කරද්දී සාධාරණයක් වෙන්න නෑ. ඒ සාධාරණත්වය ඉෂ්ට වුණේ නැති නිසා තමයි ඔබතුමාට මම මේ නැවත අතුරු ප්‍රශ්නය යොමු කරන්නේ. විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ප්‍රකාශයක් කරන්න දෙන්න බැහැ. ඔබතුමා අතුරු ප්‍රශ්නය -

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, හරි සංවේදී ප්‍රශ්නයක් මෙය. ඒ නිසා තමයි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ප්‍රශ්න තුනක් අහන්න අවස්ථාව දෙන්න පුළුවන්. ඊට වැඩිය ඔබතුමාට කථා කරන්න දෙන්න බැහැ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ප්‍රශ්න තුනක් ඉදිරිපත් කළොත් අවසානයේදී පැහැදිලි කරගන්න බැරි වන නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා ප්‍රශ්න තුනක් ඉදිරිපත් කරන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, දැන් මේ මගියාට සාධාරණය ඉෂ්ට කර දීම උපදේශක කාරක සභාවේදී පොරොන්දු වූ පරිදි මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මැදිහත් වී වන්දියක් ලබා දීමට කටයුතු කරන්නේද? කියලා ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, ඒ පිළිබඳව පිළිතුරක් ලබා දෙනවාද?

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, අපේ පනතේ කිසි තැනක එහෙම එකක් කරන්න අපට අවසරයක් නැහැ. අපට තියෙන බලතල යටතේ. අපට උසාවිය මාර්ගයෙන් ගිහිල්ලා බස් හිමියාගේ රක්‍ෂණය යටතේ තමයි වන්දියක් ලබා ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ. මෙවැනි කරුණක් පළමුවැනි වතාවට තමයි අපට වාර්තා වුණේ. එතකොට අපි ඉදිරියට මීට අදාළ පනත සංශෝධන කරන විට මෙවැනි ප්‍රශ්න සම්බන්ධව ඇතුළත් කරන්න අපි කටයුතු කරනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය. බස් හිමියා විසින් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව එක අතුරු ප්‍රශ්නයක් අහන්න පුළුවන්. ප්‍රශ්න දෙකක් දැන් ඇහුවා. එකයි තව තිබෙන්නේ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, බස් හිමියන් විසින් බස් කොන්දොස්තරවරුන් තාවකාලික පදනම මත බඳවාගෙන කටයුතු කරන්නේ. නමුත් ඒ බඳවා ගැනීමේදී ස්ථිර කොන්දොස්තරවරයෙකු බඳවා නොගන්නේ ඇයි? තාවකාලික බඳවා ගැනීම් සිදු කළ නිසා තමයි මෙවැනි ප්‍රශ්න ඇති වන්නේ. ඒ නිසා එවැනි ප්‍රශ්න ඇති වීම වැළැක්වීමට ගරු ඇමැතිතුමා ඉදිරියේදී කටයුතු කරනවාද කියලා දැනගන්නට කැමැතියි.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, පළාත් අධිකාරියට බස් කොන්දොස්තරවරයාගේ, ඩ්‍රයිවර්ගේ බලතලයක් නැහැ. ඒ බලතලය තිබෙන්නේ පෞද්ගලික බස් හිමිකරුට. එතකොට මේක ස්ථිරද? තාවකාලිකද? කියලා නැහැ. අපට තිබෙන බලය අනුව තමයි ඔහුට බලපත්‍රයක් නිකුත් කර තිබෙන්නේ, කොන්දොස්තර කෙනෙක් හැටියට කටයුතු කරන්න තමයි අපි බලපත්‍රයක් නිකුත් කරලා තිබෙන්නේ. මේ ප්‍රශ්නය නිසා නොවෙයි. මේ වැඩ වර්ජන සම්බන්ධව, ඒ ගොල්ලන් අපේ බස් මගියාට කථා කරන විධිය, ඒ අයගේ හැසිරීම් පිළිබඳව වැනි ඒ අය සම්බන්ධව ගැට රාශියක් අපට බලපාලා තිබෙනවා. නමුත් අපේ ප්‍රඥප්තියේ මේවා නැහැ. එතකොට මම ඉදිරියට මේ අයව අපේ අධිකාරිය යටතට ගන්න, බලතල සහිත පනතක් මම ඉදිරියට ගේනවා. ජනවාරි මාසයේ අන්තිම වනවිට ගෙනෙන්න බලාපොරොත්තු වෙනවා. එතකොට මේ අය අපේ අධිකාරිය යටතේ සේවය කරන අය බවට පරිවර්තනය කරන්න පුළුවන්කමක් තිබෙනවා නම් අපට මේ ගැට සියල්ලටම විසඳුමක් ලැබෙනවා. වෙලාවට බස් වැඩ කරවන්න පුළුවන්කම තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, උත්තරය කෙටි කරන්න.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

වැඩ වර්ජනවලට නොයනකම තිබෙනවා.

**ගරු සභාපතිතුමා**

Mr. Chairman

ඔබතුමාගේ පිළිතුර කෙටි කරන්න.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මම අයවැයේදී මේ ගැන පැහැදිලි කරන්න කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

***න්‍යාය පත්‍රයේ අංක 03, 04 සහ 05 යටතේ ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්න ගරු සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, ඊට සති තුනක කාලයක් කල් ඉල් බැවින් ප්‍රශ්න අදාළ සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question in the name of the Hon. Jagath Kumara, Member, under item Nos. 03, 04 and 05 of the agenda, was presented to the Hon. Minister of Coperative Development, Food Supplies and Distribution and as two weeks time was asked for, the Hon. Chairman ordered the question to be referred to the next Council sitting.*

## පළාත් සභාවේ රැස්වීම
PROVINCIAL COUNCIL MEETING

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs , Probation and Child Care Services and Council Affairs)

ගරු සභාපතිතුමනි, "*2012 දෙසැම්බර් මස 10 වන දිනට නියමිත වැඩ කටයුතු අවසන්ව විසිර යෑමෙන් අනතුරුව, මෙම සභාව 2013 ජනවාරි මස 08 වන දින පෙ.ව. 09.30 ට රැස් විය යුතුය.*" යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## 2013 වාර්ෂික මුදල් ප්‍රකාශය
FINANCIAL STATEMENT - 2013

**ගරු ජගත් අංගගේ -** අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Jagath Angage - Minister [On Behalf of Chief Minister]

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන් *"2013 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද මුදල් ප්‍රකාශය අනුමත කළ යුතුය"* යන යෝජනාව යළිත් ඉදිරිපත් කරනවා.

***2012.11.20 දින ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*Question presented by the Hon. Chief Minister on 20.11.2012 proposed again.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී පොදු සාකච්ඡාව ආරම්භ කිරීමට පෙර ගණපූරණය පිළිබඳව ගැට වක් ඇති වූ නිසා සභා ගර්භය තුළ කාලය පිළිබඳ යම්කිසි ප්‍රශ්නයක් ඇති වෙනවා. මට සිද්ධ වෙනවා ඉදිරියේදී මෙම දවස තුළ සාමානුපාතිකව කාලය දෙපැත්තෙන්ම අඩු කරන්න. ඒ පිළිබඳව විශේෂයෙන්ම අපේ කථික ගරු මන්ත්‍රීවරුන්ගේ අවධානය යොමු කරනවා. නියමිත වේලාවට කාලය -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි -

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ ඒක අසාධාරණයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි -

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අවුරුද්දකට සැරයක් ඉදිරිපත් කරන මේ අයවැය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට වෙලාවට අවසන් කරන්න නෑ, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

සහභාගි වෙන්න බැරි නම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙන්නාම වාඩි වෙන්න කෝ. එක්කෙනෙක් කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හරි. ගරු සභාපතිතුමා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

විපක්ෂයේ අපට ලැබී තිබෙන කාලය කිසිසේත් ප්‍රමාණවත් නැතිකම වුණත් අපි ඒක භාර ගත්තා. අපේ ඒ වේලාව කපන්නේ නැතිව අපට ලබා දිය යුතුයි කියලා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්‍ෂ නායකතුමා, සභා කටයුතු කාරක සභාවේදී අපි ඉතාම සාධාරණව කාලය වෙන් කළා. නමුත් අපි මේ විවාදය සවස 5 ට අවසන් කරන්න ඕනෑ. එතැනින් එහාට කාලය දික් කරන්න මට ප්‍රතිපාදන නැහැ. ඒ නිසා හැකිතාක් දුරට ඔබතුමන්ලා මේ විවාදය නියමිත වෙලාවට අවසන් කරන්න කටයුතු කරන්න කියලා මම කථික ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉතාමත් කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි –

**ගරු යූ. ජෝර්  පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, අද දවසේ ප්‍රතිපාදන නැහැයි කියන්න බැහැ. අද ඡන්ද විමසීමක් නැහැ. අපට රෑ හත අට වනතුරු යන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව එකඟ නම් මට ගැට  වක් නැහැ.

**ගරු යූ. ජෝර්  පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අද දවසේ ඒ නීතිය නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම කිව්වේ මගේ පැත්තෙන්. සභාව එකඟ නම් මට ප්‍රශ්නයක් නැහැ.

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, අයවැය විවාදය පටන් ගත්ත වෙලාවේ ගණ පූරණය නැති වුණේ, ආණ්ඩු පක්‍ෂයේම වැරැද්දෙන්ම කියලා විපක්‍ෂය චෝදනා කරන එක වැරැදියි. විපක්‍ෂයේ මන්ත්‍රීවරු හය දෙනයි, ආණ්ඩු පක්‍ෂයේ මන්ත්‍රීවරු අට දෙනයි සිටියේ ඒ පටන් ගත්ත වේලාවේ. නමුත් තමුන්නාන්සේට අපි කාලවේලාවක් දීලා තිබෙනවා. අපි පස්වරු පහ දක්වා මේ අපට සභාව පවත්වාගෙන යන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභා නායකතුමා, මම ඒක කරනවා. ඒ පිළිබඳව ගැට  වක් නැහැ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඒ තිබෙන කාලයත් මේ නැති කරගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තවත් අඩු වෙනවා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම කලිනුත් තමුන්නාන්සේලාගෙන් කාරුණිකව ඉල්ලා සිටියා නේ? දිගින් දිගටම මේ අනවශ්‍ය රීති ප්‍රශ්න සහ වරප්‍රසාද ප්‍රශ්න අපි කථා කරන එකේ තේරුමක් නැහැ.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න. මේ සභාවේ –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට එහෙම අදහස් ප්‍රකාශ කරන්න අවසර දෙන්න අමාරුයි මට.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි –

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

අපේ වරප්‍රසාදයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හොඳයි ඔබතුමා කථා කරන්න කෝ.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, මේ සභාවේ 25 වැනි අයවැය යන්නේ. මේ අයවැය 25 ටම සහභාගි වුණු මන්ත්‍රීවරයෙක් මම. ඒ නිසා මේ වාගේ ගැට  මතු වුණු අවස්ථාවේදී අපි සාකච්ඡා කරලා තේ වේලාවෙන් කාලය අඩු කර ගත්තා. ඒ වගේ යම් ප්‍රමාදයක් වුණා නම්, හවස් වරුවෙන් ඒ කාලය ලබා ගත්තා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ගැට වක් නැහැ. සභාව එකඟ නම් අපට යන්න පුළුවන්.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

අපට අවස්ථාව ලබා දෙන්න

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මගේ කිසි ප්‍රශ්නයක් නැහැ. අපි තේ විවේකයක් ගන්නේ නැහැ නේ. ඒ නිසා අපි -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, මේ විවාදය දිගටම ගෙනි යන්න එපා. දහවල් විවේකය වේලාවේ පක්ෂ නායක රැස්වීමක් කැඳවලා නිරවුල් කර ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව එකඟ නම් මට ප්‍රශ්නයක් නැහැ. කිසි ගැට වක් නැහැ. ඒ අනුව 2013 වර්ෂය වෙනුවෙන් වන විවාදයේ පොදු සාකච්ඡාව ආරම්භ කරන්න විපක්ෂයේ ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

# පොදු සාකච්ඡාව
GENERAL DISCUSSION

[ පූ.භා. 10.12 ]

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම බස්නාහිර පළාත් සභාවේ 25 වැනි මුදල් ප්‍රකාශය, නැත්නම් අයවැයට සම්බන්ධව කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න මට අවස්ථාව ලැබීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම මුලින්ම මගේ කනගාටුව ප්‍රකාශ කරන්න ඕනෑ. මුල් වතාවටයි මේ සභාව පැයක කාලයක් ප්‍රමාද වෙලා පටන් ගන්නේ. Quorum එක පිළිබඳව. ඔබතුමාගේත්, ආණ්ඩු පක්ෂයේත් වගකීමක් වෙනවා Quorum එක පවත්වාගෙන යන එක. විශේෂයෙන්ම මට ඒක සඳහන් කරන්න වෙනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මම ස්තුතිවන්ත වෙනවා, අපේ විපක්ෂ නායකතුමාටත්. අපේ කණ්ඩායමටත්. මේ 25 වැනි අයවැය විවාදය පටන් ගන්න මට අවස්ථාව ලබා දීම ගැන. මේ සභාවේ අපි වසර ගණනාවක් තුළ මේ විවාදයට සහභාගි වුණත් මෙවර අයවැය ප්‍රකාශය, මුදල් ප්‍රකාශනය, එහෙමත් නැත්නම් ගරු මහ ඇමැතිතුමාගේ වාචික ප්‍රකාශයේ කරුණු අනුව මේක කනගාටුදායක අයවැයක් හැටියට සඳහන් කරන්න නැ. ඒ කියන්නේ, 2013 අවුරුද්දේ අපට තිබුණු අයතිවාසිකම්, පළාත් සභාවක් හැටියට අපට තිබුණු අනන්‍යතාවය පවා පසුගිය අවුරුද්දෙන් ආරම්භ කරපු පළාත් සභාවේ අනන්‍යතාවය ඉබේම මේ අවුරුද්දේ අහෝසි වීගෙන යන ගමන්, රජයේ න්‍යාය පත්‍රයට අනුව තමයි මේ අයවැය ලේඛනය සකස් වෙලා තිබෙන්නේ. කොටින්ම කියනවා නම් රජයෙන් දෙනවා මෙන්න වියදම් කරගන්න. ඊට වැඩිය සරල විධියට මම මේක හඳුනනවා. යම්කිසි ගෙදරක ගෘහමූලිකයා තමන්ගේ භාර්යාවට දෙනවා මෙන්න මේ සල්ලි ටික තියාගෙන වියදම් කරන්න. රජය ඒකයි දීලා තිබෙන්නේ. අපේ තිබුණු අනන්‍යතාවය, අපට තිබුණු වරප්‍රසාදය, 13 වැනි සංශෝධනයෙන් පැවරිලා තිබුණු කටයුතු, අපි මෙතෙක් කල් උපයා ගත් ආදායම අද මුද්දර ගාස්තුවට පමණක් සීමා කරලා තිබෙනවා. මුද්දර ගාස්තුවයි, මෝටර් රථ ගාස්තුවයි අපට අහිමි වුණා නම් මේ Budget එක සම්පූර්ණයෙන් තිල්. අපට වෙන්නේ, අර දෙන දෙයක් කාලා වෙන දෙයක් බලාගෙන ඉන්න සයිස් එකට ඉන්නයි. මේ පළාත් සභාවේ වර්තමාන තත්ත්වය යන්නේ එහෙමයි. පළාත් සභාවේ අර්බුද ගණනාවක් මතුවෙලා තිබෙන මොහොතක මෙවැනි අයවැයක් ගැන සාකච්ඡා කිරීමත් අපට ඉතා වැදගත් වෙනවා. විශේෂයෙන් සඳහන් කරන්න නැ. දස ලක්ෂ හතලිස් දාහක වියදමක්. ඒකෙනුත් අපි රජයේ ආධාර සහ ලෝක බැංකු ආධාර අරගෙන අපේ වියදම පියවනවා. මේ මුදල් ප්‍රකාශනයේ හැටියට විශේෂයෙන්ම බස්නාහිර පළාතේ ජන ජීවිතයත් එක්ක, විශේෂයෙන්ම තරුණ අසහනයත් එක්ක තරුණයින්ගේ ප්‍රශ්නවලට මැදිහත් වීම සම්බන්ධයෙන් ප්‍රවේශයක් කොහේවත් සඳහන් වෙලා නැහැ. විශේෂයෙන්ම උපාධිධාරීන්ගේ රැකියා සැපයීම පමණක් අපි උ ප්පලා පෙන්නුවාට දෙන දෙයක් නැහැ. මේ ප්‍රදේශයේ ස්වයං රැකියා ලාභීන් ඉන්නවා. ඒ වාගේ රැකියා ආදායම් මාර්ග ඇති කරගෙන කටයුතු කරන මේ ප්‍රදේශයේ ජනතාවගෙන් අය කර ගන්නා බදු - මධ්‍යම රජයෙන් හෝ වේවා. පළාත් සභාවෙන් හෝ වේවා. අය කර ගන්නා බදුවලට මේ ප්‍රදේශයේ කිසිම ජනතා ව්‍යාපාරිකයෙක්ට හෝ වේවා, ස්වයං රැකියාවක් හැටියට යම් ප්‍රතිලාභයක් ලැබෙන්නේ නැහැ. දහස් ගණනකට රැකියා අවස්ථා අහිමි වෙලා තිබෙනවා මිසක් නව රැකියා ඇති කරන්න වැඩ පිළිවෙළක් සකස් කරලා නැහැ.

අනික අපේ ප්‍රදේශයේ තිබෙන සම්පත් උපයෝගී කරගෙන තවත් අපට රැකියා අවස්ථා ලබා දෙන්න ඇති කරන්න. සංචාරක ප්‍රදේශයක් මේක. අපට සංචාරක අමාත්‍යාංශයක් තිබෙනවා. ඒ වාගේම සංචාරක මණ්ඩලයක් තිබෙනවා. මේ දත්තයන් එකතු කරගෙන ඒ සඳහා පොදු වැඩ පිළිවෙළක් තිබුණා නම්, පළාත් සභා ආදායම වැඩි කරන්න අපට හැකියාවක් තිබෙනවා. නමුත් මේ පළාත් සභා වියදම් ගැන විතරයි කථා කරලා තිබෙන්නේ. ඒ එක එක වර්ග කළා නම් අපට ඉදිරි සාකච්ඡාවේදී අපේ ගරු මන්ත්‍රීවරු ඉදිරිපත් කරයි. විශේෂයෙන්ම පුනරාවර්තන වියදම්වලට මුල් තැන දුන්නත්, සංවර්ධනය සඳහා මූලධන වියදම 8% කට වැඩිය යන්නේ නැහැ. සියයට අටයි. නමුත් පසුගිය වාර්තාව කියවන කොට කියනවා. අපි රැකියා ප්‍රශ්නය,

ඒ වාගේම ප්‍රදේශයේ සංවර්ධනයට විවිධ වැඩ සටහන් සඳහා අපි අවස්ථාව ලබා දීලා තිබෙනවා කියලා. නමුත් යම්කිසි විධියකින් පාර්ලිමේන්තුවේ අයවැය ඉදිරිපත් කරන කොට මෝටර් රථ ආදායම පිළිබඳව, ඒ වාගේම බස්නාහිර මුද්දර ආදායම පිළිබඳව ප්‍රකාශනය වෙලා තිබෙනවා. ඒ මුදල් අපට ලබන වසරේදී අහිමි වුණා නම්, මේ තත්ත්වය මොකද වෙන්නේ කියලා ඔබතුමාගේ මාර්ගයෙන් මම සභාවේ අවධානය යොමු කරන්න නෑ. එහෙමනම් මෝටර් රථ ආදායම ප්‍රධාන ආදායමක් හැටියට තිබෙනවා. ඒ මෝටර් රථ ආදායම යම්කිසි විධියකින් අපට තිබුණු BTT එක වාගේම හදිසි ගැසට් නිවේදනයක් නිකුත් කළා නම්, එහෙම වෙන්නේ මොකද? අපට අදායමක් නැහැ. අර මම පසුගිය අවුරුද්දේ පෙන්නුම් කළා වාගේ එහෙන් එන වවුචරය, නැත්නම් මෙහෙත් ඉදිරිපත් කරන වවුචරයට අපේ භාණ්ඩාගාරය මෙන්න වියදම් කරන්න කියලා අපට සල්ලි දෙන තත්ත්වයට, මෙච්චර පඩි ගෙවන්න අපට මුදල් දෙන්න කියලා මාස් පතා අපට වවුචර් ඉදිපත් කරලා මුදල් ලබා ගැනීමේ තත්ත්වයකටයි අපි මේ අයවැය ලේඛනයෙන් බලාපොරොත්තු වෙන්නේ. විෂයය ධාරා ගණනාවකම සඳහන් වෙනවා. විශේෂයෙන්ම නැවත නැවත පුන පුනා කියන්න වෙන්නේ, මේ ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය පිළිබඳව අවධානය යොමු කරලා නැහැ. මේ ප්‍රදේශයේ තිබුණු සම්පත් පිළිබඳව මේ අයවැය ලේඛනය තුළ, නැත්නම් ප්‍රකාශනය තුළ අන්තර්ගත වෙලා නැහැ.

විශේෂයෙන්ම ඊයේ පවා ගුරුවරුන්ගේ වැඩ වර්ජනයක් තිබුණා. ඒ වැඩ වර්ජනයට මූලික හේතුව ලිඛිතව දීලා තියෙන දේ ඉල්ලන්නේ. බස්නාහිර පළාතේ මේ අයවැය ලේඛනය තුළ ගුරු වැටුප් හිඟය පිළිබඳව කොහෙවත් සඳහන් වෙලා නැහැ. ඔවුන්ට ගෙවනවාද? නැද්ද? කියලා සඳහන් වෙලා නැහැ. ඒ වාගේම පළාත් සභාව පිළිබඳව අර්බුද මතු වෙලා සාකච්ඡා කරන මොහොතක ගරු මහ ඇමැතිතුමා යෝජනා කරනවා තට්ටු 15 ක ගොඩනැඟිල්ලක් හදලා මේ පළාත් සභා ක්‍රමය ස්ථාපනය කරන්න නෑය කියලා. එහෙම කියනකොට ඒ කැබිනට් මණ්ඩලයේම තව ඇමැතිවරයෙක් කියනවා, මේක අහෝසි කරන්න නෑය කියලා. එහෙම අර්බුදයක් මැදයි අද අපට මේ මුදල් ප්‍රකාශය සංවාදයට ගන්න වෙලා තිබෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර** – අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තීරණය ඒක නොවෙයි.

**ගරු ඒ.එම්. යුසුප්**
Hon. A M Yoosuf

සන්තෝෂ වෙනවා. ඒකයි මම කිව්වේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි, හවුල්කාර පක්ෂයයි අතර ගැටුමක් තිබෙන මොහතක – ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියන්නේ පළාත් සභා තිබෙන්න නෑ. මේ සභාවේ ඉඳගෙන ගරු සමූපකාර ඇමැතිතුමා ප්‍රකාශ කරනවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තීරණය පළාත් සභා ක්‍රමය පවතින්න නෑය කියන එකයි කියලා. අපිත් ඒ මතය උඩ ඉඳගෙන මේ කථා කරන්නේ. එහෙමනම් මේ පළාත් සභාව අවුල් වුණු තත්ත්වයක් මැද මෙවැනි අයවැය ලේඛනයක් ඉදිරිපත් කරලා මේ දස ලක්ෂ හතළිස් දාහක වියදම ලබන අවුරුද්දේ කරන්න පුළුවන්ද කියන එක ප්‍රශ්නයක් වෙනවා. ඒ වාගේම පරිපූරක ඉදිරිපත් කරන්න වෙනවා. විශේෂයෙන්ම මෙතැන ඇතුල් වෙලා නැහැ. රජයේ මධ්‍යම ආණ්ඩුවෙන් ප්‍රකාශ වූ යම් යම් දීමනා ගෙවීමේදී මේ පරිපූරකය ඒ වාගේම භාණ්ඩ මිල ඉහළ යාමේදී පරිපූරක ඉදිරිපත් කරන්න වෙනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, ගරු මහ ඇමැතිතුමා මුදල් ඇමැතිවරයා හැටියට එතුමාගේ ප්‍රකාශනයේ සඳහන් වෙනවා, යම් යම් දේවල්. පසුගිය කාලයේ කරගෙන ආපු කටයුතු අසාර්ථක වුණු බවත් එතුමා පිළිගන්නවා. කාරණා 10 ක් ඉදිරිපත් කරගෙන එතුමා කියන්නේ ඒකයි, මේවා සපුරාගන්න බැරි වුණයි කියලා. එහෙමනම් ගරු සභාපතිතුමනි, මේ බස්නාහිර පළාත් සභාව පිහිටුවලා අවුරුදු 25 ක කාලයක් දැන් ගත වෙමින් පවතිනවා. 25 වැනි මුදල් ප්‍රකාශය සභාවට ඉදිපත් කරලා තිබෙන මොහොතක අවුරුදු 20 ට වැඩි කාලයක් පාලනය කළේ, වර්තමාන පාලකයෝ බව සඳහන් කරන්න නෑ. එහෙනම් වර්තමාන පාලකයෝ මේ අවුරුදු 20 ටම ගත්තු යම් යම් ක්‍රියාමාර්ග නිසා අද පළාත් සභාව, රට තුළ අසාර්ථක තත්ත්වයකට පත් වුණයි කියලා ඒ උදවියම පිළිගන්නවා නම්, ඊට වගකිව යුත්තේ වර්තමාන පාලකයන්ම බව විශේෂයෙන් සඳහන් කරන්න නෑ ගරු සභාපතිතුමනි. එහෙනම් මේ වියදම් කිරීමේදී මීට වඩා සැලකිලිමත් වෙන්න නෑ.

අපි මීට පෙර මේ සභාවෙන් ඉල්ලීමක් කළා, වියදම් දරනවා නම් යම් ගිවිසුමක් ඉදිරිපත් කරන්න කියලා,. අපට මේ සභාව තුළ සිදු වෙන්නා වූ යම් යම් ගිවිසුම් සම්බන්ධව, වෙනත් දේ සම්බන්ධව මේ සභාව දැනුවත් කරන්න විධියක් නැහැ. (බාධා කිරීමක්) ගරු සභාපතිතුමනි, ඒ වාගේම අපි පසුගිය කාලයේ මේ සභාවට යෝජනා කළා. විශේෂයෙන්ම පාසල් දරුවන්ගේ පෝෂණය පිළිබඳව. පාසල් දරුවන්ට දිවා ආහාර වේලක් ලබා දෙන්නය කියලා. අඩු තරමින් ඒ සම්බන්ධව අවධානය යොමු වෙලා – මධ්‍යම ආණ්ඩුවෙන් සපත්තු දෙන්න හදනකොට ඇයි අපේ දරුවන්ට – විශේෂයෙන්ම, බස්නාහිර පළාතේ දරුවන්ට දිවා ආහාර වේලක් ලබා දෙන්න අපහසුතාවයක් නැහැ. ඒ වාගේම ගරු සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් මතක් කරන්න නෑ. මෙන්න මේ වියදම් කිරීම පිළිබඳව සභාවට ලොකු ගැට වක් මතු වෙලා තිබෙනවා. අමාත්‍යාංශවලට මුදල් වෙන් කිරීම සම්බන්ධව. කෘෂිකර්මය පිළිබඳව අපි කථා කරනවා. රැකි රක්ෂා වැය ශීර්ෂයක් පිළිබඳව කථා කරනවා. එහෙමනම් විශේෂයෙන්ම රැකියා සම්බන්ධව මේ තුළ කිසිම යෝජනාවක් ගැබ්වෙලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් කියන්නේ විශේෂයෙන්ම ඉදිරි වර්ෂයේදී මේ කටයුතු කරගෙන යන්න බස්නාහිර පළාත් සභාවට පුළුවන් වෙයිදෝ කියන එක ප්‍රශ්නාර්ථයක් උඩ අද මේ මුදල් ප්‍රකාශනය පිළිබඳව අපට සාකච්ඡා කිරීමට සිදුවීම පිළිබඳව කනගාටුව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[ පූ.භා. 10.21 ]

**ගරු සුනිල් ජයමිණි** – සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා මමත් එක්ක එකඟ වෙයි. බස්නාහිර පළාත් සභාවේ 25 වැනි අයවැය ලේඛනය පිළිබඳ පොදු සාකච්ඡාව ආරම්භ කරන මේ අවස්ථාවේ මම සම්බන්ධ වන 19 වැනි පළාත් සභා අයවැය විවාදය, මෙම විවාදය බව මම සඳහන් කරන්න ඕනෑ. පළමුවෙන්ම මම ඉතා කනගාටු වෙනවා. අපේ 25 වැනි අයවැය විවාදය ආරම්භ වන අවස්ථාවේ අපි ආණ්ඩු පක්ෂය හැටියටත්, විපක්ෂය හැටියටත් අපේ යුතුකමක් සහ වගකීමක් තිබෙනවා මේ අයවැය සාර්ථක විවාදයක් බවට පත් කරලා, මේ අයවැය තුළින් යම් ආදර්ශයක් රටට ලබා දෙන්න. නමුත් අයවැය ආරම්භ වෙලා පැයක් එක දිගටම ගණ පූරණය නැතිව මේ සභාව පවත්වන්න පුළුවන්කමක් නොලැබීම අපි කාගේත් අභාග්‍යයක්. ඒ වාගේම පළාත් සභාව එපැයි කියන අයට, පළාත් සභාව අවශ්‍ය නැහැයි කියලා කියන අයට යම් ශක්තියක්, ඒකෙන් උඩගෙඩි ලබා දුන්නයි කියන එකත් මම මේ වේලාවේ මතක් කරන්න ඕනෑ.

**ගරු මංජු ශ්‍රී අරංගල** – විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා ඉන්න කොට කියන්න.

**ගරු සුනිල් ජයමිණි** – සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

මගේ කල්‍යාණ මිත්‍ර උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා එක්ක මගේ පෞද්ගලික ගැට වක් නැහැ ගරු සභාපතිතුමනි. නමුත් මම මේ වේලාවේ මතක් කරන්න ඕනෑ. පළාත් සභාව අවශ්‍යයි කියන මතයේ ඉන්න කෙනෙක් හැටියටයි මම මේ විවාදයට සම්බන්ධ වෙන්නේ. පළාත් සභාව එපැයි කියන කෙනෙක් හැටියට නොවෙයි. අපි අද ඉතාමත් සතුටු වෙනවා. වත්මන් පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ නායකත්වයෙන්, ඒ වගේම අපේ අමාත්‍ය මණ්ඩලයේ සහෝදර ගරු ඇමැතිවරුන්ගේ හිතවත්කමින්, පළාත් සභාවේ ඉන්න සිය ම ආණ්ඩු පක්ෂ කණ්ඩායමේ මන්ත්‍රීවරුන්ගේ සහෝදරත්වයෙන් තමයි අද මේ අයවැය ලේඛනයට අපි සම්බන්ධ වෙන්නේ. හැබැයි, මේ අයවැය පිළිබඳව සාකච්ඡාව ආරම්භ කරන වේලාව කියන්නේ, මම හිතන්නේ රේණුක පෙරේරා - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා දන්නවා. පළාත් සභා ක්‍රමය පිළිබඳව මේ රටේ විවිධ මත, විවිධ අදහස් පළ වෙමින් තිබෙන අවස්ථාවක තමයි මේ අයවැය විවාදය අපි අද ආරම්භ කරන්නේ. මේ පළාත් සභා ක්‍රමය වසර 25 ක් ගලාගෙන ඇවිල්ලා, පළාත් සභා ක්‍රමය අහෝසියි කියන මතයේ ඉඳගෙන - මම අර කලින් කිව්වා වාගේ මේ පළාත් සභා ක්‍රමය පිළිබඳ යම් සංශෝධන, යම් වෙනස් වීම් කරන්න අවශ්‍යයි කියන මතයේ අපි බොහෝ දෙනෙක් ඉන්නවා. ඒකෙන් අදහස් කරන්නේ නැහැ, පළාත් සභා ක්‍රමය අහෝසි කරන්නය කියන එක. නමුත් පළාත් සභා ක්‍රමය තුළ යම් සංශෝධනවලට යා යුතු අවස්ථාවකට අද මේ රට පත් වෙලා තිබෙනවාය කියන එකත් මම මේ වේලාවේ මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම අද මේ රටේ ව්‍යවස්ථාදායකය සහ අධිකරණය අතර යම් මත භේදයක් තිබෙනවා කියන එකත් බොහෝ දෙනා කථා කරන කාරණාවක්. මේක ඉස්සරහාට ගලාගෙන යන්න සැලැස්සුවොත් ඒක මේ රටේ ජනතාවගේ අවාසනාවට ලක් වෙන කාරණාවක්. පුද්ගලයෙක් පිළිබඳව තිබෙන ගැට වකට, පුද්ගලයෙක් පිළිබඳව තිබෙන ප්‍රශ්නයකට මේ අධිකරණ ක්ෂේත්‍රයත්, මුළු රටේම ඉන්න ජනතාවත් සම්බන්ධ කරගෙන විශාල මතභේදයකට යාම මේ රටේ අභාග්‍ය සම්පන්න කාරණාවක් කියන එකයි මගේ පෞද්ගලික විශ්වාසය. හැබැයි, එක දෙයක් තිබෙනවා. මේ රටේ ප්‍රශ්නවලට මැදිහත් වන අය දැනගන්න ඕනෑ, මේ රටේ සියල්ලටම වඩා ජනතා බලය ශක්තිමත් කියන එක මේ සිය දෙනා දැන ගන්න ඕනෑ. එහෙම ජනතා බලය මේක පාලනය කරගන්න බැරිව ඉදිරි කාලයේදී අ ත්කඩේ පැත්තට ගලාගෙන ගියොත් මේ සියල්ල යටපත් වෙනවයි කියන එකත් ඒ අය දැන ගන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දිවි හිමියෙන් සටන් කරනවා.

**ගරු සුනිල් ජයමිණි** – සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, දිවිහිමියෙන් සටන් කලත් සියල්ලට වඩා ජනතා බලය වැඩියි කියන එක මම මේ සභාවට ගෞරවයෙන් මතක් කරනවා. මේ අපේ ගරු මන්ත්‍රීතුමාටත් එක්ක.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

නායකතුමා කිව්වා, ගල් ගහපු කට්ටිය නිදහස් කරනවා කියලා.

**ගරු සුනිල් ජයමිණි** – සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ඔව්. ඔව්. රේණුක පෙරේරා - ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා කියනවා වාගේ අපි සතුටු වෙනවා. වත්මන්

විපක්ෂ නායකතුමා මේ ප්‍රශ්නයේදී මධ්‍යස්ථව හිතලා එතුමා මේ ප්‍රශ්නය දිහා බලන ආකාරය පිළිබඳව පළාත් සභාවේ ආණ්ඩු පක්ෂය හැටියට අපි සතුටු වෙනවා. ගරු සභාපතිතුමනි - අපේ උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා සභාවට පැමිණුනා. එතුමා පැමිණීම පිළිබඳව මම සතුටු වෙනවා. තමුන්නාන්සේ සභාවේ නැති වේලාවට සමහර අය තමුන්නාන්සේව මතක් කරනවා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

එතුමා මතක් කළේ. අපි නොවෙයි.

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

මම මතක් කරන්න නෑ, එක කාරණාවක්. අද බොහෝදෙනා කියන කාරණයක් තමයි පළාත් සභාව සුදු අලියෙක් කියන එක.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

බොහෝ අය නොවෙයි.

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

බොහෝ අය කියනවා. පළාත් සභා ක්‍රමයෙන් වැඩක් නැහැ. මේක සුදු අලියෙක්. මේක මුදල් කාබාසිනියා කරන –

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ඔය ළඟ ඉන්න එක්කෙනා.

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

එතුමාත් එක්ක මගේ පෞද්ගලික අමනාපයක් නැහැ. මුදල් කාබාසිනියා කරන ආයතනයක් කියලා. හැබැයි, අපේ උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා කියලා නැහැ, පළාත් සභාව සුදු අලියෙක් කියලා. එතුමා ඉන්නේ වෙන තර්කයක. ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා සභාවේ සිටියා නම් හොඳයි. එතුමා ඉදිරිපත් කරපු අයවැය ලේඛනයේ මුදල් වියදම් වුණු ආකාරය පිළිබඳව මම බැ වා. බස්නාහිර පළාත් සභාවේ බොහෝ දෙනා කියන්නේ, මේ මන්ත්‍රීවරු වරප්‍රසාද විඳිනවා. මන්ත්‍රීවරුන්ට පඩි දෙනවා. මන්ත්‍රීවරුන්ට ණය දෙනවා. මන්ත්‍රීවරුන්ගේ කාර්ය මණ්ඩලවලට මෙච්චර වියදම් කරනවා. ඒ වාගේම මන්ත්‍රීවරුන්ට වාහන පර්මිට් දෙන්න නෑය කියලා බොහෝදෙනා සමහර තැන්වල කථා කරනවා. ඒවා ඇත්තෙන්ම මන්ත්‍රීවරයෙකුගේ පැවැත්මට අවශ්‍ය කරන දේවල්. නමුත් සමහර අය හිතනවා මේ පළාත් සභා ආදායමෙන් සියයට පනහක් විතර පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ගේ පරිභෝජනය සඳහා යනවයි කියලා. ගරු සභාපතිතුමනි, මම තමුන්නාන්සේට සඳහන් කරන්නම්. බස්නාහිර පළාත් සභාවේ මුළු ආදායම රුපියල් මිලියන හතලිස් දහස් එකසිය අනූවයි. මේ මන්ත්‍රීවරු 104 දෙනෙක් සඳහා පළාත් සභා ලේකම් කාර්යාලයේ සේවකයන් 50 ක් පමණ ඉන්නවා. ඒ 50 සඳහා වියදම් කරන්නෙත් ඒ පළාත් සභා ආදායමෙන් රුපියල් මිලියන දෙසිය අනූවක් පමණයි. ඒ කියන්නේ ප්‍රතිශතයක් හැටියට ගත්තාම සියයට එකකටත් වඩා අඩු ගණනක් කියන එක මම මේ සභාවේදී මතක් කරන්න නෑ. ප්‍රතිශයක් හැටියට ගත්තාම සියයට දශම හතයි හතරක්. සියයට එකකටත් වඩා අඩුයි. ඒකෙනුත් දශම හතයි හතරක මුදලක් තමයි පළාත් සභාවේ මන්ත්‍රීවරු, කාර්ය මණ්ඩල සහ පළාත් සභා ලේකම් කාර්යාලය වෙනුවෙන් මේ සභාව වැය කරන්නේ. ඒ නිසා මේ කරුණු නොදැන කරන විග්‍රහයන් තුළ සමහර අවස්ථාවල මන්ත්‍රීවරු, අපේ කාර්ය මණ්ඩල, ඒ වගේම සමහර වේලාවට පෞද්ගලිකව සමහර අය කරන චෝදනා නිසා බොහෝ අපහසුතාවයට පත් වෙනවා. ඒ නිසා පළාත් සභාවේ අදායමෙන් සියයට එකකටත් වඩා අඩු මුදලක් තමයි පළාත් සභාවේ මන්ත්‍රීවරුන් සඳහා සහ පළාත් සභා ලේකම් කාර්යාලය සඳහා මේ අයවැයෙන් වෙන් කරලා තිබෙන්නේ කියන එක මම මේ සභාවේදී ගෞරවයෙන් මතක් කරන්න නෑ.

ඒ නිසා ගරු සභාපතිතුමනි, අද බස්නාහිර පළාත් සභාවේ 25 වැනි අයවැය ලේඛනය ඉදිරිපත් කරන අවස්ථාව. මට මතකයි මේ අවස්ථාවේ වත්මන් අපේ අතිගරු ජනාධිපතිතුමා අපව කැඳවලා පළාත් සභා පිළිබඳව, පළාත් සභාවේ ගැට පිළිබඳව සාකච්ඡා කළා. අපේ මන්ත්‍රීතුමන්ලා සහ බොහෝ දෙනෙක් පළාත් සභාවේ අඩුපාඩු පිළිබඳව කථා කළා. නමුත් ගරු ජනාධිපතිතුමා අවසානයේදී කිව්වා, මම බලාපොරොත්තු වුණු එක් කාරණාවක් මේ සභාවේදී කථා වුණේ නැහැයි කියලා. මොකක්ද ඒ කාරණාව? ඒ කාරණාව තමයි පළාත් සභාවට ආදායම ගෙනෙන, උත්පාදනය කරන යෝජනා මෙතැන ඉදිරිපත් වුණේම නැහැයි කියන එක තමයි එතුමා සඳහන් කළේ.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ඉදිරිපත් කරන්න නෑ නැහැ නේ?

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

තමුන්නාන්සේ දැන් කලින් සඳහන් කළා නේ. පළාත් සභාවට රජයෙන් දෙන මුදල වියදම් කරන එක විතරයි අපි කරන්නේ කියලා. මම ඒකයි තමුන්නාන්සේට උත්තරයක් දෙන්න බලාපොරොත්තු වෙන්නේ. ගරු ජනාධිපතිතුමා බලාපොරොත්තු වුණේ, මන්ත්‍රීතුමන්ලාගෙනුත් පළාත් සභාව සඳහා යම් ආදායම් උත්පාදනයක් බලාපොරොත්තු වන යෝජනා ඉදිරිපත් වෙයි කියලා. නමුත් ඒක එවලේ ඉදිරිපත් වුණේ නැහැ. ඇත්තෙන්ම අපි කනගාටු වෙනවා. ඒ සඳහා සමහර අයගේ සූදානමක් නොතිබුණා වෙන්න ඇති. නමුත් ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා මෙතැන ඉන්නවා. ඒ සම්බන්ධව මම එක කාරණාවක් සඳහන් කරනවා. පළාත් සභාවේ ආදායම් ලබා

දෙන එක මාර්ගයක් තමයි රජයේ ඉඩම් බදු ලබා දීම. රජයේ ඉඩම්වල අයිතිය තිබෙන්නේ මහ ආණ්ඩුවට. නමුත් රජයේ ඉඩම් බදු ලබා දුන්නාම බදු මුදල එකතු වීමේ අයිතිය තිබෙන්නේ පළාත් සභාවට. නමුත් අද බස්නාහිර පළාත් සභාවේ රජයේ ඉඩම්වලින් ලැබෙන ආදායම ඉතාම අල්ප ආදායමක්. මිලියන 150 ක වාගේ මුදලක් තමයි රජයේ ඉඩම්වලින් පළාත් සභාවට ලැබෙන්නේ. නමුත් රජයේ ඉඩම් රාශියක් තිබෙනවා, පළාත් සභාවට ආදායම් ලැබෙන්න නැ. ඒවා. මම මේ වේලාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යෝජනා කරනවා. රුපියල් මිලියන 1000 කට වඩා අදායමක් ලබා ගන්න පුළුවන්. මේ ඉඩම් හරියට තක්සේරු කරලා. පරණ තක්සේරුවෙන් ඉවත් වෙලා, නැවත තක්සේරු

[ ගරු සුනිල් ජයමිණි – සභා නායකතුමා ]

කරලා මේ මුදල් ලබා ගන්නවා නම් මම හිතනවා, මිලියන 1000 කට වඩා වැඩි මුදලක් ලබා ගන්න අපට පුළුවන්. ගරු සභාපතිතුමනි, කාලය පිළිබඳව ලොකු ගැට වක් තිබෙනවා.

මම මේ වේලාවේ ගරු ප්‍රධාන ඇමැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා මධ්‍යම රජයත් එක්ක සාකච්ඡා කරලා අපේ සිය ම අමාත්‍යාංශ, සිය ම ආයතන එක තැනට ගෙනෙන්න පුළුවන් විධියට පළාත් සභා ගොඩනැගිල්ලක් හදන්න රුපියල් මිලියන 4000 ක් වර්ෂ තුනක් තුළ ලබා ගන්න කටයුතු කරලා තිබෙනවා. හැබැයි, අපි දැක්කා සබරගමු පළාත් සභාව. අපි දැක්කා වයඹ පළාත් සභාව. අපි දැක්කා උතුරු මැද පළාත් සභාව. ඒ පළාත් සභා දැක්කාම යම් ආඩම්බරයක් ඇති වෙනවා. අපේ පළාත් සභාවට වඩා කොච්චර ලස්සන විධියට ඒ පළාත් සභා ස්ථාපනය කරලා තිබෙනවාද කියලා. (බාධා කිරීමක්) දකුණු පළාතේ එක්තරා මන්ත්‍රීවරයෙක්. අජිත් මන්ත්‍රීතුමා. ගරු සභාපතිතුමනි, ඒ නිසා මම ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. බස්නාහිර පළාත් සභාව ලබන අවුරුද්දේ සැලසුම් කරලා හදනවා නම්, අපේ පළාත් සභාව හදන කොට ඒක නිර්මාණශීලී පළාත් සභාවක් බවට ඒ ගොඩනැගිල්ල පත් වෙන්න නැ. නැත්නම් යට ගරාජ් එකක් ගහගෙන ගරාජ් එකේ ස්වභාවය එළියට දිස් වෙනවා නම් ඒ පළාත් සභාව තුළින් අපි බලාපොරොත්තු වන ඒ දේ ලැබෙන්නේ නැහැ. හැබැයි, ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීවරු හිනා වෙන්න පුළුවන්. පළාත් සභාව හැදුවට ඒක ක්‍රියාත්මක වෙනවාද කියලා. ඒක මමත් පිළිගන්න කාරණාවක්. පාර්ලිමේන්තුව කොච්චර ලස්සනට හැදුවත් වැඩක් නැහැ පාර්ලිමේන්තුවේ ඔක්කෝම අණපනත් සම්මත වුණේ නැත්නම්. නමුත් පළාත් සභාවක් යම් ලස්සනකට, යම් රටාවකට - පළාත් සභාව ලස්සන Ground Floor එක තුළින්ම විනාශ වෙනවා නම් එසේ කරන්න එපාය කියන කාරණාව මම තමුන්නාන්සේගෙන් ගෞරවයෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. ඒ වාගේම මට කථා කළ යුතු තව එක් කාරණාවක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභා නායකතුමා, ඔබතුමාගේ කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා එතුමාට කාලය දෙන්න පුළුවන්ද? කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා මට සිද්ධ වෙනවා කාලය අඩු කරන්න.

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ඒ වාගේම ගරු සභාපතිතුමනි,

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මගෙන් විනාඩි තුනක් දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩි තුනක් ලබා දෙනවා.

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

පළාත් සභාව තුළ අධිකාරී අටක් ක්‍රියාත්මක වෙනවා. මේ පළාත් සභාව තුළ පවත්වාගෙන යන අධිකාරී අටේ මුදල් ගනුදෙනු පිළිබඳව යම් හෝ විගණනයක් කරන්නේ පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව. හැබැයි, සමහර ආයතනවල මුදල් පරිපාලනය ඉතාමත් අයහපත් තත්ත්වයක තිබෙනවයි කියන වාර්තා අපටත් ලැබිලා තිබෙනවා. මම විශේෂයෙන් මතක් කරන්න නැ. බස්නාහිර පළාත් සභාවේ තිබෙන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය පිළිබඳව. ඒ අධිකාරියේ පළමුවැනි විගණන වාර්තාව විගණකාධිපතිට භාරදීලා තිබෙන්නේ, 2011 අවුරුද්දේ. මම හිතන්නේ ඒක පිළිබඳව ගිණුම් කාරක සභාව සාකච්ඡා කළා. ඒ ලබා දීපු සිය ම ගිණුම් වැරැදියි. විගණකාධිපතිතුමා නැවත ඒවා සකස් කරලා ඉදිරිපත් කරන්නය කියලා මාස තුනක් කල් දීලා තිබුණා. මේ අවුරුද්දේ පෙබරවාරි මාසයේ එය ඉදිරිපත් කරන්නය කියලා කල් දීලා තිබුණා. නමුත් මේ දක්වා පළාත් සභාවේ තිබෙන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ ගිණුම් වාර්තා ඉදිරිපත් කරලා නැහැ. මම මේ එකක් පමණයි සඳහන් කරන්නේ. ඒ නිසා ඒවායේ ලබා දෙන මුදල් පිළිබඳව, ඒ වාගේම ඒවායේ තිබෙන මුදල් අකටයුතුකම් පිළිබඳව පළාත් සභාවේ ගිණුම් කාරක සභාවටත් මේ දක්වා සාකච්ඡා කරන්න අවස්ථාවක් ලැබිලා නැහැ. ඒක බරපතළ වරදක්. ඒ නිසා මම විශ්වාස කරනවා, පළාත් සභාව තුළ ගරු ප්‍රධාන අමාත්‍යතුමාත්, අමාත්‍ය මණ්ඩලයත් මේවා විනිවිදභාවයෙන් පවත්වාගෙන යන්නට උත්සාහ ගන්නවා. ඒ නිසා මේ සෑම අධිකාරියකම මුදල් පිළිබඳව තිබෙන ගිණුම් වාර්තා ක්‍රමානුකූලව නිසි පරිදි ලබා දෙන්න අමාත්‍යවරු කටයුතු කරනවා නම්, අමාත්‍යවරු උනන්දු වෙනවා නම් ඒක පළාත් සභාවේ ඉදිරි පැවැත්මට ඉතා හොඳ දෙයක් හැටියට මම මේ වේලාවේ ගෞරවයෙන් මතක් කරනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, මම හැමදාම කථා කරන කාරණාවක්. මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට පෞද්ගලිකවත් ඒ ගැන සඳහන් කළා. අපේ කණ්ඩායම් රැස්වීමේදීත් සඳහන් කළා. අපේ පළාත් සභාවේ මන්ත්‍රීවරුන් සඳහා, ඒ වාගේම නිලධාරීන් සඳහා නිවාඩු නිකේතනයක් බස්නාහිර පළාත් සභාවේ නැහැ. ඒක අවශ්‍ය දෙයක්. මොකද, අනික් පළාත් සභාවල්වල, නුවර එළිය වෙන්න පුළුවන්. කතරගම වෙන්න පුළුවන්. අනුරාධපුරය වෙන්න පුළුවන්. ඒ අය ඒ මන්ත්‍රීවරුන්ට පළාත් සභාවේ නිවාඩු නිකේතන ආරම්භ කරලා තිබෙනවා. නමුත් බස්නාහිර පළාත් සභාවේ එහෙම දෙයක් නැහැ. ලංකාවේ වැඩිම ආදායම් තිබෙන පළාත් සභාව. රාජ්‍ය සේවකයන් 75000 ක් ඉන්න පළාත් සභාව. වැඩිම මන්ත්‍රීවරු සංඛ්‍යාවක් ඉන්න පළාත් සභාව. 104 ක්. නමුත් පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකුට ගිහිල්ලා තමන්ගේ කියලා නිවාඩු නිකේතනයක් නැති එකම පළාත් සභාවත් බස්නාහිර පළාත් සභාව විතරයි. ඒ නිසා මම ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් සහ කැබිනට් මණ්ඩලයෙන් අපි ඉල්ලන්නේ, අන්න ඒ කාරණාව පිළිබඳව තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරලා ඒ කාරණාවට ප්‍රමුඛත්වය ලබා දෙන්නය කියන කාරණයයි. ගරු සභාපතිතුමනි, මම මේ වෙලාවේ තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. පළාත් සභාවේ 24 වැනි අයවැය ආරම්භ වුණු අවස්ථාවේ ඒ පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් ඉදිරි කාලයේදී මෙම පළාත් සභාව ශක්තිමත් පළාත් සභාවක් බවට පත් කරන්න අප සිය දෙනාටම අවස්ථාව ලැබේවා කියා ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[ පූ.භා. 10.36 ]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යවරයා යටතේ ඉදිරිපත් කරන අවසාන අයවැයට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මගේ ගෞරවය ස්තුතියත් ගරු සභාපතිතුමාට පුද කරනවා. ගරු සභාපතිතුමනි,

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ අන්තිම අයවැය.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මම විශ්වාස කරනවා, ඔබතුමා මගේ අදාළ කාලය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. ගරු මන්ත්‍රීතුමන්ලා එතුමාට බාධා කිරීම් කරන්න එපා. බොහොම කෙටි කාලයක් එතුමාට තිබෙන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

එතුමාගේ අන්තිම අයවැය

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය පොඩ්ඩක් නිශ්ශබ්ද වන්න. එතුමාට බාධා කිරීම් කරන්න එපා. ඔබතුමාත් මූලාසනයට කථා කරන්න. පොදු සාකච්ඡාව නේ යන්නේ. ඔබතුමා ඒ අනුව කථා කරන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

විනාඩියක් ගියා. ගරු සභාපතිතුමනි, මේ රටේ මිනිස්සු දැන් පසුගිය කාලයේ බලාගෙන සිටියේ, මධ්‍යම ආණ්ඩුව හොඳ අයවැයක් මේ රටේ ජනතාවට ලබා දෙයි කියලා. කම්කරු ඇමැතිවරයෙක් ජනාධිපති වුණු රටක කම්කරුවන්ට තමන් හිතන විදියේ අයවැයක් තමන්ට හම්බ වෙයි කියලා. මේ රටේ දුප්පත් මිනිස්සු හිතන් හිටියා මේ අයවැය හරහා අපට ආණ්ඩුවෙන් අ තෙන් යමක් ලබා දෙයි කියලා. මේ රටේ ව්‍යාපාර ප්‍රජාව හිතන් හිටියා තමන්ගේ ව්‍යාපාර දියුණු කරන්න ආණ්ඩුව අතහිත දෙයි කියලා. හැබැයි මේ සියල්ලම මේ අයවැයෙන් සිද්ධ වුණේ නැහැ ගරු සභාපතිතුමනි. ඒ අයවැයේ තිබුණේ එකම නිර්වචනයයි. ඒ තමයි පිය පුතු සෙනෙහසේ අයවැය. පාර්ලිමේන්තුවේ අයවැයෙන් මේ රටේ ජනතාවට ඉතුරු වුණේ පිය පුතු සෙනෙහසේ අයවැය විතරයි. ඊට පස්සේ කලකිරීමට පත් වුණු බස්නාහිර පළාත් සභාවේ ලක්ෂ 60 කට අධික ජනතාව හිතන් හිටියේ, ප්‍රසන්න රණතුංග අපේ ගරු ප්‍රධාන අමාත්‍යවරයා යටතේ ඉදිරිපත් කරන අයවැයෙන්වත් අපට පොඩි සහනයක් බස්නාහිර පළාතේ ජනතාවට සිද්ධ වෙයි කියලා. මම ගරු සභාපතිතුමනි, ඊයේ සවස මේ සන්ධානයේ මන්ත්‍රීවරයෙකුට කථා කරලා ඇහුවා, මොකක්ද මේ සුපසෙන් නිම්තෙර කියන්නේ කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සුපසන් නිම්තෙර?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

සමාවෙන්න. සුපසන් නිම්තෙර.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

දන්නේ නැහැ, ඒක.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒක තමයි. මම ඒ T-Shirt එක දැකලා තිබෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ බදාදා දවස්වල කාර්යාලයේ තිබෙනවා -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, මෙතුමා කථාවේදී කිව්වා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකුගෙන් කථා කරලා ඇහුවා කියලා. කරුණාකරලා නම කියන්න වෙනවා, වගකීමෙන් කොයි මන්ත්‍රීවරයාද කියලා. වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරන්නේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මම බස්නාහිර පළාත් සභාව කියලා කිව්වාද? වයර්මාරු වෙලා. ධන සෘණ මාරු වෙලා. ගරු සභාපතිතුමනි

[ ගරු නිරෝෂන් පාදුක්ක ]

වගකීමෙන් වැඩ කරන්නේ. මේ වාගේ අය තමයි සභාව නොමහ යවන්නේ. වාඩි වෙන්න කියන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේ 337 න් එකක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න. ගරු මන්ත්‍රීතුමා ඔබතුමා සඳහන් කළේ, බස්නාහිර පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් නම් කරුණාකර නම සඳහන් කරන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මම කියලා තිබෙන්නේ දැනෙන තැනකට දැනෙන්න. රිදෙන තැනකට රිදෙන්න. විදින තැනකට විදින්න. විදිනවා නම්, රිදෙනවා නම්, දැනෙනවා නම් තොප්පිය දා ගත්තාට කමක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ ප්‍රකාශය බස්නාහිර පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් නම් කරුණාකර නම කියන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, සුපසන් නිම්තෙර.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, සුපසන් නිම්තෙර ගැන මේ බස්නාහිර පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් මිසක්, වෙන පළාතක මන්ත්‍රීවරයෙකුගෙන් අහලා මේක පැහැදිලි කර ගන්න බැහැ නේ?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මගේ කාලය නෑ, ගරු සභාපතිතුමනි (බාධා කිරීමක්) ගරු සභාපතිතුමනි, බලන්නකෝ මේ අයගේ හික්මීමේ තරම. මම මේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉදිරිපත් කරපු සංකල්පයක් ගැන මන්ත්‍රීවරයෙකුගෙන් - එක්කෝ මෙයාට ඒ සංකල්පය ගැන අවිශ්වාසයක්. මෙතුමාට තිබෙන ප්‍රශ්නය ඒකද? හරියට කාරණය අහගන්න කියන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සංකල්පය හරියට කිව්වේ නැහැ නේ?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මම ඇහුවාම -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සංකල්පයේ නමවත් දන්නේ නැහැ නේ?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඔබතුමා මට කථා කරන්න දෙනවා නම් දෙන්න. නැත්නම් මම නවත්තලා යන්නම්. ඔබතුමා කණ්ඩායම හදා ගන්න. මේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ගැන කථා කරන විෂයයක්. මේ පළාත් සභාවේ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

යන්න. යන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සුපසන් නිම්තෙර ගැන කථා කළේ?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මේ අයවැයේ එක විෂයයක් නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමාට මොකක්ද කාරණාවක් පැවසුවා කිව්වා. ඔබතුමා කියන්න ගිය ඒ කාරණාව කියන්න. මන්ත්‍රීතුමාගේ නමත් සඳහන් කරලාම කියන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

නැහැ, ඉතින් මන්ත්‍රීවරයා මට මේගොල්ලෝ කියලා කිව්වේ නැහැ නේ? ඇයි තොප්පිය දා ගත්තේ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් කියලා කිව්වා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු පළාත් සභා අටක ඉන්නවා. පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයක් තිබෙනවා. මෙතුමා මොකටද මේ ඇඟට ගන්නේ? ගරු සභාපතිතුමනි, මම දැන් මේ සුපසන් නිම්තෙර ඇහුවාම එක මන්ත්‍රීවරයෙක් කියනවා, මේ ප්‍රසන්නට පෙනෙන උපරිමය දුර කියලා. මේකට නිර්වචනය වන්නේ ප්‍රසන්නට පෙනෙන උපරිමය දුර කියලා. ඉතින් ගරු සභාපතිතුමනි, ඒ අනුව එතුමා අයවැය කථාවක් ඉදිරිපත් කළා තමන්ට පෙනෙන දුර බලලා. ඒක ගැනයි මම මේ කථා කරන්න හදන්නේ. මේ රේණුක පෙරේරා මහත්මයාට තිබෙන අමාරුවට මට කරන්න දෙයක් නැහැ. මන්ත්‍රීවරයෙක්. ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අනවශ්‍ය ප්‍රශ්න කථා නොකර ඉන්න කෝ?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

අපි අවශ්‍ය කාරණා පිළිබඳව කථා කරන්නේ ගරු සභාපතිතුමනි. ඒ නිසා මම ඔබතුමා හරහා අවධානය යොමු කරන්නේ මේ අයවැය ශීර්ෂය හරහා මේ පළාත් සභාවට එනකොට අපි –

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර කටයුතු අමාත්‍යතුමා)
Hon. Udaya Prabhath Gammanpila (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industries and Environmental Affairs.)

රේණුක පෙරේරා මහත්මයා නොවෙයි. මන්ත්‍රීවරයා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

එතුමා මහත්මයා වෙලා තමයි මන්ත්‍රීතුමා වුණේ. එතකොට ඔබතුමා මේවාට විරුද්ධව වැඩ කරන කාලයේ. කටවහගෙන ඉන්න. මම විශ්වාස කරනවා ඇමැතිකම රැකගෙන ආත්ම ගරුත්වයත් රැකගෙන උදය ගම්මන්පිල කියන චරිතය සිය මුඛය වහගෙන ඉඳියි කියලා මගේ කථාවේදී.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මූලාසනයට කථා කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මොකක්ද මේ හික්මීම.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සිරිකොතේ කථා නම් හරි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අනවශ්‍ය විවාදවලට යන්න එපා. ඔබතුමා මූලාසනයට කථා කරන්න කෝ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සිරිකොතේ අප්සට් එක තිබෙන්නේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මේක නම් ඔබතුමා යටතේ අපට ලබා දීලා තිබෙන නිදහස, අපට කථා කරන්න දෙන්නේ නැති, තුන්වේලම ඇල්වතුර නිවලා බොන ඇමැතිවරුන්ටත් කට වහගෙන ඉන්න තේරෙන්නේ නැත්නම්, මේ සභාවේ අපට තිබෙන අයිතිය මොකක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අනවශ්‍ය ප්‍රශ්නවලට යන්න එපා. ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මේකද මේ තමුන්නාන්සේ කථා කරන නිදහස? අපට කථා කරන්න ඉඩ දෙන්න කෝ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථා කරන්න. ප්‍රශ්නයක් නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සඳුදා සිරිකොතට ඇතුල් වෙන්න දුන්නේ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මේ පළාත් සභාව තුළ 1988 සිට –

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, ඔබතුමාට මගේ ගෞරවය පිරිනමනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථා කරන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

කථා කරන්න දෙන්නේ නැත්නම් –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා බාධා කිරීම්වලට සම්බන්ධ වෙන්න එපා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මේක නවත්තමු. ඔබතුමාට තෙරුවන් සරණයි.

[සභාවේ ඝෝෂා]

කථා කරන්න දෙන්නේ නැති බාල පළාත් සභාවක්.

**ගරු ගාමිණී තිලකසිරි**
Hon.Gamini Thilakasiri

ගරු සභාපතිතුමා, මන්ත්‍රීවරුන්ට කථා කරන්න දෙන්න. අපට මේවාට උත්තර දෙන්න පුළුවන්. මෙහෙම කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලයක් තිබෙනවා නේ? ඇයි බාධා කිරීම් කරන්නේ? පැහැදිලියි.

**ගරු ගාමිණී තිලකසිරි**
Hon.Gamini Thilakasiri

අපි ඒවාට කථාවේදී උත්තර දෙන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ විවාදය සාධාරණ වෙන්නට නෑ.

[සභාවේ ඝෝෂා]

කරුණාකර නිශ්ශබ්ද වන්න. ඒක වෙනම ප්‍රශ්නයක් ගරු මන්ත්‍රීතුමා. මේ සභාවේ සාධාරණයක් තිබෙනවා. එතුමාට අදහස් ප්‍රකාශ කරන්න ඉඩ දෙන්න. ඔබතුමා පිළිතුරු කථා කරන්න. මේක මේ බලය පාවිච්චි කරලා බාධා කිරීම් කරන්න එපා.

[සභාවේ ඝෝෂා]

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. ගරු මන්ත්‍රීතුමන්ලා, විශේෂයෙන්ම මම මේ ඉල්ලීම කරන්නේ –

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, කථාවක් කරනකොට අනවශ්‍ය කථා කරලා ප්‍රශ්න ඇති කර ගත්තේ එතුමා. ඒක එතුමාට කියන්න නෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා වාඩි වෙන්න. ඔබතුමන්ලා පොඩ්ඩක් සාධාරණ වෙන්න. මුලින්ම කිව්වා. (බාධා කිරීම්) ඔබතුමා වාඩි වෙන්න. ඔබතුමා ආයේ කථා කරන්න එපා. මේ සභාව මෙහෙය වන්නේ සභාපති. සභාපතිවරු ගොඩක් නැහැ. සභාපතිවරු එක්කෙනයි ඉන්නේ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම මේ ප්‍රශ්නය යන්න දෙන්න බැහැ, ගරු සංවිධායකතුමා. අදහස් ප්‍රකාශ කරන්න විපක්ෂයටත් අවස්ථාවක් දෙන්න නෑ. බාධා කිරීම් කරන්න එපා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් මම මතු කළේ. කථාවකට බාධා කිරීමක් නොවෙයි. මූලාසනයෙන් වැරැදි අර්ථ කථන දෙන්න එපා. මම වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කළේ. එතුමා ඉදිරිපත් කළා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් එතුමාට දුරකථනයෙන් කථා කළා කියලා. එතකොට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු හැටියට අපට වගකීමක් තිබෙනවා. කොයි මන්ත්‍රීවරයාද? කියලා. අපේ වරප්‍රසාදය. ඒ වරප්‍රසාදය පිළිබඳවයි මම මතු කළේ. එතකොට ඊට පස්සේ එතුමා ඒක ලිස්සලා ඇරියා. සුපසන් නිම්තෙර කියන්නේ බස්නාහිර පළාත් සභාවේ ව්‍යාපෘතියක්. එතකොට ඒක වයඹ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකුගෙන් අහලා කොහොමත් තේරුමක් ගන්න බැහැ නේ? ඒ වාගේ අසත්‍ය ප්‍රකාශ කරලා සභාව නොමඟ යවමින් කථා කරන්න කාරණා නැතිව බොරු කියලා සභාව ඝෝෂාවක් කරලා ගියා. මේකට අනික් මන්ත්‍රීවරුන්ට දොස් කියලා වැඩක් නැහැ. ඒ මන්ත්‍රීවරයා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවාධායතුමා, හැකිතාක් දුරට විපක්ෂයට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න. ඔබතුමන්ලාට උත්තර දෙන්න පුළුවන්.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ආණ්ඩු පක්ෂය වෙනුවෙන් මම වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කළේ. මන්ත්‍රීවරුන්ගේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මුලින්මත් කිව්වා, වරප්‍රසාද ප්‍රශ්න, රීති ප්‍රශ්න

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

එහෙම ඉදිරිපත් නොකර කොහොමද? මන්ත්‍රීවරයෙක් ඇඟිල්ල දික් කළාම. ඒ මන්ත්‍රීවරයා දැනගන්න නෑ අනික් මන්ත්‍රීවරයෙකුගේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාගෙන් මම ඉල්ලීම් කළා, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයාගේ නම සඳහන් කරන්න කියලා. නමුත්

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මම වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම මේ විවාදය මේ විධියට යන්න විධියක් නැහැ.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

යම් මන්ත්‍රීවරයෙක් වැරැදි ප්‍රකාශයක් කළා නම්, ඒ සඳහා අවශ්‍ය ප්‍රමාණයට අයිතිය තිබෙනවා එතුමන්ලාට තමන්ගේ අවස්ථාවේදී ඒකට පිළිතුරු දෙන්න. එහෙම නැතිව කථාවට බාධා කිරීම ප්‍රජාතන්ත්‍ර විරෝධියි. මෙහි ශීලාචාර භාවයක් තිබෙන්න නෑ. නෑ තරම් අවශ්‍යතාවයක් තිබෙද්දී -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සිරිකොතේ නැහැ නේ ක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේක මේ -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ශීලාචාර වෙන්න නෑ කථා කරන මිනිහා.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

ඒ සඳහා ඔබතුමන්ලාට අවශ්‍ය තරමට වේලාව තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මුදල් ප්‍රකාශය සම්බන්ධ විවාදයක් තිබෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, ශිරාල් ලක්තිලක ගරු මන්ත්‍රීතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා

**ගරු ගාමිණී තිලකසිරි**
Hon.Gamini Thilakasiri

ගරු සභාපතිතුමා. ඊළඟ කථාව නම් කරන්න.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මන්ත්‍රීවරයෙක් දුරකථනයෙන් කථා කළා කිව්වා. මන්ත්‍රීවරයාගේ නම කිව්වා නම් එයාගේ කථාවේදී එයාට උත්තර දෙන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

නම සඳහන් නොකර කථා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ගරු ඇමැතිතුමා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අපට අයිතියක් තිබෙනවා අහන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි. දැනටත් මේ තැනින් තැන නැඟිට නැඟිට කථා කරනවා. මෙතැන විනයක් තියා ගන්න බැරිද මේ කට්ටියට? මේ අය හිතනවා මේ අය කියන මතය තමයි හරියි කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විකුම් ගුණසේකර ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 08 ක කාලයක් තිබෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නීතිය හා රීතිය නොවෙයි. හයිය පාවිච්චි කරන්නයි හදන්නේ.

**ගරු ගාමිණී තිලකසිරි**
Hon.Gamini Thilakasiri

ඊළඟ කථාව නම් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විකුම් ගුණසේකර ගරු මන්ත්‍රීතුමාට, විනාඩි 08 ක කාලයක් තිබෙනවා.

[ පූ.භා. 10.49 ]

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

ගරු සභාපතිතුමනි. මේ අයවැයට අදහස් දැක්වීමට අපට අවස්ථාව ලබා දීම පිළිබඳව බොහොම ස්තුතියි. ඇත්ත වශයෙන්ම අපේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා මේ අයවැයේ කිසිම දෙයක් නැහැයි වාගේ කතා කළේ. එතුමාගේ ප්‍රකාශය පිළිබඳව අපි බොහොම කනගාටු වෙනවා. ඇත්ත වශයෙන්ම එතුමාට මෙතැනින් ඉවත් වෙලා යන්න අවශ්‍ය නැහැ. මේකට මුහුණ දෙන්න තිබුණා. එතුමා කරපු ප්‍රකාශය පිළිබඳව ඇත්ත වශයෙන්ම මන්ත්‍රීවරු සෑම කෙනෙකුගේම වරප්‍රසාදයක් වෙනුවෙන් තමයි ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයා කථා කළේ. එතුමාගේ වැඩ පිළිවෙළ පිළිබඳව අපි බොහොම කනාගාටු වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය ප්‍රශ්නවලට යන්න එපා. අදාළ මාතෘකාවට කථා කරන්න.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

ඒ වාගේම අයවැය පිළිබඳව කථා කළාම සුපසන් නිම්තෙර ගැන ඉස්ඉස්සෙල්ලාම මට කියන්න නෑ, පොදු සාකච්ඡාවේදී. මොකද, අපි මේවා බොහොම භක්තිමත්ව කරන වැඩ සටහන්. ඒවායෙන් අපි ඉතා විශිෂ්ට ප්‍රතිඵල ලබාගෙන තිබෙනවා, අධ්‍යාපන ක්ෂේත්‍රයේ. වැරැද්දක් තිබෙනවා නම් ඒ කටයුතු විවේචනය කළාට කමක් නැහැ. අපි කොයිම වේලාවකවත් දැක්කේ නැහැ, ඒකේ වැරැද්දක්. අපි බොහොම දේවල් අද ඒ මාර්ගයෙන් අධ්‍යාපනයේ දියුණුවට කටයුතු කරලා තිබෙනවා. විශේෂයෙන් වේලාව මදි නිසා මම සභාගත කරනවා[1] අපේ පානදුර කොට්ඨාශයේ අපි ලබලා තිබෙන ප්‍රගතිය පිළිබඳව. ඒ පාසල්වල තිබෙන අධ්‍යාපනයේ ප්‍රගතිය, අ.පො.ස සාමාන්‍ය පෙළ ප්‍රතිඵල ඒ වාගේ දේවල් ඔක්කෝම සම්පූර්ණයෙන් සභාගත කරන්න මම කටයුතු කරනවා. ඒ වාගේම පොදු සාකච්ඡාවේදී මොකද, අපට අමාත්‍යාංශවල කථා කරන්න සමහරවිට අවස්ථාව ලැබෙන්නේ නැහැ. කෘෂිකර්ම අමාත්‍යාංශය හැටියට පොදු සාකච්ඡාවට මම සම්බන්ධ වෙන්නේ. කෘෂිකර්ම අමාත්‍යාංශයේ අපි පසුගිය කාලයේ ඉතා විශාල වැඩ කොටසක් කළා. කර්මාන්ත පිළිබඳව. ඒ වාගේම කර්මාන්ත ගොඩනඟා ගැනීම. පොදු සාකච්ඡාවේදී මට විෂයය තිබෙන්නේ, කර්මාන්ත දෙපාර්තමේන්තුව සහ කර්මාන්ත අධිකාරිය පිළිබඳව කථා කරන්න තමයි මට අවස්ථාව ලැබිලා තිබෙන්නේ. අපි සාම්ප්‍රදායික කර්මාන්ත හැටියට අපේ ප්‍රදේශයේ විශේෂයෙන්ම තිබෙන්නේ, කොහු කර්මාන්තය. කොහු කර්මාන්තය දියුණු කරන්න අපි අමාත්‍යාංශය හැටියට කටයුතු කරලා තිබෙනවා. කළුතර දිස්ත්‍රික්කයේ පොතු පිටිය, ඒ වාගේම පොහොද්දරමුල්ල, ඒ වාගේම වස්කඩුව, බේරුවල වාගේ ප්‍රදේශ ගත්තාම සාම්ප්‍රදායික කර්මාන්තයක් තමයි කොහු කර්මාන්තය. ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කරලා ලබන අවුරුද්දටත්

[1] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

සම්පූර්ණ මුදල් වෙන් කරලා මේ අවුරුද්දේ අපි ලොකු වැඩ සටහන් කිහිපයක් කොහු කර්මාන්තය පිළිබඳව කරලා තිබෙනවා. මම හිතනවා, අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු, ලක්ෂමන් විජේමාන්න ගරු මන්ත්‍රීතුමාත් දන්නවා. එතුමාත් අපිත් එක්ක බොහොම සම්බන්ධ වුණා. අපේ මන්ත්‍රීවරුත් එක්ක එකතු වෙලා අපි ලොකු වැඩ සටහනක් කරලා තිබෙනවා. සාම්ප්‍රදායික කර්මාන්ත හැටියට කළුතර දිස්ත්‍රික්කයේ කරන්න තිබෙන දේවල් මේක.

ඒ වාගේම විශේෂයෙන්ම කියන්න ඕනෑ මාර්ග පද්ධතිය. පළාත් සභා මාර්ග හැටියට පානදුර කොට්ඨාශයේ තවම මීටර් 800 යි කරන්න තිබෙන්නේ. අනික් සැම පළාත් සභා මාර්ගයක්ම නිම කරලා තිබෙනවා. අපේ පළාත් මාර්ග ඇමැතිතුමා අපට ඒ වාගේ දේවල්වලදී ගොඩාක් උදව් කරලා තිබෙනවා. තවම මීටර් 800 යි තිබෙන්නේ. අනික් සියලුම මාර්ග පද්ධති ඉතාමත් හොඳට හදලා තිබෙනවා. ඒ වාගේම පළාත් සභාව හැටියට අපි ලොකු සේවයක් කරලා තිබෙනවා, පළාත් මාර්ග පද්ධතියට. ඉතින් මොනවත් කෙරෙන්නේ නැහැයි කියලා කියනවා. අද මිනිස්සුන්ට අමාරුයි කියනවා. ආර්ථිකයෙන් ඇති වැඩක් නැහැයි කියනවා. කිව්වාට අද බලන්න ඕනෑ හවස් වන විට බාර්වල ඉන්න සෙනඟ ප්‍රමාණය. එහෙම අමාරු නම්, ඒ මිනිස්සු බාර්වල ගිහිල්ලා බොන්නේ කොහොමද? ඔබතුමන්ලා ඔය කියන කථා තිබෙනවද බලන්න Take Away වල. අද වාහන ගහගෙන මිනිස්සු කොපමණ ඉන්නවාද? ආර්ථිකය අමාරු නම් එහෙම කරන්න පුළුවන්ද? බාර්වල බලන්න කෝ ඉන්න තරම. ඉතින් මම කියන්නේ ඒකයි. මේවා විවේචනය කරනකොට හැමදෙයම ඔබතුමන්ලා බලන්න. අද කොපමණ දියුණුවක් ලබලා තිබෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අනවශ්‍ය ගැටුම්වලට යන්න එපා. මූලාසනයට කථා කරන්න.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

මම කියන්නේ ඒකයි. ඇත්ත වශයෙන්ම ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉදිරිපත් කරපු අයවැය පිළිබඳව අපට බොහොම ලොකු ගෞරවයක් තිබෙනවා. ඒ වාගේම විශේෂයෙන්ම කියන්න ඕනෑ අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් තිබුණු කළුතර දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේදී පළාත් සභාවේ විෂයයක් පිළිබඳව කිසිම විවේචනයක් කළේ නැහැ. අපි ඇත්ත වශයෙන්ම ඒ ගෞරවය මහ ඇමැතිතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයට සහ දේශපාලන අධිකාරියටත් ඒ වාගේම මේ සඳහා කැපවන නිලධාරීන්ටත් අපි ඒ ගෞරවය දක්වන්න ඕනෑ. මොකද, ජනාධිපතිතුමා කළුතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ඒ ගැන ලොකු ඇගයීමක් කළා. අපි ඇත්ත වශයෙන්ම බොහොම සන්තෝෂ වෙනවා.

ඒ වාගේම මේ කුඩා පාලම් ව්‍යාපෘතිය පිළිබඳව විශේෂයෙන් කථා කරන්න ඕනෑ. බස්නාහිර පළාතේ ගරු මහ ඇමැතිතුමා යටතේ මේ කුඩා පාලම් ව්‍යාපෘතිය තිබෙන්නේ. මම පාලම් තුනක් - එක පාලමක් අවසන් කළා. අනික් අතලේ පාලම මේ දවස් ටිකේ ඉවර කරන්න කටයුතු කරලා තිබෙනවා. මඟුර ගහ ඉහළින් තිබෙන - පසුගිය දවස්වල මාධ්‍යවලත් නිතරම සඳහන් වුණා. මේවා මාධ්‍යයෙන් කියන්නත් ඉස්සෙල්ලා තමයි අපි මේ වැඩ සටහන හැදුවේ. ඒ හදලා, දැන් ඒ මඟුර ගහ ඉහළින් ඇති සංගිලි පාලම හෙට අනිද්දා අවසන් කරන්න කටයුතු කරලා තිබෙනවා. මේවාට පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය දක්වන සහයෝගය පිළිබඳවත් විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. මේවාගේ අපි වැඩ කරනවා. අපි සැහෙන මහන්සි වන කට්ටිය. ඒවා නොකර ඉන්නවා නම් මේවා විවේචනය කළාට කමක් නැහැ. බස්නාහිර පළාත් සභාව හැටියට අපි විශාල කාර්යභාරයක් කරලා තිබෙනවා. ඉදිරියටත් කරනවා. ලබන අවුරුද්දෙත් අයවැයෙන් කරන්න තිබෙන දේවල් බලන්න.

ඒ වාගේම අපේ කලාප වශයෙන් ගත්තාම අධ්‍යාපනය දියුණු වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම කොළඹ කලාපය තුළ පරිගණක ක්ෂේත්‍රයේ දරුවන්ගේ අධ්‍යාපනය 86 % ක් වන කොට, කළුතර කලාපයේ එය 84% ක් වෙලා තිබෙනවා. ඒ පිළිබඳව අපි බොහොම සන්තෝෂ වෙනවා. ඇත්ත වශයෙන්ම මොනවත් කෙරිලා නැහැයි කියන්නේ කොහොමද? ඒ වාගේ අධ්‍යාපනයේ දියුණුවට කොච්චර දේවල් සුපසන් නිම්තෙර යටතේ ඉතා විශිෂ්ට සේවයක් ගරු මහ ඇමැතිතුමා කරලා තිබෙනවාද? ඒ වාගේම ගොඩනැඟිලි සැදීමේදී. අපි විශාල වශයෙන් සැම පාසලකටම ගොඩනැඟිලි අලුතෙන් ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා. මිලියන 27 ක් ගිය අවුරුද්දේ වෙන් කරලා තිබෙනවා. අපේ පාසල් තුනකටම ලක්ෂ 90 ගණනේ. මිලියන 27 ක් වෙන් කරලා තිබෙනවා පාසල් තුනකට භාගෙට හදපු ගොඩනැඟිලි අවසන් කරන්න. ඉතින් වැඩ නොකර සිටියා කියන්න බැහැ කිසිම වේලාවක. සුපසන් නිම්තෙර යටතේ ඒ කරලා තිබෙන දේවල් ගැන බලපුවාම මේ නිලධාරීන් පිළිබඳවත් කියන්න ඕනෑ. ඔවුන් මේ පිළිබඳව හුඟාක් උනන්දුයි. මහ ඇමැතිතුමාගේ උපදේශක කාරක සභාවට මාව දාලා තිබෙනවා. උපදේශක කාරක සභා 21 ක් පැවැත් වුණා. 21 ට මම කරුණු 24 ක් දාලා තිබුණා. 24 ම සම්පූර්ණයෙන්ම අද සාර්ථක වෙලා තිබෙනවා. දැන් මේ පළාත් පාලන ආයතනවලදී ඇතිවන තත්ත්වයන්වලදී ඒවාට චක්‍රලේඛන පවා එතුමන් නිකුත් කරලා අද ක්‍රියාත්මක වෙනවා. ඉතින් ඒවා කෙරෙන්නේ නැහැයි කියන්නේ කොහොමද? ඇත්ත වශයෙන්ම අපි පළාත් පාලන අයතනවලදී වීථි රේඛා සහතික ලබා ගැනීමේදී, ඒ වාගේම ප්ලෑන් එකක් පාස් කර ගන්නකොට නිශ්චිත කාලසීමාවක් දීලා තිබෙනවා. ඒ දීලා ඒ අවශ්‍ය කටයුතු කරල තිබෙනවා. ඒ නිර්ණායක අනුව කටයුතු කරන්න කියලා පළාත් පාලන ආයතනවලට චක්‍රලේඛන නිකුත් කරලා තිබෙනවා. ඒ චක්‍රලේඛය මම සභාගත කරනවා.[2] මොකද ඒක ගැන කිය කියා ඉන්න වේලාවක් නැති නිසා. මේ කටයුතුවලදී පළාත් සභා හැටියට අපි බොහොම ලොකු දියුණුවක් ලබලා තිබෙනවා. අපි ඒ සැම දෙයකටම යන මන්ත්‍රීවරයෙක් හැටියට ඒකේ තිබෙන

[2] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

දියුණුව මම දකිනවා. අපේ අනික් කට්ටිය එන්නේ නැහැ නේ? උත්සවවලට එන්න කියලා හැමදාම ආරාධනා කරනවා. ගරු මන්ත්‍රීවරු ඇස් දෙකෙන් ඇවිල්ලා බලන්න. පාසල්වලට එන්න. ව්‍යූහ කමිටුවට එන්න. ආපුවාම දකිනවා එතැන තත්ත්වය. ඇත්ත වශයෙන්ම පසුගිය කාලයේ නම් අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා ව්‍යූහ කමිටුවට ආවා. ශුසුප්‍ර ගරු මන්ත්‍රීතුමා නිතරම එනවා. අපේ විජේමාන්න මන්ත්‍රීතුමාටත් කියන්නේ එන්න ව්‍යූහ කමිටුවට. එතැන තිබෙනවා. අපි සැම කෙනෙක්ම විපක්‍ෂද පක්‍ෂද කියලා එතැනදී අපි එකතු වෙලා සහෝදරාත්මකව ඒ කටයුතු කරනවා. ඒවාට සහභාගි වුණා නම් ඔය සුපසන් නිම්තෙර පිළිබඳව, ඒ සිය ම දේවල් ගැන අපට දැනගන්න පුළුවන්. සිය ම දේවල් ගැන අපට දැනගන්න පුළුවන්. එවැනි අවස්ථාව තිබෙනවා. ඒක නිසා මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මම නවතිනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ශිරාල් ලක්තිලක ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 06 ක කාලයක් තිබෙනවා.

[ පූ.භා. 10.55 ]

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

ගරු සභාපතිතුමනි, ප්‍රතිපත්තිමය සාකච්ඡාවක් කිරීම සඳහා මිනිත්තු 5ක් මිනිත්තු 06 ක් කියන්නේ, ඉතාමත් වැදගත් නැති කාලයක්. ඒ නිසා අපට වෙලා තිබෙන්නේ, සටන් පාඨ ටිකක්

[ ගරු ශිරාල් ලක්තිලක ]

කියන්න. දැන් මේ විකුම් ගුණසේකර ගරු මන්ත්‍රීතුමා කිව්වා, වැඩ ගොඩක් කරනවා කියලා. එතකොට මට මතක් වෙනවා, ජපන් ජන වහරේ කථාවක්. ඒ ජන වහරේ කථාව කියනවා, මේ දැක්මක් නැති වැඩක් ගැන. දැක්මක් නැති වැඩ බියකරු සිහිනයක් වාගේ. වැඩ පිළිපිළිවෙළක් නැති දැක්මක් දහවල් සිහිනයක් වාගේ කියලා. Mission without action is a nightmare and a action without mission is a daydream කියලා. දැන් මේ පළාත් සභාවේ අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය කියවනකොට අපට තේරෙන්නේ, මෙන්න මේ පළාත් සභාවේ ප්‍රතිපත්තිත් මේ බියකරු සිහිනය සහ දහවල් සිහිනය අතර දෝලනය වෙනවා කියලා. ගරු සභාපතිතුමනි, දැන් මම ඉස්සෙල්ලාම කියන්න කැමැතියි. මේ 25 වැනි අයවැය අද ඉඳලා ක්‍රියාත්මක වෙන්නේ, පළාත් සභාවක් හැටියට නොවෙයි. පළාත් සභා අධිකාරියක් හැටියට. අපි පළාත් සභාව කියන වචනය මේ අයවැයත් සමඟම ඉවත් කළ යුතුයි. මේක බස්නාහිර පළාත් සංවර්ධන අධිකාරිය කියලා නැවත නම් කරන්නය කියලා මම යෝජනා කරනවා. මොකද මේක අයවැයක් නොවෙයි. අයවැයක් නම් අත්‍යවශ්‍යයෙන්ම මූල්‍ය මූලාශ්‍රයන් සපයා ගැනීම පිළිබඳව සාකච්ඡාවක් තිබිය යුතුයි. ඒක අපේ ස්වාධිපත්‍යයේ පදනමක්. දැන් මේ පාර්ලිමේන්තුවේ ස්වාධිපත්‍යය ගැන මේ දවස්වල හුඟක් කථා කරනවා. පාර්ලිමේන්තුවේ ස්වාධිපත්‍යය උල්ලංඝනය කරලා තමයි පළාත් සභාවට දීලා තිබෙන්නේ. දැන් හුඟ දෙනෙකුට ඒක අමතක වෙලා. ඒ නිසා ලංකාවේ 13 වැනි සංශෝධනයෙන් පස්සේ පාර්ලිමේන්තුව උත්තරීතර නැහැ. ඒක යථාර්ථයක්. ඒ වාගේ පදනමක ඉඳලා කථා කරනකොට මම ගියවර අයවැය ප්‍රතිපත්ති සාකච්ඡාවේ කථා කරමින් යෝජනා කළා, නිකන් හුදු වාර්තාවක් දෙන්නේ නැතිව අවම වශයෙන් අර මහින්ද චින්තන ඉදිරි දැක්මේ තිබෙන නිර්ණායක සහ දර්ශක ටිකක් හරි දෙන්නය කියලා. ගරු සභාපතිතුමනි, මෙවර ඒක කරලා. හැබැයි කරලා තිබෙන්නේ, අර අන්දරේ මඟුල් ගෙදර ගියා වාගේ. අන්න ඒක තමයි මට මෙතැනදී මතක් කරන්න වෙන්නේ, මගේ ඉතා කෙටි කාලය තුළයි. දැන් ඒක හොඳයි. දර්ශක ටිකක්, නිර්ණායක ටිකක් දාලා. හැබැයි, ඒවායේ දත්ත දිහා බැලුවාම අපට හිනා යනවා. මේ නිලධාරී මහත්ම මහත්මීන් පළාත් සභාවේ ඉන්නකොට පොඩ්ඩක් හිතන් ඉන්නවා, මේ සභාවේ කියන තොරතුරු දන්න මිනිස්සුත් ඉන්නවා කියලා. අවාසනාවකට මේ සභාවේ මෝඩයෝ ඉන්නවා කියලා හිතලා තමයි මේ වාර්තාව සකස් කරලා තිබෙන්නේ.

දැන් අපි එක උදාහරණයක් බලමු. 2016 වන විට ඇමරිකානු ඩොලර් 3750 සිට 5770 ක් දක්වා ඒක පුද්ගල ආදායම ඉහළ දැමීම. ගරු සභාපතිතුමනි, පළමුවැනි එක ඒක පුද්ගල ආදායම 3750 යි කියන එකත් වැරැදියි. නමුත් එය දෙගුණයකින් වර්ධනය කිරීමට, 8% ක වර්ධන වේගයක් අඩුම වශයෙන් අවුරුදු 10 ක් පවත්වාගෙන යා යුතුයි. අද චීනයටත් ඉන්දියාවටත් තිබෙන ලොකු අභියෝගයක් ඒක. ආර්ථික විශේෂඥයින් කියන විධියට. දැන් ඊළඟ ප්‍රශ්නය 8% ක වර්ධන වේගයක් පවත්වාගෙන යන්න නම් අවම වශයෙන් 27% ක් රාජ්‍ය හා පෞද්ගලික ආයෝජනයක් පවත්වා ගත යුතුයි. 27% න් අවම වශයෙන් රාජ්‍ය ආයෝජනය 6% ත්, 7% ත් අතර ප්‍රමාණයක් පවත්වාගෙන යන කොට 21% ක හෝ 23% ක පෞද්ගලික අයෝජනයක් පවත්වාගෙන යා යුතුයි. දැන් මොකක්ද අද පළාත් සභාවේ තත්ත්වය? ගරු මහ ඇමැතිතුමා ප්‍රාග්ධන වියදම 10% ට ඉක්මවා ගිහින් තිබීම ගැන ඉතාම ආඩම්බරයෙන් කථා කරනවා. ඒක හොඳයි. නමුත් යථාර්ථය මොකක්ද? පළාත් සභාවේ ගිය 2010 වර්ෂයේ 45% ක දළ ජාතික නිෂ්පාදනය දායකත්වය ලබා දෙනවයි කියලා කියන පදනමින් යනවා නම්, මෙවර ප්‍රාග්ධන වියදම ඒ කියන්නේ, 6% ක අවම ආයෝජනයක් පළාත් සභාවේ පවත්වාගෙන යන මට්ටමින් තර්ක කළොත්, අපි පළාත් සභාව හැටියට ප්‍රාග්ධන ආයෝජනයට 0.035% ක් තමයි මේ වෙන් කරලා තිබෙන්නේ. ප්‍රාග්ධනය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

ඒක තමයි. කථා කරන්න ගොඩක් දේවල් තිබෙනවා. මේ තිබෙන සියලුම දත්ත වැරැදියි. සේවා ව්‍යුක්තිය පිළිබඳ දත්ත වැරැදියි. දරිද්‍රතාවය පිළිබඳ දත්ත වැරැදියි. මහ බැංකු වාර්තාවට අනුවත් වැරැදියි. අපි ගරු මහ ඇමැතිතුමාට යෝජනා කරනවා. ඒක තමයි මම පෞද්ගලික මන්ත්‍රීවරයෙකුගේ යෝජනාවක් හැටියටත් කළේ, කරුණාකරලා සැලසුම් කමිටුවක් පිහිටුවන්න කියලා. කරුණකරලා පළාත් සභාව 45% ක දළ ජාතික නිෂ්පාදනයට දායක වෙන්න උත්සාහ කරනවා නම්, මීට වැඩිය විද්‍යාත්මක ප්‍රවිෂ්ටයක් ගන්න. වික්‍රම් ගුණසේකර ගරු මන්ත්‍රීතුමා කිව්වාට පාරවල් හැදුවාට දරිද්‍රතාවය අඩු වෙන්නේ නැහැ. සේවා නියුක්තිය අඩු වෙන්නේ නැහැ. කරුණාකරලා මේ පළාත් සභාව විනාශ වන පදනමක් තුළ - අඩුම වශයෙන් කවුරු හරි කියනවා නම් අර සුනිල් -

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ඒක අඩු කරන්නේ කොහොමද කියලා කියන්න.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

මට අවස්ථාව දෙන්න. මම කියන්නම්.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මගෙන් කාලය දෙනවා.

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

අන්න ෆයිරෝස් ගරු මන්ත්‍රීතුමා අවස්ථාව දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කවුද දෙන්නේ. විනාඩි දෙකක්.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

දැන් කීයක් තියෙනවාද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දොළහක් තියෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කවුද දෙන්නේ. මට පැහැදිලි නැහැ. ඔබතුමා කිව්වාට එහෙම වේලාව දෙන්න බැහැ. ඔබතුමා කිව්වාට එහෙම වෙන් කරන්න බැහැ. කවුද දෙන්නේ?

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

ෆයිරෝස් ගරු මන්ත්‍රීතුමා දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ විනාඩි දෙක හරි. විපක්ෂයේ මන්ත්‍රීතුමෙක් නේ? අනික් 10 දෙන්නේ කවුද?

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

මෙතුමාත් දෙනවා කිව්වා.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

හරි. මමත් දෙනවා.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

හොඳයි, අපි ගරු මන්ත්‍රීතුමාගේ තැනින්ම පටන් ගමු. ගරු මන්ත්‍රීතුමා පළමුවැනිම ප්‍රශ්නය විරැකියාව. විරැකියාව කියලා කිව්වාම ගරු මහ ඇමැතිතුමාගේ වාර්තාවේ කියන්නේ රැකී රක්ෂා හිඟය කියලා. 60% සිට 6% දක්වා කියලා කියනවා. ඒක ආර්ථික සංකල්පයක් නොවෙයි. රැකිරක්ෂා හිඟය කියලා ආර්ථික සංකල්පයක් නැහැ. ඒ නිසා අපි ආර්ථික විද්‍යාවේ සංකල්ප තුනක් ගැන කථා කරනවා. එකක් තමයි සේවා වියුක්තිය. අනිත් එක ඌන සේවා වියුක්තිය. හැඟවුණු සේවා වියුක්තිය කියලා තුනක් තිබෙනවා. දැන් ලංකාවේ තිබෙන බරපතළම ප්‍රශ්නය තමයි අවුරුදු 19 ත්, 25 ත් අතර තරුණයින්ගේත්, අවුරුදු 26ත්, 35 ත් අතර තරුණයින්ගේත් රැකියා වියුක්තිය. අවුරුදු 19 යි 25 යි අතර රැකියා වියුක්තිය බස්නාහිර පළාතේ වෙන කොහෙවත් නොවෙයි. 60.2% ක්. වයස 26 යි 35 යි අතර සේවා වියුක්තිය 17.9% ක්. දැන් මේ ගරු මන්ත්‍රීතුමා ඇහුවා කොහොමද මේක අඩු කරන්නේ කියලා. උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාගේ වගකීමක් තිබෙනවා, කෘෂි කර්මාන්තය කියලා. කෘෂිකර්මාන්තය පසුගිය අවුරුද්දේ ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා මම කනගාටු වෙනවා. ඔබතුමාගේ කාලය අවසන් වෙනවා.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

හොඳයි. එහෙමනම් අවසාන වශයෙන් කියන්නේ, මේ කෘෂිකර්මාන්තය ගැන කියනවා. කෘෂිකර්මාන්තය ඉඳලා ත්‍රීවිල් -

**ගරු සභාපතිතුමා**

Mr. Chairman

විනාඩි දෙක ඉවරයි. දැන් විනාඩි තුනක් විතර ගිහිල්ලා තිබෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අර ගරු මන්ත්‍රීතුමා දුන්නා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට වෙලාව දෙන්න බැහැ. එතුමා කථික ලැයිස්තුවේත් නැහැ.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

වෙලාව දෙන්න. මම කියන්නම්. ඒක තමයි මම ආවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙලාවක් නැහැ.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ඔබතුමාට උත්තර දෙන්න බැහැ.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

ඉතින් ඒක තමයි මම ආවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට වෙලාවක් දීලා නැහැ. එතුමා බොරු කියන්නේ. එතුමා අනවශ්‍ය ප්‍රකාශ කරන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමා බොරු කියනවා නම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අනවශ්‍ය ප්‍රකාශ කරන්න එපා. ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමා සභාව නොමඟ ඇරියා. එහෙමනම් එතුමාට සභාවෙන් එළියට යන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඉතාමත් කාරුණිකව ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. මේ සභාවේ අනවශ්‍ය ප්‍රකාශ කරන්න එපා ගරු මන්ත්‍රීතුමන්ලා. ඔබතුමා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමෙක්. ඔබතුමාට කාලය වෙන් කරලත් නැහැ. ඔබතුමා කොහොමද විනාඩි 10 ක් දෙන්නේ. ඔබතුමා මේ සභාවේ අනවශ්‍ය ගැටුම් ඇති කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සභාවයි, ඔබතුමායි දෙන්නවම නොමඟ යැව්වා. එතුමා සභාපතිතුමාත් එක්ක විහිළු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 08 ක කාලයක් තිබෙනවා.

[ පූ.භා. 11.06 ]

**ගරු සිසිර ජයකොඩි**
Hon. Sisira Jayakody

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් අපේ රට තුළ ඇති කරලා තිබෙන අවුලක්. ඒ වාගේම පළාත් සභා ක්‍රමය පිළිබඳව ඇති වෙලා තිබෙන විවිධ විසංවාද හා විවිධ සංවාද පිළිබඳවත් පුළුල් සාකච්ඡාවකට අපේ සමාජය ලක් කරනවා. දැන් විනාඩි කීපයකට පෙර මේ සභාව දෙස පිටස්තර තැනැත්තෙකු බලා සිටියා නම්, මේ පළාත් සභාව පිළිබඳව බරපතළ කළකිරීමකට පත් වන බව කිසිම ප්‍රශ්නයක් ඇත්තේ නැහැ. ස්වකීය අදහස් පළ කිරීමේ නිදහස පක්ෂ විපක්ෂ ඕනෑම කෙනෙකුට තිබිය යුතුයි. ඒ පරිසරය, ශාස්ත්‍රීය සංවාදය අද මේ පළාත් සභාවේ නැහැ. නිදහස් අදහස් ඉදිරිපත් කිරීමේ අවස්ථාව මේ පළාත් සභාව තුළ පැවතුණොත් පමණයි මේ පළාත් සභා ව්‍යුහය පිළිබඳව සහ ඊට පක්ෂව කථා කරන අයටවත් ඒ කථා කරන අයිතිය, සුරක්ෂිත භාවය ඇති වෙන්නේ. එවැනි අයම ඊට හානි කිරීම ඉතාම බරපතළ කනගාටුදායක තත්ත්වයක් වෙනවා. අධිරාජ්‍යවාදීන් තමයි මේ පළාත් සභා ව්‍යුහයට අදාළ පළාත් නීර්ණය කළේ. මේ පළාත් ක්‍රමය බෙදුවේ සුදු අධිරාජ්‍යවාදීන්. ඒ ක්‍රමය මත ඉඳලා තමයි 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් වුණේ. ඒ නිසා පළාත් සභා ව්‍යුහය පිළිබඳව පුළුල් සංවාදයක් ලක් වෙලා තිබෙන අවස්ථාවේ සුදු අධිරාජ්‍යවාදීන්ගේ මෙහෙයවීම මත නීර්ණය කරපු මේ පළාත් ක්‍රමය තවදුරටත් අපේ රටට ගැලපෙනවාද කියලා නැවත විමසීමේ අවශ්‍යතාවයක් අපට තිබෙනවා. ඊට වඩා සරල දිස්ත්‍රික්ක ඒකක දක්වා බලය විමධ්‍යගත කිරීම තුළින් අපේ රටේ ඒකීය භාවය පිළිබඳව අනාගතයේ මතු විය හැකි තර්ජනයන් වළක්වා ගැනීම සඳහා වූ ව්‍යුහමය වූ සංවාදයකට අපේ සමාජය පරිවර්තනය විය යුතු යුගයක තමයි අපි පසු වෙන්නේ. බස්නාහිර පළාත සුවිශේෂ

ජයග්‍රහණ ලබපු පළාතක්. ශිරාල් ලක්තිලක ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන පරිදි මා දන්නේ නැහැ. අපට පුළුවන් බස්නාහිර පළාත විධියට - අපේ රටේ 2009 මහ බැංකු වාර්තාව කියනවා, ජාතික ආදායමෙන් 41% ක්ම 4.1 ක්ම බස්නාහිර පළාත දායකත්වයක් දක්වනවා කියලා. ඒ නිසා බස්නාහිර පළාතේ දායකත්වය 41% යි. ඒ නිසා බස්නාහිර පළාත තුළ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉදිරිපත් කරපු සංවර්ධන ඉලක්කයන්, ඒක පුද්ගල ආදායම නැංවීමේ හැකියාව බස්නාහිර පළාතට තිබෙනවා. සමස්තයක් වශයෙන් අපේ රටට ඒ ඉලක්ක ජය ගැනීම පිළිබඳ ගැටලු නැතත් ආර්ථිකයේ මූලික කේන්ද්‍රස්ථානය බස්නාහිර පළාත තුළ එක පැත්තකින් කේන්ද්‍රීය වෙලා තිබෙන නිසාත්, බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක වන ඒ සුවිශේෂ සංවර්ධන වැඩ පිළිවෙළ නිසාත් ඒ ඉලක්කයන් ජය ගැනීමේ හැකියාව තිබෙනවා කියන කාරණය අපි ඉතාම ඕනෑකමින් මතක් කරනවා.

ඒ වාගේම පළාත් සභාවක් විධියට අපි අධ්‍යාපනයටත්, සෞඛ්‍යයටත් සුවිශේෂ ප්‍රමුඛතාවයක් දක්වලා තිබෙනවා. ඒ මේ රට තුළ පැවතුණු නිදහස් අධ්‍යාපනයත්, නිදහස් සෞඛ්‍ය සේවයත්, සමාජ සුභ සාධනයත් පවත්වා ගැනීමේ අපේ රටේ ඉතිහාසය පුරාම පැවතගෙන ආපු ඒ උරුමය රැක ගන්න පළාත් සභාවත් වැඩි දායකත්වය කරලා තිබෙන බව පෙනෙනවා. විශේෂයෙන්ම බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ නායකත්වය යටතේ බස්නාහිර පළාතේ සියලුම පාසල් තුළ සමතුලිත සංවර්ධනයක් සඳහා මානව හා භෞතික සම්පත් ලබා දෙමින් ගෙන යන සුවිශේෂ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්න අදාළ ප්‍රතිපාදන දායකත්වය සිදු කරලා තිබෙන බව අපට පෙනෙනවා. ඒ නිසා සාක්ෂරතාවය වැඩි කරලා තිබෙනවා. පාසල්වලට නොයන සිසුන් ප්‍රමාණය අඩු කරලා තිබෙනවා. ඒ නිසා පළාත් සභාව විධියට අපේ රටේ දරුවන්ගේ සුභ සාධනය පැත්තෙන් නිදහස් අධ්‍යාපනයේ මූලික අයිතීන්, හරයන් ආරක්ෂා කරගන්න අපට හැකියාව ලැබිලා තිබෙනවා. නිදහස් සෞඛ්‍ය සේවයත් එසේමයි. අද රෝහල්වලට ගියාම ප්‍රසන්න වුණු පරිසරයක් නිර්මාණය වෙලා තිබෙනවා. රටේ ළදරු මරණ අනුපාතිකය අඩු වෙලා තිබෙනවා. දරු ප්‍රසූතියේදී මාතෘ මරණ ප්‍රමාණය අඩු කර ගන්න අපට හැකියාව ලැබිලා තිබෙනවා. අපේ රටේ ආයු කාලය සුවිශේෂී වශයෙන් 50% කින් වර්ධනය කර ගැනීමේ හැකියාව අපට ලැබිලා තිබෙනවා. බරපතළ සමාජ ව්‍යසනයන් තිබෙන, දුප්පත්කමින් පෙළෙන දකුණු ආසියාතික රටවල්වල, ඒක පුද්ගල ආදායම අපට වඩා ඉදිරියෙන් තිබෙන රටවල්වල වසංගත රෝග තත්ත්වයන් වන කොළරාව, මැලේරියාව වාගේ රෝග තත්ත්වයන්ගෙන් අපේ රට ඈත් වෙලා සෞඛ්‍ය සම්පන්න සහ අධ්‍යාපනික වශයෙන් වටිනාකමක් සහිත දරු පරපුරක් සහ මිනිසුන් සිටින රටක් බවට පරිවර්තනය කිරීම සඳහා වූ කැපවීම පළාත් සභාව විධියට පසුගිය කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කරලා තිබෙනවාය කියන කාරණය අපි ඉතා ඕනෑකමින් යුතුව මතක් කරනවා.

විශේෂයෙන්ම අප විසින් අවධානයට ලක් කළ යුතු අභියෝගතා රාශියක් තිබෙනවා. ඒ තමයි අපේ රට ගොදුරු වෙමින් පවතිනවා. විශේෂයෙන්ම අපේ පාසල් දරු දැරියන් මත් පෙති සහ විවිධ පැණි වර්ගවලට, සිරප් වර්ග වලට බරපතළ ලෙස ගොදුරු වෙමින් පවතිනවා, අපේ රටේ අධ්‍යාපනය හදාරන ශිෂ්‍යයින්ගේ සිට තරුණ පරපුර දක්වාම. මේ කෙරෙහි බස්නාහිර පළාත් සභාවේ මූලික අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවයක් පවතිනවා. ඒ වාගේම බෝ නොවන රෝගයන් පිළිබඳ තත්ත්වයන් බරපතළ ලෙස ඇති වෙලා තිබෙනවා. විශේෂයෙන් බස්නාහිර පළාත් සභාව තුළ දියවැඩියා රෝගය, රුධිරගත මේද ප්‍රමාණය, නිසි පෝෂණ තත්ත්වයන් නොමැතිකමේ ගැටලුවලට රටක් වශයෙන් අපට මුහුණ දෙන්න වෙලා තිබෙනවා. මෙවැනි තත්ත්වයන් සමනය සඳහා වූ දැක්මකින්, දර්ශනයකින් යුතුව ඉදිරි කාලපරිච්ඡේදය තුළ පළාත් සභාව මෙහෙයවීමට අපට පැවරිලා තිබෙනවා. ඒ නිසා මේ තත්ත්වයන්ට ප්‍රතිකර්ම සෙවීමේ මූලික වගකීම සභාවක් විධියට යෝජනා ඉස්මතු කරමින් එය ක්‍රියාත්මක කිරීමේ මූලික වගකීම තිබෙනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් කියන්න ඕනෑ. අද බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ඇතැම් සම්පත් ආරක්ෂා කර ගැනීම පිළිබඳ ගැටලුවක් තිබෙනවා. කැලණිය අධ්‍යාපන කලාපයේ විශේෂ අධ්‍යාපන ඒකකය තිබෙනවා. ගිය සතියේ කැලණිය අධ්‍යාපන කලාපයේ විශේෂ අධ්‍යාපන ඒකකය පළාතේ දේශපාලන බලධරයෙක් ඇවිල්ලා කැඩුවා. විශේෂ අධ්‍යාපන ඒකකයකට යවන්න ඕනෑ ඇතැම් ඇමතිවරු තමයි ඒ ඒකකය කඩලා ලක්ෂ 10 ක දේපළවලට අලාභහානි කරලා ඒ භූමිය, ඒ අවට තිබෙන චිත්ත අභ්‍යාස ආයතනය බලහත්කාරයෙන් අරන් දීලා තිබෙනවා. පොලිසිය, කලාප කාර්යාලයෙන් ඉදිරිපත් කරලා තිබෙන පැමිණිල්ලවත් විභාග කරන්න අද පැමිණෙන්නේ නැති බව ඉතාම කනගාටුවෙන් යුතුව ප්‍රකාශ කරනවා. බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට විශේෂයෙන් ප්‍රාදේශීය ආයතන, පළාත් පාලන ආයතන මෙහෙයවීමේ වගකීමක් පැවරෙනවා. අද කැලණිය ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන් එක එක්කෙනාට චෝදනා පත්‍ර ඉදිරිපත් කරමින් ඊයේ රාත්‍රියේත් ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක්ව අත්අඩංගුවට ගැනීමේ උත්සාහයක් තිබුණා. කුණු අරන් දාන්න මිනිස්සුත් එක්ක එකට එකතු වෙලා යන ඇතැම් මන්ත්‍රීවරුන්ට අතවර කිරීමේ චෝදනා යටතේ බරපතළ චෝදනා පත්‍ර එකතු කරලා තිබෙනවා. කැලණිය, බියගම, පැළියගොඩ පොලීසිවල පොලිස් ස්ථානාධිපතිවරයා බවට පත් වෙලා තිබෙන්නේ ඇතැම් දේශපාලන බලාධිකාරීන්. ඒ නිසා පළාත් පාලන ආයතනවල මේ අහිංසක පුංචි මන්ත්‍රීවරුන් රැක ගැනීමේ වගකීම බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා වශයෙන් ඔබතුමා භාර ගන්නය කියන ඉල්ලීම කරමින්, අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

[ පූ.භා. 11.14 ]

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

ගරු සභාපතිතුමනි, බොහොමත්ම ස්තුතියි. මෙම අයවැය විවාදය සම්බන්ධයෙන් පොදු සාකච්ඡාවට සහභාගිවීම සඳහා අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මම ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඇත්තෙන්ම මේ බස්නාහිර පළාත් සභාවේ 25 වැනි අයවැය ඉදිරිපත් කරන මේ අවස්ථාව වන විට විපක්ෂයේ පැත්තෙන් කවර කරුණු ඉදිරිපත් කළත්, ආර්ථික කරුණු සම්බන්ධයෙන් කවර කරුණු ඉදිරිපත් කළත් අප දකිනවා, ලාංකීය ආර්ථික ඉතිහාසය තුළ ඉතා දැවැන්ත ආර්ථික සංවර්ධනයක් අත්පත් කර ගත්තු යුගයකට අපි අවතීර්ණ වෙලා තිබෙනවා කියන කාරණය. නිදහසෙන් පසු ලාංකීය ඉතිහාසයේ ඉහළම ආර්ථික වෘද්ධිය පසුගිය වර්ෂය තුළ අපි අත්පත් කරගෙන තිබෙනවා. නිදහසින් පසු 8% ක් වූ ඉහළම ආර්ථික වර්ධනයක් අත්පත් කරගන්නට අපි සමත් වුණේ පසුගිය වර්ෂය තුළ. ආර්ථික වර්ධනය අතින් ලෝකයේ ඉහළ ආර්ථික වර්ධනයක් පෙන්නුම් කරපු රටවල් අට අතරට අටවැනි ස්ථානයට ශ්‍රී ලංකාව පැමිණිලා තිබෙනවා. රටක් හැටියට අපි ලබපු සුවිශේෂී ජයග්‍රහණයක් හැටියටයි ගරු සභාපතිතුමනි අපි මෙය දකින්නේ. ආර්ථික වෘද්ධියට කරන ලද මේ දායකත්වය තුළ ඉතා සුවිශේෂ ස්ථානයක් බස්නාහිර පළාතට හිමි වෙනවා. රටේ දළ දේශීය නිෂ්පාදිතයට බස්නාහිර පළාත තුළින් 41% ක දායකත්වයක් කරනවා කියලා කියන්නේ, දළ දේශීය නිෂ්පාදිතයෙන් අර්ධයකට ආසන්න දායකත්වයක් බස්නාහිර පළාත තුළින් සිදු කරනවයි කියන කාරණයයි. ඒ නිසා රටක් හැටියට ලබලා තිබෙන ඒ සුවිශේෂ වූ ජයග්‍රහණයට ඉතා සුවිශේෂ වූ දායකත්වයක් බස්නාහිර පළාත දායක කරලා තිබෙනවා. ඒ දායකත්වයෙහි ලා බස්නාහිර පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු ඒ අමාත්‍ය මණ්ඩලය විසින් දූරදර්ශීව කරන ලද කටයුතු, ඉදිරි දැක්මක් සහිතව බස්නාහිර පළාත් සභාවේ කටයුතු මෙහෙයවීම මේ සුවිශේෂ වූ දායකත්වයට බලපෑවයි කියන කාරණාවයි මම දකින්නේ.

[ ගරු සුගත් මතුගමගේ ]

ලාංකීය ඉතිහාසය තුළ ඉහළම ආර්ථික වර්ධනයක් ශ්‍රී ලංකාව අත්පත් කර ගනිද්දී ඒ දායකත්වයට සුවිශේෂ වූ දායකත්වයක් බස්නාහිර පළාතෙන් අත්පත් කර දෙන්නට පුළුවන්කම ලැබුණේ, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රමුඛ ඒ කැබිනට් මණ්ඩලයේ සහ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් කරන ලද කැපවීම්වල ප්‍රතිඵලයක් හැටියට තමයි අප දකින්නේ. ඒ නිසා විපක්ෂය කවර කරුණු කාරණා ඉදිරිපත් කළත්, ඒ සාවද්‍ය වූ මත ඉදිරිපත් කරනු ලැබුවත් බස්නාහිර පළාත සුවිශේෂ වූ ජයග්‍රහණ අත්පත් කර ගනිමින් ශ්‍රී ලංකා ආර්ථිකය තුළ විශිෂ්ට වූ ජයක් අත්පත් කර ගන්නට, රට මෙහෙයවන්නට පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒක පුද්ගල ආදායම පිළිබඳව අපේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරද්දී එතුමා කිව්වේ, මේ තොරතුරු සාවද්‍යයි කියන කාරණාවයි. දැන් ඇත්තෙන්ම ඒකපුද්ගල ආදායම සම්බන්ධයෙන් අපි ගත්තොත් මෑතක් වනතුරුම අපට පුළුවන්කම ලැබුණේ, ඒකපුද්ගල ආදායම ඩොලර් 1000 ඉක්මවා ගන්නට අපහසු වුණා. නමුත් අපට දැන් රටක් හැටියට ඒකපුද්ගල අදායම ඇමරිකන් ඩොලර් 2800 මට්ටමට ගෙනෙන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. බස්නාහිර පළාතේ ඒකපුද්ගල ආදායම තමයි මෙතැන්දී මේ එක්සත් ජනපද ඩොලර් 3750 මට්ටමට ගෙනැල්ලා තිබෙනවයි කියලා ප්‍රකාශ වුණේ.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

ඒකත් වැරැදියි.

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

එහෙමනම් ඔබතුමා ඒ සම්බන්ධයෙන් කරුණුකරලා අදාළ නිවැරැදි සංඛ්‍යා දත්ත ඉදිරිපත් කරන්න. සභාගත කරන්න. ඔබතුමන්ලා කිසි දෙයක් විශ්වාස කරන්නේ නැහැ නේ? ඔබතුමන්ලා කිසි දෙයක් පිළිගන්නේ නැහැ. ඒ නිසා ඔබතුමන්ලාගේ තර්ක සම්බන්ධයෙන් අපට ඒවා අදාළ නැහැ. ඔබතුමන්ලා කිසි දෙයක් පිළිගන්න සූදානම් අය නොවෙයි. ඒ නිසා 2016 වන විට බස්නාහිර පළාතේ ඒකපුද්ගල ආදායම එක්සත් ජනපද ඩොලර් 5770 මට්ටමට ගෙනෙන්න පුළුවන්කම ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා. අද, මේ වන විට ළඟා වෙලා තිබෙන මට්ටම හා සැසඳීමේදී එය සිහිනයක් නොවෙයි. එය යථාර්ථයක් කියලා අපි විශ්වාස කරනවා. ඒ වාගේම මෑත ඉතිහාසය තුළ මේ විරැකියා අනුපාතය පිළිබඳව (බාධා කිරීම්) මෙතුමා මේ විරැකියා අනුපාතය කියලා සංකල්පයක් අල්ලගෙන කථා කළාට ඇත්තෙන්ම මේ රටේ නිදහසින් පසු සේවා වියුක්ති අනුපාතය, නිදහසින් පසු ශ්‍රී ලංකාවේ අඩුම සේවා වියුක්තියක් වාර්තා කරන්නේ පසුගිය වර්ෂය තුළ. ගරු සභාපතිතුමනි, ජාත්‍යන්තරව පිළිගත්තු සම්මතයන්ට අනුව රටක සේවා වියුක්ති අනුපාතය 5% ක් පමණ මට්ටමක් දක්වා අඩු වෙනවා කියලා කියන්නේ ඒක ස්වාභාවික සේවා වියුක්තියක්. පූර්ණ සේවා නියුක්ති තත්ත්වයක් හැටියට ලෝකයේ පිළිගත් ආර්ථික විද්‍යාත්මක මූලධර්මවලට අනුව සේවා වියුක්ති අනුපාතය 5% ක් දක්වා අඩු කර ගන්නවා කියන්නේ ඒ පූර්ණ සේවා නියුක්ති තත්ත්වයට පැමිණුනා කියන එකයි. 2012 වර්ෂය තුළදී ශ්‍රී ලංකාව 4% මට්ටම දක්වා සේවා ව්‍යුක්ති අනුපාතය අඩු කර ගන්න සමත් වෙලා තිබෙනවා. 4% යි.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

එහෙම වෙලා නැහැ.

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

කොහොමද නැහැයි කියලා කියන්නේ.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

අවුරුදු 19 යි, 35 යි අතර ප්‍රමාණයක් -

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

අපි ඉදිරිපත් කරන්නේ සමස්ත සේවා වියුක්ති අනුපාතය. ඔබතුමන්ලා ඔය වයස් කාණ්ඩ අනුව තිබෙන සේවා වියුක්ති අනුපාතයන් පිළිබඳව වැරැදි කතන්දරයක් ඉදිරිපත් කරන්නේ. සමස්ත සේවා වියුක්ති අනුපාතය.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

2011 මහ බැංකු වාර්තාව කියවන්න.

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

කරුණාකරලා මහ බැංකු වාර්තාවේ සමස්ත සේවා වියුක්ති අනුපාතය කීයද කියලා මට කියන්න. සමස්ත සේවා වියුක්ති අනුපාතය. 4.3% යි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අනවශ්‍ය වාදවලට පැටලෙන්න එපා.

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

සියයට 4.3 යි සමස්ත සේවා වියුක්ත අනුපාතය. කරුණාකරලා දන්නේ නැත්නම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

ගරු සභාපතිතුමනි, මම ඉතා වගකීමෙන් කියනවා. 2012 වර්ෂය තුළ සමස්ත සේවා වියුක්ති අනුපාතය 4.3% යි. ඒ කියන්නේ අපි පූර්ණ සේවා නියුක්ති මට්ටමටත් එහා ගිය තත්ත්වයකයි සංඛ්‍යාත්මකව ගත්තොත් අද අපේ සේවා වියුක්තිය පවතින්නේ. ඒ තත්ත්වයන් තුළ බස්නාහිර පළාත ඉතාමත් සුවිශේෂ ජයග්‍රහණයක් අත්පත් කරගෙන තිබෙනවා, ගරු සභාපතිතුමනි, දරිද්‍රතාවය සම්බන්ධයෙන් ගත්තත් එහෙමයි. මෑත ඉතිහාසය තුළ දරිද්‍රතා අනුපාතය අපට විශාල වශයෙන් අඩු කර ගන්නට පුළුවන්කම ලැබිලා තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේ පොත බැලුවාම සංවර්ධනය උපරිමයි.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

ගිනි සංගුණකය කීයද?

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

ගිනී සංගුණකය. ආදායම් බෙදී යාමේ විෂමතාව. ගිනී සංගුණකය දශම කීපයක පොඩි වෙනසක් තිබෙනවා. හැබැයි, ගිනී සංගුණයක සම්බන්ධයෙන් අරගෙන බැලුවාම අපි පෙර වර්ෂවලට වඩා ඉස්සරහාට එන්න සමත් වෙලා තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, ආර්ථික වෘද්ධිය, ඒකපුද්ගල ආදායම, සේවා වියුක්ති අනුපාතය, ඒ වාගේම දරිද්‍රතාවය මේ සියල්ල සම්බන්ධයෙන් සතුටුදායක මට්ටමකට ගෙනෙන්නට ශ්‍රී ලංකා රජයට පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒ සඳහා සුවිශේෂ වූ දායකත්වයක් බස්නාහිර පළාත අත්පත් කරගෙන තිබෙනවයි කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොමත්ම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මේ අවස්ථාවේදී අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය මූලාසනාරූඪ වෙනවා.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේ රත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන් අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය මූලාසනාරූඪ විය.***

*Accordingly, Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Asoka Lankathilaka M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

එම්.එම්.එම්. ෆයිරූස් ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

[ පූ.භා. 11.21 ]

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බොහොම ස්තුතියි. 2013 අයවැයේ මුදල් ප්‍රකාශය, 25 වැනි අයවැයට සම්බන්ධවීමට අවස්ථාව ලබාදීම පිළිබඳව පළමුවෙන්ම මම ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම මම හැමදාම ව්‍යාපාරික අංශය ගැන තමයි මේ සභාවේ කථා කරලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මගේ 09 වැනි අයවැය කථාවට කරන්නේ. අද බස්නාහිර පළාත් සභාවේ ජනතාව විඳින දුක හැම එකක්ම අතිවිශාලයි. තීරු බදු. මහ ආණ්ඩුවෙන් කරලා තිබෙන මේ ලොකු අපරාධය බස්නාහිර පළාත් සභාවේ ජීවත් වන ජනතාව, බස්නාහිර පළාත් සභාවේ පඩි ගන්න සේවකයින්ට විඳින්න සිදුවෙලා තියෙනවා. අද අල කිලෝ එකක් ගත්තාම රුපියල් 50/- ක් තීරු බදු. බොම්බයි ළූණු කිලෝ එකක් ගත්තාම රුපියල් 50/- ක් තීරු බදු. සුදු ළූණු කිලෝ එකක් ගත්තාම ඒකට රුපියල් 40/- ක් තීරු බදු. සීනි කිලෝ එකක් ගත්තාම ඒකට රුපියල් 20/- ක් තීරු බදු. අඩුම තරමින් සැමන් ටිං එකක් ගත්තාම ඒකටත් තීරු බදු රුපියල් 80/- යි. මේක හරි අපරාධයක්. අද බස්නාහිර පළාත් සභාවේ ජීවත්වන ජනතාව විතරක් නොවෙයි. ඒ සේවය කරන සේවකයන්ටවත් හම්බ වන

පඩියෙන් 90% ක් මේ ආණ්ඩුව පොකට් ගහනවා. අඩුම තරමින් අද හම්බ වන ආදායමෙන් බස්නාහිර පළාත් සභාවට, මහ ආණ්ඩුවට ලැබෙන ලොකුම අදායම ව්‍යාපාරිකයන් ගෙවන බදු මුදල්.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒ වෙළෙන්දා ආරක්‍ෂා කර ගන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

දේශීය වෙළඳාම ඉවරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙතුමන්ලා දන්නේ නැතිව කථා කරනවා. දේශීය වෙළඳාම අවුරුද්දට මාස 04 යි. අද රුපියල් 140/- යි බොම්බයි ළූණු කිලෝ එකක්. අද අල කිලෝ එකක් රුපියල් 180/- යි. අද සුදු ලූණු කිලෝ එකක් රුපියල් 200/- යි. මේක කරන්න පුළුවන්ද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගොවියා ශක්තිමත් කරන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගොවියා ශක්තිමත් කරන්න කියන්නේ ඒක මෝඩ වැඩක්. ලංකාවේ ගොවියා ළූණු වගා කරන්නේ අවුරුද්දට මාස 04 යි. ඊට පස්සේ අනිවාර්යයෙන් තීරු බදු අයින් කරලා මේක නිදහස් කරලා මෙය දෙන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා කරනවාද?

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මම කරනවාද නොවෙයි. මේක කරන්න ඕනෑ වැඩක්.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඔය කියපු දේවල් ඔබතුමා ගෙන්වනවද?

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඇත්ත වශයෙන්ම අපේ බස්නාහිර පළාත් සභාවේ ඊයේ පෙරේයිදා ව්‍යාපාරිකයෙක් අවුරුදු දෙකේ ළමයත් එක්ක, නෝනත් එක්ක වහ බීලා මැරුණා. වග කියන්න ඕනෑ කවුද? මේ ආණ්ඩුව සම්පූර්ණයෙන් වග කියන්න ඕනෑ. මරණ තුනක්. බස්නාහිර පළාත් සභාවේ ආමර් වීදියේ එක ගෙයක. මැද කොළඹ මගේ ආසනයේ. බලන්න බැහැ, හිතට දුකයි. අද මේ ආණ්ඩුව පැත්තේ ඉන්න මන්ත්‍රීවරු කථා කරනවා. ලොකුවට කයිය ගහනවා. මේ අයට තේරෙනවා මේකේ අමාරුව. මේ අය එක්කෙනෙකුටවත් ගේකට යන්න බැහැ. නෝනලා තරහයි. අද තිබෙන තත්ත්වයට.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒක තමයි අපි තියන තියන ඡන්දෙන් දිනන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාට තිබුණු කාලය අවසන්.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

බොහොම ස්තුතියි.

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමයනි, විශේෂයෙන්ම මම හිතන්නේ 2013 අයවැය සඳහා අදහස් ප්‍රකාශ කරන්නට පෙර මම හිතන්නේ, විපක්‍ෂයේ මන්ත්‍රීවරයෙකුගෙන් අදහසක් ප්‍රකාශ වුණා, අතිගරු ජනාධිපතිතුමන් මේ රටේ ජනතාවට මොනවාද දීලා තිබෙන්නේ කියලා. අපි පළාත් සභාවේ අයවැය පිළිබඳව සතුටු වෙනවා. ඒකට ප්‍රධාන හේතු ලෙස අපි නියෝජනය කරන ප්‍රදේශවල විශේෂයෙන්ම ජනතාවගේ ඇඟට දැනෙන කරුණු දෙකක් පිළිබඳව විතරක් මම සඳහන් කරනවා. අතිගරු ජනාධිපතිතුමා සමස්ත ශ්‍රී ලංකාවේම දරු පරපුර වෙනුවෙන් ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට අයවැයක් තුළින් සපත්තු ජෝඩුවක් ලබා ගන්නට ප්‍රතිපාදන වෙන් කළා. හැබැයි, මේක මම හිතන්නේ, එක්සත් ජාතික පක්‍ෂයට දැනෙන්නේ නැති වුණාට අපට මේක හොඳට දැනෙනවා. මොකද අපි නියෝජනය කරන ප්‍රදේශවල සපත්තු දෙක ගන්න බැරි ඕනෑ තරම් දරුවන් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ එක්කම අපි වඩාත් සතුටු වෙනවා පාසල් දරුවන් සඳහා තවත් නිල ඇඳුමක් වසර මැදදී ලබා දීම පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2013 ගරු මහ ඇමැතිතුමාගේ අයවැය පිළිබඳව අපි වඩාත් සතුටු වෙන්නේ, 2012 වර්ෂය තුළ අපි ලබාගෙන තිබෙන ප්‍රගතිය අනුවයි. මේ අපේ ෆයිරූස් ගරු මන්ත්‍රීතුමා සඳහන් කරපු ආකාරයට -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ආණ්ඩු පක්‍ෂයේ ගරු මන්ත්‍රීවරු කරුණාකර නිශ්ශබ්ද වන්න. තමන්ගේ සහෝදර මන්ත්‍රීවරයෙක් මේ අවස්ථාවේ කථා කරන්නේ. නිදහසේ කථා කරන්න දෙන්න.

[ පූ.භා. 11.25 ]

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

මට මගේ කාලය ලබා දෙන්න. ගරු මහ ඇමැතිතුමාගේ අයවැය පිළිබඳව අපි ගොඩාක් සතුටු වෙන්නේ, අපේ පාසල් පද්ධතිය තුළ අඩක් නිම කර ගන්නට හැකියාව නොහැකිව තිබූ විශාල ගොඩනැගිලි ප්‍රමාණයක් අපේ ප්‍රදේශවල පාසල් දරුවන් වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමාගේ අවධානය යොමු කරලා දැවැන්ත මුදල් ප්‍රමාණයක් අපේ ප්‍රදේශවලට ලබා දීලා සම්පූර්ණයෙන් ගොඩනැගිලි ටික අවසන් කරලා තිබෙනවා. එපමණක් නොවෙයි. ගරු මහ ඇමැතිතුමා පාසල් පද්ධතිය වෙනුවෙන් කරලා තිබෙන ඒ උදාර සංකල්පයන් පිළිබඳව සඳහන් කරන්නට ඕනෑ. විශේෂයෙන්ම නැණ ගුණ වැඩුම කියන ජනාධිපතිතුමාගේ උදාර සංකල්පයට තව අරුතක් එක් කරමින් සරුදම් අරුණැල්ල කියන ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට පාසල්ගත දරුවන් සහ දහම් පාසල් ගත දරුවන් වෙනුවෙන් විශල මුදල් සම්භාරයක් දහම් පාසල් පද්ධතියට ලබා දීලා පාසල් යන එමෙන්ම දහම් පාසල් නොයන දරුවන් දහම් පාසල් ගත කරන්නට සුවිශේෂ මෙහෙවරක් ගරු මහ ඇමැතිතුමා කරලා තිබෙනවා. ඒ එක්කම ගරු මහ ඇමැතිතුමා හැමදාම සඳහන් කරනවා වාගේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ දරුවන් අධ්‍යාපනයෙන් පමණක් හදන්නට බැහැයි කියන ඒ උදාර අදහස තුළ අපිත් ඉන්නවා. දහම් පාසල් යන දරුවා තමාගේ හදවත තවත් අයෙක් වෙනුවෙන් කටයුතු කරන්නට, අනුකම්පාව දයාව පිරි දරුවෙක් කරන්නට විශාල මහන්සියක් ගන්නවා. ඒක තමයි අපි කිව්වේ, ඔළුව තිබෙන දරුවෙක් පමණක් නොවෙයි. හදවත තිබෙන දරුවෙක් බිහි කරන්නට ගරු මහ ඇමැතිතුමා කටයුතු කරනවා කියලා. ඒ එක්කම සඳහන් කරන්න ඕනෑ. කොළඹ කලාපයේ, අපි නියෝජනය කරන කලාපයේ, ගුරුවරුන් 8000 ක් ඉන්න කලාපයේ අබලන් ගොඩනැගිල්ල ඉතා ඉක්මණින් අවසන් කරන්නට අපට ලක්ෂ 200 ක මුදලක් ලබා දීලා කොට්ඨාශ මට්ටමින්, කොට්ඨාශ කාර්යාල ශක්තිමත් කරන්නට කටයුතු කිරීම පිළිබඳව ගරු මහ ඇමැතිතුමාට ගෞරවය ප්‍රණාමය පුද කරනවා. ඒ එක්කම අපේ කලාපවල ගුරු හිඟය මඟ හරවන්නට විශාල ගුරුවරු සංඛ්‍යාවක් අධ්‍යාපන පද්ධතියට එකතු කරමින් කරපු මෙහෙවරට අපේ ගෞරවය ප්‍රණාමය පුද කරනවා.

ඒ එක්කම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම අපේ ක්‍රීඩා ගරු ඇමැතිතුමා පිළිබඳව යම් අදහසක් ප්‍රකාශ කරන්නට ඕනෑ. අපේ පළාත් සභා ඉතිහාසයේ ක්‍රීඩාව වෙනුවෙන් අති දැවැන්තම මුදල වැය කළ වර්ෂය බවට 2012 වර්ෂය ඉතිහාසගත වෙනවා. උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා තමාගේ අමාත්‍යාංශය තුළින් පාසල් මට්ටමේ ක්‍රීඩා හැකියාවන් තිබෙන දරුවන් ඉදිරියට ගෙනෙන්නට සුවිශේෂ මෙහෙවරක් කරලා තිබෙනවා. එපමණක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින්, ඒ එක්කම දිස්ත්‍රික්ක මට්ටමින් ජාතික මට්ටමේ, ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයන් බිහි කරන්නට අති දැවැන්ත මුදලක් උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා 2012 වර්ෂය තුළදී අපේ ක්‍රීඩා පද්ධතියට එකතු කරලා තිබෙනවයි කියන එක සඳහන් කරන්නට ඕනෑ. ඒ එක්කම මේ ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ ඉතිහාසයේ නොවුණු ආකාරයට අද බස්නාහිර පළාත් සභාව තුළ සුවිශේෂ හැකියාවන්, දක්ෂතාවයන් ඉදිරිපත් කරන්නට අපේ පළාත් සභාවේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට හැකියාව ලැබිලා තිබෙනවයි කියන එක සඳහන් කරන්නට ඕනෑ. ඒ එක්කම උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාට අපි ස්තූතිවන්ත වෙනවා. අපේ පාසල් පද්ධතිය තුළ අපේ ක්‍රීඩා පිට්ටනි මායිම් සීමා කරගන්නට බැරිව අපි විශාල ගැටලුවකට මැදි වෙලා සිටියා. ඒ අවස්ථාවේදී එතුමාගේ අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් අපේ පාසල්වල ක්‍රීඩා පිට්ටනිවල මායිම් වෙන් කරගන්නටත් ඒ පාසල් ක්‍රීඩා පිට්ටනි සංවර්ධනය කරන්නටත් එතුමා දැවැන්ත මුදලක් අප වෙත ලබා දුන්නා. ඒ එක්කම සඳහන් කරන්න ඕනෑ. උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා මම හිතන්නේ, පොල්වත්ත ක්‍රීඩා පාසල පිළිබඳව නැවත සැරයක් එතුමාට අපේ ගෞරවය ප්‍රණාමය පුද කරනවා. ඒකට හේතුව තමයි 579 කට වැඩි ක්‍රීඩක සංඛ්‍යාවකට මේ පාසල තුළින් 2012 වර්ෂයේදී ඒ ඒ ක්‍රීඩකයන්ගේ ඒ දක්ෂතාවයන් ඉදිරියට ගෙනෙන්නට ඒ අවශ්‍ය කරන පුහුණු වැඩ සටහන් දැවැන්ත ප්‍රමාණයක් ලබා දෙන්නට කටයුතු ක්‍රියාත්මක කරලා තිබෙනවා. අවසාන වශයෙන් මම සඳහන් කරන්නේ, විශේෂයෙන්ම ඔබතුමාට කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් නැවත සැරයක් අපේ ගෞරවය ප්‍රණාමය පුද කරනවා. මේ ප්‍රතිපාදන ඔබතුමා ලබා දෙන්නේ අතිගරු ජනාධිපතිතුමා නියෝජනය කරන පාසල් දරුවන්ට. මේ නිල ඇඳුම සහ සපත්තු කුට්ටම් ලබා දෙන කොට වැඩියෙන්ම සතුටට පත් වෙන්නේ - මේවා අපේ රටේ පාරවල් හදන්න තිබෙන, වරායවල් හදන්න තිබෙන, ඒ වාගේම ගුවන් තොටුපලවල් හදන්න තිබෙන මුදල් තමයි මේ අපේ පාසල් පද්ධතියේ දරුවන් සඳහා ලබා දීලා තිබෙන්නේ. ඒ එක්කම ඔබතුමාට ස්තූතිවන්ත වෙන්නේ අපේ ප්‍රතිපාදනවලින් ඡන්දය ඉලක්ක කරගෙන, මනාප ඉලක්ක කරගෙන කරන සංවර්ධනයට එහා ගිය ගහේ කඳට කරපු සත්කාරය වෙනුවට ගහේ මුලට, ඡන්දයකට ගැවුණේ නැති දරුපරපුර වෙනුවෙන් කිසිම දේශපාලන වාසියක් නොතකා ගරු මහ ඇමැතිතුමා පාසල් පද්ධතියේ දරුවන් වෙනුවෙන් කරන මෙහෙයුම. ඒ මෙහෙවර අපි විශේෂයෙන්ම අගය කරනවා.

ඒ එක්කම සඳහන් කරන්න ඕනෑ. ඉතිහාසයේ කවදාවක්වත් මහ ඇමැතිවරයෙක් කොට්ඨාශ මට්ටමට ඇවිල්ලා, ඒ කොට්ඨාශ මට්ටමින් අධ්‍යාපනයේ ප්‍රගතිය විමසූ අවස්ථාවක් අපි දැකලා නැහැ. ඒ ගෞරවයත් ඔබතුමාට හිමි වෙනවා. ඒ කොට්ඨාශ මට්ටමින් ඔබතුමා පැමිණිලා කරන ඒ විමර්ශනයේදී ගුරු හිඟය පමණක් නොවෙයි, පාසල් මට්ටමේ විශාල ප්‍රගතියක් ඇති වෙනවයි කියන එක සඳහන් කරමින්, විශේෂයෙන්ම 2013 වර්ෂය සඳහා ඔබතුමා අති දැවැන්ත මුදලක් අධ්‍යාපන පද්ධතියට, අධ්‍යාපන ක්ෂේත්‍රයට වැය කිරීම පිළිබඳව අපි ගොඩාක් සතුටු වෙනවයි කියන ප්‍රකාශය කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තූතියි.

[ පූ.භා. 11.34 ]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පළාත් සභා අයවැයේදී පොදු සාකච්ඡාවට කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අද මේ පළාත් සභා ක්‍රමය පිළිබඳ ප්‍රශ්න රාශියක් හා 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන විවාදාත්මක පරිසරයක් තිබෙන වේලාවේ තමයි අපේ ගරු මහ ඇමතිතුමා මේ බස්නාහිර පළාත් සභාවේ අයවැය ඉදිරිපත් කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු මහ ඇමතිතුමාගේ අයවැය ප්‍රකාශයේදී එතුමාගේ තිබෙන අමාත්‍යාංශය තුළ එතුමා ප්‍රධාන වශයෙන්ම එතුමාගේ මහා අමාත්‍ය අමාත්‍යාංශය තුළින් නීතිය හා සාමය, ඉඩම් යන අමාත්‍යාංශ පිළිබඳව මේ අයවැය කථාවේ, මේ ප්‍රකාශය තුළ කිසිම දෙයක් ඇතුළත් වෙලා නැහැ. නමුත් එතුමාගේ අමාත්‍යාංශයන් හැටියට අද නීතිය හා සාමය, ඉඩම් යන අමාත්‍යාංශ ක්‍රියාත්මක වෙනවා. එතුමාගේ මේ අයවැය කථාව තුළදී ඒ අමාත්‍යාංශ ගැන කිසිම හෝඩුවාවක්, කිසිම තොරතුරක් අපට ලබා දීලා නැහැ. මම හිතනවා ඒකේ තිබෙන ප්‍රධාන ගැටලුව තමයි අද අපි 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පළාත් සභා ක්‍රමය මේ රටට හඳුන්වා දුන්නාට පස්සේ අද වන විට මේ පළාත් සභා ක්‍රමයේ තිබෙන - අපි දන්නවා, මේ පසුගිය කාලය පුරාම පළාත් සභා ක්‍රමය අහෝසි කළ යුතුයි. මේ පළාත් සභා ක්‍රමය ඉදිරියට ගෙන යනවාද? නැද්ද? කියන අදහස, මතය අද ආණ්ඩුව ඇතුළෙන්ම මතු වෙලා තිබෙනවා. ඒ උඩ අද දවස ගණනේ මේ පළාත් සභාවට තිබුණු බලතල අද අහිමි වෙලා තිබෙනවා. අපි අද මධ්‍යම ආණ්ඩුවෙන් යැපෙන පළාත් සභාවක් විතරක් නොවෙයි. අද දේශපාලන තීන්දුවක් ගන්න බැරි සභාවක් හැටියට මේ සභාව අද පත් වෙලා තිබෙනවා. අද ගරු මහ ඇමතිතුමාගේ අයවැය කථාව හා එතුමාගේ අයවැය ප්‍රකාශය දිහා බැලුවාම අපට පේනවා විශාල වැඩ කොටස් ඒකේ කරලා තිබෙනවා කියලා. තිබෙන සුබ සාධන දේවල්, අපි හැම පළාත් සභාවකදීම ක්‍රියාත්මක කරන දේවල් ඒ තුළ ඇතුළත් වෙලා තිබෙනවා. නමුත් දේශපාලන වශයෙන් තීන්දු ගන්න පුළුවන්ද මේ සභාවට. එහෙම අයිතිය මේ පළාත් සභාව තුළ පසුගිය කාලය පුරාම අපි දැකලා නැහැ.

අපි දන්නවා, මේ නීතිය පිළිබඳව ගත්තොත් පළාත් සභාවට අයිති විෂයයක්. පසුගිය කාලයේ බස්නාහිර පළාත් සභාව

[ ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන් ]

ඇතුළත නීතිය බිඳ වැටීම් ගණනාවක් පසුගිය කාලයේ සිද්ධ වෙනවා අපි දැක්කා. නමුත් ගරු මහ ඇමතිතුමාට ඒ නීතිය පිළිබඳ තිබෙන අයිතිය, එතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ඒ දේශපාලන බලය ක්‍රියාත්මක කරන්න එතුමාට පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒක එතුමාගේ තිබෙන දක්ෂතාවයක් හෝ අදක්ෂතාවයක් නිසා නොවෙයි. මහ ආණ්ඩුව මේ පළාත් සභාවලට බලය ලබා දීමේ තිබෙන අකමැත්ත අපි දැක්කා පසුගිය කාලයේම. මේ පළාත් සභාවලට තිබුණු යම් යම් ආර්ථික වශයෙන් වැදගත් අපේ පිරිවැටුම් බදු වාගේ දේවල් ආණ්ඩුව පසුගිය කාලයේ අපෙන් උදුර ගත්තා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද පළාත් සභා ක්‍රමයට විරුද්ධ සමහර මන්ත්‍රීවරුන් මෙතැන අදහස් දැක් වූවා. නම් වශයෙන් මට කියන්න අවශ්‍යතාවයක් නැහැ. නමුත් ඒ මන්ත්‍රීවරුන් පෙන්නලා දුන්නා, මේ පළාත් සභා ක්‍රමය යටතේ විශාල වැඩ කොටසක් වෙනවයි කියන එක. නමුත් ඇත්තටම මේ පළාත් සභා ක්‍රමය අපේ රටට හඳුන්වලා දුන්නේ, මේ රටේ ජනවාර්ගික ප්‍රශ්නයක් උඩ. මේ රටේ තිබෙන මේ ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් සොයා ගත යුතුයි. ඒ සොයාගත හැකි ක්‍රමයේ එක කොටසක් හැටියට තමයි මේ පළාත් සභා ක්‍රමය ආවේ. නමුත් අද මේ පළාත් සභා ක්‍රමය නැවත අහෝසි කළ යුතුයි, මේක මේ රටට අවශ්‍ය නැහැයි කියන අදහස අද ආණ්ඩුවේ ඉන්න මැති ඇමතිවරුන්ගේ කථාවලින් අපට පෙනෙන්න තිබෙනවා.

ඒ වාගේම අපි දැක්කා, පසුගිය කාලයේ විශේෂයෙන්ම ආණ්ඩුවේ මන්ත්‍රීවරයෙක්, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් ප්‍රකාශයක් කළා. පළාත් සභා ක්‍රමයට එරෙහිව මෙම ප්‍රකාශ වන්නේ. දිවිනැගුම පනතට අධිකරණයෙන් දීපු තීන්දුව උඩ තමයි මේ පළාත් සභා ක්‍රමයට විරුද්ධව අද විශාල බලයක් ගොඩ නහන්න අද උත්සාහ කරන්නේ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මතක තියා ගන්න දිවි නැගුම පනත, මේ රටේ පොදු ජනතාවගේ සම්පත්, පොදු ජනතාවගේ මුදල් කොල්ල කන, ඒ හොර පනත පාර්ලිමේන්තුවට ගෙනෙන්න බැරි වුණේ, මේ 13 වැනි සංශෝධනය නිසයි කියන එක මතක තියා ගන්න. ඒ අතින් බැලුවා නම්, ඒ හොර පනත් පාර්ලිමේන්තුවෙන් ගෙනැල්ලා, සම්මත කරලා මේ රටේ දුප්පත් ජනතාවගේ සල්ලි, සම්පත් කොල්ල කෑමේ ව්‍යාපෘතිය වැළකුණේ මේ රටේ තිබුණු 13 වැනි සංශෝධනයෙන් කියන එක අපි මතක තියා ගන්න ඕනෑ. ඒ නිසා මම හිතනවා, ඒ 13 වැනි සංශෝධනයෙන් මේ රටට හොඳක් වුණා. ඒ හොඳ තමයි එක පුද්ගලයෙකුගේ අතට යන්න ගිය විශාල මුදල් කන්දරාවක්, විශාල සම්පත් ප්‍රමාණයක් මේ පළාත් සභා නිසා අපට වළක්වා ගන්න පුළුවන් වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ පැත්තෙන් ගත්තාම මේ පළාත් සභාව තිබුණු එක හොඳයි. මේ පළාත් සභා තිබුණු නිසා තමයි, අද ඒකට විරුද්ධව තීන්දුව දුන්නු නිසා තමයි අද අගවිනිසුරුතුමියව අල්ලගෙන දඬු කඳේ ගහන්න උත්සාහ කරන්නේ. ඒකට දීපු තීන්දුව නිසා තමයි අද අධිකරණය තමන්ගේ යටතට නතු කර ගන්න, තමන්ගේ බලය යටතට නතු කර ගන්න, ඒ අධිකරණය අරගෙන ගිහිල්ලා දඬුකඳේ ගහලා තමන්ගේ පැවැත්ම සඳහා, තමන්ගේ බලය සඳහා ඒ අධිකරණය ගොඩනහා ගන්න අද ආණ්ඩුව උත්සාහ කරමින් ඉන්නේ.

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ පළාත් සභා ක්‍රමය ආපසු හරවන්න, මේක මේ රටේ ජනතාව ජීවිත පූජා කරලා හදපු පළාත් සභාවක්. එදා අපට මතකයි. මේ පළාත් සභා ක්‍රමය 88 ගෙනෙන කොට L.T.T.E. සංවිධානය එදා ඒ අන්තවාදී පිරිස් දෙමළ ජනතාවගේ නියෝජිතයන් හැටියට තරග කරපු උදවියව මරලා දැම්මා, අපි දැක්කා. පළාත් සභා ක්‍රමය ප්‍රතික්ෂේප කළා. එදා L.T.T.E. සංවිධානය කිව්වා, පළාත් සභා වැඩක් නැහැ.

පළාත් සභා තුළින් දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් ලැබෙන්නේ නැහැ. ඒ නිසා අපි පළාත් සභා ප්‍රතික්ෂේප කරනවා කියලා එදා L.T.T.E. සංවිධානය කිව්වා. අන්න ඒ වාගේම එදා දකුණේ දේශප්‍රේමීන් සිටියා. ඒ ඊනියා දේශප්‍රේමීන් එදා පළාත් සභා ක්‍රමය ගෙනෙන කොට රටේ දේපළ ගිනි තිබ්බා. එදා ඡන්දය දාන උදවිය මරා දැම්මා. අපේක්ෂකයන්ව මැරුවා. ඒ වාගේ ලොකු විනාශයක් මේ රටට ඇති කළා. ඒවා ඇති කරපු, ඒවායේ නායකත්වය දරපු අය අද ඇමැතිවරු හැටියට පත්වෙලා නැවත වතාවක් මේ රට ආපස්සට ගෙනි යන්න මේ රට නැවත වතාවක් ම්ලේච්ඡත්වයට ගෙන යන්න හදනවා. අද ඔවුන් සුදු රෙදි ඇඳගෙන ඇමැතිවරු හැටියට ඉඳගෙන ආණ්ඩුවේ තිබෙන සියලු වරප්‍රසාද පාවිච්චි කරලා මේක ආපස්සට හරවන්න අද කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ නිසා මේ පළාත් සභා ක්‍රමය තුළ මේ රටේ තිබෙන ජනවාර්ගික අර්බුදයට යම්කිසි ආකාරයේ විසඳුමක් ලැබෙනවා නම්, මේ රටේ සියලු ජන කොටස් මේ හරහා අපට එකතු කරගන්න පුළුවන් නම්, මේ රටේ ඉන්න අනිකුත් ජන කොටස් එකතු කරගෙන අපට එක රටක් හැටියට ඇතුළේ ජීවත් වෙන්න මේ පළාත් සභා ක්‍රමය ඉවහල් වෙනවා නම් අනිවාර්යයෙන්ම මේ පළාත් සභා ආරක්ෂා කරගන්න අපි බැඳී සිටිය යුතුයි කියලා අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ විතරක් නොවෙයි. මේ පළාත් සභා ක්‍රමය අද එපා කියන උදවිය, මේ පළාත් සභා ක්‍රමයට එදා විරුද්ධ වුණු උදවිය අද විතරක් නොවෙයි. මේ රටේ හැමදාම, මේ රටේ ඉතිහාසය පුරාම හිටපු උදවිය තමයි ඒ අය. එදා බණ්ඩාරනායක මැතිතුමා චෙල්වනායගම් එක්ක ගිවිසුම අත්සන් කරනකොටත් එදා මේ බලවේගම තමයි බණ්ඩාරනායක මහත්මයාට විරුද්ධව පෙළපාලි ගිහිල්ලා එතුමාගේ ජීවිතය පවා බිලි ගත්තේ. එදා මේ බලවේගම තමයි එතුමා මරලා දැම්මේ. ඒ නිසා ඒ බලවේග නැවත වතාවක් ආණ්ඩුව ඇතුළෙන්ම අද හොල්මන් කරන්න පටන්ගෙන තිබෙනවා. ඒ බලවේග නැවත වතාවක් මේ රටේ ඔළුව උස්සන්න පටන් අරන් තිබෙනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමියනි, ආණ්ඩුවට වගකීමක් තිබෙනවා. මේ පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ට වගකීමක් තිබෙනවා. ඒ මතවාදය පරාජය කරලා මේ රටේ සියලු ජාතීන් එක්සත් කරන්න. ඒ සඳහා මේ පළාත් සභාව ඉවහල් වෙනවා නම්, උතුරු - නැගෙනහිර යුද්ධයට මේ පළාත් සභාව විසඳුමක් හැටියට ක්‍රියාත්මක කරන්න අපට පුළුවන් නම් මම හිතනවා, අපට ඉදිරියට යන්න පුළුවන් කියලා. අනාගතය ගැන, හෙට බිහිවන දරුවා ගැන අපි කල්පනා කරන්නේ නැතිව, අපේ තිබෙන පටු දේශපාලන වාසි වෙනුවෙන් අපි මේවා ආපස්සට හරවන්න කල්පනා කරනවා නම්, අපේ තිබෙන පටු ජාතිවාදී හැඟීම් උඩ අපි මේවා ආපස්සට ගෙනි යන්න කථා කරනවා නම්, අපට යන්න තිබෙන්නේ ම්ලේච්ඡත්වයට විතරයි කියමින් මගේ වචනය ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

[ පූ.භා. 11.40 ]

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2013 අයවැය සම්බන්ධව අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව මම මුලින්ම ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. මීට පෙර කියැවුණා, යුද්ධය අල්ලගෙන දිගටම කථා කරනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැනට අවුරුදු 1200 කට ඉස්සෙල්ලා එළාර - දුටුගැමුණු යුද්ධය අවසන් වුණේ. නමුත් අදත් අපි දුටුගැමුණු රජ්ජුරුවෝ යුද්ධය නිම කරපු හැටි ගැන කථා කරනවා. එහෙමනම් ලෝකයේ හැම තැනම යුද්ධ තිබෙද්දී, තවමත් ඒ යුද්ධ තිබෙද්දී අපේ ජනාධිපතිතුමා යුද්ධය යුද්ධෙන් අවසන් කළා. තවම වසර තුනයි. අපි කථා කළාට පව් නැහැ. ඒක නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ සම්බන්ධව දැන් නොවෙය, තවත් වසර සිය ගණනක් ගියත් කථා කරන්න අපට තිබෙනවා. එසේ කියමින් පොදු සාකච්ඡාවේදී මා මුලින්ම අපේ ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ අධ්‍යාපන විෂයය ගැන කථා කරනවා. මොකද, මේ පළාත් සභාවේ විෂයයන්වලින් විශාලතම විෂයය අධ්‍යාපන විෂයය. මොකද, හොඳම දේ දරුවන්ට. අනාගතයේ හොඳ දරුවෝ බිහි කළේ නැත්නම්, හොඳ රටක් නැහැ. එතැනදී අපේ ගරු මහ ඇමැතිතුමා මම හිතන්නේ මෙතෙක්, එතුමා ප්‍රධාන අමාත්‍යතුමා වුණායින් පස්සේ ගුරුවරුන් ලබා දීමෙන්, මුදල් ලබා දීමෙන් පමණක් අධ්‍යාපනය නංවනවා කියන ඒ සංකල්පයෙන් අයින් වෙලා "සුපසන් නිම්තෙර" කියන වඩාත් ප්‍රසන්න වූ අධ්‍යාපන වේදිකාවක් ගොඩ නැගීමේ සංකල්පය මත පැමිණිලා තිබෙනවා. එතුමා අපේ පාසල අපේ දැතින් සුරකිමුයි කියන සංකල්පය මත පාසල්වලට ගිහිල්ලා, අපව යවලා මුදල් ලබා දීලා ඒ ලස්සන පරිසරයක් ගොඩ නැගීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා. ඒ වාගේම දරුවාගේ නැණ විතරක් මදී. ගුණ සංවර්ධනය කළ යුතුයි. ඒ නිසා දහම් පාසල් නොයන දරුවන් දහම් පාසල් ගත කිරීමට ඉතා විශාල දැවැන්ත වැඩ පිළිවෙළක් එතුමා අරගෙන යනවා.

ඒ වාගේම විශාල ඩෙංගු උවදුරක් රට පුරා ප්‍රචාරය වෙනවා. එතැනදී එතුමා මහා පවිත්‍රතා දිනය කියලා දිනයක් ඇති කරලා බස්නාහිර පළාත තුළ තිබෙන සියලුම පාසල් එක් දිනකදී පවිත්‍ර කරලා අපේ දරුවන් ඩෙංගු උවදුරින් ඉවත් කරලා තිබෙනවා. ඒ වාගේම මේ අධ්‍යාපනය මෙහෙය වන්නේ කලාප කාර්යාල. බොහෝ කලාප කාර්යාල ඉතාමත් ශක්තිමත් නැහැ. කුකුල් කොටු වාගේ. එතුමා කලාප කාර්යාල ශක්තිමත් කරන්නත් විශාල වැඩ පිළිවෙළක් අරගෙන යනවා. මම හිතන්නේ, ඔබතුමන්ලාගේ අතට පත් වෙලා ඇති එතුමාගේ දැවැන්ත වැඩ පිළිවෙළ. මම ඒ සම්බන්ධව කියන්න අවශ්‍ය නැහැ. එතැනදී අපේ ගරු මහ ඇමැතිතුමා කරන වැඩ පිළිවෙළ මම අගය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය මහින් අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කරනවා. අපේ අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන වැඩ පිළිවෙළේ

කියලා තිබෙනවා "*කෙනෙක් දුරට අනාගතය සඳහා ඵලදායිද යන්න නැවත සලකා බැලිය යුතු යැයි මම යෝජනා කරමි.*" අපේ අධ්‍යාපනය. ඒ වාගේම "*දරුවන් සිය අනාගතය තුළ අතරමං නොවන පරිදි පාසල් ප්‍රමාණය සහ විභාග රටාව සංශෝධනය කිරීම ගැන පියවර ගත යුතුයි කියලා*" අපේ ජනාධිපතිතුමා මහින්ද චින්තන වැඩ පිළිවෙළේ ඉදිරිපත් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා අදහස් ඉදිරිපත් කරන්නේ, ඔබතුමිය මාර්ගයෙන් ගරු මහ ඇමැතිතුමාට. බස්නාහිර පළාතේ පාසල් 1332 ක් තිබෙද්දී එයින් 1261 ක් අයිති වෙන්නේ, අපේ පළාත් සභාවට. අපේ ගරු මහ ඇමැතිතුමාට. වසරකට පන් ලක්ෂයක් අපේ දරුවෝ O/L විභාගය ලියනවා. එයින් ලක්ෂ එකහාමාරක් තමයි A/L විභාගයට සමත් වෙන්නේ. එයින් 25,000 කට ආසන්න ප්‍රමාණයක් තමයි විශ්ව විද්‍යාල ප්‍රවේශය ලබන්නේ. එහෙමනම් සාමාන්‍ය පෙළ විභාගයට පන් ලක්ෂයක් ලියන කොට විශ්ව විද්‍යාලයට 25,000 ක් වරම් ලබන කොට හාර ලක්ෂ හැත්තෑ පන්දාහක දරුවන් මේ සමාජයේ රැකියාවක් නැතිව අතරමං වෙනවා. එහෙමනම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමා යෝජනා කරලා තිබෙන්නේ, හොඳ දෙයක්. පාසලෙන් වැඩ බිමට කියලා. ඒ අලුත් යෝජනාව මා ඉදිරිපත් කරනවා. එය තව ටිකක් සංශෝධනය කරන්න මා අදහස් කරනවා. මේ අධ්‍යාපන ක්‍රමයේදී පාසල කියන ආයතනය Semi කාර්මික විද්‍යාලයක් විය යුතුයි. හේතුව අපි පුරුදු වෙලා තිබෙන මේ අධ්‍යාපන ක්‍රමය අනුව පහේ පන්තියට යන කොට අම්මලා තාත්තලා දරුවා අරන් යනවා ශිෂ්‍යත්වය පාස් කරන්න. පාස් වුණාම හෝ Fail වුණාම ඊළඟට O/L පාස් කරන්න අරගෙන යනවා. ඒකත් Fail වුණාම අපේ ළමයින් මුහුකුරා ගිහිල්ලා අවසානයි. එතැනින් පස්සේ අපේ දරුවන්ව වැඩ බිමට යවනවා කියන සංකල්පය බොහොම අමාරුයි.

එහෙමනම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ මේ අධ්‍යාපනය සැකසිය යුතු වන්නේ ඉස්කෝලේ හතේදී, අටේදී. දරුවාගේ හැකියාවන් අනුව අපේ පාසල තුළ ඒ වෘත්තීය අධ්‍යාපනය යම් ප්‍රමාණයක් පටන් ගත යුතු වෙනවා. අපේ පාසල් 1261 ක් තිබෙන කොට අපේ ගරු මහ ඇමැතිතුමාට මම අදහස ඉදිරිපත් කරනවා. මෙය Semi කාර්මික විද්‍යාලයක් බවට අපේ පාසල පත් වෙන්න ඕනෑ. එහෙම නැත්නම් අපේ දරුවන් O/L වලින් පස්සේ වෘත්තීය අධ්‍යාපනයට යොමු වෙන්නේ නැහැ.

[ ගරු අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා ]

ඊළඟට මම ඉදිරිපත් කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පළාත් පාලන විෂයේදී අපට පළාත් පාලන ආයතන අධීක්ෂණ හැකියාව තිබෙනවා. මගේ අදහස අනුව තවත් වසර 10 කින්, 15 කින් මේ ලංකාවේ මහ පාරේ මිනිස්සු මරා ගන්නවා. ඒකට හේතුවක් තිබෙනවා. අද වන විට මිනිස්සු තාප්ප බඳින්නේ මහ පාරේ. අඩියක්වත් දෙන්නේ නැහැ මහ පාරට. අපේ කාලයේ අපට Foot සයිකලයක්වත් තිබුණේ නැහැ. අද වන විට හැම කෙනෙකුටම වාහනයක් දෙකක් තිබෙනවා. තව වසර පහකින් දහයකින් අපේ දරුවෝ ඔක්කෝම වාහනයක් ගන්නවා. වාහනයක් ගත්තාම මේ අඩි 10 පාරේ කවුද වාහනේ එහෙට මෙහෙට යන්නේ? කවුද අයින් කරන්නේ? එහෙමනම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය හරහා මම ඉදිරිපත් කරන්නේ ගරු මහ ඇමැතිතුමාට පළාත් පාලන ආයතන දැනුවත් කරලා තාප්ප බැඳීමේදී, ඉදි කිරීමේදී ඒ මාර්ගයට ඉඩ හැරිය යුතු ප්‍රමාණය ඉඩ හැරිය යුතුමයි. එහෙම නැත්නම් අනාගතයේ කිසිම සංවර්ධනයක් කරන්න හම්බ වෙන්නේ නැහැ. මොකද, මිනිස්සු ලයිට් කණු වත්තට දාගෙන තාප්පේ ගහනවා. දුවට දැවැද්දට දෙන්න. ඒ සංකල්පය ඉවත් වෙන්න ඕනෑ.

ඒ සමඟම තව මම කථා කරනවා අපේ මහා මාර්ග විෂයය ගැන. මම හිතන්නේ අපි කවුරුත් දන්නවා, අපේ නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා මහා මාර්ග විෂයය භාර ගත්තායින් පස්සේ ඉතා විශාල දැවැන්ත වැඩ කොටසක් මේ පළාත් මහා මාර්ගවලට කළා. ඉස්සර පළාත් සභාවෙන් මහා මාර්ගයට Patch එකක් දා ගන්න අපට බැහැ. අද වන විට ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා බස්නාහිර පළාත තුළ තිබෙන මාර්ග අවසන් කරලා තිබෙනවා. අපේ පළාත් මාර්ග අමාත්‍යාංශය කොපමණ දක්ෂද කියතොත් වෙනත් පළාත්වලත් පළාත් මාර්ග ඉදි කරන්න අපේ පළාත් සභාවට භාර දීලා තිබෙනවා. වයඹ පළාත, මධ්‍යම පළාත ඒ වාගේ පළාත්වලත් අපේ පළාත් සභාවේ කරන ගමන් අද ඒවාත් නිම කරමින් පවතිනවා. මම හිතන්නේ, මෙතැනදී පළාත් සභාව සුදු අලියෙක් කියන කොට අපි සතුටු වෙන්න ඕනෑ. ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ඇයි මේ පළාත් සභාවට සල්ලි දෙන්නේ. අපේ පළාත් සභා සුදු අලියෙක් නොවෙයි. මධ්‍යම රජයට වඩා පළාත් සභාව හොඳ හන්දා. ඒ වාගේම පළාත් සභාවේ ඇමැතිවරු හොඳ නිසා තමයි පළාත් සභාවට සල්ලි වෙන් කරන්නේ. නැත්නම් බැසිල් ඇමැතිතුමාට තිබුණා මධ්‍යම රජය හරහා වැඩ කරන්න. ඒ වාගේම අද වන විට ගම්පහ දිස්ත්‍රික්කය පුරාම තිබෙන ඇළ වේලි සියලුම දේවල්සකස් කරලා අවසානයි. මේ පසුගිය කාලයේ මාස ගණනක් වැස්සා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා සතුටු වෙනවා. මා මෙය අවස්ථාවක් කර ගන්නවා. ස්තුතිවන්ත වෙන්න පළාත් කෘෂිකර්ම ඇමැතිතුමාටත්, ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාටත්. හේතුව, මම ඉන්නේ දඬුවම් ඔය ආශ්‍රිතව. මේ බස්නාහිර පළාත තුළින් ගංගා තුනක් හතරක් ගලා බසිනවා. හැම අප්‍රේල් කාලයටම, නොවැම්බර් කාලයටම අපි ගං වතුර ආධාර බෙදනවා. නමුත් මෙදා අපි ගං වතුර ආධාර බෙදුවේ නැහැ. හේතුව අපේ ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා සියලුම ඇළ වේලි සංවර්ධනය කරලා ගං වතුර බහින්න සකස් කරලා තිබෙනවා. අපි ඒ සම්බන්ධව එතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, අල ගණින්. එළඹු ගණින්. පරිප්පු ගණින්. Tax ගහනවා කියලා. ඒකට තමයි දිවි නැඟුම පනත ගෙනල්ලා දිවි නැඟුම ලංකාවේ ක්‍රියාත්මක කරනකොට ලංකාවේ ජනතාවගේ ආර්ථික ගොඩ ගන්න බදු ගහන්න ඕනෑ. පිට රටින් අල එනකොට ඒවාට බදු ගැහුවේ

නැත්නම් ඒ අලේ ලාභෙට දෙනවා. අපේ අලේ වවන්නේ නැති වෙනවා. අපේ අලේ වවා ගන්න ඒ අලේට බදු ගහන්න ඕනෑ කියමින් මට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

[ පූ.භා. 11.51 ]

**ගරු පංචරත්නම් රාම්**
Hon. Panchrathnam Ram

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියගෙන් අවසරයි. මේ අවස්ථාව ලබා දීම ගැන මම ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. අපි දන්නවා, අද මේ දවස්වල ආණ්ඩුවත් එක්ක ඉන්න මන්ත්‍රී කොටසක්, ඇමැති කොටසක් පළාත් සභා ක්‍රමය අහෝසි කරන්න ඕනෑ කියන මේ කාලයේ, අපි බස්නාහිර පළාතේ 2013 අයවැය ගැන කථා කරන්නයි මේ සූදානම් වෙලා ඉන්නේ. ඇත්ත වශයෙන්ම අපි දන්නවා. අයවැය කියන්නේ, අපේ පළාත් සභාවට විතරක් අයිති දෙයක් නොවෙයි. ඕනෑම පුද්ගලික ආයතනයක්, ඒ වාගේම ආණ්ඩුවේ ආයතනයක්, ආණ්ඩුවේ නොවෙන ආයතනයක් හැමතැනම මේ අයවැය කියන සැලසුමත් එක්ක තමයි ඒ ඕනෑම ආයතනයක් ඉදිරියට යන්නේ. අපි මතක තියා ගන්න ඕනෑ. කොපමණ ලස්සනට අපේ අයවැය හැදුවත් ඒ අයවැය සාර්ථක වෙන්න අපි හොඳ කළමනාකරණ ක්‍රමයක් සකස් කරන්න ඕනෑ කියන එකත්, එය අත්‍යවශ්‍ය දෙයක් බවත් අපි කවුරුත් තේරුම් ගන්න ඕනෑ. එහෙම නැතිව කවදාවත් අයවැයක් හදලා ඒක සාර්ථක ලෙස අපට ඉදිරියට අරන් යන්නට බැහැ. අයවැය කියන්නේ, අපට ලැබෙන්න තිබෙන දේත්, අපි වියදම් කරන්න යන දේත් සකස් කරලා ඒ අනුව වැඩ කිරීමයි. ඒක තමයි අපි අයවැය කියන්නේ.

අපි දන්නවා, අපේ මැතිවරණවලට තරග කරනකොට එක්සත් ජාතික පක්ෂය, පොදු පෙරමුණ කියලා තරග කෙරුවත් අපි පළාත් සභාවක් හැටියට එක වහලක් යටට ඇවිල්ලා ජනතාව වෙනුවෙන් තමයි අපේ සේවය අපි අරගෙන යන්නේ. ඒක අපි කාටවත් අමතක කරන්නට බැහැ. එහෙමනම්, අපි මේ සේවය ජනතාව වෙනුවෙන් සාර්ථක ලෙස කරනවා නම්, අපි ඔක්කෝම එක මුතුවෙන් මේ බස්නාහිර පළාත් සභාව ඉදිරියට අරන් යන්න අවශ්‍යයි කියන එකයි මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමැති වෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මේ අවස්ථාවේ කියන්න හදන්නේ, අපි දන්නවා. බස්නාහිර පළාත් සභාව විතරක් නොවෙයි, පළාත් සභා ගැන එක එක අය, එක එක විධියට කථා කරන ආකාරය අපට දකින්නට පුළුවන් වෙලා තිබෙනවා. මේකට හේතුව, ඇත්ත වශයෙන්ම අපේ මේ පළාත් සභාවල් ඇති කළේ, අපේ රටේ ප්‍රශ්නවලට විසඳුමක් ලෙසටයි. අපේ රටේ තිබුණු සුළු ජාතික ප්‍රශ්න විසඳලා මේ පළාත් සභාව තුළ බලය බෙදාගෙන අපේ වැඩ කටයුතු ඉදිරියට අරන් යන්නයි මේ පළාත් සභාවල් ඇති කළේ. නමුත් අපේ පළාත් සභාවල බලය ආණ්ඩුව අපෙන් උදුරා ගන්නවා. තවත් තිබෙන බලතල උදුරා ගන්න එක එක ක්‍රම මේ දවස්වල කරන එක අපට දකින්නට පුළුවන් වෙලා තිබෙනවා. ඒ විධියට තමයි අපෙන් BTT එක උදුරා ගත්තේ. ඒ අවස්ථාවේ අපි කිසිම කෙනෙක් ඒකට විරුද්ධව ගියේ නැහැ. නමුත් අපි කථා කළා. කථා කෙරුවාට ආණ්ඩු පක්ෂයේ බලය වැඩි හින්දාත්, බහුතරය වැඩි හින්දාත් ඒ අය ඒක මෙතැන සම්මත කර ගත්තා. නමුත් අද අපි කියන්න ඕනෑ. BTT එක අපෙන් අයින් වුණත්, අපි ආදායම් බදු දෙපාර්තමේන්තුවේ කොමසාරිස්තුමාටත් ඒ වාගේම ඒ නිලධාරීන්ටත් ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අපේ මුද්දර බදු මේ අවුරුද්දේ විශාල විධියට වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම අපි දන්නවා. අපේ ආදායම් සොරකම් කරන්න අපි ආණ්ඩුවට ඉඩ දෙන්නේ නැතිව මේ පළාත් සභාව ඉදිරියට අරන් යන්න අපි වැඩ පිළිවෙළවල් හදා ගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, I would also like to mention that today this budget is very important debate. We must always not forget that through this budget, we are only concerned about serving the people. This is not a profit making organization. We must keep that in mind. We create various projects for the benefit of the people. Today we know there is a mid-day meal which has been provided to various schools. But I would like to point out that today there are certain schools which are in the Colombo district which is not getting this benefit. So I would like to kindly through the Hon. Presiding MemberI would like to mention this to the Hon. Chief Minister. I am not trying to find fault with the Chief Minister. But I just want to say that as Provincial Council Members we also get together and serve the people as a body which comes under one roof. Now we can see even not only in the Colombo District, Gampaha District, Kaluthara District various places there are certain roads which have been made but participation of the opposition are not been called to do this jobs. This should be avoided and we should see that the benefit should go to even the opposition members to serve the masses. So what I want to say today is, as a body which works together this Provincial Council to be productive, we must work together. We must go together and see that the entire funds which has been set aside for the benefit of the people being used in the proper way. So that the funds are not being wasted and people will get the maximum benefit through this funds.
ඒ හින්දා මම මේ අවස්ථාවේ කියන්න හදන්නේ, අපි පළාත් සභා මන්ත්‍රීවරුන් හැටියට එකමුතුවෙන් එකට වැඩ කරන්න ඕනෑ. ඉදිරියට යන්න ඕනෑ. අපි මේ පළාත් සභාව සාර්ථක ලෙස ඉදිරියට ගෙන යන්න නම් අපේ වැඩ කටයුතු අපි හරියාකාරයෙන් කරගෙන යන්න ඕනෑය කියන එකයි මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමැති වෙන්නේ. අපි දන්නවා, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අයවැය කථාවෙන් එදා එතුමා ප්‍රකාශ කළා තට්ටු 15 ගොඩනැගිල්ලක් කෝටි 4000 ක් වියදම් කරලා හදනවා

කියලා. බොහොම සන්තෝෂයි. නමුත් මේ අවස්ථාවේ මම අහන්න කැමැති වෙනවා. මේ පළාත් සභාව විසුරුවන්න හදනවා නම් මේ මුදල මේකට වියදම් කරන එක හරිද කියලා. ඇත්ත වශයෙන්ම දැන් මේ වාගේ මුදලක් වියදම් කරලා එහෙම කරනවා නම්, ඒක ජනතාවගේ සේවයක් හැටියටයි මම සලකන්නේ. ඒ නිසා මම නැවත වරක් ප්‍රකාශ කරන්න කැමැතියි -

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු මන්ත්‍රීතුමා, එහෙම තීරණයක් රජයේ නැහැ.

**ගරු පංචරත්නම් රාම්**
Hon. Panchrathnam Ram

ඇයි නැත්තේ? එදා කථාවේ තිබෙනවා. එහෙම දෙයක් තිබෙනවා. මම හිතන්නේ ඔබතුමා හරියට කියවලා නැහැ. ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ ඒ කථාවට අපි ඇහුම්කන් දුන්නා. කරුණාකරලා ඒ දිහා බලන්න. ඒ නිසා මම මේ කථාව අවසාන කරන්න ඉස්සෙල්ලා කියන්නේ -

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ජනාධිපතිතුමා -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ගරු ඇමැතිතුමා, එතුමාට අදහස් ප්‍රකාශ කරන්න ඉඩ දෙන්න. එතුමාගේ කාලයත් අවසන් වෙලා තිබෙන්නේ.

**ගරු පංචරත්නම් රාම්**
Hon. Panchrathnam Ram

මම හිතන්නේ අපේ ගරු ඇමැතිතුමා හරියට මේ පොත කියවලා නැහැ. එහෙම කියවලා නම් මෙතුමා මෙහෙම කථා කරන්නේ නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාගේ කථා කිරීමේ කාලය අවසන්.

**ගරු පංචරත්නම් රාම්**
Hon. Panchrathnam Ram

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බොහොම ස්තුතියි.

[ පූ.භා. 11.59 ]

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම හිතන්නේ මේ පළාත් සභා ක්‍රමය තුළ අපි වසර 25 කට පිය මැනලා තිබෙනවා. නිදහසින් පස්සේ බස්නාහිර පළාත් සභාව කියන්නේ, මේ රටේ තිබන දෙවන විශාලතම ප්‍රජාතන්ත්‍රවාදී පාලන අධිකාරියක් තිබෙන සභාවක්. රජයේ සිට පටන් ගත්තාම පළාත් සභාව, නගර සභාව ආදී කොට ඇති ආයතනවල සැලසුම් සහ ප්‍රතිපත්ති ක්‍රියාදාම අනුගමනය කරලා තිබෙනවා. නමුත් අපි දැකලා තිබෙන දෙයක් තමයි ඒ තිබෙන සැලසුම් නිසියාකාරයකින් ක්‍රියාත්මක නොවීමේ ගැටලුකාරී බව. පළාත් සභාවක් ගත්තත්, රජය ගත්තත්, නගර සභාව ගත්තත්, නැත්නම් වෙනත් ආයතනයක් ගත්තත් එම සෑම ආයතනයකම හොඳ සැලසුමක් තිබෙනවා. නමුත් ඒ සැලසුම ක්‍රියාත්මක කරගන්න පුළුවන් පසුබිමක් අපි නිර්මාණය කරගෙන නැහැ. නිර්මාණය කරගෙන නැතිවා පමණක් නොවෙයි. ඒවා අධීක්ෂණය කරන්නට, ඒවා පසු විපරම් කරන්නට අපි ඒකට කටයුතු කරලා නැහැ. ඒ නිසා මම හිතනවා මේ වාගේ වැදගත් අයවැය විවාදයකදී අපට දෙපැත්තට බෙදිලා ඕනෑ තරම් අදහස් ප්‍රකාශ කරන්නට පුළුවන්. මේ පසුගිය අවුරුදු 24 පුරාම අපි කළේ ඒක. නමුත් අද ජීවතුන් අතර නැතත් සුසිල් මුණසිංහ ගරු මහ ඇමැතිතුමාගෙන් පටන් අරගෙන ප්‍රසන්න රණතුංග ගරු මහ ඇමැතිතුමා දක්වා වසර 25 කට අපි ගමන් කරලා තිබෙනවා. මේ පළාත් සභා ක්‍රමය අපේ ඇඟට පටෝප්පු එකක්. අපේ ජාතියට පටෝප්පු එකක් තමයි පළාත් සභාව කියන්නේ. තවමත් එළියේ පළාත් සභාව ගැන කථා කරනකොට මහජනයාගේ පැත්තෙන් අපි කල්පනා කරලා බැලුවොත්, මේ පළාත් සභා ක්‍රමයත් එක්ක මහජනයා තවම අනුගත වෙලා නැහැ. මහජනයාගේ පැත්තෙන් ගත්තොත් ඒකට බලවත් විවේචනයක් තිබෙන්නේ. හැබැයි පසුගිය අවුරුදු 24 පුරාම අපි සලකා බැලුවාම ඒ සුදු අලියෙක් කියන මතය තුළ පටන් ගත්ත මේ පළාත් සභාව අද මහජනතාවට සමීප සම්බන්ධතාවයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා අද පළාත් සභාවෙන් පළාතේ අධ්‍යාපනය, පළාතේ සෞඛ්‍ය, පළාතේ මහා මාර්ග ඇතුළු යටිතල පහසුකම්, ඒ වාගේම ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ අපි ඉදිරියට ගිහිල්ලා තිබෙනවා.

එදා පළාත් සභාව පටන් ගන්න කොට සමගාමී ලැයිස්තුවේත්, ඒ වාගේම අපට වෙන් වුණු ලැයිස්තුවේත් අපට පැවරුණු කාර්යයන්වලදී පළාත් සභාව සුවිශේෂ කාර්යභාරයක් ඉෂ්ට කරලා තිබෙනවා. ඒක අපි අධ්‍යාපනය වශයෙන් ගත්තොත් එහෙම කොළඹ නගරයේ තිබෙන ආනන්ද, නාලන්ද, රාජකීය, විශාඛා, සිරිමාවෝ, දේවි බාලිකා වාගේ විද්‍යාල ජාතික පාසල් හැටියට තිබෙද්දී අපේ පළාත් සභාවෙන් උදුරාගෙන මෑත කාලයේ ජාතික පාසල් බවට පත් කරපු පාසල් අද ඇද වැටිලා තිබෙනවා. නමුත් අපේ පාලනය යටතේ තිබෙන ජනප්‍රිය පාසල් අද මේ පළාත් සභා පටන් ගන්නවාටත් වඩා තත්ත්වයකට ඉහළ නඟන්නට මේ පළාත් සභාවට පුළුවන්කමක් ලැබිලා තිබෙනවා. ඒ නිසා කාටත් ඇඟිල්ල දික් කරලා කියන්න බැහැ, මේ පළාත් සභාවෙන් වැඩක් වෙලා නැහැයි කියලා. මේ පළාත් සභාව සුදු අලියෙක් කියන මත තවදුරටත් ඉදිරියට ගෙනියන්න පුළුවන්කමක් නැහැ. දැන් අද බලන්න. මේ බලය විමධ්‍යගත කිරීම තුළ ජනතාවට අවශ්‍ය පහසුකම් නිර්මාණය වෙලා තිබෙනවා. අද ආදායම් බලපත්‍රයක් ගන්න ගියත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගිහිල්ලා රස්තියාදුවක් වෙන්නේ නැතිව එක විනාඩි 05 කින්, 10 කින්

ආදායම් බලපත්‍රයක් ලබා ගන්න පුළුවන් පරිසරයක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ නිසා ජාතික පාසල්වලට අභියෝග කළ හැකි අධ්‍යාපන ප්‍රතිපත්තියක් බස්නාහිර පළාත් සභාව ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ නිසා ජාතික පාසල් පරයමින් සෑම ශිෂ්‍යත්ව විභාගයේදීත්, සාමාන්‍ය පෙළ විභාගයේදීත් ඒ වාගේම උසස් පෙළ විභාගයේදීත් අපේ ජාතික පාසල්වල ඉන්න දරුවන්ට වඩා ඉහළ අධ්‍යාපන අගයක අපේ පළාත් සභාවේ දරුවෝ ඉන්නවා. ඒ නිසා අපි පසුගිය ශිෂ්‍යත්ව විභාගය විශ්ලේෂණය කළොත් ජාතික පාසල්වල දරුවන්ට වඩා අපේ දරුවෝ සමත් වෙලා තිබෙනවා. උදාහරණයක් හැටියට මම නියෝජනය කරන කොට්ඨාශයේ මහරගම තිබෙන ධර්මාශෝක කණිෂ්ට විද්‍යාලය. ජාතික පාසලක ශිෂ්‍යයන් ලකුණු 175 ට වඩා ලබා ගත්තු ප්‍රතිශතය කල්පනා කරලා බැලුවාම, ඒ කුඩා පාසලේ කණිෂ්ට පාසලේ දරුවන් වැඩි අගයකින් ලකුණු 175 ට වඩා ලබාගෙන සමත් වෙලා තිබෙනවා. ඒ නිසා ඒක එක රැයකින් සිද්ධ වුණු කාරණාවක් නොවෙයි. එය දේශපාලන අධිකාරියත්, ඒ වාගේම අධ්‍යාපනය සම්බන්ධ නිලධාරීනුත් එකතු වෙලා ගත් මහන්සියක ව්‍යායාමයක්. හැබැයි, මේ ඔක්කෝම කයිවාරු ගහන්න පුළුවන්. ඒ අධ්‍යාපන වර්ෂයේදී විභාගයට මුහුණ දෙන දරුවන් තුළ ඇති වන සාක්ෂරතාවය පදනම් කරගෙන. එහෙම නැත්නම් කාටවත් ඒකේ ගෞරවයක් ගන්න පුළුවන් එකක් නොවෙයි. ඒ නිසා අද කල්පනා කරලා බලන්න. අපි ගමක ග්‍රාම සේවා වසමක් ගත්තොත් එහෙම, සේවා සපයන්න කොයිතරම් නිලධාරීන් පිරිසක් ඉන්නවාද? ග්‍රාම නිලධාරී. පරිවාස නිලධාරී. ප්‍රජා සංවර්ධන නිලධාරී. සමාජ සේවා නිලධාරී. කාර්මික නිලධාරී. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු. ඒ වාගේම සමෘද්ධි සංවර්ධන නිලධාරීන්. කෘෂිකර්ම පර්යේෂණ නිලධාරීන්. පවුල් සෞඛ්‍ය සේවිකාව. දැන් රජය අලුතින් උපාධිධාරීනුත් ආදේශ කරලා තිබෙනවා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

අභ්‍යාසලාභීන්.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

අභ්‍යාසලාභීන්. ඒ අනුව නිලධාරීන් 10 දෙනෙක් එක ග්‍රාම සේවා වසමකට සේවය සපයන්න යොදවලා තිබෙනවා. ඒ නිසා අපි කොයිතරම් පුරසාරම් දෙඩුවත් යුද්ධයට මුහුණ දෙමිනුත්, යුද්ධ ජයග්‍රහණය කරමිනුත්, යුද්ධයෙන් පස්සෙත් මේ රටේ ජනතාව වෙනුවෙන් රජය වගේම මේ පළාත් සභාව ඉතා විශාල සේවාවක් කරලා තිබෙනවා. මම හිතන්නේ ලංකා ඉතිහාසයේ එක ගමකට නිලධාරීන් 10 දෙනෙක් සේවය කරනවා නම්, ඒ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය යටතේ කියන එක අපි මේ අවස්ථාවේ ගෞරවයෙන් ප්‍රකාශ කරන්න ඕනෑ. පසුගිය කාලේ ගංවතුරක් ගලනකොට දහස් ගණන් අපේ ජනතාව අවතැන් වෙනවා. නමුත් පසුගිය ධාරානිපාත වර්ෂාවේ එහෙම තත්ත්වයකට අපි මුහුණ දුන්නේ නැහැ. එදා සිංගප්පූරුව අපි තුළින් දැකලා හඳුනු දේ වාගේම අපි පසුගිය කාලේ සිංගප්පූරුවෙන් දැකපු දේ අද අපේ ලංකාව තුළ, අපේ කොළඹ නගරය තුළ විද්‍යාමාන වෙලා තිබෙනවා. ස්වභාව ධර්මයට අපි අද මුහුණ දීලා තිබෙනවා. යුද්ධයට, ප්‍රභාකරන්ට, ජාත්‍යන්තර බලවේගවලට ජනාධිපතිතුමා මුහුණ දුන්නා වාගේ, ආරක්ෂක ලේකම්තුමා මුහුණ දුන්නා වාගේ අද ස්වභාව ධර්මයේ අභියෝගවලට ආරක්ෂක ලේකම්තුමා ප්‍රමුඛ රජය මුහුණ දීලා තිබෙනවා. සාමාන්‍යයෙන් මීට වර්ෂයකට දෙකකට උඩදී සාමාන්‍ය වාර්ෂාවකින් අපේ ගම්වල 5000 ක් විතර අවතැන් වෙනවා. ගංවතුරට යට වෙනවා. පාරවල් කිහිපයකින් ගමනාගමනය කරන්න බැරි වෙනවා. නමුත් මේ සැරේ අපට එහෙම තත්ත්වයකට මුහුණ දෙන්න සිද්ධ වුණේ නැහැ. ඒ නිසා යුද්ධයෙන් පස්සේ ආරක්ෂක ලේකම්තුමාගේ නායකත්වයෙන් අපේ යුද්ධ හමුදාවේ සියලුම නිලධාරීන් කරන කැපවීම, ස්වභාව ධර්මයාගෙන් මේ රටේ ජනතාව බේරා ගන්න කරන කැපවීම යුද්ධයේදී වාගේම අපි මේ කාරණයේදීත් ඉතාමත් ගෞරවයෙන් සිහිපත් කරන්න ඕනෑ.

අද මුළු පළාත් සභාවම එකට ගත්තත්, අපි සියලු දෙනාම එකතු වෙලා පක්ෂ භේදයෙන් තොරව - අපේ විපක්ෂයට අද තිබෙන සංයුතිය අනුව මේ කිසිම පළාත් සභාවකට අභියෝග කරන්න පුළුවන්කමක් නැහැ. එහෙම කරලා ඒ අයගේ අයිතිවාසිකම් දිනාගන්න පුළුවන් පරිසරයක් නිර්මාණය වෙලා නැහැ. ඒ නිසා ජනතාව මේ රජය කෙරෙහිත් මේ පළාත් සභාව කෙරෙහිත් විශ්වාසය තබලා තිබෙනවා. ඒ නිසා යුද්ධයෙන් පස්සෙත් මේ රටේ ජනතාව පළාත් සභාවල බලය මේ පවතින රජයට ලබා දීලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයට මේ පළාත් සභා පහේම එක් වරක් විතරයි බලය ලබා ගන්න පුළුවන්කම ලැබුණේ. ඊට පස්සේ තිබුණු පළාත් සභා හතරේම බලය පොදුජන එක්සත් පෙරමුණට, එක්සත් ජනතා නිදහස් සන්ධානයට ලබා දීලා තිබෙනවා. ඒ තුළින් අපට ගම්‍ය වෙන්නේ, මේ රටේ සමස්ත ජනතාව පළාත් සභා ක්‍රමයේ ගැටළු තිබුණත්, අඩුපාඩු තිබුණත් මේ එක්සත් ජාතික පක්ෂයට වඩා කාර්ය භාරයක් මේ පළාත් සභාව තුළින් පසුගිය කාලේ අපේ රජය ඉෂ්ට කරලා තියෙනවයි කියන විශ්වාසය තිබෙනවා. ඒ නිසා අපි ජයග්‍රහණය කරලා තිබෙනවා. මේ ගමන නවත්වන්න පුළුවන්කමක් නැහැ. අපි ඉදිරියටත් යනවා. බොහොම ස්තූතියි.

[ අ.භා. 12.09 ]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බස්නාහිර පළාත් සභාවේ 25 වන වසර සමරන මේ අවස්ථාවේ ඉසුර දේවප්‍රිය මගේ හිතමිත්‍රයා මහරගම ප්‍රදේශයේ ප්‍රබල සමාජ සේවකයෙක් කථා කරලා ඉවර වුණාට පස්සේ කථා කිරීමට ලැබීම මා භාග්‍යයක් කොට සලකනවා. ඇත්තටම එතුමා සයිස් එකෙන් කොට වුණාට උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාට ශක්තියක් තිබෙන පුද්ගලයෙක් තමයි. කෙසේ වෙතත් එතුමා තමන්ට උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමාට කෙළින් කියන්න බැරි දේ, ගිහිල්ලා කියන්න බැරි දේ අද විවෘතව ප්‍රකාශ කළා. ඒ ගැන අපි

සතුටු වෙනවා. ඒ කියන්නේ, පළාත් සභා ක්‍රමය හොඳයි කියන තැනට එතුමා ගෙනාවා. හැබැයි, එතුමාත් දේශපාලනය ආරම්භ කළේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්ම නොවෙයි. කෙසේ වෙතත් ඒ ස්ථාවරයට පැමිණීම සම්බන්ධව අපි අපේ ස්තුතිය ප්‍රකාශ කරන්න ඕනෑ. අද පොදු සාකච්ඡාවට අපි මේ කථා කරන්නේ. පොදු සාකච්ඡාවේදී ඕනෑම දෙයක් කථා කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද පළාත් සභාවේ 13 වැනි සංශෝධනය ගැන ලංකාවම කථා කරන වෙලාවක්. පෙළක් උදවිය පළාත් සභා ක්‍රමය හොඳයි කියනවා. පෙළක් උදවිය පළාත් සභා ක්‍රමය ආරක්ෂා කරන්න හදනවා. අපේ බස්නාහිර පළාත් සභාවේ උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා ඇතුළු හෙළ උරුමයේ කට්ටිය ඇමැතිකම තියෙද්දී, ඇමැතිකමේ තිබෙන වරප්‍රසාදත් අරගෙන පළාත් සභා ක්‍රමය එපා කියනවා. මේක තමයි යථාර්ථය. එහෙම තියෙද්දී ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමා අවුරුදු 25 ක අද බස්නාහිර පළාත් සභාවේ තිබෙන ක්‍රියාදාමය, ජාතික පාසල් අභිබවා යන්න පුළුවන් ශක්තිය අද ප්‍රධාන අමාත්‍යතුමාව වර්ණනා කරලා කථා කළා. ඉතින් එවැනි අවස්ථාවක මම කියන්න කැමැතියි. ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමා කිව්වා විපක්ෂයට බහුතරයක් නැහැ. විපක්ෂය අපට අවශ්‍ය නැහැ කියන එක තමයි එතුමාගේ කථාවේදී ගම්‍ය වුණේ. ඒ වුණත් අද විවාදයක් ඇති වෙන්නෙත් විපක්ෂයක් තිබුණොත් තමයි. ඒක තේරුම් ගන්න ඕනෑ. විපක්ෂයක් තිබුණොත් තමයි අද මේ අයවැය විවාදය හරි ඇති වෙන්නේ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ජනතාව කියන්නේ විපක්ෂයක් ඕනෑ නැහැයි කියලා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒක පෙන්නනන්නම් කෝ? පොඩ්ඩක් ඉන්න. ඉස්සරහාට බලමු ඒක.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ශක්තිමත් විපක්ෂ නායකවරයෙක් ඉන්නවා නේ? අවුරුදු 06 කට අපි ඒක හදාගත්තා නේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අනේ හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඉන්න. අර බියගම විලේජ් (බාධා කිරීම්) එකට ජීප් එක භාර දෙන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ශක්තිමත් විපක්ෂයක් –

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා මූලාසනට කථා කරන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමා කියපු කථාවෙන් තමයි පටන් ගන්න යන්නේ. අපි විපක්ෂයේ මන්ත්‍රීවරු. බහුතරයක් නැති වෙන්න පුළුවන්. කුඩම්මාගේ සැලකිල්ලෙන් සැලකීම වැරැදියි. අපට ලක්ෂ 35 ක් දෙනකොට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ලක්ෂ 50 ක් දෙනවා. එතකොට අපට අමාත්‍යාංශයෙන් මුකුත් නැහැ. ලක්ෂ 200, 300 අමාත්‍යාංශයෙන් වෙන් කරනවා. හැබැයි, බස්නාහිර පළාත් සභාවේ ඇවිල්ලා විවාද කරන්න උත්සාහ කරනවා. ඇත්තටම මේක සදාචාරාත්මක නැහැ. එහෙම තියෙද්දී තමයි උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා එතුමාගේ වරප්‍රසාද ගන්නේ. එහෙම තියෙද්දී තමයි ත්‍රීවීල්වලට ගිහිල්ලා මීටර් දෙන්නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ත්‍රීවිල් උදවියට. මේක –

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මේ රටේ ජනතාව කොහෙන් හරි දෙන්න පුළුවන් නම් හොඳයි නේද? ඇයි UNP අයටත් දීලා තියෙන්නේ. UNP, ශ්‍රී ලංකා කියලා බලලා නැහැ. කැලණියේ තමුන්නාන්සේගේ මස්සිනාටත් දීලා තියෙන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මගේ මස්සිනාට දුන්නා කියලා ඔප්පු කරන්න. ඔබතුමා තමයි ගිහිල්ලා අර බියගම විලේජ් එකේ පෙජරෝ එක අරගෙන ආවේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මගේ පෙජරෝ එක මම අරගෙන එන්නේ නැතුව කවුරු අරගෙන එන්නද?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගිහිල්ලා මොන්ටෙරෝ එක උස්සගෙන ආවේ කවුද?

[සභාවේ ඝෝෂා]

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, ඔබතුමාට තව විනාඩියයි තියෙන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එම නිසා අපි ඉල්ලීමක් කරනවා විපක්ෂයට කුඩම්මාගේ සැලකිලි කරන්න එපා. අපි සාධාරණව මේ ගමන යමු. විපක්ෂයේත් සහයෝගය ඇතුව

ඡන්දය ජයග්‍රහණය කරන්න පුළුවන්. පරාජය වෙන්න පුළුවන්. මෙතැනට ආවේ සංවර්ධනය කරන්න නම් මන්ත්‍රීවරු එක හා සමානව සලකලා මේ ගමන යන්න පොදු සාකච්ඡාව තුළ මම ගම්‍ය කරන්න උත්සාහ කරන්නේ ඒකයි. එහෙම නම් ඒ දේ කරන්න. ගරු ප්‍රධාන ඇමැතිතුමා මාර්ගයෙන් ඒ ශක්තිය දෙන්න කියලා ඉල්ලීමක් කරන්නේ. ඒ වාගේම මේ පළාත් සභාවේ අමාත්‍ය ධූරයක් දරන උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාට කියනවා. අනෙක් පළාත් සභා විවාදයට ඉස්සෙල්ලා පුළුවන් නම් අභියෝග කරනවා, මේ ඇමැතිකම දාලා ගිහිල්ලා ජනතාවට පෙන්වන්න. ඔබතුමාගේ තිබෙන නිදහස් සටන පෙන්වන්න කියලා අභියෝග කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[ අ.භා. 12.14 ]

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බස්නාහිර පළාත් සභාවේ අවුරුදු 24 ක් ගෙවිලා, 25 වැනි පළාත් සභා අයවැය සාකච්ඡා කරන අවස්ථාවේ පොදු සාකච්ඡාව වෙලාවේ අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් මේ දිනවල හැම කෙනාගේම අදහස් පළ වෙන්නේ, 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා ඇති වුණු මේ පළාත් සභාව එක පැත්තකින් අහෝසි කරනවාද නැද්ද කියන මතිමතාන්තරයි. එවැන්නක් සාකච්ඡා වන වෙලාවේ අපේ පළාත් සභාව අවුරුදු 24 ක් ගෙවිලා 25 වැනි අයවැය සාකච්ඡා කරන අවස්ථාව, ඉතාමත් වැදගත් අවස්ථාවක්. විශේෂයෙන්ම විපක්ෂයේ පාර්ශවයෙන් විවිධ චෝදනා ඉදිරිපත් කරන්න යෙදුණා. අපේ උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා බොහොම පැහැදිලිව මේ සභාවේ අවස්ථා කිහිපයකදීම සඳහන් කළා එතුමාගේ ස්ථාවරය. එතුමාගේ ස්ථාවරය ඒක. නමුත් එතුමාට මේ තනතුරේ ඉඳගෙන ජනතාව වෙනුවෙන් සේවය කරන්න එතුමාගේ අමාත්‍යාංශය හරහා විශාල වැඩ කොටසක් මේ වනකොට ක්‍රියාත්මක කරලා තිබෙන බව මේ සභාවට බොහොම ගෞරවයෙන් සඳහන් කරන්න කැමැතියි. ඒ වාගේම තමයි මේ 13 වැනි සංශෝධනය හරහා ඇති වුණු පළාත් සභා ක්‍රමය තුළ පළාත් සභාවට අයිති විෂයයන් සහ ඒවායේ බලය පිළිබඳ යම් තීරණාත්මක සාකච්ඡාවක් සිදු වන මොහොතක මෙහි යම් යම් සංශෝධන අවශ්‍යයි කියන කාරණයේ මා පෞද්ගලික ඉන්නවා කියන එක මගේ මතය හැටියටත් මම ප්‍රකාශ කරන්න කැමැතියි. විශේෂයෙන්, අපට තිබෙන මේ අත්දැකීමත් එක්ක මගේ දෙවැනි පළාත් සභා වාරය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට මගේ පෞද්ගලික අදහස, මේ පළාත් සභා විෂයය තුළ ඉඩම් බලතල සහ පොලිස් බලතල පළාත් සභාවට අවශ්‍යයි කියලා මම විශ්වාස කරන්නේ නැහැ. අපේ වපසරිය තුළ අපට අවශ්‍ය මේ පළාත් සභාවේ තිබෙන බලතල ක්‍රියාත්මක කිරීම සහ ජනතාව වෙනුවෙන් සුභසාධන සේවාවන් පවත්වාගෙන යාම සඳහායි. මා පෞද්ගලිකව විශ්වාස කරන කාරණය තමයි පොලිස් බලතල සහ ඉඩම් බලතල අවශ්‍ය නැහැයි කියන කාරණය. ඒක මගේ පෞද්ගලික අදහස. එහෙම නැති වුණාට අපි මේ වනකොට ඒවා ක්‍රියාවේ යොදවලා නැති වුණත් ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් පළාත් සභාව හරහා සිද්ධ කරන්නට ඕනෑ අවශ්‍ය සේවාවන් අපි සිද්ධ කරලා තිබෙනවා කියන කාරණය මම මතක් කරනවා. විශේෂයෙන් මේ පළාත් සභාවට අයිති විෂයයන් තුළ තිබෙන ප්‍රධානතම විෂයය අධ්‍යාපන විෂයය. අද විපක්ෂය මොනතරම් චෝදනා නගන්න හැදුවත් ඒ අයට කරුණු ගොනු කරන ගන්න බැහැ. බස්නාහිර පළාත් සභාව තුළ අධ්‍යාපන විෂයය හරහා අද ජාතික පාසල් අභිබවා යන සංවර්ධනාත්මක අධ්‍යාපනයේ ගුණාත්මක මට්ටමක බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපනය තිබෙනවා කියන කාරණය මම බොහොම පැහැදිලිව කියනවා.

ඒ වාගේම විශේෂයෙන්ම මම ඉතාම ගරු කරනවා. ආරම්භයේදී විපක්ෂයෙන් සඳහන් කරන්න හැදුවා "සුපසන් නිම්තෙර" අධ්‍යාපනික වැඩ සටහන් පිළිබඳව. අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ උපදෙස් මත මේ ගිය සතියේ ඉඳලා ඊයේ වනතුරු ක්‍රියාත්මක වුණු පාසල් තුළට ගොස් පාසල්වල පසුගිය වසරවල් තුනක අධ්‍යාපනයේ ප්‍රගතිය පිළිබඳ අධීක්ෂණ ක්‍රියාවලිය - මේ වෙලාවේ අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඉන්නවා. මේක ඉතාම විශිෂ්ට වැඩ පිළිවෙළක්. මම හිතන්නේ, ලංකාවේ කිසිම පළාත් සභාවක ක්‍රියාත්මක නොවුණු මහ ආණ්ඩුවේ ජාතික පාසල් තුළ පවා ක්‍රියාත්මක නොවුණු විශිෂ්ට වැඩ පිළිවෙළක් පසුගිය දින කිහිපය පුරා අපේ ප්‍රදේශවල පාසල් තුළ ක්‍රියාත්මක කළා. මෙහිදී පාසලක අධ්‍යාපනයේ ගුණාත්මක මට්ටම මොකක්ද කියන එක හැම කෙනාම අවබෝධ කරගෙන 2013 වසරේ ඉලක්ක කරා යන්නේ කොහොමද කියන වැඩ පිළිවෙළ හඳුනා ගන්නට සහ ක්‍රියාත්මක කර ගන්නට ඉතාම හොඳ උත්තේජනයක් මේ අධීක්ෂණ ක්‍රියාවලිය තුළ පසුගිය වසරවල් කිහිපයක විභාග ප්‍රතිඵල විශ්ලේෂණය කිරීම තුළින් අපට හඳුනා ගන්න ලැබුණා. මම ඒ සම්බන්ධව ගරු ප්‍රධාන ඇමැතිතුමාට ගෞරවනීය ලෙස ස්තුතිවන්ත වෙනවා. මේ ක්‍රියාවලිය ඔබතුමාගේ අදහසක් අනුව ක්‍රියාත්මක කරලා අපට හොඳ වැඩ පිළිවෙළක් අනාගතයේ ඇති කරන්න පුළුවන් වුණු කාරණය බව මතක් කරන්න කැමැතියි. මම ඊට වැඩිය අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳව සඳහන් කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

විශේෂයෙන්ම මට ප්‍රවාහන අමාත්‍යාංශයේ විෂයයන් කිහිපයක් සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරන්න අවශ්‍ය වෙනවා. විශේෂයෙන්ම ප්‍රවාහන අධිකාරිය සම්බන්ධයෙන් යමක් ප්‍රකාශ කිරීමේදී මම ඉතාම කනගාටු වෙනවා. ප්‍රවාහන අමාත්‍යතුමාත්, ප්‍රවාහන අධිකාරියේ නිලධාරීනුත් අපව ගෙන්වලා මේ අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළ පිළිබඳව දැනුවත් කරන වැඩ සටහනේ අපට ලබා දීපු දත්තයන් පිළිබඳව ගැටළුවක් තිබෙනවා. මම දන්නේ නැහැ, මේ නිලධාරී මහත්වරු අපව බුරුවෝ, හරක් ගාණට දාලාද මේවා ඉදිරිපත් කරන්නේ කියලා. ඒ ගැටළුව මට තිබෙනවා. එදා දැනුවත් කිරීමේදී අපට ලබා දීපු අයවැය සාකච්ඡා පොතේ 2013 අයවැය සාකච්ඡාව, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය. මෙකේ සඳහන් කරලා තිබෙනවා, දිනකට ප්‍රවාහනය කරනු ලබන මගීන් සංඛ්‍යාව ලක්ෂ 29 යි. ඒ වාගේම අද

උදේ මේ සභාවට එනකොට මට ප්‍රවාහන අමාත්‍යාංශයේ සියලු විස්තර ඇතුළත් පොතක් ලබා දුන්නා. මේ පොතේ 13 වැනි පිටුවේ තිබෙනවා, බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය කියන කාරණාව යටතේ,

*"බස්නාහිර පළාත තුළ වෙසෙන දිනකට ලක්ෂ 05 කට ආසන්න වූ මගී ප්‍රජාවගේ හිතසුව පිණිස වන මගී ප්‍රවාහන සේවයක් ලබා දෙනවා"* කියලා.

මේ ප්‍රවාහන අධිකාරියෙන් අපට ගිය සතියේ දීපු වාර්තාවේ සඳහන් කරලා තිබෙනවා, ලක්ෂ 29 ක් මගී ජනතාව ප්‍රවාහනය කරනවා කියලා. අද උදේ දීපු පොතේ ලක්ෂ 05 ක්. මම දන්නේ නැහැ, මේ නිලධාරී මහත්වරු අපව මෝඩයෝ ගාණට දාලා මේවා දෙනවාද කියලා. දිගින් දිගටම මේ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කිරීම සිද්ධ වෙනවා. මේවා මෙහෙම වෙන්න බැහැයි කියන කාරණය මම මතක් කරනවා. විශේෂයෙන් ප්‍රවාහන අමාත්‍යතුමා ප්‍රවාහන ක්ෂේත්‍රය දියුණු කරන්න වැඩ පිළිවෙළවල් ගෙන යන වෙලාවේ නිලධාරී මහත්වරු ඒකට අනුගත වෙලා, ඒ අමාත්‍යතුමා ගෙනියන වැඩ පිළිවෙළ ශක්තිමත් කරලා, ක්‍රියාවේ යොදවන්න සහාය නොදෙන තත්ත්වයක් තමයි අපට දකින්නට තිබෙන්නේ. විශේෂයෙන් ප්‍රවාහන අධිකාරියෙන් සේවාවන් සපයා ගන්න එන ජනතාව විශාල අපපසුතාවයන් රාශියකට පත් වෙනවා. මේ ප්‍රවාහන අධිකාරියේ ඉන්න අය මුදලක් තමන්ගේ සාක්කුවට දාගන්නේ නැතුව කිසිම සේවාවක් ප්‍රවාහන අධිකාරිය හරහා ලබා නොදෙන තත්ත්වයකට අද බස්නාහිර පළාතේ ප්‍රවාහන අධිකාරිය පත් වෙලා තිබෙනවා කියන කාරණය මම පැහැදිලිව සඳහන් කරනවා. මේවාට අවශ්‍ය සාක්ෂිත් මට ඉදිරි අයවැය අවස්ථාවකදී සභාගත කරන්න වුණත් පුළුවන් කියන කාරණය මම මතක් කරනවා.

ප්‍රවාහන අමාත්‍යතුමා බස්නාහිර පළාතේ ප්‍රවාහන සේවය දියුණු කරන්න විශාල වැඩ කොටසක් කරගෙන යන වෙලාවේ මේ අවුරුද්දේ නව බස් නැවතුම් පොළවල් හතරක් සම්පූර්ණයෙන් ඉදි කරලා අවසන් කරලා කෝටි 30 කට වැඩි මුදලක් වෙන් කරලා වැඩ කටයුතු ක්‍රියාත්මක කරලා තිබෙනවා. බස්නාහිර පළාතේ මගී ප්‍රවාහනයෙන් ජනතාවට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න. විශේෂයෙන් මම නියෝජනය කරන දෙල්ගොඩ නගරයේ බස් නැවතුම් පොළ වසර ගණනාවක ඉඳලා ඉදි කර ගන්න බැරිව තිබුණු වෙලාවේ, මෙතුමාගේ මැදිහත් වීම මත කෝටි 6 කට වැඩි මුදලක් වෙන් කරලා අද අපට හොඳ අංග සම්පූර්ණ නවීන පහසුකම් ඇති බස් නැවතුම් පොළක් ඉදි කරලා දී තිබෙනවා. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය හරහා අවධානයට යොමු කරනවා. ප්‍රවාහන අධිකාරිය හරහා ඉතාමත් ඉක්මණට

[ ගරු ගුණසිරි ජයනාත් ]

සිද්ධ වෙන්න ඕනෑ කාරණයක් තමයි ත්‍රීරෝද රථ ප්‍රඥප්තිය. තවම අපට ක්‍රියාවේ යොදවන්නට බැරි වෙලා තිබෙනවා. අද අපේ ප්‍රදේශවල ඉන්න ත්‍රීරෝද රථ රියදුරු මහත්ම මහත්මීන්ට මේ ත්‍රීරෝද රථය ලියාපදිංචි කර ගන්න ස්ථානයක් නැතුව විශාල අපහසුතාවයකට පත් වෙලා තිබෙනවා. මේ ප්‍රඥප්තිය අපේ පළාත් සභාවේ සම්මත කර ගත්තාට එහි තිබෙන අඩුපාඩු නිසා ක්‍රියාවේ යොදවන්නට බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මේක ඉක්මණින් ක්‍රියාත්මක කරන්න කටයුතු යොදන්නයි කියන කාරණය මතක් කරනවා. ඒ වාගේම අපේ ගරු ඇමැතිතුමා සඳහන් කරලා තිබෙනවා, අපේ පෞද්ගලික බස් රථ සේවයේ රාත්‍රී 08.00 න් පස්සේ ගමන් වාර යොදවන බවට. ඇත්තටම මේක ප්‍රමාණවත් මදී. ප්‍රමාණවත් මදී පමණක් නොවෙයි, හරියට ක්‍රියාවේ යෙදවෙන්නේ නැහැ. අද ප්‍රවාහන ක්ෂේත්‍රයේ 70% කට වැඩිය පෞද්ගලික බස් රථ සේවයක් තමයි සේවා පහසුකම් සපයන්නේ. නමුත් රාත්‍රී 6.00 න් 7.00 න් පස්සේ සේවයේ යෙදෙන බස් රථ ප්‍රමාණය ඉතාම අල්පයි. මේ සඳහා විශේෂ වූ වැඩ පිළිවෙළක් ප්‍රවාහන අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක කළ යුතුයි කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 12.21 ]

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පොදු සාකච්ඡාව සඳහා අදහස් ප්‍රකාශ කිරීමට, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම මේ අයවැය දිහා බැලුවාම, මේ බස්නාහිර පළාත් සභාවේ මෙහෙම අයවැයක් ඉදිරිපත් කරද්දී, මට හිතාගන්න බැහැ කොහොමද මේ ලංකාව ආශ්චර්යයට ගෙන යන්නේ කියලා. මේකේ වැරැද්දක් නැහැ. ලෝක බැංකුවට ඕනෑ විදියට මහ ආණ්ඩුවත් අයවැයක් ඉදිරිපත් කළා. මේ අයවැය ඉදිරිපත් කරලා තිබෙන්නේ, බස්නාහිර පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ගේ මන්ත්‍රීකම රැක ගන්න. මේකේ තියෙන්නේ සද්දේ විතරයි. ලොකු ඉලක්කම් හරඹයක් තිබෙනවා. විසිල් විතරයි තියෙන්නේ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

බල්ට් නැහැ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ජනතාව බලාගෙන ඉන්නවා බල්ට් ගහයි කියලා. බල්ට් නැහැ. බැලුවාම බල්ට් නැහැ. මහ ආණ්ඩුවේ අයවැයත් එහෙම තමයි.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

සමුළුව ඇතුළේද හිටියේ? පිටතද හිටියේ?

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

මහ ආණ්ඩුවත් එහෙමයි. ජනතාව බලාගෙන හිටියා අයවැයෙන් බඩගින්නට උත්තරයක් දෙයි කියලා. නමුත් දුන්නේ පුතාට ලැම්බෝගිනි.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඔබතුමන්ලාට බල්ටිත් නැහැ. විසිලුත් නැහැ. ඒ ඔක්කෝම අපට.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ඒක තමයි මේ අයවැයෙන් බස්නාහිර පළාතත් සංවර්ධනය කරයි කියලා බලාගෙන ඉන්නවා. අනේ දෙයියනේ මේ අයවැයෙනුත් වෙන්නේ පළාතේ ඉන්න ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු සංවර්ධනය කරන එක විතරයි. ඒ නිසා තමයි අපි කිව්වේ, මේකේ තිබෙන්නේ විසිල් විතරයි. ජනතාව බලාගෙන ඉන්නවා. නමුත් බල්ටි නැහැ. 2013 අවුරුද්ද ඉවර වෙනකනුත් බල්ටි නැහැ. එහෙම අයවැයක් තමයි ඉදිරිපත් කරන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමාට කොහොමත් ගම්පහ බල්ටි ගහන්න බැහැ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බලාපොරොත්තු වෙලා ඉන්නවා. ඒ විතරක් නොවෙයි. මේ අයවැය කියවනකොට බදු වැඩි කරනවා. අපි දැක්කා, ඊයේ පෙරේදා පත්තරේ තිබෙනවා, බදු වැඩි කිරීම නිසා බැංකු ණය ගෙවන්න බැරුව ව්‍යාපාරිකයෝ දිවි නසා ගන්නවා. (බාධා කිරීමක්) ලැම්බෝගිනි තමයි අපට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කථා කරන ප්‍රකාශය දිහා බලද්දී අධ්‍යාපන ඇමැතිතුමා විශේෂයෙන්ම අවධානය යොමු කරලා තිබුණා, පහේ ශිෂ්‍යත්ව ළමුන්ගේ ලකුණු 100 ට වඩා වැඩි කරන්න ඕනැය කියලා. එහෙම නම් එතුමාට තිබෙන්නේ ප්‍රශ්න පත්‍ර හදන කෙනාට ලෙහෙසියට ප්‍රශ්න පත්‍ර හදන්න කියන්න. වෙන දෙයක් නොවෙයි. මොකද, අපි දකිනවා. අපේ ප්‍රජාව නාස්ති වෙනවා මේ පහේ ශිෂ්‍යත්ව ක්‍රමය නිසා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවධානය යොමු කරන්න. පහේ ශිෂ්‍යත්වය කරවන එක නොවෙයි තියෙන්නේ. දරුවන්ට හොඳ පාසල් ටිකක් ගොඩ නහලා පහේ ශිෂ්‍යත්වය පුළුවන් නම් නැති කරන්න කියන එකට විශේෂයෙන්ම අවධානය යොමු කරන්න කියනවා. මොකද, අද දෙමව්පියෝ දරුවන්ට පහේ ශිෂ්‍යත්වය කරවන්නේ ඉස්කෝලයක් හොයා ගන්න. වෙන දෙයකට නොවෙයි. දරුවාට දැනුම දෙන්න නොවෙයි. පහේ ශිෂ්‍යත්වය කරවන්නේ ඉස්කෝලයක් හොයා ගන්න. නමුත් ඔබතුමා කොපමණ මහන්සි වුණත්, පහේ ශිෂ්‍යත්වයෙන් ලකුණු 100 ට වැඩිය ගත්තු ළමුන් හදන්න ඕනැ කියලා ඔබතුමා මහන්සි වුණාට ටියුෂන් කඩ තමයි තියෙන්නේ. සෙනසුරාදා, ඉරිදාට ගම්පහ නගරයේ යන්න තැනක් නැහැ. පුංචි දරුවෝ අරගෙන ඇවිල්ලා ටියුෂන් පන්තියට දාගන්න අම්මලා පෝළිමේ ඉන්නවා. මම දන්නේ නැහැ, අධ්‍යාපනයෙන් එහෙම දෙයක් කරනවාද කියලා. මේක එන්න එන්න රේස් එකක් කරලා, ඉවර වෙන්නේ නැති දෙයක් කරලා පහේ ශිෂ්‍යත්ව ක්‍රමය නිසා මේ සමාජය විනාශ කරලා දානවා. විශේෂයෙන්ම, ගම්පහ දිස්ත්‍රික්කයේ බස්නාහිර පළාතේ දෙමව්පියෝ බලාපොරොත්තු වෙන්නේ උගතුන් බිහි කරන්න. මේ පහේ ශිෂ්‍යත්වය නිසා උගතුන් නොවෙයි බිහි කරන්නේ. දැනුම තියෙන මිනිස්සු බිහි කරන සමාජයක් හදන්නේ. විභාග පාස් වන සමාජයක් මිසක් වැඩ කරන සමාජයක් නොවෙයි. විශේෂයෙන්ම අවධානය යොමු කරන්න ඕනැ. උගතෙක් බිහි කරන්න නම් දැනුම, කුසලතා, ආකල්ප මේ තුනම එකතු වෙන්න ඕනැ. පහේ ශිෂ්‍යත්වය පාස් කරවනවා කියන්නේ, දැනුම වැඩි කරන එක විතරයි වෙන්නේ. කුසලතා නැහැ. ආකල්ප නැහැ. නමුත් උගතෙක් බිහි කරනවා නම් දැනුම සඳහා දෙන ලකුණු ප්‍රමාණය සියයට සියයක් දැනුම තියෙන කෙනාට දෙන ප්‍රමාණය ලකුණු 10 යි. කුසලතාවය සියයට සියයක් තියෙනවා නම් ලකුණු 25 ක් හම්බ වෙනවා. ආකල්ප ශක්තිමත් පුද්ගලයාට තමයි ලකුණු 65 ක් හම්බ වෙන්නේ.

එහෙම නම් මම හිතනවා. අපි පටන් ගන්නකොටම අධ්‍යාපන ප්‍රතිපත්තිය පොඩ්ඩක් වරද්දලා තියෙනවා. විභාගයට ලකුණු ගන්න මිනිස්සු බිහි කරන්නයි හදන්නේ. විභාගයට ලකුණු ගන්න මිනිස්සු නොවෙයි, උගතුන් බිහි කිරීමට අවධානය යොමු කරන්න. විභාග පාස් වෙන අය නොවෙයි. මොකද, අපි දන්නවා මේ ලෝකේ ශ්‍රේෂ්ට පුද්ගලයෝ බිහි වෙලා තියෙන්නේ, විභාග පාස් වෙලා නොවෙයි. ආකල්ප ශක්තිමත් පුද්ගලයෝ තමයි ශ්‍රේෂ්ට පුද්ගලයෝ හැටියට බිහි වෙලා තියෙන්නේ. ඒ වාගේම මේක කියවනකොට අපි දැක්කා, දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කරනවා කියලා. ඇයි දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කරන්නේ? බලෙන් කරන්න එපා. මිනිස්සුන්ගේ අවශ්‍යතාවය තියෙන්න ඕනැ. එහෙම නම් අද දහම් පාසල් යන්නේ නැත්තේ ඇයි?

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

කිසිම අවස්ථාවක දහම් පාසල් අනිවාර්ය කරන්න කියලා නැහැ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

හරි. මේකේ කථා කරලා තිබෙනවා, ඒ ගැන උනන්දු කරන්න ඕනැයි කියලා. හැබැයි, මම කියනවා ඔබතුමාගේ ක්‍රමය වැරැදියි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ක්‍රමය වැරැදියි. ඇයි අද දරුවෝ දහම් පාසල් යන්නේ නැත්තේ? දෙමව්පියන්ට යවන්න ඕනැ නැතිකම නොවෙයි. ටියුෂන් පන්ති නිසා යන්නේ නැත්තේ. ඇයි ටියුෂන් පන්ති තියෙන්නේ. අර කියනවා වාගේ ලකුණු ගන්න විභාග ක්‍රමයක් හරිගස්සලා තියෙන නිසා යන්නේ නැත්තේ. එහෙම නම් ඔය පහේ ශිෂ්‍යත්ව ක්‍රමය අහෝසි කරලා ඕකට වියදම්

කරන සල්ලි ටික අරගෙන පාසල් ටික දියුණු කරන්න. ගම්වල පාසල් ශක්තිමත් කරන්න. නිකම්ම පහේ ශිෂ්‍යත්වයට උනන්දුව නැති වෙයි. නිකම්ම දහම් පාසල් යන්න පටන් ගනියි. එහෙම නම් ආකල්ප ශක්තිමත් පුද්ගලයෝ සමාජයේ බිහි වෙන්න පටන් ගනී. එම නිසා මේ ප්‍රතිපත්තිය වෙනස් කරන්න කියලා විශේෂයෙන්ම ඉල්ලනවා. ඒ වාගේම අපි දැක්කා, දැඩි අවධානයක් යොමු කරලා තිබෙනවා කැළි කසළ පාවිච්චි කරලා විදුලිය හදන්න ඕනෑය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා පරිසර අමාත්‍යාංශයේ සභාපති වෙලා ඉන්නකොට මම නගරාධිපතිවරයා වශයෙන් කටයුතු කළා. අපි විවිධ රටවල සංචාරය කළා. ඔබතුමාගේ මග පෙන්වීම යටතේ. සංචාරය කළාම අපි දැක්කා, මෙහෙම ආසියාවේ කුණු කසලවලින් විදුලිය නිෂ්පාදනය කරන්න බැහැ. ඒක පාඩුයි. අපි වාගේ කෘෂිකර්ම රටකට හරි යන්නේ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරන එක. නමුත් විදුලිය නිෂ්පාදනය කරන -

**ගරු නිමල් ලාන්සා** (මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යතුමා)
Hon. Nimal Lansa - (Minister of Road Development, Animal Production and Development, Housing and Construction, Fisheries and Tourism)

ඕක නම් මාර ඊර්ෂ්‍යාවක්.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

හොයලා බලන්න. මේ අපේ සල්ලි නාස්ති කරන්නේ. ඊර්ෂ්‍යාව නොවෙයි. අපේ ජනතාවට බඩගින්න නිවා ගන්න දහලන වෙලාවේ ලැම්බෝගිනි දීලා හරි යන්නේ නැහැ. ඒකයි මම කිව්වේ (බාධා කිරීමක්)

**ගරු අජ්මාල් මවුජුඩ්**
Hon. Ajmaal Maujud

ඉන්න, ඉන්න. ලැම්බෝගිනි ගැන හොඳට දෙන්නම්.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ඒ නිසා මම විශේෂයෙන්ම කියනවා, අවධානය යොමු කරන්න. දිරන කුණු කසළවලින් අපට කවදාවත් විදුලිය නිපදවන්න බැහැ. ලංකාව වාගේ රටකට ඒක පාඩුයි. මොකද, ලංකාවේ තියෙන්නේ තෙතමනයෙන් පිරි කසළ. ඒ ගැන විශේෂයෙන්ම හිතන්න. මේ සල්ලි නාස්ති කරන්න එපා. ඒ වාගේම සෞඛ්‍ය ඇමැතිතුමා ගිලන් රථවලට - මම කියන්නේ, ගරු ප්‍රධාන ඇමැතිතුමා මේ පළාත් සභාවේ ගිලන් රථවලට වැඩි අවධානයක් යොමු කරනවා. ඇයි ගිලන් රථ දෙන්නේ? ඉස්පිරිතාලවල බෙහෙත් නැති නිසා. ඇයි වෙන ඉස්පිරිතාලයකට Transfer කරන්න වෙලා. ඒ නිසා ගිලන් රථ හොයනවාට වඩා ඉස්පිරිතාලවල බොහෙත් ටික හරියට ලැහැස්ති කරනවා නම් හොඳයි. එතකොට

[ ගරු අජිත් මාන්නප්පෙරුම ]

ඔය ගිලන් රථ ඔය තරම් ඕනෑ වෙන්නේ නැහැ. ඒ ලෙඩාව සුව කරන්න ඒ ඉස්පිරිතාලෙටත් පුළුවන්කම ඇති වෙනවා. (බාධා කිරීම්) ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියලා විශේෂයෙන්ම ඉල්ලනවා.

ඒ වාගේම වැන්දඹු දිරිය මාතා සංකල්පය. මම දන්නේ නැහැ, දැන් ඒක ක්‍රියාත්මක වෙනවාද කියලා. මම දන්න විධියට නම් වර්තමානයේ ඒක ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒක අවශ්‍ය දෙයක්. ඒ පිළිබඳව අවධානය යොමු කරන්න. මේ පොතට විතරක් ඒක සීමා කරන්න එපා. වර්තමානය වනකොට මම දකිනවා ඒක ක්‍රියාත්මක වෙන්නේ නැහැයි කියලා. ඒ වාගේම ළමා ආරක්ෂාව ගැන කථා කළා. අද ළමා ආරක්ෂාව නැහැ. කිසිම ළමා නිවාසයක පිරිමි හෝ ගැහැණු දරුවෙකුට තමුන්ගේ ආරක්ෂාව පිට ඉන්න විධියක් නැහැ. ඒ ගැන පසු විපරමක් කෙරෙන්නේ නැහැයි කියන එක තමයි අපි දකින්නේ. ඒ විතරක් නොවෙයි. පුරන් කුඹුරු වගා කරනවා කියනවා. එක දවසක් වගා කළාම ඊළඟ අවුරුද්දේ එක පුරන් වෙනවා. මේක ඉවරයක් නැහැ. පුරන් කුඹුරු වගා කරන්න සල්ලි නාස්ති කරන්න -

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

අන්න පුරන් කුඹුරු ගැන කියද්දී රෝස් මන්ත්‍රීතුමිය මොනවාද කියනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය අවසන්.

[සභාවේ ඝෝෂා]

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ලොකුවට බෝඩ් ගැහුවා. Photo ගැහුවා. නමුත් අද වනකොට ඒක ආයිත් පුරන් වෙලා. ඒ නිසා මම විශේෂයෙන්ම කියනවා පුරන් කුඹුරු වගා කරනකොට පසු විපරමක් නැහැ. ඒ සල්ලි සියල්ලම වප් මඟුල් උත්සවලට විතරයි. උත්සවලට සීමා වෙනවා. ඒකයි අපි කිව්වේ විසිල් විතරයි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ජනතාව බලාගෙන ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවසාන වශයෙන් කියනවා නම් මේ අයවැයේ අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා අවසන් කරලා තිබෙනවා,

*මෙම අයවැය ප්‍රකාශය මාගේ හෝ පාලක පක්ෂයේ අයවැයක් නොව මෙම ගරු සභාව නියෝජනය කරන සෑම ගරු මන්ත්‍රීවරයෙකුගේම අය වැයක්, එනම් අපගේ අයවැයක් ලෙස සලකා අප සියලුදෙනා එක්ව කටයුතු කර -*

මම අභියෝග කරනවා. පුළුවන් නම් ආණ්ඩු පක්ෂයට වාගේ විපක්ෂයටත් සලකන්න. හොරෙන් දෙන ලක්ෂ 15 දෙන්නේ නැතුව, ලක්ෂ 35 අපට දීලා ලක්ෂ 50 ආණ්ඩුවට දෙන්නේ නැතුව ලක්ෂ 50 ක් හැමෝටම දීලා අපේ අයවැයක් කියලා කටයුතු කරන්න කියලා විශේෂයෙන්ම ඉල්ලනවා. ස්තුතියි.

[ අ.භා. 12.30 ]

**ගරු අජ්මාල් මවුජුඩ්**
Hon. Ajmaal Maujud

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියගෙන් අවසරයි. කාලය ලබා දීම ගැන ඉතාමත්ම ස්තුතිවන්ත වෙනවා. මම හොඳට ඇහුම්කන් දුන්නා. හැමෝගෙම කටේ තිබුණේ ලැම්බෝගිනි. මම හිතන්නේ ඒ අයට බඩගිනි. ඒකයි මේ සම්බන්ධව වැඩියෙන්ම දෙඩෙව්වේ. මොකක්ද මේ ලැම්බෝගිනි කියන එකේ බද්ද? ඔන්න මම අද පැහැදිලි කරලා දෙන්නම්. ඉස්සෙල්ලාම අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ලැම්බෝගිනි කියන කාර් එක ආච්චි අම්මලාත් එක්ක ගෝල්ෆේස් යන කාර් එකක්වත්, මාර්කට් එකට යන කාර් එකක්වත් නොවෙයි. එම රථය නිෂ්පාදනය කරලා තියෙන්නේ, රේස් එකක් දුවලා සම්මානයක් ගන්න. ඒ කියන්නේ, ඒක රේස් කාර් එකක් කියලා කියන්නේ.

[සභාවේ ඝෝෂා]

කලබල වෙන්න එපා. මම හොඳට දෙන්නම්. ලැම්බෝගිනි කියන කාර් එක ටූ සීටර් කාර් එකක්. දැන් මම දැක්කා, සමහරු බද්ද ඉතාමත් වැඩියි කියමින් ජනාධිපතිතුමාට බනිනවා. එතකොට අපි සාධාරණව බද්දක් අඩු කරලා තියෙනවා නම්, අපි හිතන්න ඕනෑ මේකට අපි බදු අඩු කළේ ඇයි කියන එක. අඩු කරන්න හේතුව තමයි ඉස්සරහාට ශ්‍රී ලාංකිකයෝ කප් උස්සනවා, මේ වාගේ රේස් දුවලා. විදේශිකයන් රටට පැමිණිලා ඒ අයගේ ආදායමත් අපි අරගෙන ඉන්දියාව ඊයේ පෙරේදා කළා වාගේ මින් ඉදිරියට ශ්‍රී ලංකාවේ හොඳ රේස් ට්‍රැක් එකකුත් හදලා විදේශ විනිමය කෝටි ගණනක් ගන්න පුළුවන් ක්‍රමයක් තමයි හැදුවේ. මතක තියා ගන්න ලැම්බෝගිනි අපට බඩගිනි කියලා මඩ ගහන්න ගත්තා. මම කියන්නේ මින් ඉදිරියට හැමෝටම ලැම්බෝගිනි, මින් ඉදිරියට අපි කාටත් ලැව්ගිනි නැහැ කියලා. මේ රටේ ඕනෑම පොඩි පහේ මිනිහෙකුට හරි ආසාවක් තියෙනවා නම් තීරු බදු නැතුව ඒ වාහනයක් ගේන්න පුළුවන් ක්‍රමයක් හැදුවා. නමුත් මේකෙත් නීතිරීති ගෙනාවා. ඒක කවුරුත් දැනගෙන හිටියේ නැහැ. ඒකේ නීතිරීති තමයි මෙවැනි කාර් එකක් ගේන කෙනෙක් මෝටර් රේස් එකේ Register වෙලා තියෙන්නත් ඕනෑ. එතුමා මේක ගේන්නේ රේස් කරන්න මිසක් පාරේ දුවන්න නොවෙයි කියන එකත් මතක තියා ගන්න ඕනෑ. එහෙම ගේන නීතිවලට තමයි මේක Duty free කියලා හඳුන්වලා දුන්නේ. තවත් එකක් තියෙනවා. ඇත්ත වශයෙන්ම ලැම්බෝගිනි එකට තාම Duty free කියලා කිව්වේ නම් නැහැ. ඒක Duty free කියලා කියනවා නම් ඒක වැරැදියි. Formula F 1. ඒ කියන්නේ Frow cart, Go cart. තනියෙන් වාඩි වෙලා එක්කෙනෙක් පදින කාර් එකට විතරයි Duty free කළේ. ලැම්බෝගිනි එක Duty free කියලා කියනවා නම් ඔබතුමන්ලා වැරැදියි. ඔබතුමන්ලා කවුරුත් නීතිය දන්නෙත් නැහැ. Frow cart එකටත් හෙට ගේනවා නම් රේස් සංගමයේ Register වෙලා ඒකේ Member කෙනෙක් වෙලා තමයි මේ Conditions, තීරු බදු රහිතව ගේන්න පුළුවන්.

තවත් දෙයක් මට ආරංචි වුණා. සමහර මන්ත්‍රීවරු කිව්වා ඇත්තට සාඩින් ටින්වලට අර ඩියුටි, මේ ඩියුටි කියලා. ඇත්ත වශයෙන්ම ඩියුටි එක හඳුන්වලා දුන්නේ අපේ ගොවියෝ ශක්තිමත් කරන්නයි, ගලාගෙන යන විදේශ විනිමය ආරක්ෂා කරන්නයි. ඒ වාගේම දේශීය නිෂ්පාදනයේ සංවර්ධනය තව තව වැඩි කරන්න තමයි ඔය බද්ද හඳුන්වලා දුන්නේ. අද කවුරුත් කථා කරනවා නම්, ලෝක වෙළඳ පොළත් එක්ක බලනවා නම් මම රටවල් 28 කට ගිය කෙනෙක්. ශ්‍රී ලංකාවේ තමයි ජීවන වියදම ඉතාමත් අඩු. ඒ වාගේම කෑම අතින් අඩු රටවල් තුනයි මම නම් කරන්නේ. ශ්‍රී ලංකාව, මැලේසියාව සහ ඉන්දියාව. මේ රටවල් තුනෙන් අපට රුපියල් සියයක මුදලින් ෂේප් එකේ මොනවා හරි කාල බඩ පුරවා ගන්න පුළුවන් රටවල්. ඊයේ පෙරෙයිදා අපේ මන්ත්‍රීවරු ගියා ප්‍රංශයට. ගිහිල්ලා හොඳට රෝස් පාන් තමයි කාලා ඇවිල්ලා තියෙන්නේ. මොකක්ද හේතුව? ඇත්ත වශයෙන්ම යූරෝ එකක් කියන්නේ රුපියල් 175 ක් වාගේ වටින මුදලක්. මේ යූරෝ එකට කන්න පුළුවන් පාන් තමයි කොනයිස් කියලා තියෙන පොඩි ජාතියේ බන් එකක්. ඒක යූරෝ එකයි. එහෙම නම් අපේ පාන් රාත්තල මෙච්චර ලොකුයි. කපලා හතර දෙනෙකුට කන්න පුළුවන්. අපි ලංකාවට පින් දෙන්න ඕනෑ. ජීවත් වෙන්න පුළුවන් වාතාවරණයක් හැදුවාට. ඒ අතරතුරු යුද්ධය අවසන් කරලා සංවර්ධනය ඇස්වලට පෙනි පෙනී මෙතැනිනුත් එළියට යනකොට දියවන්නා ඔය දැක්කාම අපට පේනවා කොපමණ ලස්සනද කියලා. යුද්ධයත් නිම කරමින්, දේශීය නිෂ්පාදනයත් දියුණු කරමින්, රජයේ රැකී රක්ෂා ලක්ෂ 12 කට අධික සංඛ්‍යාවක් දීලත්, මෙපමණ හොඳ දේවල් කරලත් කාගෙන්ද දෙයියනේ අපි මෙහෙම බැණුම් අහන්න ඕනෑ. ඒක වැරැදියි. කවුරු හරි කියනවා නම් වැරැදියි. තව දෙයක් මම අද හඳුන්වලා දෙන්න ඕනෑ. අද ළමයින්ට පිටරට යන්න සල්ලි නැහැයි කියලා කියනවා. ඒකටත් මම ජී.බී. ජයසුන්දරට ටොකක් ඇණලා කියනවා මගේ Advice එක ගන්න කියලා. මම මේක කියන්නේ, අද මේ මන්ත්‍රීතුමාගෙන් තමයි දඩ දාන්න මිනිස්සු ගොඩක් එන්නේ. ඇයි කියනවා නම් මේ මන්ත්‍රීතුමා හදවතින් උදව් කරනවා කියන එක දන්නවා. මේක Week Point එකක් හැටියටත් සමහර මිනිස්සු පෝලිම් ගහලා එනවා. එක එක ආසනවලින්. මම පුළුවන් මට්ටමින් උදව් කරලා තිබෙනවා. අපේ

රටට ක්‍රීඩා සම්බන්ධයෙන් කීර්තියක් ගෙන එන්න සමහර ළමුන් හොකී වාගේ දේවල්වලින් ඒ අය හොඳ ලකුණු අරගෙන පිටරට යන්න සල්ලි නැහැයි කියලා අම්මලා එක්කරගෙන එනවා. ඊළඟට කියනවා, අතේ රුපියල් 5000 ක් තියෙනවා. තවත් රුපියල් 20,000 ක් හොයා ගන්න ඕනෑ. මේ අම්මලාට සහ ජනාධිපතිතුමාට මම අද උපදේශයක් දෙනවා. නවත්වලා තියෙන මිහින් එයාර් ක්‍රාෆ්ට් එක Start කරලා මේ ළමයින්ට ණයවරයක්, ඒ කියන්නේ තියෙන මුදල් ටික දීලා Starter Flight එකක් හදලා මේ සම්මානෙත් උස්සගෙන එන්න කියලා, සම්මානේ උස්සගෙන එන කෙනාට ටිකට් ඒක Free. අනිත් අය ගෙවන්න. අම්මලත් යනවා නම් ඒ අයටත් ණය දීමෙන් රුපියල් 1000 ක් ණයට දෙන නිසා වැඩිපුර දීලා ඒ රුපියල් 1000 පළාත් සභාවට ආදායමක් ලෙස හඳුන්වලා එතකොට කීයක් ආදායම එනවාද කියලා බලන්නකෝ? පොඩි මිනිහාගේ බඩට ගහන්නේ නැතුව ඒ අයට උදව් කරලා - මට දුකයි. මෙපමණ වැඩ කරන මන්ත්‍රීවරයෙක්ව පාගලා පැත්තක දාලා. මම වැඩ කරගෙන යනවා. මම දන්නවා. පළාත් සභාවේ වෙන්නේ මොකක්ද කියලා. ප්‍රශ්නයක් නැහැ.

[සභාවේ ඝෝෂා]

මගේ ගුරු තියෙන්නේ කේන්ද්‍රේ දෙවැනි කොටුවේ. කථාවට දක්ෂ වාගේම වැඩටත් දක්ෂයෙක්. මතක තියාගන්න ඕනෑ. ඊර්ෂ්‍යාව අපි පරද්දන්න ඕනෑ. ඊර්ෂ්‍යාව තියාගෙන ගියා නම් කවදාවත් රට හැදෙන්නෙත් නැහැ. (බාධා කිරීමක්) නමුත් මම තවත් දීර්ඝ ලෙස කථා කරන්නේ නැහැ. මොකද, හේතුව මේක හොඳ අයවැයක්. ඇත්ත වශයෙන්ම හොඳ අයවැයක්. අපි අයවැය සංසන්දනය කරලා බලන්න ඕනෑ වෙනත් රටක තියෙන ජීවන මට්ටමත් එක්ක තමයි. අපි ඉන්නේ කොහේද කියන මට්ටම එතකොට පේනවා. අද යුද්ධයත් අවසන් කරලා -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාට තව විනාඩියක් පමණයි තියෙන්නේ.

**ගරු අජ්මාල් මවුජුඩ්**
Hon. Ajmaal Maujud

තව එකක් තියෙනවා. මේ අය ලැම්බෝගිනි කියනවා. විපක්ෂයේ කා ළඟද ෆෝර්ඩ් මස්ටැන්ග් කාර් එක තියෙන්නේ කියලා බලන්න. ඒක නිසා අපි කාටවත් ඊර්ෂ්‍යා කරන්නේ නැහැ. මම කියන්නේ ලංකාවට රෝල්ස් රොයිස්, බෙන්ස් මේ හැම හොඳ ජාතියක්ම එන්න ඕනෑ. එතකොට තමයි අපට හෙට නම් කරන්න පුළුවන් ලංකාවේ දුප්පත් මිනිස්සු නොවෙයි ඉන්නේ, කෝටිපතියෝ කියලා. අපි මන්ත්‍රීවරු ඇවිල්ලා ඉන්නේ ජනතාව හිඟන්නෝ කරන්න නොවෙයි. කෝටිපතියෝ කරන්න. නැත්නම් උන් ඉඳලා වැඩකුත් නැහැ. හොඳ අධ්‍යාපනයක් දීලා නැණවත්, ගුණවත් සමාජයක් බිහි කරන්න තමයි මන්ත්‍රීවරු වන අපට අවශ්‍යය. එහෙම නම් මේ හිඟමනෙන් ඔය තාල වර්ගයට අයිතියි කියලා කථා කරන, දිගට යන කථා වැඩක් නැහැ. මම කියන්නේ

[ ගරු අජ්මාල් මවුජුඩ් ]

පාරවල්, ඉස්කෝලවල් මේ කෙටි කාලය තුළ සැහෙන සංවර්ධනයක් ඇති වෙලා තියෙනවා. ජනාධිපතිතුමාට පිං සිද්ධ වෙන්න වාගේම හොඳ ඇමැතිවරු හතර දෙනෙක් අපට ඉන්නවා. උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාත් එක්ක මම ළඟදී ගිහිල්ලා මඩ වගුරක Garden එකක් හදන්න මුල්ගල තිබ්බා -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු අජ්මාල් මවුජුඩ්**
Hon. Ajmaal Maujud

ඇමැතිවරු හතර දෙනාම බොහොම හොඳයි. කිසි අඩුවක් නැහැ. හොඳට වැඩ කරනවා. ඊර්ෂ්‍යා නැතුව මම මේ කියන්නේ. උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා විශේෂඥයෙක්. ඔහු හොඳ වැඩකාරයෙක්. මම අගය කරනවා. මම ජනාධිපතිතුමාටත් ලියුමක් ලියනවා හොඳ වැඩකාරයෙක් කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සංවිධායකතුමා.

**ගරු අජ්මාල් මවුජුඩ්**
Hon. Ajmaal Maujud

සංවිධායකතුමා නම් මෙහෙමයි. මාත් එක්ක ඊර්ෂ්‍යායයි. මම දන්නේ නැහැ මොකද කියලා. ඉතින් ඒක නිසා මම කාටවත් බනින්නේ නැහැ. නමුත් මෙහෙම කථාවල් දුන්නොත් පළාත් සභාවට වැඩක් වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන්.

**ගරු අජ්මාල් මවුජුඩ්**
Hon. Ajmaal Maujud

මම කාටවත් බනින්නේ නැහැ. මට ඊර්ෂ්‍යා කරනවා. ඒ මුකුත් නොවෙයි. මම පස්සේ ඒක කියන්නම්. බොහොම ස්තූතියි.

[ අ.භා. 12.40 ]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තූතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවුරුදු 30 ක යුද්ධයක් ඉවර කරලා අද සුන්දර වචනවලින්, සුන්දර කථාවලින්, සුන්දර අයවැයක් ඉදිරිපත් කරලා තිබෙන මේ මොහොතේ ජනතාවට ඉතුරු කරලා තිබෙන්නේ, ජනතාවගේ බඩේ ගින්දර විතරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම එහෙම කියන්නේ, මේ පළාත් සභාවේ අයවැයේ ඒක පුද්ගල ආදායම ගැන කථා කෙරුවා. සමහර අය කිව්වා, මේක 3700 ගණනක් කියලා වෙන්න ඇති. අපි ඩොලර් 4000 ක් කියමුකෝ? හැබැයි, මේ අය දන්නේ නැහැ. මේ රටේ ජීවත් වන, අද ඉපදෙන, හෙට ඉපදෙන ඒ දූවා දරුවා පවා රුපියල් ලක්ෂ තුනක ණයකාරයෝ වෙලා කියලා. ඒ ගෙවන්නේ, මේ සුන්දර කථාවලට. මේ සුන්දර වරායවල් හදන්න. මෙතුමා කිව්වා වාගේ සුන්දර රෝහල් හදන්න. ඒ සුන්දර දේවල්වලට වියදම් කරපු සල්ලිවලට ණය ගෙවන්න වෙලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද මේ රටේ ඉපදෙන කුඩා දරුවා පවා රුපියල් ලක්ෂ 03 ක් ණයකාරයෝ හැටියට තමයි අද ඉපදෙන්නේ. අපි කිව්වා ගිහිල්ලා මේ රෝහල් කොපමණ සුන්දරද බලන්න කියලා. සුන්දර වෙන්න ඇති. හැබැයි රෝහලට ගියාම ලේ බලන්නත් ෆාමසියට ගිහිල්ලා කටුව අරගෙන එන්න ඕනෑ. ඒ තත්ත්වයට තමයි අද රෝහල පවා පත් වෙලා තිබෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒක නිසා මේ සුන්දර කථා හොඳයි. සුන්දර කථා ගොඩක් ආණ්ඩු පක්ෂයේ අය කියනවා. නමුත් ඇත්ත කථාව මේ රට දවසින් දවස, මේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ජනාධිපති වුණු දවසේ ඉඳලා -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඔය කථා එකක්වත් ජනතාව පිළිගන්නේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේ රට දවසින් දවස ණයකාරයෙක් වන බව, මේ කවුරුත් දැනගෙන තමයි අද බොරුවට සුන්දර කථා කියන්නේ. මේ අයවැය ඉදිරිපත් කිරීමෙන් රැකියා ප්‍රශ්නය ගැන අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා කථා කරලා තිබෙනවා. මම අහන්න කැමැතියි. එතුමා දන්නවාද? එතුමා ළඟ සංඛ්‍යා ලේඛන තියෙනවාද? මේ බස්නාහිර පළාත් සභාවේ චීන ජාතිකයෝ කීදෙනෙක් රැකියාවල නිරත වෙලා ඉන්නවාද කියලා. මම ඒකත් දැනගන්න කැමැතියි, එතුමා දන්නවා නම්. එතුමා ළඟ සංඛ්‍යා ලේඛන තියෙනවා නම්, ඒ සංඛ්‍යා ලේඛනවලට මේ චීන ජාතිකයෝත් අයිතිද කියන එකත් මම දැන ගන්න කැමැතියි. මේ සුන්දර ලෝකයේ මේ සුන්දර ශ්‍රී ලංකාව, සුන්දර රාජපක්ෂ පවුලකට මේ සුන්දර පළාත් සභාවත් අද උකස් තියලා ඉවරයි, මේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු එකතු වෙලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපට ඊළඟ අවුරුද්දේ පළාත් සභාවේ කථාවක් කරන්නවත්, අයවැයක් ඉදිරිපත් කරන්වත් අවස්ථාවක් ලැබෙයිද කියන ප්‍රශ්නයත් තියෙනවා. ඒක නිසා එක කාරණයක් සම්බන්ධයෙන් -

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ලබන පාර ඡන්දයෙන් පරදිනවා නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාත් එක්ක සහයෝගයෙන් වැඩ කරනවා. අද තිබෙන පළාත් සභාව ජනතාවට අහිතකර පළාත් සභාවක් කියලා මම ප්‍රකාශ කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම ඇයි එහෙම කියන්නේ? අපි මේ පොතෙන්ම අරගෙන බැලුවොත්, අපි බිලියන 22 ක් පුනරාවර්තන වියදමෙන් 63% ක් පඩිනඩි ගෙවනවා. මොනවාටද අපි පඩිනඩි ගෙවන්නේ? (බාධා කිරීමක්) පළාත් සභාව අහෝසි කරනවා කියලා ටිකක් කනගාටුයි. (බාධා කිරීම්) මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි මේ බිලියන 22 ක් ගෙවන්නේ - ආණ්ඩු පක්ෂයට ලක්ෂ 50 යි. අපට ලක්ෂ 35 යි කිව්වා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ, හැමෝටම ලක්ෂ 35 යි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා කියනවා, හැමෝටම ලක්ෂ 35 යි කියලා. හරි එහෙම නම් අපි ලක්ෂ 35 යි කියලා කියමු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ මුදලින් පාරක් හැදුවොත් පාර හදන්නෙත්, එහෙම නැත්නම් යම්කිසි දෙයකට වෙන් කළොත් ඒක කරන්නෙත් ප්‍රාදේශීය සභාවෙන් හෝ නගර සභාවෙන්. අපි පළාත් සභා මන්ත්‍රීවරු මොනවාද කරන්නේ? යෝජනාවක පොතක හරි පිටු කිහිපයක හරි ලියනවා. ලියනවා අරිනවා. ඕකට බිලියන 22 ත් මහජනතාවගේ බඩට ගින්දර දෙන්න ඕනෑද? ඒක තමයි ප්‍රශ්නය.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

අජ්මාල් හොඳයි වගේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙතුමාට හොඳයි.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

(බාධා කිරීමක්) ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද පාසල් ගැන කථා කරනවා. අද පාසල් ගැන සුන්දර කථා කිව්වා. මම අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාට වැරැද්දක් කියනවා නොවෙයි. නමුත් ඔබතුමාගේ අවධානය කරුණාවෙන් යොමු කරනවා. අද ජා-ඇළ ආසනයේ පළාත් සභා පාසල් විශාල සංඛ්‍යාවකට වතුර ටිකවත් තාම දීලා නැහැ. අද අධීක්ෂණ මන්ත්‍රීවරු පත් කරලා ඉන්නවා. අපි කමිටුවලට එන්නේ නැහැයි කියනවා. අද ළමයින්ට අවශ්‍ය වතුර ටිකවත් සමහර පාසල්වලට දෙන්න බැරි වෙලා තියෙනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මෙතුමා ලංකාවේද ඉගෙන ගත්තේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒකත් දීලා තියෙන්නේ, -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා මයික්‍රොෆෝනය පාවිච්චි කරලා සභාවට බාධා කරන්න එපා. කරුණාකරලා තමුන්නාන්සේගේ ආසනයට යන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇත්ත කථා කරද්දී පොඩ්ඩක් වේදනාව දැනෙනවා. ඇත්ත කියද්දී වේදනාව එනවා. ඒක සාධාරණයි. අපි කවදාවත් අසාධාරණයි කියන්නේ නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මෙතුමා ප්‍රකාශ කළා අපි අධීක්ෂණ මන්ත්‍රීවරු පත් කරලා තියෙනවා කියලා. අපි එහෙම පත් කරලා නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම පත් කරලා නැද්ද? එහෙම නම් ඔබතුමා වගකීමෙන් කියනවාද පත් කරලා නැහැයි කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම වගකීමෙන් ප්‍රකාශ කරනවා. අධීක්ෂණ මන්ත්‍රීවරුත් නැහැ. අපි ව්‍යුහ කමිටු පත් කරලා කටයුතු කරනවා. ඒ වාගේම කනගාටු වෙනවා. මෙතුමා කිව්වා පාසල්වල පානීය ජලය –

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කිව්වේ සමහර පාසල් කියලා ගරු ප්‍රධාන ඇමැතිතුමනි.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

සමාවෙන්න. මම කනගාටු වෙනවා එතුමාගේ ප්‍රතිපාදනවලින් අඩු ගාණේ අධ්‍යාපනය ක්ෂේත්‍රය සඳහා ශත පහක්වත් වෙන් කරලා නැහැ. මා ළඟ ලේඛන තියෙනවා.

[සභාවේ ඝෝෂා]

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

සභාව නිශ්ශබ්ද වෙන්න. එතුමාට කථා කරන්න දෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ කථාව ඇත්ත. මම විපක්ෂයේ ඉන්නේ. මම ඉන්නේ ආණ්ඩු පක්ෂයේ වැඩ කරන්න නොවෙයි. (බාධා කිරීම්) මේ සුන්දර කථා කියන අයට ඒක තමයි මම කියන්නේ. මේ සුන්දර කථා කියනවා. නමුත් එතුමාම පිළි අරගෙන තිබෙනවා, වතුර නැති පාසල් අද ජා-ඇළ ආසනයේ තියෙනවා කියලා. මම ඔබතුමාට ඔප්පු කරලා පෙන්වන්නම්. ලියකියවිලි ඉදිරිපත් කරන්නම්. හැබැයි, මම ඔබතුමාට වැරැද්දක් කියනවා නොවෙයි. මම කලින්ම කිව්වේ ඒකයි. ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

**ගරු නිමල් ලාන්සා –** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

තාත්තා ඇමැති කාලේ ජා-ඇළට වතුර දෙන්න තිබුණා නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම කිව්වේ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

තාත්තා ඇමැති කාලේ මෙතුමා ලංකාවේ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මගේ කාලය අවසන් වෙන්නේ කොහොමද?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

තාත්තා වැඩ කෙරුවා. තාත්තා හදපු පාසල් තමයි කදානේ තියෙන්නේ.

**ගරු යූ. ජෝර් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

හර්ෂණ රාජකරුණා ගරු මන්ත්‍රීතුමාගෙන් විනාඩි 03 ක් ලබා දෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ කාලය ගන්න බැහැ. එතුමාට කාලය අවශ්‍ය නම් ඉල්ලා ගන්න කියන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ කාලෙන් විනාඩි 03 ක් විතර ප්‍රධාන ඇමැතිතුමා ගත්තා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඒ කාලය ඔබතුමාට දුන්නා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එහෙම කරන්න එපා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් නඟනවා. මම ජා-ඇළ කොට්ඨාශය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. මෙතුමාත් ජා-ඇළ කොට්ඨාශය නියෝජනය කරමින් පාසල්වල පානීය ජලය නැහැයි කියලා බොරු චෝදනාවක් කරනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම අභියෝග කරනවා. මම හෙට ඉල්ලා අස් වෙනවා. මට හෙට ඔප්පු කරලා පෙන්වනවා වතුර නැති පාසල්. හෙට ඔප්පු කරලා පෙන්වනවා. ඔබතුමා ලැහැස්තිද? ඉල්ලා අස්වෙන්න ලැහැස්තිද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඉස්සර ජා-ඇළ කොට්ඨාශයේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා ලැහැස්තිද හෙට ඉල්ලා අස් වෙන්න?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පොඩ්ඩක් කියන එක අහගෙන ඉන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ඔප්පු කරලා පෙන්වන්නම්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාගේ කථාවේදී ඒවාට උත්තර දෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මගේ කථාවෙන් එතුමාට උත්තර දෙන්න බැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාවේදී උත්තර දෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා භාර ගන්නවා නම් කියන්න. මම අද ලියුම ලියලා දෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඔබතුමිය හරියට මේ සභාව මෙහෙයවන්න. ඒක වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම දැන් ලියුම ලියලා දෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඒ නිසා තමයි මම ඉඳගන්න කිව්වේ. ඔබතුමාගේ කථාවේදී ඒ තර්ක මතු කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අද අධීක්‍ෂණකමක් නැති -

**ගරු යූ. ජෝර්  පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අභියෝගය භාර ගන්න කියන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අධීක්‍ෂණකමක් නැති මන්ත්‍රී කෙනෙක් -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු මෙරිල් පෙර්රා**
Hon. Meril Perera

ඔබතුමා පාසල් දෙක මොකක්ද කියලා නම් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අධීක්‍ෂණකමක් නැති මන්ත්‍රීට එක පාරටම පුදුම කැක්කුමක් ඇවිල්ලා තියෙන්නේ.

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

පාසල නම් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පාසල් එකක් නොවෙයි. මම දෙකක් නම් කරලා පෙන්වන්නම්. ඔබතුමා අභියෝගය භාර ගන්නවාද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා ඉඳ ගන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා අදහස් ප්‍රකාශ කිරීමේදී කිව්වා මම එතුමාට කිව්වාලු මගේ ආදායම ගැන. මගේ ආදායම ගැන කියන්න ඕනෑ තැන්වලට මම කියලා තියෙනවා. [ ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා ]

එතුමාට මගේ ආදායම ගැන මම කියලා නැහැ. ඒ නිසා මේ සභාව නොමඟ යවන, අසත්‍ය ප්‍රචාර කරන්න එපා කියලා ඔබතුමිය මාර්ගයෙන් එතුමාගෙන් ඉල්ලනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමා කියනවා නම් කිව්වේ නැහැයි කියලා මම ඒක ඉල්ලා අස්කර ගන්නවා. මොකද, එතුමාගේ වචනයයි, මගේ වචනයයි විතරයි තියෙන්නේ. ඒ නිසා මම ඒක ඉල්ලා අස්කර ගන්න කැමැතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඔබතුමා අසුන් ගන්න. මීළඟට හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා.

[ අ.භා. 12.54 ]

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අවස්ථාව තිබෙන්නේ පොදු සාකච්ඡාව පිළිබඳවයි. අද මා විශ්වාස කරනවා. ඉතාමත්ම දීර්ඝ කාලයක් මම අයවැය විවාදවලට සහභාගී වෙලා තියෙනවා. අද තමයි නියම පොදු සාකච්ඡාව වෙන්නේ.

**ගරු යූ. ජෝර්  පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

බියගම විලේජ් ගැන කියන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඔව්, බියගම විලේජ් ගැනත් කියන්නම්. ඔබතුමා බියගම විලේජ් යන හැටිත් කියන්නම්, පොදු සාකච්ඡාවේදී. ඇත්තටම බස්නාහිර පළාත් සභාව ඉදිරියට ගෙනයාම පිළිබඳව කෙරෙන සාකච්ඡාව තමයි පොදු සාකච්ඡාව. ඒ සඳහා තමයි කරුණු පැහැදිලි කරන්නේ. මොනවා වුණත් අජ්මාල් මවුජුඩ් ගරු මන්ත්‍රීතුමා අපි කවුරුත් නොදන්න ලැම්බෝගිනි පිළිබඳ යථාර්ථය අපට කියා දුන්නා. ඒකෙන් මම හිතනවා, විපක්ෂයේ මුඛවාඩම් ඔක්කොම තව තද කරලා බැඳුණා කියලා. ඒ නිසා මේක හොඳ පොදු සාකච්ඡාවක්. ඒ වාගේම බස්නාහිර පළාත් සභාවේ නායකයා හැටියට අපේ ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා කෘතහස්ත දේශපාලඥයෙක් හැටියට එතුමාගේ වැඩ පිළිවෙළ එතුමාගේ අමාත්‍ය මණ්ඩලයත් එක්ක අයවැය ලේඛනය තුළ ඉතා හොඳින්ම ඉදිරිපත් කරලා තිබෙනවා. ඒකට කිසිම අභියෝගයක් නැහැ. මම දැක්කා, විපක්ෂයේ

මන්ත්‍රීවරු උත්සාහයක යෙදෙනවා, නොයෙක් නොයෙක් විධියට ඒක අභියෝගයට ලක් කරන්න. ඒක අභියෝගයට ලක් වෙන්නේ නැහැ. ඒ මොකද, සියල්ලම හරියට යථාවාදීව හොඳට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා එහි අභියෝගයක් නැහැ. ඒ වාගේම ගරු ප්‍රධාන ඇමැතිතුමනි, ඔබතුමාට මම උපදේශයක් දෙන්න යනවා නොවෙයි. 2014 දී තමයි අපේ පළාත් සභාව අවසන් වෙන්නේ. නමුත් මම ඔබතුමාට දැන්ම කියනවා, 2014 ට නොවෙයි, ඔබතුමා තව අවුරුදු 06 කට දැන්ම සැලසුමක් හදන්න ඕනෑ. ඒ මොකද, 2014 න් පස්සෙත් මේ පළාත් සභාව පත් වෙනවා. ඔබතුමා මහ ඇමැති වේවි. මම හිතනවා උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා මාත් එක්ක විරුද්ධ වෙන එකක් නැහැ. මොකද, මම හය අවුරුද්දකට කියන්නේ, අපට ඉදිරියේදී කිසිම අභියෝගයක් එන්නේ නැහැ. මොකද, අපේ ජනාධිපතිතුමාගේ අශිර්වාදය තුළ අපි හොඳ ගුණගරුක විපක්ෂ නායකවරයෙක් පත් කර ගත්තා, ඊයේ පෙරේදා එක්සත් ජාතික පක්ෂ සම්මේලනයේදී. ඒක අපට හොඳ ශක්තියක්.

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒක තේරෙනවාද?

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මොකද, අවුරුද්දෙන් අවුරුද්ද විපක්ෂ නායකවරු පත් කරනකොට අපේ පක්ෂයේ වුණත් අවුරුද්දෙන් අවුරුද්ද නායකයෝ මාරු කරන්න ගියොත් –

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා. ඔබතුමා නිශ්ශබ්ද වෙන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

හොඳ විපක්ෂයක්. මේ වාගේ බාල විපක්ෂයක් නොවෙයි. හොඳ විපක්ෂයක් රටේ තිබෙනවා. අපට යා යුතු මාර්ගය පිළිබඳව කියා දෙනවා. ඒ නිසා අපට හරි ආඩම්බරයි. ඒ වාගේම මතක තියා ගන්න අජටාකාශගාමී යුගය දැන් එන්නේ. එදා ඔබේ දරුවා, මගේ දරුවා මේ රටේ මිනිස්සුන්ගේ දරුවෝ දොස්තරවරු කරන්න, නැත්නම් ඉංජිනේරුවරු කරන්න තමයි ප්‍රාර්ථනා කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සුපසන් නිම්තෙර තුළ අද 7.30 ට අපි පාසල් කිහිපයකට ගියා ඔබතුමාගේ වැඩ පිළිවෙළ දියත් කරන්න. මම වැඩිම ශිෂ්‍යත්වලාභී දරුවන්ව ගෙනැල්ලා පහන පත්තු කරනකොට මම ඇහුවා, ඒ ශිෂ්‍යත්වලාභී දරුවන්ගෙන්, දුව ඔයා ලොකු වෙලා කවුරු වෙන්නද කැමති කියලා. මම හිතුවා මම අර පරණ කියපු විධියටම දොස්තර නෝනා කෙනෙක් ඉංජිනේරුවෙක් වෙනවා කියයි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ සිහිති දියණිය කිව්වේ මොකක්ද? මට අජටාකාශගාමියෙක් වෙන්න ඕනෑ කිව්වා. බලන්න. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඔබේත්, මගේත් හැම දරුවෙකුගේම ආඩම්බර තාත්තා හැටියට අද ඒ යුගය නිර්මාණය කරලා තිබෙනවා. එහෙම නම් විපක්ෂයෙන් මම ඉල්ලා සිටිනවා ඊර්ෂ්‍යාවෙන් කථා කරන්නේ නැතුව - අර කථාවක් තියෙනවා ඊර්ෂ්‍යාව රුසියාවටත් වඩා ලොකුයි කියලා. ඒ නිසා ඊර්ෂ්‍යාවෙන් කථා කරන්නේ නැතුව මේ වැඩ පිළිවෙළ තුළ ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් උදව් අරගෙන වැඩ කරන්න. දැන් මෙතැන කැගහනවා. මේ කැලණියේ උන්නැහේ, ජෝර්ජ් මහත්තයා. මෙතැන කැගහනවා. පිටිපස්සෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ කාමරේට ගිහිල්ලා අනේ, අනේ, අනේ කියලා කොළ ටික පෙරලනවා. ඔක්කෝම කරගන්නවා.

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ලක්ෂ 100 ක් දීලා ගෙනාපු වාහනේ –

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

අනෙක් අයටත් කියන්නේ තමුන්නාන්සේලා රැවටෙන්න එපා. රෝස් නෝනා රැවටෙන්න එපා. ඔබතුමන්ලාත් ගිහිල්ලා ආණ්ඩු පක්ෂයෙන් වැඩ කර ගන්න. මොකද, මේක ශක්තිමත් ආණ්ඩුවක්. මතක තියා ගන්න අනාගත ආශ්චර්යමත් ශ්‍රී ලංකාව සැබැවින්ම බලන්න ඕනෑ නම්, හැන්දෑවට දියවන්නා ඔය ළඟට ගිහිල්ලා බලන්න. සැබැවින්ම බලන්න ඕනෑ නම්, හැන්දෑවට බේරේ වැව අබියසට යන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඊයෙත් අදත් මේ දවස් ටිකේම කථාවලදී මම දරුවන්ට කිව්වේ මගේ දුවේ, පුතේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රට ආශ්චර්ය බවට පත් කරනකොට ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන ඇමැතිතුමා බස්නාහිර පළාතේ කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්ක ආශ්චර්ය බවට පත් කරනවා. භෞතික වශයෙන් ජනාධිපතිතුමා මහ අණ්ඩුව, යුතුකම් ඉෂ්ට කරනකොට අධ්‍යාත්මික වශයෙන්, ගුණාත්මක වශයෙන් මහ ඇමැතිතුමා අධ්‍යාපනය සංවර්ධනය කරනවා කියලා. ඒ නිසා අපි සතුටු වෙන්න ඕනෑ. විපක්ෂ නායකතුමා ඔබතුමා ඔය ළඟ ඉන්න යෝදයාගෙන් ලණු කන්න එපා. මගේ පෞද්ගලික වාහන පිළිබඳව මෙතැන කථා කරනවා. මගේ අඹුදරුවෝ ගැන කථා කරන්න පුළුවන්. ඒවා බාල දේශපාලනය.

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒක ඇත්ත දේශපාලනය.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මගේ මොන්ටෙරෝ රථය මම පාවිච්චි කරන්නේ. ඒ ගැන කියන්න ඕනෑ. ඒක මගේ අයිතිය පිළිබඳ ප්‍රශ්නයක්. තමුන්නාන්සේ දන්නේ නැහැ. ඊළඟට විශේෂයෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මේ කැබිනට් මණ්ඩලය

ගැන කියන්න ඕනෑ. අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් පස්සේ. උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමා පෙරේදා මම දැක්කා TNL රූපවාහිනී නාලිකාවේ. සම්මුඛ සාකච්ඡාවකට සහභාගී වෙනවා. මට හරිම සන්තෝෂයි. එතුමාව වට කරලා ගහන්න හදනකොට, එතුමා ඉතාමත්ම හොඳ ප්‍රවීනයෙක් හැටියට, කෘතහස්ත දේශපාලඥයෙක් හැටියට හොඳ ප්‍රවාහන ඇමැතිවරයෙක් හැටියට ඒ සාකච්ඡාවේදී කථා කළා. අපි සතුටු වෙනවා. ඒ වාගේ ශක්තිමත් අමාත්‍ය මණ්ඩලයක් තිබීම පිළිබඳව. ඒ වාගේම මම නම් වශයෙන් කියන්නේ නැහැ. නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමා මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියේ නේ? මාර්ග එකයි මාර්ගස්ථ එකයි පොඩ්ඩක් මට වැරදෙනවා. මාර්ග සංවර්ධන අධිකාරියෙන් විශාල වැඩ කොටසක් කරනවා. එතුමාගේ වැඩ පිළිවෙළ කොයිතරම් අගයනවාද කිව්වොත් මධ්‍යම ආණ්ඩුවේ බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමා අනෙක් පළාත් සභාවලත් මාර්ග සම්බන්ධ වගකීම පවරලා තිබෙනවා. මේක අපට හරි ආඩම්බරයට කාරණයක්. ඊළඟට ඊයේ පෙරේදා සිරස රූපවාහිනි නාලිකාවල මම දැක්කා විපක්ෂයේ මන්ත්‍රීවරු තුදෙනෙක් ෆයිල් කවරයකුත් කිහිල්ලේ ගහගෙන සිරසට කියනවා අල්ලන්න, අල්ලන්න කියලා. ඒ කියන්නේ Photo එකට අල්ලන්න කියලා. කාටද කියන්නේ? උදය ගම්මන්පිල මැතිතුමා ත්‍රීරෝද රථ රියදුරන්ට මීටර් දීම වැරැදියි කියලා මුදල් කොමිෂමට කියන්න යනවා. මට මතක් වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය කථානායකතුමා රැක ගත්තා. කථානායකතුමා කිව්වා අධිකරණයට බැහැයි කියලා පාර්ලිමේන්තුවට පාඩම් උගන්වන්න.

ඒ වාගේ මේ බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රධාන කැබිනට් මණ්ඩලය ගන්න තීන්දුවලට එරෙහිව මුදල් කොමිෂන් සභාවට තීන්දු ගන්න බැහැයි කියන කාරණාව මම මේ අවස්ථාවේදී පැහැදිලිව කියනවා. ඒ අනුව මීටර් ලබා දෙන්නේ, මේ රටේ දුප්පත් මිනිස්සු වෙනුවෙන්. තමුන්නාන්සේලා හිතයි මොකක්ද දුප්පත් මිනිස්සුන් කියන්නේ - අපේ අහිංසක මිනිස්සු මීටර් නැති ත්‍රීරෝද රථවල ගියාම නොයෙක් නොයෙක් ගණන් තමයි ඉදිරිපත් කරන්නේ. කවුරු හරි දෛනිකව වැඩ කරලා රුපියල් 1000 ක් අරගෙන බස් එකක් නැති වුණාම තමයි ත්‍රීරෝද රථයේ යන්නේ. හැම ත්‍රීරෝද රථ රියදුරෙක්ම නොවෙයි. ඇතැම් ත්‍රීරෝද රථ රියදුරන් වැඩි මුදල් අය කරනවා. ඒ නිසා සර්ව සාධාරණ, යුක්ති සහගත වැඩ පිළිවෙළක් තමයි අපේ උදය ගම්මන්පිල මැතිතුමා කළේ. ඒ කාරණාව -

**ගරු යූ. ජෝර් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

එයාම තමයි පළාත් සභාව එපා කියන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඉන්න ඒකත් පහදලා දෙන්නම්. එතුමා කියන කාරණාව මෙතුමාට තේරෙන්නේ නැහැ. පළාත් සභාව එපා කියනවා නොවෙයි. පළාත් සභා ක්‍රමය -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඔබතුමා කථා කරන්න දෙන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

පළාත් සභා ක්‍රමයේ තිබෙන වැරැද්ද නිසා -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

කරුණාකරලා කථා කරන්න දෙන්න.

**ගරු යූ. ජෝර් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ත්‍රීවීල්වලට මීටර් දෙනවා කියන්නේ, ලැජ්ජ නැද්ද? එතුමාට යන්න කියන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

එතුමා කිව්වත් නොකිව්වත් -

**ගරු යූ. ජෝර් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

යන්න කියන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, ඔබතුමාට එහෙම කියන්න අයිතියක් නැහැ. තමන්ගේ -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ නිසා මම මේ අවස්ථාවේදී ප්‍රශංසා මුඛයෙන් කථා කරනවා. උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා මේ බස්නාහිර පළාත් සභාවේ ජීවත් වන අහිංසක මිනිස්සු වෙනුවෙන් ලබා දුන් සහනයක් තමයි ඒ ලබා දුන්නේ කියන කාරණාව මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

ඒ වාගේම අපේ ජගත් අංගගේ ගරු සෞඛ්‍ය ඇමැතිතුමා විශාල සේවයක් කරනවා. එතුමා නිශ්ශබ්ද සේවයක් කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම එතුමාගෙන් ඉල්ලා සිටිනවා. අපේ කඩුවෙල මැතිවරණ කොට්ඨාශයේ ඉස්පිරිතාල තුනක් තිබෙනවා. එයින් ප්‍රධාන ඉස්පිරිතාලය තමයි තලංගම රෝහල. තලංගම රෝහලේ හොඳ ප්‍රධාන වෛද්‍ය

නිලධාරීවරයෙක් ඉන්නවා. එයින් අදහස් කරන්නේ, අනෙක් වෛද්‍ය නිලධාරීන් හොඳ නැහැ කියන එක නොවෙයි. මේ වෛද්‍ය නිලධාරීතුමා ඉතාමත්ම කාර්යක්ෂම, කඩිසර, රෝහල නඟා සිටුවන්න විශාල වෙහෙසක් වෙනවා. ඒ නිසා ගරු සෞඛ්‍ය අමාත්‍යතුමනි, මේ රෝහලේ යම් යම් අඩුපාඩු තිබෙනවා. ඒවා ලබා දීමට ඔබතුමා උත්සුක වන ලෙස ඉතාමත් ගෞරවයෙන් සහ කරුණාවෙන් ඉල්ලා සිටිනවා. මම දීර්ඝව කථා කරන්නේ නැහැ. එක වචනයක් කියලා කථාව අවසන් කරනවා.

දුර්වල දේශපාලඥයෝ මේ වැදගත් සභාවේ මඩ ගහන්න නොයෙක් නොයෙක් දේවල් කියනවා. සමහර විට අහිංසක දරුවෝ ගැන කියනවා. සමහර විට අහිංසක බිරිඳ ගැන කියනවා. ඒ වාගේ දේවල් පිළිබඳව කියනවා. මේ ජෝර්ජ් පෙරේරා සංවිධායකතුමා මේකේ ඉන්න ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක් හැටියට ඉතාමත්ම නින්දිත විධියට මිනිස්සුන්ට පහර ගහන්න බලනවා. ඒ නිසා තමුන්නාන්සේට අභියෝග කරනවා මොනවා හරි ප්‍රශ්නයක් තිබෙනවා නම්, මම වැරැද්දක් කරලා තිබෙනවා නම් ඒ සඳහා රහස් පොලීසිය තියෙනවා. මේ රටේ නීතිය, අධිකරණය තියෙනවා. ඒවාවලට යන්න ඕනෑ. අවසාන වශයෙන් මෙවැනි අයවැය විවාදයකට වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම පොදු සාකච්ඡාවේදී සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව. ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත්, අමාත්‍ය මණ්ඩලයටත්, මගේ ප්‍රණාමය පුද කරනවා. ස්තූතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

අද උදෑසන සිට මේ දක්වා අදහස් ප්‍රකාශ කළ ගරු මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වෙමින් දිවා ආහාරය සඳහා මෙම සභාව තාවකාලිකව අත්හිටුවනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත් සිටුවන ලදින් අ.භා. 02.10 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යළිත් රැස්විය.***

*Accordingly the Sitting, Suspended and. it resumed at 02.10 p.m with Hon Chairman in the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

[ අ.භා. 02.10 ]

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, 2013 මුදල් ප්‍රකාශනය ඉදිරිපත් කරන මේ අවස්ථාවේදී පොදු සාකච්ඡාව වෙනුවෙන් වචන කිහිපයක් කථා කරන්නට ලැබීම ඉතාමත් සන්තෝෂයි. වසර 25 ක පළාත් සභා ඉතිහාසයේ පළාත් සභාව දැඩි කථාබහට අර්බුදයට එහෙම නැත්නම් විවේචනයට ලක් වන අවස්ථාවක මේ ඉදිරිපත් කරලා තිබෙන මුදල් ප්‍රකාශනයේදී මම හිතන්නේ, ගරු ප්‍රධාන ඇමැතිතුමා ඉතාමත් අසරණ භාවයක් උසුලනවා. ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ මේ මුදල් ප්‍රකාශනය එතුමාටත් එක පැත්තකින් අභියෝගයක්. එතුමාගේ ප්‍රධාන අමාත්‍ය කාල සීමාව අවුරුදු 05 ක අවසානයේදී, එතුමාගේ ප්‍රගති වාර්තාව හැදෙන්නේ මේ අවුරුදු 05 ත් එක්කම තමයි. ඊළඟ මැතිවරණයට ඉස්සෙල්ලා. හැබැයි, මේ අවුරුදු 05 ම එතුමා ඉදිරිපත් කරපු මුදල් ප්‍රකාශන 04 දිහා බලලා එතුමාට මේ මුදල් ප්‍රකාශනය මීට වඩා සාර්ථකව ඉදිරිපත් කරන්න තිබුණා. එතුමා මුලින්ම ප්‍රධාන ඇමැතිවරයා හැටියට මේ සභාවට ඉදිරිපත් කරපු මුදල් ප්‍රකාශනය, එදා සැලසුම් කරපු දේවල්, එතුමා අදහස් කරපු දේවල් මොන විධියට සිද්ධ වෙලා තිබෙනවාද කියලා සොයා බලන්න. හැබැයි, එතුමා අපට ඉදිරිපත් කරපු පොතේ බොහොම සාවද්‍ය තොරතුරු විශාල වශයෙන් සඳහන් වෙලා තිබෙනවා. ඒ වාගේම අඩුපාඩුත් රාශියක් තිබෙනවා. එයින් එකක් හැටියට මා සඳහන් කරන්න කැමැතියි, මේ සභාවේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරනවා කලා ශිල්පීන් තුන් දෙනෙක්. හැබැයි, මේ පොතේ කලා කටයුතු, සංස්කෘතිය ගැන එක වචනයක්වත් සඳහන් කරලා නැහැ. එතුමා උවමනාවෙන්ම අත හැරියාද? එහෙම නැත්නම් –

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇමැතිතුමා ඉන්නවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඔව්. ඇමැතිතුමා ඉන්නවා. නමුත් මම කියන්නේ, ඒ සැලසුම් මොනවාද කියන එක පිළිබඳවත් අඩු ගාණේ එක වචනයක්වත් මේ පොතේ එතුමා සඳහන් කරලා නැහැ. ඊට අමතරව අවුරුදු 25 ක් ගත වන අවස්ථාවේදී අද අපි ඉතාමත් අවාසනාවන්ත තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. සමහර අමාත්‍යාංශ, එහෙම නැත්නම් අපේ සභා ලේකම් කාර්යාලයේ ඔබතුමාගේ වාස භවන. අද අපට ඉන්න හිටින්න තැනක් නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අවුරුදු 25 ක් ආපස්සට හැරිලා බැලුවාම අපට අඩුම තරමින් සභා ලේකම් කාර්යාලය ස්ථිර ගොඩනැගිල්ලක් හදා ගන්න බැරි තත්ත්වයට අද මේ අවුරුදු 25 අවසන් වනකොට මේ සභාව පත් වෙලා තිබෙනවා. අන්න එහෙම කල්පනා කරනකොට මේ සභාව නියෝජනය කරන ගරු අමාත්‍ය උදය ගම්මන්පිල මැතිතුමාත් එක්ක මට එකඟ වෙන්න සිද්ධ වෙන්නේ මෙන්න මේ වෙලාවට තමයි. එතුමා එක පැත්තකින් හරි. එතුමාගේ දැක්ම හරි. මොකද, මේ පළාත් සභා ක්‍රමය තුළ එතුමා ඉඳගෙන මෙහි තිබෙන අඩුපාඩු විවේචනය කර කර, මේක නිශ්ක්‍රීය ක්‍රියාවක් හැටියට එතුමාගේ යම් යම් ප්‍රකාශවලදී, ප්‍රවෘත්ති පත්‍ර සාකච්ඡාවලදී කරන ක්‍රියාව හරියි කියලා තේරෙන්නේ මේ පළාත් සභාවේ අද අපට අත් වෙලා තිබෙන ඉරණම දිහා බලනකොට. ඒ ඉරණම දිහා බලන්නේ, මේ අවුරුදු 25 ඇතුළතදී තමුන්නාන්සේට හරියට වාඩි වෙලා

ඉන්නවත් කාර්යාලයක් හදා ගන්නවත් බැරි වෙලා තියෙනවා. විශේෂයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ ගෙවුණු අවුරුදු 05 ක කාල සීමා තුළදී ඒ පිළිබඳව සැලසුමක්වත් - සෞඛ්‍ය ඇමැතිතුමාට තමන්ගේ ස්ථානය දාලා යන්න සිද්ධ වුණා, තැනක් හොයාගෙන, ලක්ෂ ගණනක් කුලී ගෙවාගෙන. අද සභා ලේකම් කාර්යාලයට ලක්ෂ 12 ක් 13 ක් විතර වියදම් කරගෙන වෙනත් තැනකට යන්න වෙලා තිබෙනවා. ඊළඟට එන මහ ඇමැතිතුමා කවුද කියලා අපි දන්නේ නැහැ. එතුමා මොන විධියට සැලසුම් හදයිද? හැබැයි, මොනවා වුණත් මම මෙතැනදී කියන්න ඕනෑ. මේවායේ සැලසුම් නොමැතිකම පිළිබඳවමේ සභාවේ සාකච්ඡා වනකොට ගරු ඇමැතිතුමාගේ මතය හරියි කියන එක පිළිබඳව අපට කථා කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම අධ්‍යාපනය ගැන කථා කරද්දී මේ පොතේ සමහර තැන්වල සඳහන් වෙලා තිබෙනවා, බස්නාහිර පළාතේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වුණු ළමුන්ගේ සංඛ්‍යාව ප්‍රතිශතයක් හැටියට. හැබැයි, මේ ඔක්කෝම බස්නාහිර පළාත් සභාවේ තිබෙන පළාත් සභාව සතු පාසල්වල ළමයින්ගේ නොවෙයි කියන එක මම මේ වෙලාවේ බොහොම අවධාරණයෙන් කියන්න ඕනෑ. මේ පළාත් සභාවේ තමයි ජාතික පාසල් විශාල පද්ධතියක් තියෙන්නේ. කොළඹ ජාතික පාසල්වල ඉන්න ශිෂ්‍යයෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වෙලා තිබෙන ඒවායේ ගණනුත් එකතු කරලා තමයි මේ බස්නාහිර පළාත් සභාවේ සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිශතය හදලා අපේ පොතට ඇතුල් කරලා අපේ පළාත් සභාවේ ගිණුමට බැර කරගෙන තිබෙන්නේ. මෙවැනි විශාල කරුණු රාශියක් තියෙනවා. ඒ වාගේම තමයි තරුණයන් පිළිබඳව, ඒ වාගේම කලා කටයුතු පිළිබඳව වචනයක්වත් කථා කරන්න පුළුවන්කමක් ලැබිලා නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කලින් කියන්න තිබුණා නේ?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

පොඩ්ඩක් සමාවෙලා අහගන්න. මේ පළාත් සභාවේ අපි යම් යම් දේවල් පිළිබඳව සෑහීමකට පත් වෙන්න පුළුවන් කාරණා තිබෙනවා. නමුත් ඊට වඩා විශාල වශයෙන් තිබෙන්නේ, අද විවේචනයට ලක් වන කාරණා පිළිබඳව කථා වන එක. මම හිතන්නේ, ඒක සාමාන්‍යයෙන් අපට දැන් නම් පිළිගන්න පුළුවන් තත්ත්වයකට තමයි පත් වෙලා තියෙන්නේ. මේ විධියට -

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

විපක්ෂයේ කාර්ය භාරය.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

විපක්ෂයේ කාර්ය භාරය මට වැඩිය හොඳට අමාත්‍ය මණ්ඩලයේ වගකීම දරණ උදය ගම්මන්පිල මැතිතුමා ඉෂ්ට කරනවා කියන එකවත් අඩු ගාණේ තමුන්නාන්සේලාට තේරෙන්නේ නැද්ද? එතුමා ඒක හරියට කරනවා. ඒක නිසා මම කියන්නේ,

[ ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා ]

මේ අනතුරින් බේරා ගන්න ඕනෑ. මේ පළාත් සභා ක්‍රමය නිර්මාණය කෙරුවේ උතුරු - නැගෙනහිර තිබෙන ඒ ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් විධියට. 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය තුළින් තමයි පළාත් සභා ක්‍රමය නිර්මාණය කෙරුවේ. මම පළාත් පාලනයෙන් උපන් දරුවෙක්. අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය අපි පළාත් පාලනයෙන් උපන් දරුවෝ තමයි. නමුත් මගේ විශ්වාසය තිබෙන්නේ තවමත් මේ පළාත් සභා ක්‍රමය ශක්තිමත් වුණා මදී. ඒ සඳහා මධ්‍යම රජය ස්ථිර වශයෙන්ම -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජෝන් අමරතුංගට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා බාධා කරන්න එපා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

වාචාලයෙක් වාගේ කෑගහන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ ආසනයේත් නොවෙයි ඔබතුමා ඉන්නේ. වෙනත් ආසනයක ඉඳගෙන බාධා කිරීම් කරනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

එතුමාත් එක්ක කිසි ප්‍රශ්නයක් නැහැ. එතුමා කිව්වා එතුමා යන දවසට මට ඒක දීලා යන්නම් කියලා. තමුන්නාන්සේ වාඩි වෙලා ඉන්නකෝ? හැබැයි කවදාවත් කොලොන්නාවේ සංවිධායකකම හම්බ වෙන්නේ නැහැ හිරුණිකා ඉන්නකල්. ඒක මතක තියා ගන්න. ඒක නිසා ගරු සභාපතිතුමනි, ඒ පළාත් පාලන ක්‍රමය ශක්තිමත් කළා නම් මම හිතන්නේ, මේ පළාත් සභා ක්‍රමය නිශ්ක්‍රීය ක්‍රමයක් වෙනවා. මගෙත් තදබල විශ්වාසයක් තිබෙනවා - දැන් අවුරුදු 25 ක් මේ ක්‍රමය ගලාගෙන ගිහිල්ලා තියෙන්නේ. පළාත් පාසල් ඇති කරලා තිබෙනවා. පළාත් පාලනය සම්පූර්ණයෙන්ම විමධ්‍යගත කරලා තිබෙනවා. හැබැයි, අපට පේන්නේ නැති දේ, උදය ගම්මන්පිල මැතිතුමාත් සමග එකඟ වෙන්න සිද්ධ වන එකම දේ පළාත් පාලන ක්‍රමය විමධ්‍යගත වෙලා තිබෙනකොට පළාත් පාලන කැබිනට් ඇමැතිවරයෙක් ඉන්නවා. සමූපකාර ක්‍රමය සියයට සියයක් මේ

පළාත් සභාව ඇතුළේ විමධ්‍යගත වෙලා තිබෙනකොට මධ්‍යම රජයේ කැබිනට් ඇමැතිවරයෙක් ඉන්නවා සමූපකාර ක්‍රමය පිළිබඳව. ඒ වාගේම තමයි ක්‍රීඩා කටයුතු, මේ විධියට ඇමැතිවරුන්ට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මේ විකෘති භාවය පිළිබඳව මම හිතන්නේ අපට ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු යූ. ජෝර් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ප්‍රධාන ඇමැතිතුමා එනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු ප්‍රධාන ඇමැතිතුමනි, ගරු සභාපතිතුමා මාර්ගයෙන් මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට කියන්නේ, මේ අවුරුදු 05 තමුන්නාන්සේගේ ප්‍රගති සමාලෝචනය නැවත බැලුවා නම්, ඔබතුමා 2010 දී ඉදිරිපත් කරපු මුදල් ප්‍රකාශනයත් එක්ක සංසන්දනය කරලා බලනකොට මේ අවුරුදු 05 දී ඔබට කරන්න පුළුවන් වුණු දේවල් මොනවාද? ඔබට කරන්න බැරි වුණු දේවල් මොනවාද? මධ්‍යම රජය ඔබගෙන් උදුර ගත්ත දේවල් මොනවාද? කියලා ඔබතුමා කල්පනා කරලා බැලුවොත් ඇත්ත වශයෙන්ම හිතට එකඟව උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාත් එක්ක එකඟ වෙන්න වෙනවයි කියන කාරණාව මතක් කරමින් මම නිහඬ වෙනවා.

[ අ.භා. 02.19 ]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, 25 වැනි අයවැය වෙනුවෙන් කථා කරන්න වේලාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අද පොදු සාකච්ඡාවේදී පළමුව ප්‍රවාහන අමාත්‍යාංශය ගැන කථා කිරීමට අදහස් කරනවා. මොකද, ප්‍රවාහන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවට සහභාගී වන මන්ත්‍රීවරයෙක් නිසා. මොකද, ප්‍රවාහන අමාත්‍යාංශයේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ගැන කථා කරනවා නම්, බස්නාහිර පළාතේ ලියාපදිංචි බස්රථ 6158 ක සංඛ්‍යාවක් තිබෙනවා. ඒ වාගේම දෛනිකව ධාවනය වන බස්රථ සංඛ්‍යාව 5100 යි. සේවා සපයන මාර්ග සංඛ්‍යාව 451 යි. බස් නැවතුම් පොළවල් 80 ක් තිබෙනවා. ඒ වාගේම භූමියක් සහිත නැවතුම් පොළවල් 56 ක් තිබෙනවා. භූමිය රහිත බස් නැවතුම් පොළවල් සංඛ්‍යාව 24 ක් තිබෙනවා. ඒ වාගේම ප්‍රාදේශීය කාර්යාල 07 ක් තිබෙනවා. කොළඹට 04 කුත්, ගම්පහට 02 කුත්, කළුතර 01 කුත්. මම හිතන්නේ, ප්‍රවාහන අධිකාරිය ගැන අද කථා කරන සෑම මහජන නියෝජිතයෙක්ම සෑහීමකට පත් වෙන්නේ නැහැ. ඒකට හේතුව, ප්‍රවාහන අධිකාරියේ සභාපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාම අද ප්‍රවාහන අමාත්‍යවරයා, උපදේශක කාරක සභාවල ගන්නා තීන්දු ක්‍රියාත්මක කරලා බලාපොරොත්තු වන අරමුණ කරා යන්න බැහැයි කියන එක අද පිළි අරගෙන තිබෙනවා. ඒකට හේතුව තමයි අද මම ජා-ඇළ කොට්ඨාශයේ තිබෙන ගම්පහ 01 කාර්යාලය ගැන කථා කරනවා නම් ගම්පහ 01 කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු හැටියට භාරව ඉන්න කළමනාකරු ඒ ප්‍රදේශයේ මාර්ග ගණනාවක් සම්බන්ධව ඉන්නවා. මේ මාර්ගවල වෙලා තිබෙන දූෂණ ගැන කථා කරනවා නම්, ඒ පිළිබඳව ඉදිරිපත් කරන්න සෑහෙන කොටසක් තිබෙනවා. ඒ වාගේම තමයි ප්‍රවාහන අමාත්‍යවරයා ඉල්ලීමක් කෙරුවා, ප්‍රාදේශීය කාර්යාලවල කමිටු පිහිටුවන්න කියලා. මම දන්නා තරමින් මේ අවුරුද්දටම ප්‍රාදේශීය කාර්යාලවල - අනෙක් කාර්යාල මම දන්නේ නැහැ. ගම්පහ 01 කාර්යාලයේ අවුරුද්දටම එක රැස්වීමක් විතරයි පවත්වලා තියෙන්නේ. ඒ රැස්වීමටත් මන්ත්‍රීවරු හැටියට සහභාගී වෙන්නේ මමත්, නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමා සහ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සාමාන්‍යාධිකාරීතුමා විතරයි. අපි අද හොඳටම දන්න දෙයක් තමයි ප්‍රවාහන අධිකාරියෙන් යම්කිසි මාර්ගයකට ගමන් බලපත්‍රයක් දුන්නොත් දවස් තුන හතරකට පස්සේ මාර්ගයේ යම්කිසි වාර්ජනයක් කරලා ඒ ගමන් බලපත්‍රය අවලංගු කරනවා. යම්කිසි ගමන් බලපත්‍රයක් දෙන්න පෙර ඒ ප්‍රාදේශීය කළමනාකරු හරහා ඒ ප්‍රදේශයේ ඉන්න මහජන නියෝජිතයන් කැඳවලා, මාර්ගයේ ඉන්න සියලුම බස්රථ අයිති අය කැඳවලා තීන්දුවක් අරගෙන මාර්ග බලපත්‍රයක් නිකුත් කෙරුවා නම්, මේ විධියට මාර්ග බලපත්‍ර අවලංගු කරන්න වෙන්නේ නැහැ. අද මාර්ග බලපත්‍ර දෙන්න පුළුවන්කමක් වෙලා නැහැ. දුන්න බලපත්‍රයත් දවස් දෙකක් තුනක් සුමානයක් ඇතුළත අවලංගු කරනවා. ඒකට ප්‍රධාන හේතුව තමයි කළමනාකරුවන්ගේ කමිටු ක්‍රියාත්මක කරලා, මගීන්ට පහසුකම් ලබා දෙන්න බලාපොරොත්තු වන තැනට අපට යන්න බැරි වීම. නිවාසිපුර තිබෙන නිවාස සංකීර්ණයේ ගෙවල් 1200 ක් තිබෙනවා. 5000 කට වැඩි ප්‍රමාණයක් ජීවත් වෙනවා. ඒ වාගේම කොළඹ සිට නිවාසිපුර දක්වා 187/2 කියලා බස් එකක් ධාවනය වෙනවා. නමුත් නිවාසිපුර සංකීර්ණයේ වෙනම Bus stand එකක් හදලා තිබෙනවා, බස් ගාල් කරන්න. අද කොළඹින් යන බස් එක නිවාසිපුර Bus stand එකේ ගාල් කරන්නේ නැතුව රියදුරන්ට, කොන්දොස්තරට ඕනෑ ඕනෑ තැන්වල බස් එක නවත්වලා ක්‍රියා කරද්දී තමයි අද සියලු දෙනා චෝදනා කරලා තිබෙන්නේ. ප්‍රවාහන අධිකාරියේ සභාපතිතුමාට 2012.10.18 වැනිදා ලියුමක් එවලා තිබෙනවා, පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යතුමා. මේ නිවාස සංකීර්ණයේ ජීවත් වන සියලු දෙනා ඉල්ලීමක් කරලා තිබෙනවා. මේ බස් ටික ගාල් කරන්නේ නැහැ. ඒ නිසා අවශ්‍ය තැනට Bus stand එක ගාල් කරන්න කියලා. මොකද,

ඒ ප්‍රදේශයේ ජීවත් වන ජනතාව මහත් අපහසුතාවයකට පත් වෙනවා කියලා.

ඒ වාගේම තමයි තවත් මාර්ග තුනක් තිබෙනවා. 271, 264/1, 376. මාර්ග බලපත්‍රය නිකුත් කරලා තිබෙන්නේ, රාගම සිට ජා-ඇළ කියලා. නමුත් රාගම සිට ජා-ඇළ දක්වා බස් ගමන් ගන්නේ නැහැ. කදාන නගරයෙන් නවත්වලා, කදාන නගරයෙන් ආපසු හරවලා නැවත රාගමට ධාවනය කරනවා. මේ ප්‍රාදේශීය කළමනාකරුගේ අනුමැතිය ඇතිව. මාර්ග බලපත්‍රයක් නිකුත් කළොත්, ගමන පටන් ගැනීම රාගම නම් ගමනේ අවසානය තිබෙන්නේ ජා-ඇළ. නමුත් අද මගියෙකුට රාගමින් නැඟලා ජා-ඇළට යන්න පුළුවන්කමක් නැහැ. කදානෙන් බැහැලා නැවත බස් එකක යන්න වෙනවා ජා-ඇළට. මේක මගීන්ට වන විශාල අපහසුවක්. ඒ වාගේම තමයි 271 පාරේ අද ආසන 29 බස් එකක් ධාවනය වෙනවා. බස්නාහිර පළාතේ තීන්දුවක් අරගෙන තිබෙනවා, ආසන 29 බස් පාවිච්චි කරන්න බැහැයි කියලා. නමුත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය දැනුවත්ව මාර්ග බලපත්‍රයක් ආසන 29 බස් එකකට දීලා, ආදායම් බලපත්‍රයක් නැති බස් එකක් අද පාරේ දුවනවා. අපි මේක උපදේශක කාරක සභාවේදී සඳහන් කළා. නමුත් මේ වනතුරුත් පාරේ බස් එක දුවනවා. ඒ වාගේම තමයි අද සමහර ස්ථානවල වේලා සටහන්කරුවන් නැහැ. ගනේමුල්ලේ සිට ජා-ඇළ දක්වා ධාවනය වන මාර්ගයේ, ගනේමුල්ලේ වේලා සටහන්කරුවන් සිටින ස්ථානයේ එක දවසට වේලා සටහන්කරුවන් තුන් දෙනෙක් යොදාගෙන එක්කෙනෙකු නිකම් අත්සන් කරලා දීලා මාස ගණනාවක් තිස්සේ ඔහුට පඩි ගෙවනවා. සමහර තැන්වලට වේලා සටහන්කරුවන් නැහැ. අපි මේවා උපදේශක කාරක සභාවේදී අවුරුද්දක් තිස්සේ කථා කෙරුවා. නමුත් ප්‍රවාහන අධිකාරිය හැටියට සභාපතිතුමා ඇතුළු නිලධාරී මණ්ඩලය මේවාට ක්‍රියාත්මක වුණා නම්, අද මේ වනකොට මේවාට වැඩ සටහන් ක්‍රියාත්මක කරන්න තිබුණා. නමුත් අපි කනගාටු වෙනවා. ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටියා, ප්‍රවාහන කමිටු හැටියට මේ ප්‍රාදේශීය කාර්යාල හතේම කමිටු පිහිටුවලා, මහජන නියෝජිතයින් කැඳවලා, ඒ වාගේම අදාළ නිලධාරීන් කැඳවලා කමිටු හරහා මේවා ක්‍රියාත්මක කෙරුවා නම් යම්කිසි ප්‍රමාණයකට දූෂණ අඩු කර ගන්න තිබුණා. ඒ වාගේම තමයි ජා-ඇළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇතුළත මාර්ගයේ දුවන බස්වල අද විශාල වශයෙන් මාර්ග පරීක්ෂකවරු අයුතු ලෙස හැම බස් එකකින්ම මුදල් අය කරනවා. අපි දකිනවා. වරදක් කරලා නම් ලොග් ෂීට් එක ඇතුළේ රුපියල් 200 ක් 300 ක් දාලා දුන්නාම සල්ලි ටික සාක්කුවේ දාගෙන ලොග් ෂීට් එකත් අරගෙන බස් එක යන්න අරිනවා. මේ වාගේ දූෂණ රාශියක් අද ප්‍රවාහන අධිකාරියේ ප්‍රාදේශීය ගම්පහ 01 කාර්යාලයේ සිද්ධ වෙනවා කියන එක මේ වෙලාවේ මම මතක් කරනවා. මේක අනිවාර්යයෙන්ම නවත්වන්න ඕනෑ දෙයක්.

මොකද, මීට පෙර අයවැය විවාදවලදී යම්කිසි මන්ත්‍රීවරුන් ප්‍රමාණයක් කථා කළා. ඒ වාගේම උපදේශක කාරක සභාවේදී කථා කෙරුවා. ගියවර 2011.11.06 වැනිදා මේ සභාවේ මම විශේෂ ප්‍රකාශයක් කෙරුවා. ඩබ්ලිව්.ඒ.එස්. කුමාර පෙරේරා කියන පුද්ගලයා මේ පළාත් සභාව තුළ ප්‍රවාහන අධිකාරියේ වේලා සටහන් කරුවෙක් හැටියට රස්සාව කරමින් වේතනය ගන්නවා වාගේම ජා-ඇළ කෙට්ඨාශයේ මන්ත්‍රීවරයෙකුගේ කාර්ය මණ්ඩලයේ ඉඳගෙන අවුරුදු ගණනාවක් පඩි ගත්තාය කියලා. අද එක සභාවකින් එක පුද්ගලයෙක් අවුරුදු ගණනාවක් පඩි

[ ගරු මෙරිල් පෙරේරා ]

ගත්තා. ඒ ප්‍රකාශය කරලා හෙට වනකොට මාසයක් වෙනවා. ප්‍රවාහන අධිකාරියේ එම වේලා සටහන්කරු තවමත් රස්සාව කරනවා. මේ වනතෙක් ගත්තු ක්‍රියා මාර්ගය මොකක්ද? ඒ නිසා ප්‍රවාහන අධිකාරිය ගැන අපි සෑහීමකට පත් වෙන්නේ නැහැ. ප්‍රවාහන අධිකාරියේ සභාපතිගේ ඉඳලා සියලුම නිලධාරීන් මේවාට වග කියන්න ඕනෑ. ඒ වාගේම තමයි සාමාන්‍ය නීතියක් තිබෙනවා. ප්‍රවාහන අධිකාරියේ වැඩ කරන කෙනෙකුට, සේවකයෙක් වෙන්න පුළුවන්. නිලධාරියෙක් වෙන්න පුළුවන්. ඒ කිසිම කෙනෙකුගේ නමට හෝ භාර්යාවගේ නමට මාර්ගයක ගමන් බලපත්‍රයක් ලබා ගෙන බස් එකක් දුවන්න පුළුවන්කමක් නැහැ. මට ඔප්පු කරලා කියන්න පුළුවන්. දැනුවත්වම වේලා සටහන්කරුවන්ගේ නමට හෝ තමුන්ගේ බිරිඳගේ නමට බස් අරගෙන මාර්ග බලපත්‍ර අරගෙන අද පාරේ දුවනවා. මේක නීතියෙන් තහනම්. ඒ නිසා මම මේ වෙලාවේ ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ප්‍රවාහන ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. සල්ලි නැතුව වැඩක් කරන්න බැහැයි කියන එකත් අද ඔප්පු කරලා තිබෙනවා. ඒ නිසා 2013 වසරේ මේ වැරැදි හදා ගන්න කියන එක තමයි ප්‍රධාන ඉල්ලීම.

ඒ වාගේම අධ්‍යාපනය වෙනුවෙන් යම්කිසි උත්තරයක් දෙන්න ඕනෑ. ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කළා, ජා-ඇළ කොට්ඨාශයේ පානීය ජලය නොමැති පාසල් තුනකට වැඩිය තිබෙනවා කියලා. මම වගකීමෙන් කියනවා. ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා ඉන්නවා. එතුමා 1991 ඉඳලා ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායකවරයෙක්, මන්ත්‍රීවරයෙක්, සභාපතිවරයෙක් හැටියට ඉඳලා තමයි මේ පළාත් සභාවට මන්ත්‍රීවරයෙක් වශයෙන් ආවේ. එතුමා සභාපති කාලේ මමත් විපක්ෂ නායක හැටියට ඉඳලා පළාත් සභාවට ආවා. මම පළාත් සභාවට ඇවිල්ලා මේ වනකොට අවුරුදු 08 ක් වෙනවා. වගකීමෙන් කියනවා ජා-ඇළ පළාත් සභාවට අයිති පාසල් 38 යි තියෙන්නේ. ඒ පාසල් 38 තුළ ළිඳක් හෝ නළ ළිඳක් හෝ ඒ වාගේම ජල සැපයුම් තිබෙන පාසලක් නැත්නම්, මම වගකීමෙන් කියන්නේ හෙට මම පළාත් සභාවෙන් අයින් වෙනවා, මෙතුමාට ඔප්පු කරන්න පුළුවන් නම්. එහෙම පාසලක් නැහැ. පානීය ජලය ජා-ඇළ කොට්ඨාශයටම -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. ඔබතුමා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ලිඳෙන් වතුර ගත්තු කාලේ ඉවරයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, පානීය ජලය කියන්නේ ලිඳෙන් බිව්වත් ජලය. නළ ලිඳෙන් බිව්වත් ජලය. නලයෙන් බිව්වත් ජලය. ඇඳගෙන නැවත් ජලය. මම වගකීමෙන් කියනවා. ජා-ඇළ කොට්ඨාශයේ අලුත් ව්‍යාපෘතියක් යනවා. හැම පාසලෙන්ම පානීය ජලය ඉල්ලුවාට, පාසලට පාවිච්චි කරන්න ජලය තිබෙනවා කියන එක මේ වෙලාවේ එතුමාගේ දැන ගැනීම සඳහා අවධාරණය කරනවා. අනෙක් එක මේ වනකොට ජා-ඇළ කොට්ඨාශයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 04 දෙනෙක් ඉන්නවා. පළාත් සභා මන්ත්‍රීවරු 05 දෙනෙක් ඉන්නවා. ඔය කියන සියලු දෙනාට මේ අවුරුදු 3 1/2 ඇතුළත පළාත් සභාවෙන් වැඩ කරන තුරු ඇස් ඇරුණේ නැහැ. ඇස් ඇරුණේ මේ අවුරුදු 3 1/2 තුළ ප්‍රධාන ඇමැතිතුමාගේ අධ්‍යාපන අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළ නිසයි. ඒ සංවර්ධන කටයුතු වනකොට තමයි ඇස් ඇරුනේ. එතකල් ඇස් ඇරුනේ නැහැ. අද සුපසන් නිම්තෙර වැඩ සටහන යටතේ ක්‍රියාත්මක කරනකොට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත්, පළාත් සභා මන්ත්‍රීවරුන්ටත් බලාගෙන ඉන්න බැරි වෙලා තිබෙනවා. විපක්ෂයේ සියලු දෙනාටමත්. අන්න ඒ නිසා තමයි අද මෙතුමා පෙන්නනන්නේ. ජා-ඇළ ආසනය නියෝජනය කරමින් තාත්තා අවුරුදු 37 ක් පාර්ලිමේන්තුවේ අද පාසල්වලට කෙරුවා නම්, පුතාට පානීය ජලය දෙන්න තිබුණා නේ? තාත්තා කෙරුවා නම්. ශත පහක් අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරලා නැහැ. ඒ නිසා මම එතුමාට වගකීමෙන් කියනවා. අභියෝගය භාර ගන්න. හෙට උදේට ඇවිල්ලා නැහැයි කිව්වොත් තමුන්නාන්සේ අයින් වෙන්න ඕනෑ. නැත්නම් මම හෙට උදේ අයින් වෙනවා කියලා කියනවා. ස්තුතියි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, අභියෝගය භාර ගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අභියෝගය භාර ගන්න. විවාදයකට යන්න දෙන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මෙතුමා තවම ඉන්නේ ආදි කාලේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පොඩි ළමයි ලිඳෙන් වතුර ඇදපු කාලේ ඉවරයි. එතුමා තවම ඉන්නේ 70 ගණන්වල.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

චන්ද්‍රභානු අදිකාරම් ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

**ගරු ඩී.ඒ. චන්ද්‍රභානු**
Hon. D.A. Chandrabhanu

ගරු සභාපතිතුමනි, -

[සභාවේ ඝෝෂා]

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, මෙහේ ඉගෙන ගන්න බැරුව, O/L Fail වෙලා එංගලන්තෙට ඇරියා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම දැක්කා නේ?

[සභාවේ ඝෝෂා]

අර ගම්මන්පිල ගරු ඇමැතිතුමාගේ අයිපෑඩ් එක -

[සභාවේ ඝෝෂා]

මම දැක්කා නේ ඔබතුමා. ඔබතුමා නිකම් බයිලා කියන්න එපා. තමුන්නාන්සේගේ -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පුළුවන් නම් වැල්ල වීදියේ බූත් එක දිනලා පෙන්වන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අනවශ්‍ය විවාදවලට යන්න එපා. කරුණාකර වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තමුන්නාන්සේගේ ගේ තිබෙන වැල්ල වීදියේ බූත් එක පුළුවන් නම් දිනලා පෙන්නන්න. ගමේ මිනිස්සු ඔබතුමා ගැන හොඳට දන්නවා.

**ගරු ඩී.ඒ. චන්ද්‍රභානු**
Hon. D.A. Chandrabhanu

ගරු සභාපතිතුමනි, මගේ කාලය අවශ්‍යයි.

**ගරු මෙරිල් පෙර්රා**
Hon. Meril Perera

බූත් එකේ ඡන්දයක් නොවෙයි. දිස්ත්‍රික්කයේ ඡන්දයක් තියෙන්නේ.

**ගරු යූ. ජෝර්  පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කථා කරද්දී උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා හිටියේ නැහැ. දූෂණ සම්බන්ධ ගොඩාක් විස්තර කිව්වා. අමාත්‍යතුමා හිටියේ නැහැ. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා ඒ සම්බන්ධව කමිටුවක් දාලා පරීක්‍ෂණයක් කරන්න කියලා.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා මීගමුව ආසනයේ මම නියෝජනය කරන ඡන්ද කොට්ඨාශයේ මම ඡන්දය පරාදයි කියන එක. ගරු සභාපතිතුමනි, වගකීමෙන් කියනවා මම මැතිවරණයට ආපු දා ඉඳලා පළමුවැනි මැතිවරණයෙන් මීගමුව ආසනයේ ඡන්ද 4200 ක් අරගෙන ඊළඟට පහලොස් දහස් ගණනක ලංකාවේ වැඩිම මනාප ප්‍රතිශතය අරගෙන -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේ කියන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වරප්‍රසාද ප්‍රශ්නයක් නෙවෙයි නේ? පැහැදිලි කිරීමක් නේ කරන්නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පොඩ්ඩක් ඉන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මටත් අවස්ථාව දෙනවාද පැහැදිලි කිරීමක් කරන්න? මටත් 36 (1) යටතේ දෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අශෝභන ලෙස හැසිරෙන්න එපා. ඉස්සරහාට මම ඔබතුමාව නම් කරනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මාර ආණ්ඩුවක් නේ මේක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වරින් වර බාධා කිරීම් කරන්න එපා. මම ඉස්සරහාට ඔබතුමාව නම් කරනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දෙගොල්ලන්ටම සාධාරණය ඉෂ්ට කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැම තිස්සේම ඔබතුමාට ඔය දේ කරන්න දෙන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා එතුමාට පැහැදිලි කිරීමක් කරන්න අවස්ථාවක් දෙනවා නම්, මටත් අවස්ථාවක් ඕනෑ පැහැදිලි කිරීමක් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා කෙටියෙන් කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මාර කථාවක් නේ මේක?

**ගරු නිමල් ලාන්සා – අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මන්ත්‍රීවරයෙකුගේ ගරුත්වය ආරක්ෂා කර ගන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා සාධාරණය කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සාධාරණය තමයි. එතුමා ඇමැතිවරයෙක්.

**ගරු නිමල් ලාන්සා – අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

මම වෙන මුකුත් කියන්නේ නැහැ ගරු සභාපතිතුමා. මෙතුමා මතු කළා විශේෂයෙන්, මීගමුව කොට්ඨාශයේ මම නියෝජනය කරන මගේ කොට්ඨාශයේ ඡන්දය මම හැමදාම පරාදයි කියන එක. ඉතින් ගරු සභාපතිතුමනි, මම ඒකට උත්තරයක් දෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උත්තරයක් නොවෙයි. ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කියන්න.

**ගරු නිමල් ලාන්සා – අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ඒ නිසා ඉතාමත් කෙටියෙන් පැහැදිලිව මම උත්තරය දෙන්නම්.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

මේ වෙලාවේ උත්තර දෙන්න බැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මට වරප්‍රසාද ප්‍රශ්නය යොමු කරන්න.

**ගරු නිමල් ලාන්සා – අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, මම ඉතාමත් කෙටියෙන් කියන්නම්. මම මැතිවරණ 08 කට විතර පෙනී හිටියා. මැතිවරණවලදී එන්න එන්න මගේ ඡන්ද ප්‍රතිශත සංඛ්‍යාව වැඩි කරගෙන ඇවිල්ලා තිබෙනවා. ඊළඟට මම එතුමාට අභියෝග කරනවා –

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කථාවක් නේ කරන්නේ? මේක මොන වරප්‍රසාදයක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පොඩ්ඩක් වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වරප්‍රසාදය මොකක්ද? තමන්ගේ ඡන්ද ප්‍රතිඵල කියන වරප්‍රසාදය මොකක්ද? ඕනෑ නම් මාව එළියට දාන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ඕනෑ ඒක නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙතුමාගේ ඡන්ද ප්‍රතිඵල කියන්න –

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වරින් වර බාධා කිරීම් කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා මෙතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය සඳහා අවස්ථාව දුන්නේ මොන රීති යටතේද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ වැඩවලින් මන්ත්‍රීවරයෙකුට තිබෙන ගරුත්වයටත් හානි වෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මොන රීති යටතේද කථා කරන්න දෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවස්ථාව දෙන්න. මම ඒක බලාගන්නම්. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම නම් අපටත් කථා කරන්න දෙන්න.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා දිගටම බාධා කිරීම් කරනවා. ඉස්සරහාට මම ඔබතුමාව නම් කරනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඡන්ද ප්‍රතිඵල ගැන කියන්නත් වරප්‍රසාදයක් තියෙනවා.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, මම ඡන්දදායකයෙක් විධියට මගේ ඡන්දය තියෙන්නේ 158 බී වැල්ලවීදිය යන කොට්ඨාශයේ. ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ, -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේ අයවැය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය පිළිබඳව ඔබතුමාට පැහැදිලි කිරීමක් කරන්න -

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, මෙතුමා පැහැදිලිව කිව්වා, මගේ කොට්ඨාශයේ මම හැමදාම පරාදයි කියලා. එතකොට මගේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒ ප්‍රශ්නය වරප්‍රසාද කමිටුවට යොමු කරලා සාකච්ඡා කරමු.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඒ නිසා මම පැහැදිලිවම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. 158 බී ඡන්ද කොට්ඨාශයේ ඡන්දය වැටුණාද? කවුද ඡන්දය දින්නේ කියන එක මුළු වැල්ලවීදියම, මුළු මීගමුවම මුළු රටම දන්නවා. මොකද, එතරම් ඡන්ද සංඛ්‍යාවක් මම අරගෙන තිබෙනවා. නමුත් තමුන්නාන්සේත් විශාල ඡන්දය ප්‍රමාණයක් කරලා අත්දැකීමෙන් දන්නවා එක කොට්ඨාශයක (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා අපි මේක ඉවර කරමු.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, අපි මැතිවරණ 1000 ක් කරපු මිනිස්සු විධියට එක කොට්ඨාශයක ඡන්දය ගණන් කරන එක අපි කාටවත් කියන්න බැහැ. කාටද කියන්න පුළුවන්? ඉතින් මෙතුමා අහන ප්‍රශ්නවලට මට උත්තර දෙන්න බැහැ. ඒ නිසා මම පැහැදිලිව කියන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඉතාමත්ම කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මේ පළාත් සභාවේ අද අයවැය සම්බන්ධව සාකච්ඡාවක් තියෙන්නේ. මේක මීට පෙරත් ඇදුනා. මෙතුමන්ලාගේ අධ්‍යාපන ප්‍රතිඵල පිළිබඳව. එදත් ඔබතුමා පොරොන්දු වුණා මේ දෙදෙනාගේම අධ්‍යාපන ප්‍රතිඵල ගෙනැල්ල සභාගත කරනවා කියලා. ඒක කළා නම් මේ ප්‍රශ්නය ඉවරයි ගරු සභාපතිතුමනි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු මහ ඇමැතිතුමා, අධ්‍යාපන ප්‍රතිඵල කථා කරන භාෂාවෙන් හොඳටම තේරෙනවා. ආයිත් ඒක අහන්න දෙයක් නැහැ.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

භාෂාවෙන් නෙවෙයි, හැසිරීමෙන් පේනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

චන්ද්‍රභානු අදිකාරම් ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[ අ.භා. 02.35 ]

**ගරු ඩී.ඒ. චන්ද්‍රභානු**
Hon. D.A. Chandrabhanu

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව මා ප්‍රථමයෙන් ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මගේ කථාව ආරම්භයත් සමගම, මම කථා කිරීමට බලාපොරොත්තු වුණු මාතෘකාවෙන් පොඩ්ඩක් බැහැර වෙලා මේ සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ ප්‍රකාශ සම්බන්ධයෙන් පිළිතුරක් ලබා දිය යුතු වෙනවා. විශේෂයෙන් අපේ මොහොමඩ් ෆයිරුස් ගරු මන්ත්‍රීතුමා ආනයනික අත්‍යවශ්‍ය භාණ්ඩ කිහිපයකට අය කරනු ලබන තීරු බද්ද වැඩි කිරීම සම්බන්ධයෙන් කථා කළා. විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. රටක් හැටියට එක පැත්තකින් නිෂ්පාදකයා සවිබල ගන්වන්නට, ශක්තිමත් කරන්නට බොහෝ විට තීරු බදු වැඩි කරන්නට වෙන අවස්ථා තිබෙනවා. ඒ වාගේම අනෙක් පැත්තෙන් සංචිත ආරක්ෂා කරන්න, විදේශ සංචිත ආරක්ෂා කර ගැනීමේ කාර්ය වෙනුවෙනුත් ආනයන සීමා කිරීමක් හැටියට ඒ දේ කරන්න වෙනවා. ඊටත් වඩා මෙතැන තිබෙන බරපතළ ප්‍රශ්නය ඕක නොවෙයි. අපි දන්නවා සමහර වෙලාවට තීරු බදු වැඩි කිරීම නිසා භාණ්ඩයේ මිල ඉහළ යනවා. ඒ භාණ්ඩයේ මිල ඉහළ යනකොට මිලත් එක්ක එයට තිබෙන ඉල්ලුමෙත් අඩුවීමක් වෙනවා. නමුත් මේ රටේ වෙළඳ ඒකාධිකාරය මෙහෙයවන පිටකොටුවේ ව්‍යාපාරිකයින් කිහිප දෙනෙකුට අවශ්‍යතාවය තිබෙනවා, තමන්ගේ අධිකාරියක් හැටියට මේක පාවිච්චි කරලා ඒ භාණ්ඩ වෙනුවෙන් අය කරන ලාභ තීරුව, මාජින් එක වැඩිම ප්‍රමාණයකින් ආරක්ෂා කරන්න. භාණ්ඩ මිල ඉහළ ගියාට පස්සේ සමහර විට ඉල්ලුම අඩු වනකොට අලෙවි වන ප්‍රමාණය Turnover එක අඩු වෙනවා. එහෙම වුණොත් මහ පරිමාණයෙන් වෙළඳ ආර්ථිකය පාලනය කරන අත්‍යවශ්‍ය භාණ්ඩ ටික ලංකාවට ගෙන්වීම පාලනය කරන්න ව්‍යාපාරිකයින්ට ඉඩ දෙනවා. සමහර විට මොහොමඩ් ෆයිරුස් ගරු මන්ත්‍රීතුමා එහෙම රිදීමක් වුණාද කියන එක ගැන දැනීමක් නැති බව මේ වෙලාවේ ප්‍රකාශ කරන්න වෙනවා. සීනි, අර්ථාපල්, පරිප්පු මේවා තමයි ඒවා.

ඒ වාගේම අනෙක් පැත්තෙන් ගරු සභාපතිතුමනි, නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, මේක පිය පුතු සෙනෙහස විදහා දැක්වෙන අයවැයක් හැටියට. 2013 අවුරුද්දේ අතිගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කරපු අයවැයත් එක්ක. විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, අද වනකොට ලංකා ඉතිහාසය තුළ රටේ ආර්ථිකය පිළිබඳව මනින ඕනෑම දර්ශකයක් ඉතාමත්ම ඉහළ අගයක පවත්වන්න මේ රජය සමත් වෙලා තිබෙනවා කියලා. සුගත් මතුගමගේ ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් බොහෝ අදහස් ප්‍රකාශ වුණා. දර්ශක සම්බන්ධව. ඊට අමතරව විශේෂයෙන් උද්ධමනය අද 7% දක්වා පහළ බැහැපු වෙලාවක, ඒ වාගේම ඒක පුද්ගල ආදායම ගැන සඳහන් කළත් ඒවා ගැන මම වැඩිය කියන්නේ නැහැ. විශේෂයෙන් සෑම ආර්ථික දර්ශකයක්ම ඉතාමත් ශක්තිමත් අදියරක පවතින අවස්ථාවක තමයි මේ රටේ 2013 ජාතික අයවැය ඉදිරිපත් කළේ. සමහර විට පළාත් සභාවේ අයවැය ගැන, ජාතික අයවැය ගැන කථා කරන්න අදහස් නැති වුණාට පස්සේ මඩ ගැසීමෙන් පමණක් සෑහීමකට පත් වෙන්නට විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා කටයුතු කිරීම පිළිබඳව, අපේ අප්‍රසාදය මේ වෙලාවේ ප්‍රකාශ කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ අයවැය ගැන කථා කරනකොට මේ වෙලාවේ බොහෝ මන්ත්‍රීවරුන්ගේ අදහසක් වුණේ සමහර විට ගිය අවුරුද්දට සාපේක්ෂව ප්‍රාග්ධන වියදම 1.6% කින් අඩු වුණාය කියලා. නමුත් අපි බොහොම පැහැදිලිව දන්නවා. 2013 අවුරුද්දේ මධ්‍යම රජයේ අයවැය ප්‍රකාශය ඉදිරිපත් කරනකොට ඒකේ සඳහන් කරලා තිබෙනවා, පළාත් සභාවෙන් අපි ගණනය නොකරපු විශාල බදු සංඛ්‍යාවක් අපට ලබා ගැනීමේ හැකියාව පිළිබඳව. විශේෂයෙන් මෝටර් රථ ලියාපදිංචි කිරීමේ බද්ද වැඩි වීම තුළ මිලියන 1500 ක ප්‍රමාණයක් පළාත් සභාවලට අය වෙන්න සලස්වා තිබෙනවා. මේ රටේ සමස්ත වාහන ප්‍රමාණය සැලකුවාම අලුතින් ලියාපදිංචි වුණු ඒවායෙන් 40% කට ආසන්න ප්‍රමාණයක් ලියාපදිංචි වෙන්නේ බස්නාහිර පළාත් සභාවේ. එහෙම නම් ඒ අදාළ වැඩි කිරීම තුළ වැඩිම වරප්‍රසාදය හම්බ වෙන්නේ, බස්නාහිර පළාත් සභාවට කියන එක මතක් කරන්න ඕනෑ. ඒ වාගේම වාහන ආදායම් බලපත්‍ර ගාස්තු වැඩිවීම තුළිනුත් වැඩිම වාහන සංඛ්‍යාවක් ලියාපදිංචි වුණු බස්නාහිර පළාත් සභාවට තමයි ඒ වැඩිම මුදල ලැබෙන්නේ. ඒ විතරක් නොවෙයි. මිලියන 950 ක මුදලක් මධ්‍යම රජයෙන් ගුරු පුහුණුව සඳහා ලබලා දීලා තිබෙනවා. ඒ තුළත් වැඩිම ගුරුවරුන් ඉන්න පළාත් සභාව හැටියට බස්නාහිර පළාත් සභාවට තමයි වැඩිම ප්‍රතිලාභය ලැබෙන්නේ කියන එකත් මතක් කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, පළාත් සභාවේ විෂයය පථය තුළ වඩාත්ම අවධානය යොමු වෙන්නේ, වැඩිම කථා බහට ලක් වෙන්නේ අධ්‍යාපනය. අපි සන්තෝෂ වෙනවා. පළත් සභාවේ සමස්ත වැයෙන් 40.97% ක් එහෙම නැත්නම් 42% ක් පමණ වෙන් කරලා තිබෙන්නේ, අධ්‍යාපනය වෙනුවෙන්. ඒක බොහොම සාධාරණයි. ඇයි එහෙම කියන්නේ? අනෙක් අමාත්‍යාංශවලට වෙන් කිරීමත් අවශ්‍යයි. ගරු සභාපතිතුමනි, අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරන ආයෝජනය, තුළින් ලැබෙන ප්‍රතිලාභය අනන්තයි, අප්‍රමාණයි, අසීමිතයි, අමිලයි. ඇයි එහෙම කියන්නේ? වෙන ඕනෑම ව්‍යාපෘතියක් වෙනුවෙන්, ඕනෑම වැඩ සටහනක් වෙනුවෙන් කරනු ලබන ආයෝජනයේ ප්‍රතිලාභය ගණනය කිරීමේ හැකියාවන් තිබෙනවා. එය සංඛ්‍යාත්මකව ගණනය කරන්න පුළුවන්. ප්‍රමාණාත්මකව ගණනය කරන්න පුළුවන්. කාලානුරූපව ගණනය කරන්න පුළුවන්. එහෙත් අධ්‍යාපනයෙන් ලැබෙන ප්‍රතිලාභය මොන ක්‍රමයටවත් ගණනය කරන්න බැහැ. ඒක අනන්තයි. අසීමිතයි. ඒ නිසා විශේෂයෙන්ම අධ්‍යාපනයට මූලිකත්වය දීලා කරන මේ ක්‍රියාදාමය තුළ මම හිතනවා, ඉදිරි පරපුරක් ගොඩ නහන්නට දැනුමේ කේන්ද්‍රස්ථානය කරා ගමන් කරන මේ වෙලාවේ බස්නාහිර පළාත් සභාව තුළින් එයට විශාල අත්වැලක් සපයනවා කියන එක මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, දීර්ඝ වශයෙන් කථා කරන්න වෙලාව නැති වුණත්, ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ සුපසන් නිම්තෙර වැඩ

සටහන් යටතේ පසුගිය දවස් දෙකේම මම මතුගම කොට්ඨාශයේ පාසල් 42 කට විතර ගියා. මේ ගිය වෙලාවේ දරුවන්ගෙන් ලැබුණු ප්‍රතිචාරය, ගුරුවරුන්ගෙන් ලැබුණු ප්‍රතිචාරය, මව්පියන්ගෙන් ලැබුණු ප්‍රතිචාරය මම සඳහන් කරන්න ඕනෑ. සමහර වෙලාවලදී සුපසන් නිම්තෙර වැඩ සටහනේ "*අපේ දෑතින් අපේ පාසල සුරකිමු*" කියන තේමාව තුළ අපි පාසලකට රුපියල් 50,000/- ක මුදලක්. 750 ට අඩු නම් 75,000/- ක මුදලක්. 1000 ට අඩු නම් රුපියල් 100,000/- ක මුදලක්. ඊට වැඩි නම් 150,000/- ක්. හැබැයි ගරු සභාපතිතුමනි, ගිය අවුරුදුවල වැඩ ප්‍රගතිය බලනකොට අපි දැක්කා රුපියල් 50,000 ක් දෙනකොට ලක්ෂ එකහමාරක දෙකක වැඩ කරලා තිබෙනවා. ඒකට ප්‍රධාන හේතුව පාසල තමයි ගමක හෝ නගරයක තිබෙන හොඳම ප්‍රජා මධ්‍යස්ථානය. වැඩිම ප්‍රජා දායකත්වයක් ලබා ගන්න පුළුවන් කේන්ද්‍රස්ථානය තමයි පාසල. පාසලක් වුණාමලු ඒ පාසලේ පාසල් දරුවෝ, දෙමව්පියෝ, ආදි ශිෂ්‍යයෝ, සංවර්ධන සමිතිය ඒ විතරක් නොවෙයි, සුභ පතන්නෝ මේ සියලු දෙනාම එක යදමක පුරුක් වාගේ එක මිටියකට, කැටියකට ගොනු වෙලා පාසලේ සංවර්ධනය වෙනුවෙන් කැප වෙනවා. ඒ විතරක් නොවෙයි. ඒ සියලු දෙනාම ඇවිල්ලා තීන්ත ගානවා. පුහුණු ශ්‍රමිකයෝ, වඩු කාර්මිකයෝ, මේසන්වරු මේ සියලු දෙනාම තමන්ගේ ශ්‍රමය දුන්නාම මේක අපේ වැඩක් හැටියට සලකලා පුදුම සහභාගීත්වයක් තුළින්, මූල්‍ය වටිනාකම වාගේ ගුණාකාර කිහිපයකින් යුක්ත වූ හිමි වටිනාකමින් යුතුව කටයුතු කරන්න මේ සුපසන් නිම්තෙර වැඩ සටහන යටතේ කටයුතු කරලා තිබෙනවා කියන එකත් මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, සරුදම් අරුණැල්ල. අපි දන්නවා පාසලේ පන්ති කාමරය තුළදී ඉගැන්වීම් ක්‍රියාවලිය කරනකොට මේ තුළ බොහෝ විෂයයන් උගන්වනවා. අපේ කාලයේ නම් ගණිත, මිණිත, ලිඛිත, සාහිත විෂයන් ඉගැන්වුවා. පන්ති කාමරයෙන් බැහැර වෙලා දුවන්න, පනින්න, නටන්න, ගයන්න, රඟන්න, වයන්න අවස්ථාව උදා වුණා. මේ දේවල් කළා. අපි මේ සියල්ල තුළින් දරුවාගේ අධ්‍යාපන මට්ටම දියුණු කරනවා. ඒ වාගේම දැනුම වර්ධනය කරනවා. ඒ වුණාට හදවතට කථා කරන්න, හදවතට සංවේදී වෙන්න පාසල තුළදී මොළේට තරම් සංවේදී වීමක් හදවතට තිබුණේ නැහැ. ඒ නිසා ගුණාත්මක පුරවැසියෝ හැටියට, සාරධර්මවලින් පිරුණු පුරවැසියෝ හැටියට දරුවාව හොඳ මඟකට ගෙනියන්න හොඳම තැන තමයි දහම් පාසල. එය ආගම් භේදයකින් තොරව. බෞද්ධ වේවා, හින්දු වේවා, ඉස්ලාම් වේවා, කතෝලික වේවා මේ මොන දහම් පාසලට ගියත් ඒ සෑම දහම් පාසලකදීම දරුවාගේ හදවතට තමයි කථා කරන්නේ. අපි දන්නවා, පාසලේදී විෂයය දැනුම ලබා ගන්නවා වාගේම මව්පියන්ට ගරු කරන, වැඩිහිටියන්ට ගරු කරන නිහතමානී බොහොම අවිහිංසා ඒ වාගේම අවංක, ගුණගරුක, ඒ වාගේම හොඳ ආදරවන්තයෝ - ආදරවන්තයෝ කියලා කියන්නේ, සතා සිව්පාවට, ගහට කොළට, ඇළට දොළට, පරිසරයට කරන ආදරයනුයි. එවැනි දරුවෝ හදන්නට නම්, අත්‍යවශ්‍යම තෝතැන්නක්, පාලමක් බවට පත් වෙන්නේ දහම් පාසල. ඒ නිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. සමස්තයක් හැටියට මේ රටේ 40 ලක්ෂයක් පාසල් දරුවෝ ඉන්නකොට එයින් මම හිතන්නේ පසුගිය කාලයේ සංගණනය තුළ ලක්ෂ 20 ක් විතරයි දහම් පාසල් යන්නේ. දහම් පාසල් ගුරු භවතුන් රටේම ඉන්නේ 120,000 ක් විතර. මේ සියල්ල විපර්යාසකට ලක් කරලා මේ ක්‍රියාවලිය තුළ ඉඳලා පළමුවැනි ශ්‍රේණියේ ඉඳලා බස්නාහිර පළාතේ දරුවෝ දහම් පාසල්ගත වෙනවා.

විශේෂයෙන් ඒ සාරධර්මවලින් පිරුණු ගුණාත්මක දරුවෝ හදන්න හොඳම තැන තමයි දහම් පාසල. දවසක් මම රූපවාහිනී වැඩ සටහනක් බැලුවා. ඒ වැඩ සටහන බලන වෙලාවේ

[ ගරු ඩී.ඒ. චන්ද්‍රභානු ]

නිවේදකයාත් එක්ක සම්මුඛ පරීක්ෂණයට ඇවිල්ලා හිටියා සාමාන්‍ය අවුරුදු 70 ක විතර හොඳ ප්‍රභූ පෙනුමක් තිබෙන කාන්තාවක්. ඇය - (බාධා කිරීමක්) ඒ නිසා මේ කාන්තාව සමග නිවේදකයා සම්මුඛ පරීක්ෂණයට එළැඹියා. ඇයත් සමග කථා කරනවා. කථා කරනකොට ඇය කියනවා, මම රාජ්‍ය සේවයේ ඉහළම ආයතන ගණනාවක තනතුරු දරලා දැන් විශ්‍රාම සුවයෙන් ඉන්නේ කියලා. මේ කාන්තාව තමන් රාජකාරී කටයුතු කරපු ස්ථාන ගැන කථා කළා. බොහෝ දේවල් ප්‍රකාශ කළා. ඊට පස්සේ නිවේදකයා අහනවා හොඳයි, ඔබතුමියගේ දරුවෝ දැන් කෝ කියලා. ඒ කියනකොට අර කාන්තාවගේ මුහුණේ තිබුණු දීප්තිමත් භාවය තවත් උත්දීපනය වෙලා, බොහොම ලස්සන මුහුණක් ඇති වෙලා ඇය කියනවා මගේ දරුවෝ ඉතාමත් හොඳයි. මගේ ලොකු පුතා ඇමරිකාවේ අහවල් විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් හැටියට කටයුතු කරනවා. ඊළඟ දියණිය තවත් බටහිර රටක විශේෂඥ වෛද්‍යවරියක් හැටියට කටයුතු කරනවා. මගේ බාල පුතා වරලත් ඉංජිනේරුවරයෙක්. ඔහුත් තවත් බටහිර රටක සේවය කරනවා. ඒ පාර නිවේදකයා අහනවා, ඔබ මේ දරුවන් තුන් දෙනාගෙන් කාගාවද ඉන්නේ? කියලා. එතකොට කාන්තාව ටිකක් නිරුත්තර වෙනවා. නැවත නිවේදකයා අහනවා මැතිනිය ඔබ ලංකාවට ආවේ නිවාඩුවක් ගත කරන්නද කියලා. ඒ වෙලාවේ මේ කාන්තාව පොඩ්ඩක් නිරුත්තර වෙලා ඉඳලා කියනවා. ඒ කියනකොට ඇගේ ඇස් දෙකේ කෙළවරවලින් කඳුළු බේරෙනවා. ගරු සභාපතිතුමනි ඇය කියනවා, මට හොඳ විශ්‍රාම වැටුපක් හම්බ වෙනවා. ඒ නිසා මම දරුවෝ කවුරුත් ළඟ නොවෙයි ඉන්නේ. මැය ඇයට වුණු පුංචි අගතිය මකා ගන්න කියනවා. මම මේ විශ්‍රාම වැටුප පාවිච්චි කරලා ලංකාවේ අහවල් වැඩිහිටි නිවාසයේ ජීවත් වෙන්නේ කියලා. හැබැයි, ඒ වෙලාවේ නිවේදකයා ඇහුවේ නැහැ. ඔබතුමිය දරුවන්ට ඉගැන්නුවා. විශ්ව විද්‍යාල අධ්‍යාපනය දුන්නා. හැබැයි දහම් පාසල් ඇරියාද කියලා. එහෙම ඇහුවේ නැහැ. දහම් පාසල් ඇරියාද කියලා ඇහුවා නම් අනිවාර්යයෙන්ම ගරු සභාපතිතුමනි, ඇයගේ පිළිතුරු වෙන්නේ දහම් පාසල් ඇරියේ නැහැයි කියන එක. ඒකයි මම කිව්වේ, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සරුදම් අරුණැල්ල වැඩ සටහන තුළින් අර කලින් කිව්වා වාගේ මේ රටේ

ගුණාත්මක සාරධර්මවලින් පිරි පරපුරක් හදන්නට හොඳම පාඩමක් බවට පත් වෙලා ඉවරයි කියලා.

ඒ වාගේම මහා පවිත්‍රතා දිනය. ඒ වාගේම පාසල්වල ගුරු තුලනය. මේ සියල්ල ගත් කල අපි ඉතාම සන්තෝෂ වෙනවා. බස්නාහිර පළාත් සභාවේ මෑත අවුරුදු කිහිපය තුළ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විශාල සංවර්ධනයක් ඇති වෙලා තිබෙනවා කියන එක මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ අයවැය ලේඛනය දිහා බැලුවාට පස්සේ අනෙක් කාරණාව තමයි රටේ සමස්ත අයවැයේ දර්ශකත් එක්ක ගත්තාම බස්නාහිර පළාත් සභාව විශේෂයෙන්ම ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ නව වැදැරුම් ප්‍රවේශය ගැන මතක් කරන්න ඕනෑ. මධ්‍යම රජය නොයෙක් දර්ශකයන් පිළිබඳව ඉලක්කගත කරනකොට බස්නාහිර පළාත් සභාව හැටියට එතුමාට හොඳ දැක්මක් තිබෙනවා, ඒ ඉලක්කයන් හඹාගෙන ගිහිල්ලා ඊට වඩා යම් ප්‍රගතියක් ඇතුව බස්නාහිර පළාතේ ජනතාවට ඒ ආර්ථික වාසි ලබා දෙන්නට. 2016 වනකොට එක පැත්තකින් දරුවන්ට ප්‍රාථමික අධ්‍යාපනයට සියයට සියයක් යොමු කරන්නට. ඒ විතරක් නොවෙයි, විශේෂයෙන්ම පාසල් නොයන සෑම දරුවෙකුම පාසල්ගත කරන්නට. ඒ වාගේම 2016 වනකොට සාක්ෂරතාව සියයට සියයක් මට්ටමට ගෙන එන්න. පිරිසිදු ජල පානය දැනට 95.7% ක් වන එක අර මන්ත්‍රීතුමා කිව්වා වාගේ 2016 වනකොට සියයට සියය දක්වාම වැඩි කරන්නට. 2016 වනකොට මේ බස්නාහිර පළාතේ විදුලි පාරිභෝගික සංඛ්‍යාව සියයට සියය දක්වා වැඩි කරන්නට. ඒ විතරක් නොවෙයි. බස්නාහිර පළාත් සභාවේ අද දරිද්‍රතා ඒක ශීර්ෂ දර්ශකය 8% ක් වනකොට බස්නාහිර 4% යි. 2016 වනකොට එය 1% දක්වා අඩු කර ගන්නට, ඒ වාගේම පළාතක් හැටියට රටේ ජාතික ආර්ථිකයෙන් 45% ක දායකත්වයක් ලබා දෙන මට්ටමකට බස්නාහිර පළාත් සභාවේ ආර්ථික සංවර්ධනය, ආර්ථික දායකත්වය රඳා පවත්වනවා වාගේ ශ්‍රේෂ්ඨ වූ දැක්මකින් යුතුව ඉදිරිපත් කළ අයවැයක් බව මේ වෙලාවේ සඳහන් කරමින් අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 02.51 ]

**ගරු ජේම්ස් ප්‍රිමිලස් කොස්තා**
Hon. James Primilus Costa

ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් අවසරයි. මෙම කෙටි කාල සීමාව ලබා දීම සම්බන්ධව පළමුවෙන්ම ඔබතුමාට මගේ ස්තුතිය සහ ප්‍රණාමය පුද කරනවා. ගිය අවුරුද්දේ මෙම අයවැය සාකච්ඡාවට මම සහභාගී වනකොට මම නවක මන්ත්‍රීවරයෙක්. මෙම පළාත් සභාව ගැන අධ්‍යයනය කිරීමට මට එපමණ කාලයක් තිබුණේ නැහැ. මම දිවුරුම් දීලා මාසයයි. එම අයවැය කාලයේදී ඔබතුමන්ලා කරපු කථාවලට ඇහුම්කන් දුන්නා. ඊට පසුව තමයි මට අවුරුද්දක් තිබුණේ, මේ පළාත් සභාවේ තිබෙන බලතල සහ මහජනතාවට විය යුතු සේවාවන් සම්බන්ධව අත්දැකීමක් ලබා ගැනීමට. ඒ නිසා තමයි අද මේ සම්බන්ධව කථා කරන්න මට කෙටි වේලාවක් ඉල්ලුවේ. විශේෂයෙන් අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා මේ වතාවේදී අධ්‍යාපනය සම්බන්ධව, අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා 53% ක මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ පිළිබඳව අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ වාගේම සමස්ත රටෙන්ම වෘත්තීය සමිතිවලින් ලොකු ඉල්ලීමක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම අයවැයේදී මධ්‍යම ආණ්ඩුවෙන් මේ අධ්‍යාපනය සම්බන්ධව හරියාකාරයෙන් මුදල් වෙන් වුණේ නැහැයි කියලා. නමුත් අපි හිතනවා මධ්‍යම ආණ්ඩුවට විශාල ආදර්ශයක් මේ පළාත් සභාව. පළාත් සභාවේ නරක දේවල් කථා කරන අය, අඩුපාඩු කථා කරන අය මධ්‍යම ආණ්ඩුවටත් ආදර්ශයක් දෙනවා. අපේ මේ අයවැයේදී අධ්‍යාපන ක්ෂේත්‍රයට විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ඒක ලොකු සතුටක්. ලොකු හයියක්. අපේ පළාත් සභාවේ තිබෙන අඩුපාඩුත් අපි හඳුනා ගන්න ඕනෑ, ඒවා නිවැරැදි කරන්න. කොළඹ මහ නගර සභාව අපට ආදර්ශයක් වෙනවා. කොළඹ මහ නරග සභාව ගිය අවුරුද්දේ පාලනය තුළ බලනකොට, එක්සත් ජාතික පක්ෂ පාලන සමයේදී ඒ අය සියලුම සභිකයන්ට එක හා සමාන ලෙස ලක්ෂ 40 ක මුදලක් වෙන් කරලා තිබෙනවා. ලක්ෂ 40 ක්. දැනට ලක්ෂ 30 ක මුදල්වලට වැඩ නිම කරලා ඉවරයි. සියලුම ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මන්ත්‍රීවරුන්ට, එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරුන්ට. මේක කියන්නේ, මම ඉතාම සතුටින්. එතැන UNP පාලනයක් තිබුණාට ඒ අය පක්ෂ භේදයෙන් තොරව මේ කරන සේවය අපි ඇත්තටම අගය කරන්න ඕනෑ. අපෙන් වන හොඳ දේවල් පිළිබඳව මධ්‍යම ආණ්ඩුව ආදර්ශයක් ගන්න ඕනෑ කියන ඉල්ලීම අනුව අපේ යටතේ තිබෙන මේ වාගේ පළාත් පාලන ආයතනයක් කරන හොඳ දේවලුත් අපි බස්නාහිර පළාත් සභාව ආදර්ශයට ගන්න ඕනෑ. මට මේ අවුරුද්දේ විශාල විධියට ප්‍රශ්නවලට මුහුණ දෙන්න වුණා, මේ ලක්ෂ 35 ක් වාගේ මුදලක් අරගෙන ගිහිල්ලා පාසල්වලට සල්ලි වෙන් කරන්නයි, ස්වයං රැකියාවට මුදල් වෙන් කරන්නයි ගියාම ඒ වාගේම ඡන්දයෙන් පත් වෙලා පළාත් සභාවට ගියාට පසු ජනතාව හිතන්නේ මේ මන්ත්‍රීවරයාට ඕනෑම දෙයක් කරන්න පුළුවන් කියලා. එවැනි මතයක තමයි මහජනයා ඉන්නේ. ඇත්ත වශයෙන්ම මන්ත්‍රීවරයෙක් වුණාට පස්සේ මහජනයාගේ ඉල්ලීම්, අපි ආණ්ඩු පක්ෂයේ නොවුණාට ආණ්ඩු පක්ෂයේ වරප්‍රසාද සියලු දේම හම්බ වෙයි කියන පැත්තකින් නොවෙයි මම කථා කරන්නේ. නමුත් මේ සාධාරණව ලැබිය යුතු දේවල්. සියලු දෙනාම මහජන නියෝජිතයෝ හැටියට. සමහර වෙලාවට ගරු ප්‍රධාන ඇමැතිතුමා හිතන්න ඇති ලබන අවුරුද්දේ අපි මැතිවරණයට යනවා කියලා. ඒක වෙන්න පුළුවන්. හැබැයි මම කියන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හරි, UNP එක හරි දිනනවා කියන එක නොවෙයි මෙතැන ප්‍රශ්නය. අපේ සියලුම මන්ත්‍රීවරුන් මහජනයා ඉදිරිපිට ඡන්දයකට යනකොට බොහොම ශක්තිමත්ව, ගාම්භීරව ගිහිල්ලා තමන් කරපු වැඩේ කියලා ඡන්දයක් ගන්න පුළුවන් ශක්තියක් අපට තිබෙන්න ඕනෑ කියන එක තමයි මගේ ඉල්ලීම. ඒ නිසා ලක්ෂ 35 ක මුදල් ඉතාම අඩුයි කියන එක තමයි මගේ ඉල්ලීම වන්නේ.

ඒ වාගේම ඒ මුදල්වලින් අද බලන්න රුපියල් 15,000 ක මුදලක් තමයි පෙර පාසල් සඳහා වෙන් කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. මේ රුපියල් 15,000 කින් පුටු කොපමණද ගන්න පුළුවන්. මේ වාගේ ප්‍රශ්න අපි හැමදාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් එක්ක කථා කරද්දී එතුමන්ලා අපට කියන්නේ ඔබතුමන්ලා රැස්වීම්වලදී කථා කරලා මේක වැඩි කර ගන්න බලන්න කියලයි. ඒ වාගේම ගරු සභාපතිතුමනි, මරණාධාර සමිතියක් සඳහා උපරිම මුදල රුපියල් 30,000 යි. 10 x 10 හට් එකක් ගන්න ගියාමත් ඒ මුදල මදී. ඒ නිසා නිලධාරී මහත්වරුන් අපව හැල්ලුවට ලක් කරනවා. ඔබතුමන්ලා නේ මන්ත්‍රීවරු. ඔබතුමන්ලා මේවා කථා කරන්න. කථා කරලා මේ වැඩි කර ගන්න ක්‍රමයක් හදා ගන්න කියනවා. ප්ලාස්ටික් පුටුවක් Purchasing කරන්න ගියොත් රුපියල් 800 කටත් වැඩියෙන් යනවා. ඒ වාගේම ගිය අවුරුද්දේ ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ හොඳ ව්‍යාපෘතියක් තිබුණාලු මම දැක්කා. අඩු ආදායම්ලාභීන්ගේ නිවාසවලට විදුලිය සැපයීම ලබා ගැනීම සඳහා රුපියල් 15,000 ක මුදලක් අපේ විමධ්‍යගත මුදලින් දෙන්න පුළුවන්කම තිබුණා. ඒ සඳහා මම කටයුතු කරද්දී ප්‍රායෝගිකව එතැන ප්‍රශ්නයක් තිබුණා. මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා, අපි ඔක්කෝම උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාටත් නිතර කිව්වා. කොළඹ නගරයේ එක නිවසකට අද විදුලිය ගන්න ගියොත් අවම වශයෙන් රුපියල් 70,000 ක් අය කරනවා. ඉතින් මේ ඇස්තමේන්තු කරන මහත්වරු මම හිතන්නේ රුපියල් 70,000 කට වැඩියෙන් තමයි අය කරන්නේ. ඒ කාලේ System එකක් තිබුණා. එක ලූප් එකකින් නිවාස හතරකට විදුලිය ගන්න පුළුවන් ක්‍රමයක් තිබුණා. අද ඒක විදුලිබල මණ්ඩලයෙන් අහෝසි කරලා තිබෙන බවට තමයි ඒ නිලධාරී මහත්වරු අපට කියන්නේ. එම නිසා තනි කේබල් එකක් ගත්තාම රුපියල් ලක්ෂයකට ආසන්න මුදලක් දුප්පත් මිනිස්සුන්ට ගෙවන්න වෙලා තිබෙනවා. එක්කෝ ඒක අඩු වීමක් වෙන්න ඕනෑ. නැත්නම් මේ මුදල වැඩි වෙන්න ඕනෑ. රුපියල් 15,000 ක් මදී. 30,000 ක් නැත්නම් 40,000 ක් විය යුතුයි. මම මේ කථා කරන්නේ මා වෙනුවෙන් නොවෙයි. අපේ කොළඹ නගරයේ ජීවත් වන සියලුම දුප්පත් මිනිසුන් වෙනුවෙන්. ඒ වාගේම ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් මම ඉල්ලන්න කැමැතියි දෙමළ පාසල් සම්බන්ධවත් විශාල අඩුපාඩු රාශියක් තිබෙනවා. 43% ක් හෝ 53% ක් වෙන් කරලා අපට සතුටු වෙන්න බැහැ. මේවා හරියාකාරයෙන් වෙනවාද කියලා බලන්න ඕනෑ. අධීක්ෂණ මන්ත්‍රීවරු ගොඩක් අය ඉන්නවා. දෙමළ මන්ත්‍රීවරු -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

නැහැ, නැහැ.

**ගරු ජේම්ස් ප්‍රිමිලස් කොස්තා**
Hon. James Primilus Costa

එහෙම කිව්වාට එහෙම තියෙනවා. අද මම උත්සවයකට ගිහිල්ලා ආවේ. මම අද පාසලක උත්සවයකට ගියා. ඒක පිළිගන්න වෙනවා. නමුත් ගරු ප්‍රධාන ඇමැතිතුමාට කියන්න කැමැතියි. දෙමළ එක මන්ත්‍රීවරයෙක්වත් ආණ්ඩු පක්ෂය නියෝජනය වෙන්නේ නැහැ. එම නිසා දෙමළ පාසල්වලට යම්කිසි විධියේ අසාධාරණයක් වෙන්න පුළුවන්. ඒ නිසා ගරු ප්‍රධාන ඇමැතිතුමා සම්බන්ධ වෙන්න. අපට ඕනෑම දෙයක් කියන්න, දෙමළ පාසල් සම්බන්ධව කටයුතු කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු ජේම්ස් ප්‍රිමිලස් කොස්තා**
Hon. James Primilus Costa

මට විනාඩියක කාලයක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට වැඩිපුරත් කාලය දුන්නා.

**ගරු ජේම්ස් ප්‍රිමිලස් කොස්තා**
Hon. James Primilus Costa

කොළඹ මහ නගර සභාවේ යෝජනාවක් සම්මත වෙලා තිබෙනවා. කොළඹ මහ නගර සභාවේ සියලුම මන්ත්‍රීවරුන් ඒකමතිකව ඡන්දයකින් යෝජනාවක් සම්මත කරලා තිබෙනවා. ඒක අනුමත වෙලා තිබුණා කියලා මම පත්තරවල කියෙව්වා. වැල්ලවත්තේ තිබෙන පාරකට දෙමළ සංගම් කියන නම යෝජනා කරලා සම්මත වුණා. මම හිතන්නේ, ගරු ප්‍රධාන ඇමැතිතුමාත් එයට අනුමැතිය දීලා තිබෙන බවට පත්තරවලින් වාර්තා වෙනවා. අවසානයේදී නීත්‍යානුකූලව සියලු දේවල් වුණාට පස්සේ ගරු ප්‍රධාන ඇමැතිතුමා විසින් එය නතර කළ බවට පත්තරවල පළ වෙලා තිබෙනවා. නමුත් සත්‍ය මොකක්ද කියලා දන්නේ නැහැ. ඊයේත් ඒකට සාකච්ඡාවක් තිබුණා කියලා ආරංචි වුණා. ගරු ප්‍රධාන ඇමැතිතුමා ඒකට සහභාගී වුණේ නැහැයි කියලා අද වීරකේසරී පත්තරේ සඳහන් වෙලා තිබුණා. එම නිසා මම කියන්නේ, දෙමළ ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරුන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු ජේම්ස් ප්‍රිමිලස් කොස්තා**
Hon. James Primilus Costa

මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ කෙටි කාලය අපට ලබා දීම සම්බන්ධව. ස්තුතියි.

[ අ.භා. 03.00 ]

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

ගරු සභාපතිතුමනි, මා ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාවේ අදහස් දැක්වීමට ඉඩකඩ ලබා දීම සම්බන්ධයෙන්. ප්‍රථමයෙන්ම විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද අදහස් සම්බන්ධයෙන් මම හිතන්නේ, යම් අදහසක් පළ කිරීමට අවශ්‍යයි කියලා මා හිතනවා. සාමාන්‍යයෙන් විපක්ෂයේ නවක මන්ත්‍රීවරයෙක්, අත්දැකීම් නැති මන්ත්‍රීවරයෙක් වුණත් ඇවිල්ලා කථාවක් කරනකොට ආණ්ඩු පක්ෂය නිශ්ශබ්දව ඉන්නවා මම දැක්කා. ඇත්තටම ප්‍රශංසනීයයි. ඒ නිශ්ශබ්දතාවය රැක ගන්න විපක්ෂයේ සංවිධායකතුමා ඇතුළු කවුරුත් සූදානම් වුණේ නැහැ. ඔහුට කථා කරන්න තිබෙන අයිතියවත් දුන්නේ නැහැ. කොහොම වුණත් පසුගිය විවාදයේ මුළු කාල සීමාව තුළම මට කථා කරන්නට නොදෙන එක සම්බන්ධයෙන් කොහොමටත් මම පුදුම වෙන්නේම නැහැ. පසුගිය විවාදයේ අදහස් දැක්වීම්වලදී අපි පොදුවේ දැකපු ලක්ෂණ කිහිපයක් තිබුණා ගරු සභාපතිතුමනි. පසුගිය කාලයේ පළාත් සභා ක්‍රමය සම්බන්ධයෙන් යම්කිසි විවාදයක් මේ රටේ තිබෙනවා. තීන්දුවක් මේ රටේ තිබෙනවා නොවෙයි. විවාදයක් මේ රටේ තිබෙනවා. ඒ තිබෙනකොට ඒ සම්බන්ධයෙන් අපේ කෘෂිකර්මාන්ත ගරු ඇමැති උදය ගම්මන්පිල මැතිතුමා තමන්ගේ අදහස් දක්වනවා. බොහොම පැහැදිලිව අදහස් දක්වනවා. මේ අදහස් දක්වනකොට එක දෙයක් බොහොම පැහැදිලිව කියන්න ඕනෑ. එතුමන් 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ක්‍රියාත්මක වන පළාත් සභාව සුදු අලියෙක්ද, කින්ද මන්ද කියන කථාව කියන්නේ නැතුව එතුමා පළාත් සභාවෙන් වන සේවය ගැන කථා කරමින් එය බෙදුම්වාදයට රුකුල් දීම සම්බන්ධයෙන් එතුමාගේ අදහස් දැක්වීම කරනවා. නමුත් බොහොම ද්වේශ සහගත විධියට විපක්ෂයේ මන්ත්‍රීවරු - විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාව ගම්පහ නායකතුමා හිටපු වේදිකාවේදී, නායකතුමයි එතුමාගේ කලිසම ගැලෙව්වේ. ගලවලා පල්ලෙහාට දැම්මේ. එහෙම කෙනා අපේ ඇමැතිතුමාගේ සරම ගැලවීම ගැන කථා කරනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නායකතුමා ඒවා කරනවා.

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

මෙන්න මේ තත්ත්වයේදී අද එතුමාගේ කලිසම විතරක් නොවෙයි, එතුමාගේ තිබෙන පට්ටම් තානාන්තර ඔක්කෝම ගලවලා ඔය නාමධාරී ලේබල් එක විතරක් ගහලා තියෙනවා, ඒක විතරක් ගලවන්නේ නැතිව. එතකොට ඉතුරු ටිකත් ඉවරයි. ගරු සභාපතිතුමනි, හැබැයි, මෙතැන අපි විමර්ශනය කළ යුතු යම් දෙයක් තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයට -

**ගරු ඒ.එම්. යූසුප්**
Hon. A M Yoosuf

මේ පොදු සාකච්ඡාව.

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

පොදු සාකච්ඡාව තමයි. එක්සත් ජාතික පක්ෂයට බරපතළ ගැටළුවක් තිබෙනවා. දිනන්න බැරි ගැටළුව. ඒකට හේතුව ආණ්ඩු පක්ෂයේ අද දවසේ එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය මේ ජාතික කොඩිය අත දරාගෙන ඉන්න තාක්කල් එක්සත් ජාතික පක්ෂයට ජයග්‍රහණයක් ගැන හිතන්න බැහැ. ඒ ජයග්‍රහණය පිළිබඳව නොහිතන්න තිබෙන ඉඩකඩ වැඩි වෙන්නේ -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අල්ලපු ගෙවල්වල ප්‍රශ්න හොයන්න යන්න එපා.

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

අද දවසේදී බොහොම පැහැදිලිවම ජාතික උවමනාව ගැන කථා කරන, ලාංකීය අනන්‍යතාවය ගැන කථා කරන නායකයන්ට මඩ ගහන එකේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා විෂයයට අදාළව කථා කරන්න.

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

කොන්ත්‍රාත්තුව විපක්ෂය විසින් ඉෂ්ට කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොදු සාකච්ඡා විෂයය පථයට අදාළව කථා කරන්න.

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

ගරු සභාපතිතුමනි, මම මේ ඔවුන්ගේ කථාවලට පිළිතුරක් දුන්නේ. මේ කරන්නේ මගේ කථාවක් නොවෙයි. ඒ වාගේම මේ කථාව කරගෙන යනකොට අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා අධ්‍යාපනය සම්බන්ධයෙන් තිබෙන අඩුපාඩු හා විවිධ දේවල් කථා කළා. ඒ වාගේම එතුමාට පුංචි උත්තරයක් දෙන්න ඕනෑ ගරු සභාපතිතුමනි. වෙලාවකට වාඩි වෙලා ඉන්න බැරි අමාරුවක් තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. හැම වෙලේම හිට ගත්තු ගමන් ඉන්න නිසා මම පුංචි උත්තරයක් දෙන්න ඕනෑ. මේ අධ්‍යාපන ක්‍රියාවලිය සිද්ධ වනකොට කලාප කමිටු හරහා තීන්දු තීරණ ගන්නවා. පාසල්වල අඩුපාඩු කථා කරනවා. පාසල්වල අඩුපාඩු සම්පූර්ණ කරන්න අදාළ සැලසුම් අපි සකස් කරනවා. ඊළඟට උපදේශක කාරක සභාවට යනවා. මේ යනකොට මට සැකයක් ආවා, මේ රටේ පාසල් පද්ධතිය තුළ හිටපු කෙනෙක්ද මේ කථා කරන්නේ කියලා. මම විස්තර හොයලා බැලුවා. ඒ විස්තර තුළ ලංකාවේ පාසලක එතුමන්ගේ නම තිබුණේ නැහැ. ඊට පස්සේ පළාත් පාසල් බැලුවා. ජාතික පාසල් බැලුවා. තිබුණේ නැහැ. සැකයට මම විශේෂ පාසලුත් බැලුවා. (බාධා කිරීමක්) ඒත් නැහැ. ඒක හොයා ගන්න බැරුව ගියා. විශේෂ අධ්‍යාපන ඒකක යටතේවත් තිබුණේ නැහැ.

ගරු සභාපතිතුමනි, මේ කථා කරන ගරු මන්ත්‍රීතුමා, ගරු ප්‍රධාන ඇමැතිතුමාට උත්තර දෙනකොට මේ රටේ තමන්ට හිමි වන ලක්ෂ 35 න් ශත 05 ක් හෝ අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරන්න එතුමාට එහෙම දැනුමක් තිබිලා නැහැ. ඒ කියන්නේ, අධ්‍යාපනයට තිබෙන සැලකීම කී වෙනියාටද එතුමාගේ තියෙන්නේ? එතුමා අධ්‍යාපනයේ අඩුපාඩු කථා කරනවා. තව දෙයක්. විපක්ෂය විසින් තමන්ට හිමි වන ලක්ෂ 35 ප්‍රමාණවත් නැහැයි කියනවා. ලක්ෂ 35, ලක්ෂ 50 වුණත් ප්‍රමාණවත් නැහැ. ලක්ෂ 50, ලක්ෂ 60 වුණත් ප්‍රමාණවත් නැහැ. ප්‍රමාණවත් නැහැයි කියමු. ඔබතුමා විශ්වාස කරනවාද? මේ ලක්ෂ 35 පාවිච්චි කරපු නැති විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් ඉන්නවා. ඒ නිසා තමන්ට හිමි වන ප්‍රතිපාදන ප්‍රමාණය මේ රටේ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නම කියන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

මේ රටේ -

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ජෝර්ජ් පෙරේරා.

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රී වරුණ දීප්ති රාජපක්ෂ මැතිතුමා මුදල් පාවිච්චි කරලා නැහැ.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

නම කියන්න.

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

තව පාරක් කියන්න බැහැ. ඒක වටෙන් අහගන්න. එක පාරක් කිව්වා. ඒ නිසා මෙන්න මේ තත්ත්වය යටතේ මේ මහජනතාවගේ මුදල් ලබා ගෙන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු වැඩිපුර ප්‍රතිපාදන පාවිච්චි කරන එක සම්බන්ධයෙන් කියන්න තිබෙන්නේ, ජනතාව බලය දුන්නේ නම් එක්සත් ජනතා නිදහස් සන්ධානයට. ආණ්ඩු පක්ෂයට. එක්සත් ජනතා නිදහස් සන්ධානයට ජනතාව ආණ්ඩු බලය දුන්නේ, වැඩිපුර වැඩ කරන්න. ඒ නිසා මහජන නියෝජිතයෙක් හැටියට අප විසින් අපේ උපමාන පාදක ප්‍රමාණය එහෙම නැත්නම් අමාත්‍යාංශවලින් ගන්න මුදල් ප්‍රමාණය පිළිබඳව කටයුතු කරන්න නම් ආණ්ඩු බලයත් ඒ අයට දෙන්න එපැයි. අපි විසිල් විතරක් නොවෙයි. බල්ටිත් ගහනවා. ඒ නිසා මෙන්න මෙතැනදී තව දෙයක් කියන්න ඕනෑ. මේ අයවැය ප්‍රකාශනය සම්බන්ධයෙන් කථා කරගෙන යනකොට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය යටතේ එතුමාගේ නව යෝජනා සම්බන්ධයෙන් අපට එක දෙයක් කියන්න ඕනෑ. අපට පළාත් සභා මන්ත්‍රීවරු හැටියට යම් සමාජීය අනන්‍යතාවයක් ගොඩ නැඟිලා තිබෙනවා නම්, විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ගොඩ නැඟුණු අනන්‍යතාවය. ඒ හරහා ක්‍රියාත්මක වන්නා වූ සුපසන් නිම්තෙර වැඩ සටහන යටතේ ක්‍රියාත්මක වන දේ ගැන අපේ මහජන නියෝජිතයන් කථා කළා. එහිදී යම් දෙයක් අපි කියන්නට ඕනෑ. අපේ දෙමව්පියන්ව පාසලට කැන්දගෙන එන්න විදුහල්පතිවරුන්ට බැරි වෙද්දී, පාසල් සංවර්ධන සමිතියට බැරි වෙද්දී මේ ව්‍යාපෘතිය හරහා දෙමව්පියන්ව කැඳවාගෙන ඇවිල්ලා දරුවා වෙනුවෙන් ඇප කැප වෙන හදවතක් ඇති දෙමව්පියෙක් අපට නිර්මාණය කරන්න පුළුවන් වෙලා තිබෙනවා. සරුදම් අරුණැල්ල වැඩ සටහන අද 2600 කට අධික වූ දහම් පාසල් සංඛ්‍යාවකට බෞද්ධ, කතෝලික, ඉස්ලාම් ඒ වාගේ හින්දු සියලු දහම් පාසල් සඳහා රුපියල් ලක්ෂයක් ලබා දෙමින් - ගරුතර ස්වාමීන් වහන්සේ නමක් මාත් එක්ක කිව්වා, උන් වහන්සේගේ දහම් පාසල පවත් වන්නේ ඉරිදා දවසේ පැය දෙකක් පමණයි

[ ගරු නෙලුක් මල්ලව ]

කියලා. එයට මූලික හේතුව දහම් පාසලට වැසිකිළියක් නැහැ. දහම් පාසලට වැසිකිළියක් නැති ප්‍රශ්නය නිසා දහම් පාසල පැය 02 යි පවත් වන්නේ. මන්ත්‍රීතුමා මේ රුපියල් ලක්ෂය නිසා අපට හැකියාව තිබෙනවා, දහවල් 12.00 වනකල් දහම් පාසල පවත්වාගෙන යන්න කියලා. අද වැඩ පිළිවෙළක් ආරම්භ කරලා, ඒ වැඩ පිළිවෙළ තුළ පළමුවැනි වසරේ ඉඳලා දරුවන් දහම් පාසල්ගත කරලා, අධ්‍යාත්මික ගුණ වගාවකින් පිරිපුන් ශ්‍රේෂ්ට පුරවැසියෙක් නිර්මාණය කිරීමේ ගමන පටන් අරගෙන තිබෙනවා. භෞතික සම්පත්වලට එහා ගිහිල්ලා.

ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ කුමන දේ සාකච්ඡා වුණත් අපේ සෞඛ්‍ය ඇමැතිතුමාට ජය ගැනීමට යම් අභියෝගයක් තිබෙනවා. ඒ තමයි සෞඛ්‍ය හේතූන් මත නොවන, වෙනත් ආහාර පෝෂණය ආදී වූ හේතූන් මත තිස් අවුරුද්දක් මුළුල්ලේ තිබුණු යුද්ධයටත් වඩා අද දවසේදී බරපතළ අභියෝගය එල්ල වෙලා තිබෙන්නේ, මේ බෝ නොවන රෝග සම්බන්ධයෙන්. බෝ නොවන රෝග සම්බන්ධයෙන් කථා කරනකොට සාමාන්‍යයෙන් දෛනික මරණ සංඛ්‍යාව 500 කට ආසන්නයි. සමහර වෙලාවට ඩෙංගු රෝගියෙක් ඩෙංගු රෝගයෙන් මිය යන්නේ සතියට එකක් වෙන්න පුළුවන්. දෛනික මරණ සංඛ්‍යාව 500 කට ආසන්න ප්‍රමාණයක් වෙනවා. එහෙම නැත්නම් ඔත්පලවීම්, අකර්මන්‍යවීම් ඒ ආසන්න ප්‍රමාණයේ තිබෙනවා. මා හිතන්නේ මෙයට මූලික හේතුව අප විසින් හඳුනාගත යුතුව තිබෙනවා. ගරු සභාපතිතුමනි, අපේ ජීවන රටාවේ වෙනස් වීම්, අපේ ආහාර රටාවේ වෙනස් වීම්, මේ කථා කරන්නා වූ ජීවන මිල ඉහළ යෑම, ජීවන වියදම ඉහළ යෑම ඔය වාගේ දේවල් නිසා මා මගේ ඇස් දෙකට දැක්කා දවසේ පඩියට වැඩ කරන එක ගෙදරක තාත්තා කෙනෙක් තමන්ගේ ගෙදර තිබෙන ජංගම දුරකථන හතරකට රුපියල් 100 ගාණේ Reload දානවා. එය

සත්‍ය තත්ත්වයක්. සමහර වෙලාවට කොහේ හරි ඉන්න කෙනෙකුට, කොහේ හරි නළුවෙකුට, ගායකයෙකුට කාට හරි SMS යවන්න වෙන්න පුළුවන්. කොහේ හරි ඉන්න කෙනෙක් සුපිරි තරුවක් කරන්න පුළුවන්. මේ ජීවන මට්ටම එදාට වඩා වෙනස් වීම අපි කවුරුත් පිළිගන්නට ඕනෑ. ජීවන මට්ටම වෙනස් කරන්නේ නැතුව, ජීවන මට්ටම තමන්ගේ ප්‍රකෘති තත්ත්වයට ගේන්නේ නැතුව, ජීවන මට්ටම තමන්ගේ ආර්ථිකයට සරිලන ආකාරයට ගේන්නේ නැතුව ජීවන වියදම ගැන කථා කළ යුතු නැහැයි කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා -

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

කොහේ හරි ඉන්න නළුවෝ කියන්න එපා.

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

කොහේ හරි ඉන්න නළුවෝ කිව්වේ, ප්‍රවීන නළුවෝ නෙවෙයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, මෙන්න මේ කාරණය අපි සැලකිල්ලට ගත යුතුව තිබෙනවා. අද දවසේ විවිධ ජනමාධ්‍ය හරහා ප්‍රචාරය වෙමින්, ප්‍රචාරක මාධ්‍ය ඇති කරමින් මව්පියන්ගේ විඥානය වෙනස් කරමින් ආහාර රටාව, ජීවන රටාව වෙනස් කිරීමේ ලොකු වැයමක් තිබෙනවා. වෙනස් කරන්නේ වෙන මොකකටවත් නොවෙයි. වෙළඳ පොළ අවශ්‍යතාවයට. ජීවන රටාව වෙනස් වීම උඩ, ව්‍යායාම මදිකම උඩ අප හෙට දවසේදී මේ බෝ නොවන රෝගයේ ගොදුරක් බවට පත් වෙනවා. ඒ නිසා හෙට දවසේදී මම හිතන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශය මීට වඩා වැඩි වගකීමකින් එය භාර ගත යුතුයි කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

ගබ්සා කිරීම් නීතිගත කරමු.

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

එහෙම වුණොත් ඔබතුමාට ඔය රාජකාරිය කරනවාට වඩා එතැන පෝලිමේ ඉන්න වෙනවා. ඒ නිසා ඒකට අවස්ථාවක් නැහැ. ඒ කියන්නේ මෙතුමාත් විපක්ෂයේ ගරු සංවිධායකතුමා හොරෙන් ගිය ගමන එළිපිට යන්න අපෙන් අහනවා. ඒ නිසා නොදන්න දේ කථා කරන්න එපා ගරු සංවිධායකතුමා. නොදන්න දේ කථා කරන්න එපා. එය නීතිගත කළොත් ඔබතුමාට අයිතිය ලැබෙනවා. ඔබතුමාට ලැබෙන අයිතිය ඒ ආකාරයෙන් පාවිච්චි කරනවාට අපි කැමැති නැහැ. එම නිසා ගරු සභාපතිතුමානි, මේ අයවැය මගින් හෙට දවසේදී බස්නාහිර පළාත් සභාවේ ප්‍රගතිය වෙනුවෙන් කටයුතු කරන්න ගරු ප්‍රධාන ඇමැතිතුමාට ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයට හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. එතුමා මගේ නම බැලුවා කිව්වා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට අවස්ථාව දෙන්න. එතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් යොමු කරන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමා මා ගැන කියද්දී මම ශබ්ද නොකර හිටියා. ගරු සභාපතිතුමනි, -

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු සභාපතිතුමනි, මටත් වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කරුණාකරලා වාඩි වෙන්න කෝ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වරප්‍රසාද අහන හැටි පොඩ්ඩක් ඉගෙන ගන්න කෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමා කිව්වා මගේ නම හැමතැනම හෙව්වා. හැබැයි, හම්බ වුණේ නැහැයි කියලා. එතුමාට අමතක වෙලා තිබෙනවා. ගබ්සාගාරවල පොඩ්ඩක් හෙව්වා නම් ඒක හම්බ වෙයි.

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

සමාවෙන්න ගරු මන්ත්‍රීතුමා. මට බලන්න බැරුව ගියා. ගරු සභාපතිතුමනි, මෙතුමා එතැනට යනවා කියලා මම දන්නේ නැහැ. ඊළඟ දවසේ මම ඒකත් බලන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදවලට යන්න දෙන්න බැහැ. කරුණාකරලා වාඩි වෙන්න. එස්. රාජේන්ද්‍රන් ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු එස්. රාජ න්ද්‍රන්**

ගරු සභාපතිතුමනි, කාලය ලබාදීම සම්බන්ධව මම ස්තුතියි වන්ත වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. එතුමාට විනාඩි 05 යි තියෙන්නේ.

[ අ.භා. 03.11 ]

**îæóõô öÝ°.õèÎÛå°êðõä°**
Hon. S. Rajandran

îæóõô êéùô^ íô^æÎó ¡å°ê Îåõê°éê ôïñ°æðÁê÷°Æ ãñ°æÓæ°Æ Ëê÷°æÈ öä°ÄéìÁ ëäëè^å°ê åä°÷ðéÁ îêèðôðê°Êæ° îæèó°æðä°Î÷ä°. öëÊ ¡å°ê ôõÔ-îòùÔê°êðì°ì ôðôèêê°êðù° çêðä° †ä°÷èôÊ òõê°Ê ëèæèú Ëé÷éÁç° ç÷°÷ð íéäê°Ê ã×ç°çðä^æÓë° ãéõÁè÷°÷ðäè^æó°. íå°ê ôéæÁðù° ¡ë° ëèæèú Ëé÷éÁ Éæ°æðÁ ÎêòðÁ æì°òð Íì°òðÁðù° ¡Õæ°Æë° ÎçèÊ ôïñ°æðÁ ëèæèú òéç Ëé÷ òð×çèä°éë ëæ°æÓéìÁ îòÁù°çèÌæÓæ°Æë°, íô^æÓæ°Æ ÎêéôÁèä íêðæèõñ°æéó çæð^å°êóðç°çê÷°æèæÔÎë ¡ë° ëèæèú òéç Ëé÷éë îæèÈÌõç°çì°ìÊ. íå°ê ôéæÁðù° ¡å°ê Îëù° ëèæèú òéçÁðù° ¡Õçê°êð Éå°êèôÊ ôõÔ îòùÔê° êðì°ìê°éê åèñ°æó° ôðôèêðê°Êæ° îæèÈÌ ¡Õæ°æðä°Î÷èë°. öëÊ îæóõô ã×ç°çðä^ ËÛðÇ^ õà°ëèä íô^æó° ÎçÒë° ÎçèÊ îòèä°äè^ îæóõô Ëêùéëò°òÕéìÁ ôõÔ-îòùÔç° Çê°êæê°êðù° òì°ìë° òëèêèäë° öä°÷ ôêè°æðÁê°Êæ°Îæ ¡ìëðù°éù öä°× Æ÷ðç°çðì°ìè^. ãÈééÁðÎùÎÁ íÊ Îôêéäæ°Æ÷ðÁ ôðìÁëèæ åèñ°æó° æÕÊæðä°Î÷èë°, Öîää°÷èù° ãñ°æÓæ°Æê° îêèðüë° òéç êéùô^ íô^æÎó, ¡ç°îçèÏÊ æù°ôð òë°ëå°êëèæ åèñ°æó° ÎçÒë° ÎçèÊ öëÊ Ëêù°ô^ íô^æó° ¡å°ê ÍÈÌ çèìòèéùæÓæ°Æ ÍòðèðÁ åðÁëãñ°æéó ôïñ°æðÁê÷°Æ åèä° íôéõç° çèõèì°ÌôÎêèÌ, êëðï° ëæ°æó° òè^çèæ íôÕæ°Æ åä°÷ðéÁê° îêèðôðê°Êæ° îæèó°æðä°Î÷ä°. ¡Õå°êèÙë° …ì ãñ°æÓæ°Æê° îêèðüë° òëÐç æèùëèæ çèõèÓëä°÷ê°êðÎù …ì Îçòç°çì°âÕå°êÊ, öñ°æóÊ åú°ç^ çðèðëðùÝ° îæèÝ°êè íô^æó° îòèä°äÊ Îçèù 57ÍôÊ øÏñ°éææ°Æ, "êëðï°ò° òñ°æë°" ôÐêð öä°× îçÁ^ „ì°Ìêù° åéìç÷°÷Ê. íÊ îæèÏë°Ç ëèåæõ òéçÁðù°, îçèÊ …ì°ìñ°æóðù° òì°ìçŒ^ôëèæ åðé÷Îô÷°÷ç°çì°Ì íå°êç° çðÎõéúæ°Æ íéäê°Ê ã×ç°çðä^æÓéìÁ ÍêõÔë° îç÷°×, òì°ìëèæ íËù°çÌê°êð, íå°ê çðÎõéúéÁ æÝì° (Casate) †ùëèæ í÷ðôðæ°æç°çì°Ì íÊ êð÷ç°Ç ôðïèÔæ°Æ ÎêéôÁèä Ö÷°çèÌæéó Ëêùéëò°ò^ ë÷°×ë° åëÊ ÍÓå^ íô^æÓéìÁ êéùéëÁðù° ÍÁê°êë° îòÁ°Ê ¡Õå°ê ÎçèÊ íôòõ íôòõëèæ åëÊ Ëêù°ô^ íêéä æâêë° †ùëèæ ¡éì åð×ê°êðäè^. íê÷°Æç° çð÷Æ åèä° Ëêùéëò°òÕìä° îêèì^Ç îæèÈÌ ¡Ê òë°ëå°êëèæ ôðäôðÁ ÎçèÊ íê÷°Æê° ÎêéôÁèä øÏñ°Ææéóò° îòÁ°Ê Îå÷°×  øÕ …ì°ìê°éê Ö÷°çèÌ îòÁ°Ê ¡Õå°êè^. íå°ê ôðìÁë° òë°çå°êëèæ åèä° ãêÁ æë°ëä°çðù íéëò°òÕìÄë° …ì ÎçòðÎää°. Íäèù° íå°ê çèéê òë°ëå°êëèä …ì°ìë° åæõ òéçÁðÎù 2011 âòë°ç^ ëèêë° ËâÔ Îç÷°×, íê÷°Æç° çð÷Æ Ûßä° ëèêë° íê÷°Æë° ÎêéôÁèä òì°ìñ°æó° íñ°Æó°ó ëæ°æÓæ°Æ í÷ðôðæ°æç°çì°âÕå°êÊ. ¡Õå°êèÙë° …ì íêä° çð÷Æ æÝì° (Casate) ÍæðÁêðä° çð÷Æ öù°ùè ÍÁê°êñ°æÓë° åðé÷ôéìå°ê çðä° íç° çèééÊÁðù° ôòðæ°æèê ¡õÈÌ †ä°× ÎçèÔä° Ëé÷ÁÐì°âäèù° íÊ ¡ä°× åð×ê°êç°çì°Ì ¡Õæ°æðä°÷Ê. öñ°æÓéìÁ Îëù° ëèæèúê°êðù° ¡Õæ°æðä°÷ íêðæèõñ°æó° Ö÷°æäÎô íõòèñ°æê°êðäèù° ç÷ðæ°æç°çì°Ì ¡Õæ°æðä°÷ ¡å°ê „ó°åðéùÁðù° ¡å°ê ëèêðèð ¡Õæ°æðä°÷ íêðæèõñ°æéó ¡ù°ùèëù° îòÁ°æðä°÷ çâÁèù° íÌê°ê ôõÔ-îòùÔç° Çê°êæê°êðù° …ì òì°ìë° òëèêèäë° íç° Çê°êæê°êÙë° ¡ìë° îç÷èëù° îòä°÷èù° ¡å°ê ëèæèú òéç öñ°Îæ Îçèæðä°÷Ê öä°çéêä ¡å°ê òéçÁðù° Îæì°æ ÎôÈâüó°óÊ.

**îæóõô åðëù° ùèä°òè - íéëò°ò^**
Hon. Nimal Lansa - Minister

Çê°êæê°êðù° ¡ù°éùÁè ?

**îæóõô öÝ°.õèÎÛå°êðõä°**
Hon. S. Rajandran

íêðÎù ¡ù°éù, ¡ù°ùèêéê êèä° åèñ°æó° îòèù°Ùæðä°Î÷èë°.

**îæóõô åðëù° ùèä°òè - íéëò°ò^**
Hon. Nimal Lansa - Minister

ëäòðùüë° ¡ù°éùÁè ?

**îæóõô öÝ°.õèÎÛå°êðõä°**
Hon. S. Rajandran

¡ù°éù ëäêðÎùüë°, ¡ù°ùèêéê êèä° îòèù°Ùæðä°Î÷èë°

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා අනවශ්‍ය විවාදවලට යන්න එපා.

**îæóõô öÝ°.õèÎÛå°êðõä°**
Hon. S. Rajandran

ÍéæÁðäèù° îæóõô òéç êéùô^ íô^æóðä° †ùëèæ åèä° öñ°æÓéìÁ Ëêù°ôèðìë° åèä° ëðæê° êèï°ééüìä° Îæì°Ìæ°

îæèó°ôÊ öä°äîôä°÷èù° ¡å°ê ôðìÁê°éê ãñ°æÓéìÁ Îåõâ æôäê°Êæ°Æ öÌê°Ê Ÿˆê°êð îòÁ°üëè× Îæì°Ìæ° îæèó°æðä°Î÷ä°.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන් ගරු මන්ත්‍රීතුමා

**îæóõô öÝ°.õèÎÛå°êðõä°**
Hon. S. Rajandran

Ëêù°ôˆ íôˆæóðä° ëéäôð …ì øÕ êëðïˆ, íôèðìë° òèêð Îçêë° ¡ù°éù, ëæ°æÓæ°Æ ÎêéôÁèä Îôéùæéóò° îòÁ°æðä°÷èˆ öä°× åèë° ãñ°æéóç° ç÷°÷ð ÇæÏìä° îçÕéëÁèæç° ÎçÒæðæ° îæèÈâÕæ°æðä°Î÷èë°. Íäèù° ¡å°ê ôðìÁê°êðÎù öëÊ êëðï° ëæ°æó° Îôêéäç°çÌæðä°÷èˆæó°. ÍéæÁðäèù° ãñ°æÓéìÁ ËÏæ° æôäê°éêüë° îòÙê°êð ¡éê ãñ°æÓéìÁ æèùê°êðÎù çŒˆê°êð îòÁ°Ê êÕëè× íä°Çìä° Îæì°Ìæ° îæèó°æðä°Î÷èë°. ගරු සභාපතිතුමනි, මෙම කාරණාව මම පැහැදිලි කළේ, අපේ දෙමළ නමක් තිබුණු වැල්ලවත්තේ මීටර් 200 ක් දිග ඒ පාර – මීටර් 200 ක් ඇතුළේ තමයි දෙමළ සංගම් කියලා ඒ පාරට අපි නම තියන්නේ. අනික් එක ඒ පාරට ඒ පළාතේ වෙන කාගේවත් නමක් නැහැ. 57 වැනි පටුමග කියලා තමයි ඒකේ තියෙන්නේ. ඒ පාරට මීටර් 200 යි දිග තියෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්

**ගරු එස්. රාජේන්ද්‍රන්**
Hon. S. Rajandran

සමාවෙන්න, ඉතින් ඒ නිසා මේ අවස්ථාවේදි ඔබතුමාගෙන් ඉල්ලනවා ඔබතුමාගේ අවධානය යොමු කර මෙය ඉෂ්ට කර දෙන මෙන්. බොහෝම ස්තුතියි.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මේ සභාවේ මේසය මත තිබෙනවා ක්‍රීඩා කටයුතු අමාත්‍යාංශයේ ඉදිරි විවාදය සඳහා ප්‍රගත් වාර්තාව. මෙහි සිංහල භාෂාව පළමුවැනි තැනටත්, දෙමළ භාෂාව තුන්වැනි තැනටත් ආවාම මේ රටේ භාෂා ප්‍රශ්නය ආපහු මතු වේවිද දන්නේත් නැහැ.

**ගරු නිමල් ලාන්සා** – අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

භාෂා ප්‍රශ්න ඇති කරන්න එපා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

භාෂා ප්‍රශ්නය මම නොවෙයි මතු කළේ. (බාධා කිරීම්) ඒකට ඔබතුමාගේ අවධානය යොමු කරනවා. සුළු දේවල් තමයි ලොකුවට යන්නේ. දෙමළ භාෂාව මේ රටේ රාජ්‍ය භෂාවක් හා සම මට්ටමේ භාෂාවක් හැටියට යන්නේ. මම ඒ ගැන අවධානය යොමු කරනවා. (බාධා කිරීම්) මේවා කිව්වාම මෙතුමියලා කෑ ගහන්න දෙයක් නැහැ. මෙය පිළිගන්න වෙනවා. වරදක් වෙන්න ඇති. සිංහල, ඉංග්‍රිසි, දෙමළ තියෙන්නේ. දෙමළ භාෂාව දෙවැනි තැනට එන්න ඕනෑ.

**ගරු උපාලි කොඩිකාර** – අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

එහෙම චක්‍රලේඛකයක් නිකුත් කරලා තියෙනවාද?

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

අපි මේ රටේ පුරවැසියෝ හැටියට රාජ්‍ය භාෂාවන් වන්නේ, සිංහල හා දෙමළ භාෂාව. ජාත්‍යන්තර භාෂාව ඉංග්‍රිසි හැටියටයි අපි පරිහරණය කරන්නේ. මේක මේ රටේ ජනතාවගේ අයිතිය පිළිබඳ ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, මුල් පිටුවේ පිළිවෙළට තියෙනවා. ඇතුල් පිටුවල පොඩි ප්‍රශ්නයක් ඇති වෙලා තියෙනවා. අපි ඒ ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා වැරැද්ද හොයලා දීපු එක ගැන.

[ අ.භා. 03.19 ]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, 2013 ට අදාළ අයවැය සාකච්ඡා කරන වෙලාවේ, පොදු සාකච්ඡාව පිළිබඳව වචන කිහිපයක් කථා කිරීමට අවස්ථාව සලසා දීම ගැන. අපි දන්නවා මෙය පළාත් සභාවේ විසි පස්වන අයවැය ප්‍රකාශය බව. ඒ වාගේම අපි පෞද්ගලිකව සම්බන්ධ වෙන දාහතර වැනි අයවැය ප්‍රකාශය. අවුරුදු 14 ක් තිස්සේ අයවැය ප්‍රකාශ දාහතරකට අපගේ අදහස් දක්වලා කථා කරලා තියෙනවා.

ගරු සභාපතිතුමනි, අපි දන්නවා. අයවැය ප්‍රකාශය සාකච්ඡා කරන වෙලාව කියන්නේ, මේ රටේ පළාත් සභා ක්‍රමයට විරුද්ධව ව්‍යාජ තර්ජනයක් ඉදිරිපත් වෙමින් තියෙන වෙලාවක තමයි අපි මේ අයවැය ප්‍රකාශය පිළිබඳව සාකච්ඡා කරන්නේ. අපි දන්නවා, අපේ රටේ යුද්ධයක් තිබුණා. අවුරුදු ගණනක් තිබුණු යුද්ධය අවසන් වෙලා අද යුද්ධයක් නැති රටක් අපට නිර්මාණය වෙලා තියෙනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, ත්‍රස්තවාදය නැති රටක් අපට අද උදා වෙලා තියෙනවා. අද බෝම්බ පුපුරන්නේ නැති රටක් අපට තියෙනවා. නමුත් යුද්ධය නැති වුණත්, වෙඩි හඬ

නැති වුණත්, ත්‍රස්තවාදය නැති වුණත් මේ රටේ සාමය උදා වෙලා තියෙනවාද කියන ප්‍රශ්නය අපට තවමත් මතුවෙමින් තියෙනවා. අපි විශ්වාස කරන්නේ, සාමය උදා වීම සඳහා මේ රටේ සියලු ජාතීන්ට දේශපාලන බලය, හවුල්කාරිත්වය සමානව ලැබිය යුතු බව. එවැනි තත්ත්වයක් නිර්මාණය වුණොත් විතරයි මේ රටේ සාමය උදා වුණාය කියන සතුට සියලු ජාතීන්ට භුක්ති විඳින්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ නිසා දෙමළ අයිතිවාසිකම් සටනේ ඉතිහාසය, ශ්‍රී ලංකාවේ දෙමළ අයිතිවාසිකම් සටනේ ඉතිහාසය ඉතාමත් ප්‍රවේශමෙන් ගවේෂණය කළාම, අපට පේන කාරණයක් තමයි ඉතිහාසය පුරාම ඒ අය සටන් කරලා තියෙන්නේ, දේශපාලන බලය, හවුල්කාරිත්වය ලබාගැනීම සඳහා. ඒ නිසා තමයි පළාත් සභා ක්‍රමය බිහි වුණේ. දේශපාලන බලය, හවුල්කාරිත්වය සහෝදර ජාතීන්ට බෙදා දෙන්න. නමුත් අද වෙන කල් මේ බල ව්‍යුහය උතුරු පළාතේ පිහිටුවන්න බැරි වෙලා තියෙනවා. නමුත් අද අපට සතුටුදායක ආරංචියක් එනවා. ලබන අවුරුද්දේ උතුරු පළාතේ ඡන්දය තියලා, විශේෂයෙන් දේශපාලන වශයෙන් අසාධාරණයට ලක් වුණාය කියන ද්‍රවිඩ ජාතියට දේශපාලන බලය, හවුල්කාරිත්වය පළාත් සභා ක්‍රමය හරහා දිනාගන්න පුළුවන්කම ලැබෙනවා. ඒ හරහා අපට විශ්වාසයක් තියෙනවා. මේ රටේ සහෝදර ජාතීන්ට දේශපාලන බල හවුල්කාරිත්වය ලැබිලා මේ රටේ සාමය උදා වෙනවා කියලා.

ගරු සභාපතිතුමනි, ඉතිහාසය පුරාම සිංහල ජාතිවාදීන් සහ දෙමළ ජාතිවාදීන් තමයි මේ රට යුද්ධමය වාතාවරණයට ඇද ගෙන ගියේ. විශේෂයෙන්ම සිංහල ජාතිවාදීන් මේ රට සිංහල රටය, මේ රට ඒකීය රටක්ය කියන ජාතිවාදී ප්‍රකාශ කළා. ඒ වාගේම දෙමළ ජාතිවාදීන් ඔවුන්ට වෙනම රටක් ඉල්ලලා ජාතිවාදී ප්‍රකාශයක් කළා. මේ ජාතිවාදී ප්‍රකාශයන් දෙකම මේ රට ඉතාම ඛේදනීය තත්ත්වයන්වලට ඉතිහාසයේ ඇදලා දැම්මා. නමුත් අද මතුවෙමින් තියෙන මේ පළාත් සභා ක්‍රමය එපාය කියන එක, ජාතික දේශපාලන මතයද කියන ප්‍රශ්නය අපට තියෙනවා. සමහරුන්ගේ චිත්ත සන්තාන තුළ සිහින නිර්මාණ මතුවෙන්න පුළුවන්. පළාත් සභා ක්‍රමය එපාය කියලා. හැබැයි, ඒක ජාතික දේශපාලන මතය බවට සමාජගත කරන්න ගියොත් නැවත වතාවක් මේ රට ඉතාම අවාසනාවන්ත තත්ත්වයට ඇදී ගෙන යනවා. ඒ නිසා එවැනි තත්ත්වයකට රට ගෙන යන්නේ නැති ජාතික ප්‍රතිපත්තියක් මේ රටේ නිර්මාණය විය යුතු කාලයක තමයි, මේ පළාත් සභා අයවැය ප්‍රකාශය ගැන අපි කථා කරන්නේ.

ගරු සභාපතිතුමනි, මේ පළාත් සභා ක්‍රමය කියලා කියන්නේ මේ රටේ නීතිය. රටේ මූලික ව්‍යවස්ථාවට එකතු කරපු 13 වැනි සංශෝධනය තමයි පළාත් සභා ක්‍රමය. ඒ නිසා මේක මේ රටේ මූලික නීතිය. ඒ විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි, ගෙවුණු ඉතිහාසය පුරා අපි ප්‍රඥප්ති 63 ක් සම්මත කරලා තියෙනවා. මේ පළාත් සභාවේ නීති 63 ක් සම්මත කරලා තියෙනවා ඒක අද මහ පොළවේ ක්‍රියාත්මක වෙනවා. මෙහි විශේෂම කාරණය තමයි, අපි සම්මත කළ නීති හැට තුනෙන් අපි ඉතාම ගෞරව කරන, ආදරය කරන අපේ ගම්මන්පිල ඇමතිතුමා තමයි නීති දෙකක්ම සම්මත කරන්නේ. කෘෂි සේවා අධිකාරි ප්‍රඥප්තිය අපට මතකයි. ආණ්ඩුවෙන් ගත්ත මුදලක් පළාත් සභාව ඉතුරු කර ගෙන පළාත් සභා කෘෂිකර්මාන්තයට බෙදුණු බලය යටතේ, පළාත් සභා බල අධිකාරිය විසින් තින්දු කර ගෙන වියදම් කරන්න පුළුවන් දේශපාලනමය අධිකාරියක් තමයි කෘෂි සේවා අධිකාරිය හරහා නිර්මාණය කළේ. ඒ නිසා එතුමා කියන දේ සහ කරන දේ අතර පරස්පරයක් තියෙනවා. ඒ නිසා සමාජයට මේ පරස්පරය නිවැරදි කළ යුතු වෙනවා.

ඒ වාගේම පොලිතින් භාවිතය අවම කිරීම සඳහා වූ ප්‍රඥප්තියක් එතුමා මේ පළාත් සභාවට ගෙනාවා. ඒ ප්‍රඥප්තිය අද නීතිමය ප්‍රශ්නයක් මත නතර වෙලා තියෙනවා, නැවත ඒක යම් ප්‍රමාණයක් සංශෝධනය කරලා එවන්න කියලා. ඒ නිසා සම්මත කරපු නීති හැට තුනෙන් දෙකක්ම සම්මත කරන්න කටයුතු කළේ, ගම්මන්පිල ඇමතිතුමා. ඒ නිසා මේ ක්‍රියාවේ සහ කථාවේ වෙනසත් එක්ක මතුවන තත්ත්වයක් කියන කාරණය තමයි අපට මතු කරන්න සිදු වෙලා තියෙන්නේ. මේකෙදි ගරු සභාපතිතුමනි, අපට සතුටුවන ප්‍රධාන කාරණයක් තියෙනවා. ඒක තමයි ඉතාම හොඳ ප්‍රජාතාන්ත්‍රිකයෝ මේ සභාවන් මෙහෙයවන එක. බස්නාහිර පළාත අද මෙහෙය වන්නේ ඉතාම වැදගත් ප්‍රජාතාන්ත්‍රිකයෙක්. අපි ඉතාම සතුටු වෙනවා. බලය බෙදීම පිළි ගැනීම ගරු ප්‍රසන්න රණතුංග ඇමතිතුමාගේ දර්ශනය බවට පත් වෙලා තියෙනවා. ඒ පිළිගැනීම මත ඉඳන් තමයි 2013 සඳහා වූ අයවැය ප්‍රකාශය ඉදිරිපත් කරලා තියෙන්නේ. ගරු සභාපතිතුමනි, එතුමා ඉදිරිපත් කළ අය වැය ප්‍රකාශයේ එතුමා ඉතා පැහැදිලිව කියලා තියෙනවා, අයවැය ප්‍රකාශය අවසන් කරන වෙලාවේ. එතුමා අයවැය ප්‍රකාශය අවසන් කරන්නේ ගරු සභාපතිතුමනි,

*"අවසාන වශයෙන් මා විශේෂ යමක් සඳහන් කරන්න කැමතියි. පළාත් සභා ඉතිහාසයට වසර 24 ක් ගත වුවත් සියලු කාර්යාල එක් වහලක් යට නොතිබීම මත නොයෙක් දුෂ්කරතාවට මුහුණ දීමට සිදුව ඇත. නගරය තුළ ගොඩනැගිලි කුළියට ලබාගැනීම මත විශාල වියදමක් දැරීමට සිදුව ඇත. මේ අඩුව සම්පූර්ණ කරමින් මහල් පහළොවකින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට*

[ ගරු මහේෂ් අල්මේදා ]

*රජයේ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හම්බ වෙලා තියෙනවා"* කියලා.

එහෙම නම් අපි කොහොමද කියන්නේ මේ ආණ්ඩුව පළාත් සභා ක්‍රමයට විරුද්ධයි කියලා? ගරු සභාපතිතුමනි, එතැනින් එහාට ගරු ප්‍රධාන අමාත්‍යතුමා කියනවා,

*"වර්ෂ තුනක් තුළ රුපියල් දස ලක්ෂ 4000 ක් පමණ ඒ සඳහා ලබා දීමට ආණ්ඩුව එකඟ වෙලා තියෙනවා"* කියලා.

පළාත් සභා ක්‍රමය ශක්තිමත් වෙමින් යනවා. ඒ නිසා ජාතිවාදීන්ට මේ රට නැවත වතාවක් අවුල් කරලා පළාත් සභා ක්‍රමය බලය බෙදීමේ මූලික දේශපාලන පරමාර්ථ විනාශ කරලා දාලා නැවතත් මේ රට යුද්ධයකට අවාසනාවන්ත තත්ත්වයකට ගෙන යන්න දෙන්න පුළුවන් කමක් නැහැ. ඒ ප්‍රධාන ඇමතිතුමා කියපු කථාව. ඒ විතරක් නොවෙයි. එතුමා පළාත් සභා අයවැයේදී කිව්වා ගරු සභාපතිතුමනි, ඉතා පැහැදිලිව කිව්වා. මොකක්ද? අතිගරු ජනාධිපතිතුමා එතුමාගේ අයවැය පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කරමින් කිව්වේ,

*"ඒ අනුව දිළිඳු බව අඩු කිරීමේ වැඩ සටහන යටතේ රුපියල් දස ලක්ෂ 2000 ක්ද, මෝටර් රථ ලියාපදිංචි ගාස්තුව වැඩි කිරීමෙන් රුපියල් දස ලක්ෂ 1500 ක්ද, පළාත් ගුරුවරුන් පුහුණු කිරීම සඳහා රුපියල් දස ලක්ෂ 900 ක්ද, මෝටර් රථ බලපත්‍ර ගාස්තු සංශෝධනයෙන් රුපියල් දස ලක්ෂ 1000 ක්ද පළාත් සභා වෙත ලබා දීමට කටයුතු කරනවා" කියලා.*

ඒ, මේ රටේ ජනාධිපතිතුමා එතුමාගේ අයවැය ප්‍රකාශය ඉදිරිපත් කරමින් කියපු කථාව. ඒ නිසා පළාත් සභා ක්‍රමය හීන කරන්න හදනවා කියන එක ඉතාම දේශපාලන වශයෙන් හුදකලා වෙලා කරන පෞද්ගලික අදෝනා විධියට තමයි අපි පිළිගන්නේ. ඒ නිසා මේ පළාත් සභා ක්‍රමය ශක්තිමත් කිරීමෙන් මිසක, ජාත්‍යන්තරයට උත්තර දෙන්නත්, මේ රටේ සහෝදර ජාතීන්ට තියෙන ප්‍රශ්නය විසඳා ගන්නත්, මේ රටේ දිගු කාලීන ස්ථිරසාර සාමයක් උදා කර ගැනීමටත් නොහැකි බව අපි කියන්නට ඕනෑ.

ගරු සභාපතිතුමනි, මේ පළාත් සභා ක්‍රමය ශක්තිමත් කිරීමේදී, මම කලින් කිව්වා වාගේම අපේ ප්‍රධාන අමාත්‍යතුමා කොයි තරම් ප්‍රජාතාන්ත්‍රිකයෙක් විධියට කටයුතු කරලා තියෙනවාද කියන කාරණය අපට පැහැදිළි කර ගන්න පුළුවන්කම ලැබෙනවා. ගරු සභාපතිතුමනි, පහුගිය ඉතිහාසයේ අපේ අයවැයේ වැඩිම මුදල වෙන් වන්නේ අධ්‍යාපනය සඳහා. ඒකෙදි සමස්ත වියදමෙන් 40.97 % ක් වියදම් වෙන්නේ අධ්‍යාපනය සඳහා. ගරු සභාපතිතුමනි, මේ අධ්‍යාපනය සඳහා වෙන් වන මුදල ප්‍රධාන අමාත්‍යතුමාට පුළුවන් තනි කාමරයක ඉඳගෙන, තනියම මේ මුදල් වෙන් කරලා වියදම් කරන ක්‍රමයක් නිර්මාණය කරන්න. නමුත් එතුමා එහෙම කළේ නැහැ. ඉතිහාසයේ පළමුවැනි වතාවට ව්‍යුහ කමිටුව කියන, යම් බල අධිකාරියක් ප්‍රාදේශීය මට්ටමේ පිහිටුවන්න එතුමා කටයුතු කළා. අද කලාප කාර්යාල ඇතුලේ තියෙන, කලාප මට්ටමෙන් එන දේශපාලනඥයෝ නියෝජනය කරන, කලාප මට්ටමෙන් ඉන්න අධ්‍යාපන බලධාරීන්, මාණ්ඩලික නිලධාරීන් නියෝජනය කරන දේශපාලන බල රාමුවකින් තමයි අධ්‍යාපනයේ මුදල් කුමන දිශාවකට ගමන් කරනවාද කියන කාරණය තීන්දු වන්නේ. ඒ නිසා අද බලය බෙදීමේ සංකල්පය තව දුරටත් පහළට ගෙනෙන පළාත් සභාව හරහා ප්‍රධාන ඇමතිතුමා කටයතු කරලා තියෙනවා. ඒ නිසා මේ ව්‍යුහය තවදුරටත් ශක්තිමත් වෙමින් යනවා. මේක ඇකිලෙන්න විධියක් නැහැ. ඇකිලෙන්න ක්‍රමයක් නැහැ. මේක අකුලන්න සමහරු උත්සාහ කළාට, ඒක අද වලංගු නැති තත්ත්වයක් බවට පත් වෙලා තියෙනවා.

ගරු සභාපතිතුමනි, එක දේශපාලන පක්ෂයක් කියනවා, මේ පළාත් සභා ක්‍රමය ආරම්භ වෙද්දි, පාර්ලිමේන්තුව ඇතුලේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙද්දි නීතිමය වරදක් වෙලා තියෙනවා. ඒක පදනම් කර ගෙන තමයි උසාවි යන්නේ කියලා. මේ ක්‍රමය අද අවුරුදු 25 ක් ලාංකීය මහ පොළොවේ ක්‍රියාත්මක වෙලා ඉවරයි. ඒ නිසා අවුරුදු 25 ක් ක්‍රියාත්මක වුණු බල ව්‍යුහයක් එදා වුණු වැරැද්දක් කියලා ආපස්සට හරවන්නට පුළුවන් කමක් නැහැ. මේ සියලුම ප්‍රකාශ මේ රට නැවත යුද්ධයකට ඇදගෙන යන්න බල කරන අවස්ථාවන් විධියට තමයි අපි දකින්නේ. ඒ නිසා පළාත් සභා ක්‍රමය අකුලන්න කවුරු හරි යෝජනා කරනවා නම්, ඒ යෝජනා කරන සියලු දෙනා මේ රටේ දිගුකාලීන සාමයට තර්ජනයක් එල්ල කරනවයි කියන කාරණය තමයි අපි මතක් කරන්නේ. ඒ නිසා මේ රටේ සාමය, මේ රටේ ජාතීන් අතර සුහදත්වය, මේ රටේ ජනවර්ග අතර තියෙන සංහිදියාව නැති කරන්න ගන්න උත්සාහයන් වළක්වන්න ජාතික වශයෙන් ප්‍රතිපත්ති තීන්දු තීරණ ගත යුතුව තියෙනවා. එහෙම නැත්නම් නැවත වතාවක් මේ රට ඉතාම අවාසනාවන්ත තත්ත්වයකට පත් වෙනවා කියන කාරණය අපි මතක් කරන්න ඕනෑ.

ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ වෙලාවේ අපි නැවත නැවතත් මතක් කරනවා. අපේ අදහස් අපි තවදුරටත් ප්‍රකාශ කරනවා, අධ්‍යාපනය පිළිබඳව කථා කරන වේලාවට. මේ පළාත් සභා ක්‍රමය තවදුරටත් ශක්තිමත් කරමින්, බලය බෙදීම තවදුරටත් අර්ථවත් කරමින් උතුරු පළාතේ හැදෙන පළාත් සභාව හරහා සහෝදර ද්‍රවිඩ ජාතීන්ට මේ රටේ දේශපාලන බලයේ හවුල්කාරිත්වයට එකතු වෙන්න අවස්ථාව ලබා දෙමින් - මේ රට සාමකාමී රටක්. දීර්ඝකාලීන සහජීවනය තියෙන රටක් බවට පත් වෙන්න කියන ප්‍රාර්ථනය කරමින් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[ අ.භා. 03.29 ]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ විසි පස්වන අයවැය විවාදය මේ වෙලවේ අපි සාකච්ඡා කරන්නේ, එක පැත්තකින් මට පෙර කථා කළ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ පළාත් සභා සම්බන්ධයෙන් රටේ යම් කතිකාවක් නැවත වටයකින් කෘතීමව ආරම්භ කරලා තියෙන වෙලාව. මීට අවුරුදු විසිපහකට ඉස්සර වෙලා මේ පළාත් සභා ක්‍රමය ආරම්භ කරන කොටම අපි කිව්වා මේ පළාත් සභා කිසිසේත්ම ජාතික

ගැටලුවට විසඳුමක් නොවෙයි කියලා. අද මොකක්ද වෙලා තියෙන්නේ? උතුරු - නැගෙනහිර තිබුණු ඒ ජාතික ගැටළුවට උත්තරයක් කියලා ඉන්දියාව අප වෙත බලහත්කාරයෙන් පටවපු පළාත් සභා ක්‍රමය. අඩු තරමින් ඒවා අවශ්‍ය කරලා තිබුණේ උතුරටයි. නැගෙනහිරටයි. එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ඉන්දියාවේ පිළිගත් විධියට - අවුරුදු විසිපහක් ගිහිල්ලත් උතුරේ පළාත් සභාව පිහිටුවලා නැහැ නේ? මෙහේට දීලා තියෙනවා පළාත් සභාව. මෙහේ මහා මන්ත්‍රීවරු ගොන්නක්, ඇමතිවරු තොගයක් නඩත්තු කරනවා. ඒකෙන් ජනතා මුදල් කොටසක් වෙන් කරවා ගෙන යනවා මිසක් අවුරුදු විසිපහක් ඇතුළේ එහෙම දෙයක් වෙලා නැහැ. දැන් මේ ලියවිල්ල ගැන - ඇත්තටම ගත්තොත් මේ අයවැයේ අන්තර්ගතය පිළිබඳව සාකච්ඡා කරන්න දෙයක් නැහැ. ඒ නිසා තමයි පළාත් සභා වෙනුවෙන් දිවි හිමියෙන් කටයුතු කරන මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා වාගේ අයට මේකේ අග සිට මුලටත්, මුල සිට අගටත් පෙරළ පෙරළා බැලුවාට පස්සේ හොයා ගන්න පුළුවන් වුණේ, පළාත් සභාවලට මහ ඇමතිතුමා එකහයි කියන්න. හොඳයි කියන්න.

එකම එක දේ තමයි අවුරුදු විසිපහකට පස්සේ ඔක්කෝම එකතු කරලා ගොඩනැගිල්ලක් හදනවයි කියලා කියන එක. අපිත් විරුද්ධ නැහැ ඔය ගොඩනැගිල්ල හදනවාට. ඒ මොකද? ඔය පළාත් සභා අහෝසි කළත්, ගොඩනැගිල්ල සමතලා කරන්නේ නැහැ නේ? පළාත් සභා ක්‍රමය සමතලා කරලා දැම්මත්, ඔය ගොඩනැගිල්ල ආණ්ඩුවේ වෙන වැඩකට පාවිච්චි කරන්න පුළුවන්. ඒ නිසා ගොඩනැගිල්ල හදන්න. හොඳයි. එපමණයි හොයා ගන්න පුළුවන්කම ලැබුණේ. ඒ නිසා මෙය කිසිදු අන්තර්ගතයක් නැති හිස් ලියවිල්ලක්. ඇයි මහ ඇමතිතුමාට එහෙම තැනකට පත් වෙන්න සිදු වුණේ. වෙන මොකක්වත් නිසා නොවෙයි. ආණ්ඩුව අද පළාත් සභා ගැන දක්වන ස්ථාවරය මොකක්ද? ස්ථාවරයක් නැහැ. එන එන පැත්තට ගහ උළුවස්ස වාගේ. ඉන්දියාව එන කොට එකක්. ජිනීවාවලින් එන කොට තව එකක්. ඇමරිකාවේ රාජ්‍ය ලේකම් එන කොට තව එකක්. මෙහේ පක්ෂ ටික තියා ගන්න තව එකක්. ඔහොම කිය කියා ඉන්නවා මිසක් - දැන් ඔබතුමා කල්පනා කරලා බලන්න. මේ 13 වන සංශෝධනයයි 18 වැනි සංශෝධනයයි එක්ක අපේ රටේ දේශපාලන පක්ෂවල හැසිරීම හොඳට තේරුම් ගන්න පුළුවන්. දැන් එක්සත් ජාතික පක්ෂය ගත්තොත් එහෙම, ඒ ගොල්ලෝ 13 ට කැමතියි. හැබැයි 18 ට විරුද්ධයි. අපට පිළිගන්න පුළුවන්. මොකද? 13 ට කැමතියි ඒ ගොල්ලෝ බලය බෙදීමට පක්ෂ නිසා. 18 ට විරුද්ධයි. වික්‍රමසිංහ මහත්තයා වැඩිපුර කල්පනා කරන්නේ තමන් බලයට ඒම එක ගැන නොවෙයි. ධනපති ක්‍රමය කවදා හරි ශක්තිමක් වෙලා ඉස්සරහට යන්න ඕනෑ කියන එක නේ එතුමා කල්පනා කරන්නේ. ඒ නිසා තනි පවුලකට බලයක් එන ක්‍රමයට, 18 ට විරුද්ධයි. හැබැයි, දැන් ගත්තොත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. එතුමන්ලාගේ 13 ගැන ස්ථාවරය මොකක්ද? ස්ථාවරයක් නැහැ. ඒකට තියෙනවා ප්‍රශ්නාර්ථයක්.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔබතුමාගේ ස්ථාවරය මොකක්ද?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

කියන්න ඉන්න පොඩ්ඩක්. ලැජ්ජයි ඒක අහපු එක ගැන. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, එහෙ ඉන්න නායකයා අනුව තමයි ස්ථාවරය. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඉන්න කාලයේ අපිත් එක්ක ගිහිල්ලා කොටුවේ බෝගහ ඉස්සරහ වාඩි වෙලා උද්ඝෝෂණත් කළා. ඊට පස්සේ චන්ද්‍රිකා නෝනා ඉන්න කොට එකයි. දැන් මහින්ද මහත්තයා ඉන්න කොට එකයි.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔබතුමා කෑ ගහ ගහ ඉන්නෙ මොකද මෙතැන?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මේ කථා කරන්නේ පොදු කටයුතු සම්බන්ධව. ඔබතුමා කථා කරන්නේ -

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔබතුමා අර මන්ත්‍රීවරු කියලා කිව්වා නේද? ගරු සභාපතිතුමනි, මෙතුමා මන්ත්‍රීවරු කියලා ඔක්කෝම වරප්‍රසාද ගන්නවා කිව්වා. මෙතුමාත් ඒ වරප්‍රසාද ඔක්කෝම ගන්නවා නේ? ඉතින් ඔබතුමාත් ගන්නවා කියන්න කෝ? ඔබතුමා කථා කරන්නේ අපි විතරක් ගන්නවා වාගේ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, බාධා කිරීම් කරන්න එපා. එතුමාට පස්සේ උත්තර දෙන්න පුළුවන් නේ? ඔබතුමා උත්තර දෙන්න ඔබතුමාට අවශ්‍ය නම් ඔබතුමාගෙ වෙලාවේ. බාධා කිරීම් කරන්න එපා. ඔබතුමාට ඕනෑ නම් වෙලාව දෙන්න පුළුවන්. වෙලාව තියෙනවා. එතුමා එතුමාගේ අදහස් ප්‍රකාශ කරන්නේ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

අහගෙන ඉන්න කෝ? 13 කියන්නේ බලය බෙදීම. (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. කාලය දෙන්නම් ඔබතුමාට අවශ්‍ය නම් කථාකරන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

කාලය තියෙනවා නේ? අපට සුළු කාලයයි තියෙන්නේ. බලය බෙදීමට, එතුමා ස්ථාවරය දන්නේ නැහැ. හැබැයි 18 ට පක්ෂයි. අපි 13 ට විරුද්ධයි. මොකද? මෙවැනි බලය විමධ්‍යගත කිරීමෙන් රටේ ප්‍රශ්න විසඳෙන්නේ නැති නිසා. ඒ වාගේම 18 ට විරුද්ධයි. අත්තනෝමතික මධ්‍යගත කිරීමට විරුද්ධ නිසා. ඒ වාගේම තමයි, දැන් මේ ආණ්ඩුවේ ඉන්නවා සමහර පක්ෂ. ඒ ගොල්ලෝ 13 ට විරුද්ධයි. 18 ට පක්ෂයි. ඒ මොකක්ද ඒ? 13 ට විරුද්ධයි කියන්නේ, බලය බෙදීමට විරුද්ධයි. හැබැයි 18 ට - අර තනි බලයක් ශක්තිමත් කරන කොට ඒකට පක්ෂයි. ඒක වාගේ නොවෙයි. ඊට වඩා ලෝකය හිනස්සන වැඩේ තමයි දැන් මහේෂ් අල්මේදා මන්ත්‍රීතුමාලා 13 ට පක්ෂයි. ඒ කියන්නේ බලය බෙදන්න පක්ෂයි. (බාධා කිරීමක්) ඒ වාගේම 18 ටත් පක්ෂයි. බලය විමධ්‍යගත කිරිමටත් පක්ෂයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. ඔබතුමාට කථා කරන්න අවශ්‍ය නම් කාලය දෙන්නම්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඒ නිසා වෙලා තියෙන්නේ ගරු සභාපතිතුමනි, මේ පළාත් සභා ක්‍රමය දිගින් දිගට දුර්වල කරලා තියෙන්නේ. දැන් ඔබතුමා දන්නවා.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

දැන් පක්ෂයත් දුර්වල වෙලා. ජේ.වී.පී. එකත් නාය ගිහිල්ලා නේ?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

අපි පළාත් සභා ක්‍රමයට විරුද්ධයි. හැබැයි ආණ්ඩුවට ස්ථාවරයක් තියෙනවා නම් පළාත් සභාව පවත්වා ගෙන යන්න. එය ශක්තිමත් කිරිම සඳහා මොනවා හරි ප්‍රතිපත්තිමය රාමුවක් ඕනැ. ඒ ප්‍රතිපත්තිමය රාමුව මත ඉඳලා තමයි මහ ඇමතිතුමාට අයවැය හදන්න පුළුවන්කම ලැබෙන්නේ. දැන් මොකද වෙලා තියෙන්නේ? පිරිවැටුම් බද්ද තිබුණා. එය ඉවත් කරලා ගත්තා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට. ගරු සභාපතිතුමනි, මේ ආණ්ඩුවේ ඇමතිවරුන්ට, මන්ත්‍රීවරුන්ට මොනවා හරි ආපදාවක් වුණාට පස්සේ ගිහිල්ලා ජනතාවට මොනවා හරි බෙදන්න ක්‍රමයක් තිබුණා. ඒකත් දැන් අරගෙන තියෙනවා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට. දැන් මේ සියල්ල අරගෙන. දිවි නැගුම පනතට අපි විරුද්ධයි. හැබැයි, පළාත් සභා ක්‍රමයට කැමති අය ගන්න කෝ? දිවි නැගුම පනතට මොකද කළේ? අර ග්‍රාමීය සංවර්ධන බලතල ටික සේරම ගත්තා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට. දැන් මේ මොකක්ද යන්නේ? පළාත් සභා ක්‍රමය දුර්වල කරමින්, දුර්වල කරමින් යනවා. හැබැයි, ඒකේ සැකිල්ල ආරක්ෂා කර ගන්නවා. ඒ මොකටද? මේ ආරක්ෂා කර ගන්නේ වෙන මොකටවත් නොවෙයි. මේ අයට පළාත් සභා තිබුණත් එකයි. නැතත් එකයි. මේ රටේ පළාත් සභා ගෙනාවෙත් ජාතික ගැටලුවට විසඳුමක් ලෙස කිව්වාට ගරු සභාපතිතුමනි, ඒක එහෙම නොවෙයි. ඒ වෙලාවේ හිටපු නායකයන්ට, ඒ වෙලාවේ හිටපු පක්ෂවලට බලය රැක ගන්න ඉන්දියාවට හරි, ජාත්‍යන්තරයට හරි කෝහේට හරි පෙන්වන්න. එහෙම ගෙනාපු ව්‍යුහයක්. ඒ නිසා තමයි, වැඩිපුර කථා නොකරන ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ නෝනා. හෙලේනා ජයවර්ධන මහත්මිය. එතුමියගෙන් 1987 මේ පළාත් සභා කලබල වෙලාවේ-

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම දිගින් දිගටම ඔබතුමාට කිව්වා. ඔබතුමාගේ විග්‍රහය හොඳයි. නමුත් ඔබතුමා කථා කරන්නේ පොදු සාකච්ඡාව යටතේ. ඒ අනුව ඔබතුමා කථා කරන්න. ඉන් එහාට යනවා නේ ඔබතුමා?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

එතුමියගෙන් අහනවා, මේ පළාත් සභා ක්‍රමය ක්‍රියාත්මක නොකර රටේ කළබලයක් ඇති කළොත් එහෙම ඉන්දියානු ආණ්ඩුව ඇවිල්ලා ජේ.ආර්. ජයවර්ධන මහත්තයාගේ ආණ්ඩුව ආරක්ෂා කරයි ද කියලා. එතුමන්ලාට ඒ දවස්වලත් තිබුණේ මොකක්ද? මේක ක්‍රියාත්මක නොකළොත් ආණ්ඩුව වැටෙයි කියන භය. ඒ නිසා දැන් මේ දෙමළ ජනතාව ගැන ආදරයෙන් කරන එකක් නොවෙයි. දෙමළ ජනතාවට ආදරය නම්, කොහොමද ගිහිල්ලා යාපනය විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට ගහන්නේ? එහේ අවතැන් කඳවුරුවල ඉන්න අයට ගෙවල් හදලා දෙන්නේ නැත්තේ ඇයි?

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ජේ.වී.පී අය ගිනි තිබ්බ ඒවා මතක නැද්ද කොහේද? ලංගමය ගිනි තිබ්බා. පොලීසිය ගිනි තිබ්බා. ගිනි තිබ්බේ ආදරේට. සිංහල ජාතියට ආදරයක් නැතුව ගිනි තිබ්බේ. තමුසෙලානේ ගිනි තිබ්බේ.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බස් ගිනි තිබ්බේ තමුන්නාන්සේලා නේ?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

පළාත් සභා - ඉන්ඩ කෝ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

රෑ ගෙවල් ගානේ ගිහිල්ලා හැඳුනුම්පත් උස්සා ගෙන ගියේ. මතකද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සරත් පතිරණ කැන්ට්මේදිත් කිව්වා ආයෙත් මරණවා කියලා.

**ගරු නිමල් ලාන්සා** – අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

නාය ගිහිල්ලා තිබෙන්නේ පක්ෂයත් එක්ක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා එතුමාට බාධා කිරීම් කරන්න එපා. පිළිතුරු දෙන්න ආණ්ඩු පක්ෂයට අවස්ථාවක් තියෙනවා. ගරු ඇමැතිතුමා, පිළිතුරු දෙන්න ඔබතුමාට කාලය දෙන්නම්.

**ගරු නිමල් ලාන්සා** – අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

නාය ගිහිල්ලා තියෙන්නේ පක්ෂයත් එක්ක. බොරු කියලා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

මේක අහගෙන ඉන්නේ නැහැ නේ?

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

බස් කොහොම හරි ගිනි තිබ්බ නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා බාධා කිරීම් කරන්න එපා. දෙන්නටම අවස්ථාව දෙන්නම් කථා කරන්න. කරුණාකරලා එතුමාට බාධා කිරීම් කරන්න එපා. එතුමාට අවස්ථාව දෙන්න. ගරු ඇමතිතුමා, ඔබතුමාට පිළිතුරු දෙන්න අවස්ථාව දෙන්නම්. බාධා කිරීම් කරන්න එපා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඒ නිසා අවසානයේ වෙලා තියෙන්නේ, මේ රටේ ජනගහනය වැඩි වන කොට රාජ්‍ය සේවය පුළුල් කරන්න ඕනෑ. ඒ රාජ්‍ය සේවයේ සේවකයන් කොටසක් මේ පළාත් සභාවට අර ගෙන අධ්‍යාපන අමාත්‍යාංශයයි, සෞඛ්‍ය අමාත්‍යාංශයයි, ගුරුවරුයි, හෙද සේවකයොයි ඒව මේවා කියලා කොටසක් අරගෙන පඩි ගෙවනවා. එපමණයි වෙලා තියෙන්නේ. අවුරුදු විසිපහකට පස්සේ. ඒ නිසා මේ පළාත් සභා අපි කියපු විධියට රටට අනවශ්‍ය බරක්. මේක රටේ පරිපාලන යාන්ත්‍රය දුර්වල කරනවා. අඩු තරමින් අපි කියනවා. ආණ්ඩුවේ දැන් පළාත් සභාවලට, 13 ට විරුද්ධව කථා කරන මහත්වරු ඒක අවංකවම නම් කරන්නේ, පුළුවන් නම් මේ අයවැය ශක්තිමත් කරන්නේ නැතුව, අයවැයට පක්ෂව ඡන්දේ දෙන්නේ නැතුව පුළුවන් නම් මේ අයවැයට විරුද්ධව ඡන්දය දෙන්න කියලා. තමන්ගේ දේශපාලන හැඟීම ඇත්ත නම්. අපි, ජනතා විමුක්ති පෙරමුණ පළාත් සභාවට විරුද්ධව මේ පළාත් සභාවේ, පාර්ලිමේන්තුවේ කථා කරලා නොවෙයි. පාරෙ සටන් කරලා.

[සභාවේ ඝෝෂා]

ජීවිත පූජා කරලා - ඒ නිසා පුළුවන් නම්, ඇත්තටම විරුද්ධ නම් අඩු තරමින් (බාධා කිරීම්)

**ගරු නිමල් ලාන්සා** – අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

සටන් කරලා බලන්න කෝ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

පොඩ්ඩක් අහගෙන ඉන්න කෝ? හරි වදයක් මෙයා. පොඩ්ඩක් අහගෙන ඉන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. කරුණාකරලා නිශ්ශබ්ද වන්න කෝ දෙයියනේ. එතුමාට අවස්ථාව ලබා දෙන්න කෝ.

**ගරු නිමල් ලාන්සා** – අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

පළාත් සභා–

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇමැතිතුමාට විනාඩි 5 ක් දෙන්නම් කථා කරන්න කෝ. එතකොට උත්තර දෙන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු සභාපතිතුමනි, පළාත් සභා කොහොම පවතීද? අඩු තරමින් මේ වාගේ ඇමති කෙනෙකුට පළාත් සභාවට කරන විවේචන අහගෙන ඉන්න බැරි නම්, මේ වාගේ ඇමතිලද පළාත් සභා කර ගෙන යන්න ඉන්නේ? (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට විනාඩි 02 ක කාලයක් තිබෙනවා.

**ගරු මෙරිල් පෙර්රා**
Hon. Meril Perera

කැන්ටිමේ ඒවා හොඳට කාලා කියවනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඕක තමයි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ (බාධා කිරීමක්) වැඩේ.

**ගරු මෙරිල් පෙර්රා**
Hon. Meril Perera

කැන්ටිමේ හොඳට කාලා ඇවිල්ලා කියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට කවුරුවත් බාධාකිරීම් කළේ නැහැ නේ? ඔබතුමා නිශ්ශබ්ද වෙන්න කරුණාකරලා. බාධා කිරීම් කරන්න එපා. අවස්ථාව තියෙනවා නේ? ආණ්ඩු පක්ෂයට කාලය දෙන්නම්. කාලය තියෙනවා. ඒ බාධා කරන මන්ත්‍රීවරුන්ට උත්තර දෙන්න ඕනෑ නම්, විනාඩි පහ පහ මම දෙන්නම්. අසාධාරණයක් නේ කරන්නේ එතුමාට. එතුමාට අවස්ථාව ලබා දෙන්න. උදෙත් ඔය වැඩේ කළා. මන්ත්‍රීතුමෙක් ගියා යන්න.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

වයර් මාරු වෙලා ඒක නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වයර් නොවේ. ඔබතුමා කථා කරන්න අවස්ථාව දෙන්න. ගරු මන්ත්‍රීතුමා තව විනාඩි 02 ක කාලයක් තිබෙනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඒ නිසා ගරු සභාපතිතුමනි, අපේ තර්කය හරිම පැහැදිලියි. අපි කිව්වේ, පළාත් සභා ක්‍රමය ජාතික ගැටළුවට විසඳුමක් නොවෙයි. පළාත් සභා ක්‍රමය මේ රටේ පරිපාලනය අවුල් කරනවා. හැබැයි, මේ රටේ බලය සඳහා සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව හවුල් කර ගන්න ඕනෑ. ඒකට පළාත් සභා නොවෙයි, ව්‍යුහය. පහළ මට්ටමේ පරිපාලන බලය විමධ්‍යගත කරන්නයි ඕනෑ. පරිපාලන බලයට දෙමළ ජනතාව සම්බන්ධ කර ගන්නයි ඕනෑ. ඒක දෙන්නේ නැහැ. දැන් නැගෙනහිර මුදා ගත්තා කියලා පළාත් සභා ඡන්දය තිබ්බා. මොකක්ද කළේ? ජාතිවාදය වැපිරෙව්වා. මුස්ලිම් කොංග්‍රසය එහෙන් ජාතිවාදය වැපිරෙව්වා. දෙමළ ජාතික සන්ධානය එහෙන් ජාතිවාදය වැපිරෙව්වා. ඒකට තකට තක හරියන්න ආණ්ඩුව මෙහෙන් ජාතිවාදය ගෙන ගියා. අවසානයේ මොකද වුණේ? යුද්ධයෙන් මුදා ගත්ත නැගෙනහිරත් ජාතිවාදය බෙදෙන තැනකට ගෙනාවා. උතුරටත් වෙන්නේ ඔය සන්තෑසියම තමයි. ඒ නිසා මේ අය පළාත් සභා ක්‍රියාත්මක කර ගෙන යන්නේ, මේ රටේ ප්‍රශ්නයට විසඳුමක් ලෙස නොවෙයි. දැන් මේ පළාත් සභා තියාගෙන යන්නේ, අතුරු මැතිවරණ තියන්න. (බාධා කිරීම්) පළාත් සභා ටික තියා ගත්තොත් එහෙම කාලෙන් කාලෙට අතුරු මැතිවරණ තියන්න පුළුවන්. ඒ නිසා මේක සුදු අලියෙක් තමයි. මේකෙන් රටට වැඩක් වෙන්නේ නැහැ තමයි. ඒ නිසා මේක අහෝසි කරන්නම ඕනෑ. අපි ඒ වෙනුවෙන් තමයි පෙනී සිටින්නේ. පුළුවන් නම් විරුද්ධ වෙන මන්ත්‍රීලා, stage එකේදී 13 ට විරුද්ධ වන මන්ත්‍රීවරු ටික මේ අයවැයට විරුද්ධව ඡන්දය පාවිච්චි කරන්න කියලා කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 03.40 ]

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** – අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි,

සබ්බේ තසන්ති දණ්ඩස්ස – සබ්බේ තං ජීවිතං පියං
අත්ථා නං උපමං කත්වා – න හනෙය න ඝාතයේ

කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා. බුදු රජාණන් වහන්සේ දේශනා කරන්නේ, අන් අය හිංසාවට භියයි. ජීවිතේට ප්‍රිය කරනවා. තමන් අනුන් තැන තබා සිතා තමනුත් අනුන්ට හිංසා කිරිමෙන් ජීවිත අහිමි කිරීමෙන් වළකින්න කියලයි ධම්මපදයේ ඒ ගාථාවෙන් කියන්නේ.

ගරු සභාපතිතුමනි, හදිසියෙන්ම මට ධම්ම පදය සිහිපත් වුණේ, මගේ හිත මිත්‍ර නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාට අද අත් වුණු ඉරණම දැකලා. අවංකව මම එතුමාට වුණු දේ ගැන කනගාටු වෙනවා. නමුත් පසුගිය සභාවේ මම අදහස් ප්‍රකාශ කරන්න නැගී සිටි අවස්ථාවේ, ඒ මන්ත්‍රීතුමා නායකත්වය දෙමින් විපක්ෂයෙන් දැවැන්ත ඝෝෂාවක් කරමින් මගේ කථාවට බාධා පැමිණුවා. දිට්ඨධම්ම වේදනීය කම්ම එල දීලා එතුමා දැක්කා තිස් දෙනෙක් කෑ ගැහුවාම කෙනෙකුට කථා කරන්න අමාරු නම්, හැත්තෑ එක් දෙනෙක් කෑ ගැහුවොත් මොකක්ද ඇතිවන තත්ත්වය කියලා. ඒ නිසා අපේ විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා තේරුම් ගන්න ඕනෑ. තමුන්නාන්සේලා වාගේ දෙගුණයටත් වැඩි පිරිසක් ආණ්ඩු පක්ෂයේ ඉන්නවා. තමුන්නාන්සේලා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කථා කරද්දි බාධා කරනවා නම්, ඊට වඩා හයියෙන් කථා කරන්න, ඊට වඩා වැඩියෙන් කථා කරන්න පුළුවන්, දැවැන්ත ආණ්ඩු පක්ෂයක් මෙතැන තියෙනවාය කියන එක සිහිපත් කර ගෙන මේ විවාදය ඉදිරියට ගියොත් ඉදිරි දවස් හතර එලදායී විවාදයක් කර ගන්න ලැබෙයි. නැත්නම් තවත් එක් ඝෝෂාවක් බවට පත් කරලා අපි මෙන්න මේ පළාත් සභාව

තවදුරටත් හැල්ලු කිරීම් විතරක් පමණයි විපක්ෂයෙන් සිදු වන්නේ ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමනි, අද මේ අයවැය විවාදයේ අවසාන හරියට අපි පැමිණෙමින් ඉන්නවා. අපේ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා විශාල ගණනක් කථා කළා. එතුමන්ලා කථා කළා දිවි නැගුම ගැන. පළාත් සභා අහෝසි කිරීම ගැන. ජනාධිපතිතුමාගේ අයවැය කථාව පිළිබඳව. ලෝක බැංකු පදේට නැටීම ගැන. බඩගිනි සහ ලැම්බෝ ගිනි ගැන. අනේ දෙයියනේ මම බලා ගෙන ඉන්නවා, මේ අයවැයේ දුර්වලතා ගැන කථා කරයි කියලා. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමනි, ඔබේ කථාවන් හරහා මේ අයවැය විශිෂ්ට අයවැයක් කියලා ඔබ සහතිකය දීලා ඉවරයි කියන කාරණය මා අපේ මහ ඇමතිතුමාට ගෞරවයක් වශයෙන් සිහිපත් කරන්න ඕනෑ. මේ අයවැයට කියන්න දෙයක් නැහැ. හොයා ගන්න අඩුපාඩුවක් නැහැ. කථා කරන්න වෙලාවක් දීලා තියෙන නිසා මොනවා හරි කථා කරන්න අහළ පහළ දේවල් ඇහිඳ ගැනීම පමණයි අද මේ අයවැය විවාදයේදී විපක්ෂයෙන් අපි දැක්කේ.

ගරු සභාපතිතුමනි, අපේ මහ ඇමතිතුමන්ගේ අයවැය කථාවේ සඳහන් වුණා, 2011 දී ඒක පුද්ගල ආදායම ඩොලර් 3750 සිට 2016 දී එය 5770 දක්වා වැඩි කරන්න බලාපොරොත්තු වෙනවා කියලා. ශිරාල් ලක්තිලක ගරු මන්ත්‍රීතුමාට අනුව මේක දවල් දකින සිහිනයක්. Day dream එකක් කියලා එතුමාට තේරෙන සිංහලෙන් එතුමා ඒක විස්තර කළේ. ගරු සභාපතිතුමනි, අපි ඩොලර් 3750 සිට 5770 දක්වා වැඩිවෙනවාය කියන්නේ, වසර පහක් තුළ 53% කින් වැඩි කිරීමක්. ශ්‍රී ලංකාවේ 2006 ඒක පුද්ගල ආදායම ඩොලර් 1421 යි. 2011 දී එය ඩොලර් 2399 දක්වා වැඩි වුණා. ඒ කියන්නේ 69% ක වැඩිවීමක්. සියයට 69% පහුගිය අවුරුදු පහේදී වැඩි කළ අපට, ඉතිරි වර්ෂ පහට 53% කින් වැඩි කරනවා කියන එක යථාර්ථවාදී නැහැයි කියන්නේ මොන පදනමින්ද කියලා අනේ අපේ ශිරාල් ලක්තිලක ගරු මන්ත්‍රීතුමා දැන් මෙතැන හිටියා නම් කියලා මට හිතෙනවා. ගරු සභාපතිතුමනි, ඒක පුද්ගල ආදායම කියන එක නිර්ණායක තුනක් මත තීරණය වෙන දෙයක්. රටේ ආර්ථික වර්ධන වේගය, ජනගහන වර්ධන වේගය සහ විනිමය අනුපාතිකයේ විචලතාවය කියන කාරණා තුන මත පදනම් වෙන්නේ. මේ කාරණා තුනටම පුරෝකථනයන් කරමින් තමයි, අපි 2016 බස්නාහිර පළාතේ ඒක පුද්ගල ආදායම ඩොලර් 5770 කින් අවමයට ගේන බවට පුරෝකථනය කළේ. ගරු සභාපතිතුමනි, මේ අවමයයි. මේ බස්නාහිර පළාත් සභාවේ අපි බස්නාහිර පළාතේ ආදායම මේ මට්ටමත් ඉක්මවා යන්නට කටයුතු කරනවාය කියන එක සිහිපත් කරන්න ඕනෑ.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, අපේ යුසුෆ් ගරු මන්ත්‍රීතුමාත්, ශිරාල් ලක්තිලක ගරු මන්ත්‍රීතුමාත් සඳහන් කළා, මේක මේ වියදම් මිස ආදායම් උපයන වැඩ පිළිවෙළක් නැති අය වැය ලේඛනයක් කියලා. ආදායම වැඩි කරන්නේ කොහොමද? ආදායම් වැඩි කරන්න ක්‍රම දෙකක් තියෙනවා. පළමුවැනි ක්‍රමය තමයි, අපි අය කරන බදු සහ ගාස්තු වැඩි කිරීමෙන් ආදායම වැඩි කරන්න පුළුවන්. ඒක අපි කරලා නැහැ. හැබැයි, අපි 2011 දී බිලියන 25.5 ක් වුණු අපේ ආදායම, 2012 දී බිලියන 25.9 කට වැඩි කර ගනිමින් 2013 ට බිලියන 29.6 ක් දක්වා වැඩි කර ගන්න යෝජනා කරලා තියෙනවා. බදු ප්‍රතිශත වැඩි කරන්නේ නැතුව, ගාස්තු වැඩි කරන්නේ නැතුව, අපි කොහොමද ආදායම වැඩි කර ගන්නේ? යාන්ත්‍රණය කාර්යක්ෂම කරමින්, බදු ජාලයට අසුවන පුද්ගලයන් වැඩි කර ගනිමින්, ඒ බදු කාර්යක්ෂමව එකතු කර ගනිමින්, පැහැර හරින්නන් බදු දැළට හසු කර ගනිමින් තමයි ආදායම වැඩි කරන්නේ. විපක්ෂය අපට මේ චෝදනා නගන්නේ, අපි බදු වැඩි කළේ නැත්තේ ඇයි කියලා. ජනතාව මත බදු පීඩනය වැඩි නොකළේ ඇයි? ගාස්තු වැඩි නොකළේ ඇයි? ඔව්. සමහර විට ඒවා වැඩි කළා නම්, මේ අයවැය කථාවේදී තමුන්නාන්සේලාට කථා කරන්න මාතෘකාවක් ලැබෙන්නට නම් තිබුණා. නමුත් මහ ඇමතිතුමන් මල නොතලා රොන් ගන්නා බඹරෙකු සේ බස්නාහිර පළාතේ ජනතාවට පීඩනයක් එල්ල නොකර බස්නාහිර පළාතේ ආදායම පසුගිය වසර හතර තුළ අඛණ්ඩව වැඩි කළා සේම, 2013 ටත් වැඩි කරන්නට සැළසුම් හදලා ඉවරයි ගරු සභාපතිතුමනි.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, තව කාරණයක් විදියට, අපේ ශ්‍රීනාත් පෙරේරා මන්ත්‍රීතුමා. මම එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. පළාත් සභා අහෝසි කිරීමේ මගේ සටනට එතුමන්ගේ සහාය පළ කළා. එතුමා මතු කළා කාරණයක්. පඩි ගෙවන්න විතරත් බිලියන 22 ක්. මේක නාස්තියක් නේද? මේකෙන් තියෙන ඵලය මොකක්ද? මේකටද බස්නාහිර පළාත් සභාව කර ගෙන යන්නේ? ගරු සභාපතිතුමනි, පඩි ගෙවනවා කියන්නේ මුදල් නාස්තියක් නොවෙයි. අපි පඩි ගෙවන නිසා තමයි බස්නාහිර පළාතේ සෑම පාසලකම උදැසන ගුරුවරු පාසලට පැමිණෙන්නේ. අපි පඩි ගෙවන නිසා තමයි, බස්නාහිර පළාතේ රෝහල්වලට වෛද්‍යවරු හෙදියෝ පැමිණෙන්නේ. අපි පඩි ගෙවන නිසා තමයි මහා මාර්ග තාර දමන්න, කොන්ක්‍රීට් කරන්න ඉංජිනේරුවෝ පැමිණෙන්නේ. අපි පඩි ගෙවන නිසා තමයි, කෘෂි උපදේශකයෝ වෙලට බහින්නේ. කර්මාන්ත තාක්ෂණිකයන්, කාර්මික ශිල්පීන් හොයාගෙන යන්නේ. මේ යාන්ත්‍රණය දුවන්නේ, අපේ ඇඟේ රුධිරය දුවනවා වාගෙයි. වාහනයකට ඉන්ධන අවශ්‍ය වගේම බස්නාහිර පළාත තුළ මේ රාජ්‍ය යාන්ත්‍රණය වැඩ කරන්නේ, මේ පඩි නඩිවලින්. ඒකට මූල ධන වියදම් විතරක් තිබිලා වැඩක් නැහැ. පඩි නඩි ගෙවලා අපි ශ්‍රම සම්පත නඩත්තු කළේ නැත්නම්. ඒ නිසා මේ බිලියන 22 නාස්තියක් නිෂ්ඵල දෙයක් විදියට කවුරු හරි හිතනවා නම්, එය වැරදි අදහසක් ගරු සභාපතිතුමනි. ඒ වාගේම ගරු සභාපතිතුමනි, අපේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා. අවසානයේ අපෙන් ඉල්ලීමක් කළා.

[ ගරු උදය ගම්මන්පිල - අමාත්‍යතුමා ]

එතුමන් අපට අභියෝගයක් කළා. පළාත් සභාවලට අවංකවම විරුද්ධ නම් මෙවර අයවැයට විරුද්ධව ඡන්දය දෙන්න කියලා. ගරු සභාපතිතුමනි, මගේ නොදන්නා කමටයි මේ ප්‍රශ්නය

ඔබතුමා හරහා එතුමන්ගෙන් අහන්නේ. එතුමාටත් ඕනෑ පළාත් සභාව අහෝසි කර ගන්න. මටත් ඕනෑ පළාත් සභාව අහෝසි කර ගන්න. අය වැයට විරුද්ධව ඡන්දය දුන්නොත් පළාත් සභාව අහෝසි වෙයිද? එහෙම වෙනවා නම්, මමත් ඔබතුමාත් එක්ක ඡන්දය දෙනවා. මම පළාත් සභා ක්‍රමයට විරුද්ධයි. මා ඉගෙන තියෙන ව්‍යවස්ථා නීතිය අනුව නම් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දයක් ලැබුණොත් තමයි පළාත් සභා ක්‍රමය අහෝසි කරන්න පුළුවන් වන්නේ. මේ අය වැයට මා විරුද්ධ නැහැ. මේ අය වැයට මා පක්ෂයි. මේ අයවැයට විරුද්ධ වීමයි - පළාත් සභාවලට විරුද්ධ නම් අපි පාර්ලිමේන්තුවට පනතක් ගෙනෙමු. තමුනනාන්සේලාගේ මන්ත්‍රීවරු ඉන්නවා. ගේන්න පුළුවන් පනතක්. ඒ පනතට දෙන ඡන්දය අනුව තමයි -

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගේන්න කෝ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

(බාධා කිරීමක්) අපි ගේනවා තමයි.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

අන්න හරි.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

අනිවාර්යයෙන් ගේනවා. ඔබතුමා නම් මේවා දන්නවාද දන්නේ නැහැ. බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත් වීමට මහ පොළොවේ ඉපදීමට කලින් පස් මහ බැලුම් බැලුවා. උන් වහන්සේට ඕනෑ අවස්ථාවක මේ මහ පොළොවේ පහළ වෙන්නට අවස්ථාව තිබුණා. පස් මහ බැලුම් බලලයි ආවේ. මොකද? කරන වැඩේ හරියට කරන්න ඕනෑ නිසා. පළමුවැනි බැලුම තමයි කාලය. අයං කාලෝ කියලා කිව්ව දවසට අපි ඒක ගේනවා. මෙයයි කාලය කියලා පෙනෙන දවසට අපි ඒක ගේනවා. ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉවසීමෙන් බලා ගෙන ඉන්න. ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තමයි තියෙන්නේ. තව විනාඩි යයි.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

පළාත් සභා අහෝසි කරන තුරු මේක නඩත්තු කරන්න- (බාධා කිරීමක්)

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මිනීමරුවන් මේවා දන්නේ නැහැ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, පළාත් සභා අහෝසි කිරීම එතුමාගේයි මගේයි සිහිනයක් තියෙනවයි කියමු. ආසාවක් තියෙනවයි කියමු. මේක අහෝසි කරන දවස වන තුරු පළාත් සභාව නඩත්තු විය යුතුයි. පළාත් සභාව නඩත්තු කරන්න අය වැය සම්මත කළේ නැත්නම් අන්න පළාත් සභාව සුදු අලියෙක් බවට පත් වෙනවා. පළාත් සභාව තියෙනවා. මන්ත්‍රීවරු ඉන්නවා. නිලධාරීන් ඉන්නවා. වැඩ කර ගෙන යන්න සල්ලි නැති වෙනවා. පළාත් සභාව තියෙන තාක් එයින් උපරිම ප්‍රයෝජනය ගන්න ඕනෑ. මොකද, මේ යාන්ත්‍රණය නීතියේ තියෙනවා. ක්‍රියාත්මක වෙනවා. ඒකට අපි නිසි ලෙස අරමුදල් ලබා දුන්නේ නැත්නම් - මට මහේෂ් අල්මේදා මගේ හිතවත් ගරු මන්ත්‍රීතුමා පැත්තටත් එන්න තියෙනවා. ඒ නිසා අපි පළාත් සභාව තියෙන තුරා පිළිගත හැකි අයවැයක් එන හැමදාමත් ඒ අය වැයට අත උස්සනවා. අය වැයට අත ඉස්සීමයි, පළාත් සභාවට විරුද්ධ වීමයි දෙකක් මිස එකක් නොවෙයි.

දැන් ගරු සභාපතිතුමනි, මට පුංචි සැකයක් ඇති වුණා. මම මේ ඉන්නේ ආණ්ඩු පක්ෂ කණ්ඩායම් රැස්වීමේ දෝ කියලා. මගේ හිත මිත්‍ර මහේෂ් අල්මේදා මන්ත්‍රීතුමාගේ කථාව වඩාත් ගැලපෙන්නේ කණ්ඩායම් රැස්වීමට කියලයි මට හිතුනේ. ගරු සභාපතිතුමනි, එතුමා මතු කළා, මගේ කියන දේ සහ කරන දේ අතර පරස්පරයක් තියෙනවාය කියලා. ගරු සභාපතිතුමනි, මේ කාරණය මත තමයි මට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ආවේ. එදා ආණ්ඩු පක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන් මා වෙනුවෙන් ඇවිත් ඡන්දය දුන්නා. හැබැයි, එකම එක මන්ත්‍රීවරයෙක් ආවේ නැහැ. ඒ තමයි මහේෂ් අල්මේදා මන්ත්‍රීතුමා. එතුමා එදා ආවා නම්, එදා එතුමා මේ විවාදය අහගෙන හිටියා නම්, එතුමාට මේ පරස්පරය තේරෙනවා.

ගරු සභාපතිතුමනි, මෙතුමා මතු කළා මම පළාත් සභාවට විරුද්ධ නම් ඇයි ප්‍රඥප්ති දෙකක් ගෙනාවේ කියලා. මම පළාත් සභාවට විරුද්ධයි කියලා පළාත් සභාව නතර වන්නේ නැහැ. මම අද පළාත් අමාත්‍ය ධූරයක් දරනවා. මේ පළාත් සභාව පවතින කල්, මේ අමාත්‍ය ධූරය ඵලදායක වන්න නම්, සේවයක් වෙන්න නම් මේ පවතින පද්ධතිය සඳහා උපරිම සේවය ලබා ගැනීමට මම කැප වෙලා වැඩ කරනවා. එහෙම නැත්නම් මම මේ අමාත්‍ය ධූරයෙන් - අන්න ඒක මම කරන්න ලැහැස්ති නැත්නම්, මේතුමා කියන ආකාරයට මම ප්‍රඥප්ති ගෙනාවේ නැත්නම්. මට වෙන් වන මුදලින් වැඩ කරන්නේ නැත්නම්. මට මතු වෙන ප්‍රශ්න විසඳන්නේ නැත්නම්. අන්න මම ඇමති ධූරයෙන් අනිවාර්යයෙන්ම ඉවත් විය යුතුයි. දැන් මෙතුමන්ලා විධායක ජනාධිපති ධූරය අහෝසි

කරන්න කථා කරනවා. සමානුපාතික ඡන්ද ක්‍රමය අහෝසි කරන්න කථා කරනවා. තවත් සමහරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගෙදර යවන්න පක්ෂය ඇතුලේ ඉඳන් කථා කරනවා. ගරු සභාපතිතුමනි, අභ්‍යන්තර පරස්පරය සෑම තැනකම තියෙනවා. මට මේවා කියලා දෙන්න පුළුවන්. ඒවා තේරුම් ගන්න මොළයක් දෙන්න නම් මට හැකියාවක් නැහැ.

ගරු සභාපතිතුමනි, මට අමතක වුණා, මා මේ පාච්චිච් කර කර ඉන්නේ අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමියගේ කාලයයි කියලා. ඒ නිසා අවසාන වශයෙන් මා සඳහන් කරන්න කැමතියි. මගේ හිත මිත්‍ර නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා සභාවේ නැහැ. එතුමා හිටියා නම්, ගොඩාක් කැමතියි. එතුමා ගැන අපූරු කථාවක් මට කියන්න තියෙනවා. ඒ නිසා කෘෂිකර්ම විවාදය දවසට එතුමන් සභාවට පැමිණේවායි කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ඔබ සැමට තෙරුවන් සරණයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේ අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වුයෙන් අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Asoka Lankathilaka M.P.C took the Chair*

[ අ.භා. 03.56 ]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ස්තුතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා අයවැය පොදු සාකච්ඡාවේ කථා රාශියකට සවන් දී ගෙන හිටියා. අපේ උගත් ගම්මන්පිල ඇමතිතුමාත් අදහස් ප්‍රකාශ කරනු ලැබුවා. එක එක්කෙනාගේ අදහස්වලට ප්‍රති අදහස් දක්වන්නට කලින් අයවැය සම්බන්ධයෙන් කරුණු කිහිපයක් කථා කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා පළමු කොටම නිරීක්ෂණය කරලා තියෙනවා. එම අයවැය ඉදිරිපත් කිරීමේදී මේ ප්‍රාග්ධන වියදම අපි පසුගිය වසරේ රුපියල් දස ලක්ෂ 5203 ක් වශයෙන් වියදම් කරන කොට, මෙම වසරේ 5119 කට අඩුවීමක් පෙන්නුම් කරනවා. පුනරාවර්තන වියදම වැඩි වෙන කොට ප්‍රාග්ධන වියදම් අඩු වෙනවාය කියන්නේ, ආර්ථිකය සම්බන්ධ පුංචි හරි දැනීමක් තියෙන කෙනෙක් දන්නවා. ඒ ආර්ථිකයේ යම් කඩා වැටීමක් තියෙනවයි කියලා. එලෙස යම්කිසි කඩා වැටීම් තත්ත්වයකදී තමයි ප්‍රාග්ධන වියදම් අඩු වෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ අයවැය දිහා බැලුවාම ගම්මන්පිල ඇමතිතුමා කිව්වා, බදු වැඩ කරපු නැති නිසා තමයි ආදායම් අඩු වුණේ කියලා. මේ ආදායම කියන එක බදුවලට පමණක් සීමා වන්නේ නැහැ. ඕනෑම රජයක ආදායම බදුවලට පමණක් සීමා වන්නේ නැහැ. බදු කියන්නේ, එක්තරා ආදායම් ප්‍රභවයක් පමණයි. ඒ එක්කම මූලාසනාරූඪ මන්ත්‍රීතුමියනි, අපි විපක්ෂය හැටියට මේ අයවැය ගැන විවේචන ඉදිරිපත් කරන ගමන්, අපේ ආදායම් වැඩි කර ගන්න ක්‍රම ගැනත් සාකච්ඡා කරන්න ඕනෑ. අපේ මහ ඇමතිතුමාගේ විෂයයක් තමයි විදුලි බලය. මේ විදුලි බලය ගැන කථා කළොත් අද සමස්තයක් හැටියට පායන කාලයට විදුලිය නැතුව පැය තුනක් හතරක් විදුලිය කපනවා. වැස්ස කාලෙට විදුලිය දෙනවා. ආපහු නැතුව ගියාම ජෙනරේටර් මගින් දෙන්න අධික වියදමක් යනවා කියලා විදුලි බිල වැඩි කරනවා. මම අද කථා කරන්නේ, 1994 න් පසුව අවුරුදු 18 ක් මේ රටේ පාලනය ගෙන ගිය රජයකට සම්බන්ධ මේ ප්‍රධාන පළාත් සභාවක අයවැය සම්බන්ධයෙන්. අයවැය සම්බන්ධයෙන් කථා කරන කොට අදටත් අපි සමත් වෙලා නැහැ, මනුෂ්‍යයාට එදිනෙදා පරිභෝජනයට අවශ්‍ය කරන විදුලිය කඩවීමකින් තොරව නිරන්තරයෙන් සපයන්න. අපි විදුලිය අඛණ්ඩව දෙන්න අසමත් වෙලයි ඉන්නේ. එහෙම නම් අපි කොහොමද අපේ පළාත් සභාවේ ආදායම වැඩි කර ගන්නේ. ඒ එක්කම ජනතාවගේ අවශ්‍යතාවයන් සපුරා ගන්නත් කටයුතු කරන්නේ කොහොමද? අපි දන්නවා නොරොච්චෝලේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වුණා. නමුත් සාර්ථක ප්‍රතිඵල අපට අත් වුණේ නැහැ.එය පළාත් සභාවෙන් නොවෙයි. මධ්‍යම ආණ්ඩුවෙන් ක්‍රියාත්මක කළා වුණාට, විදුලි බල විෂය අපට අයිති විෂයක් හැටියට ඊට සම්බන්ධකම් ඇතුව කථා කරන්න සිද්ධ වෙනවා. අපි දන්නවා. අපට යම් කිසි හැකියාවක් තියෙනවා නම් - මම ඇහුම්කන් දුන්නා, කසළ මගින් විදුලිය නිපදවීම ගැන කථා කරමින් යනවා. නමුත් වියදම් අධික තත්ත්වයක් තියෙන බවට කියැවුණා. කෙසේ නමුත්, මෙවැනි නිෂ්පාදනයක් අපට කරගන්න පුළුවන් නම් අපේ මහ ඇමතිතුමා සහ අනෙකුත් ඇමති මණ්ඩලය අපේ තියෙන දැනුම, ශක්තිය අපට තියෙන සම්පත් ප්‍රයෝජනයට අරගෙන එවැනි ව්‍යාපෘතියක් කරලා අපේ එදිනෙදා කර්මාන්ත භාණ්ඩ හා සේවා සපයන සෑම ආයතනයකටම විදුලිය නොකඩවා දෙන්න පුළුවන් නම් එය අත්‍යවශ්‍ය සාධකයක් හැටියට වැඩි මිලක් ගෙවලා හරි ඒ විදුලිය ලබා ගන්න ජනතාව පෙළඹෙනවා. එවැනි ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් අපේ කිසිම අවධානයක් යොමු වෙලා නැහැ.

ඒ එක්කම බැලුවොත් පානීය ජල ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ප්‍රශ්න තියෙනවා. පානීය ජලය ගුණාත්මක විධියට ලැබෙන තත්ත්වයක් - අඩු ගානේ මම ඉන්න කොට්ඨාශයේවත් කිරිදිගොඩ සහ කිඹුලපිටිය ප්‍රදේශවලට පැවිල්ල ඇති වුණු ගමන් වතුර නැතිව යනවා. බව්සර වලින් වතුර දෙනවා. පසුගිය වසරේත් අපි වතුර දුන්නා. මෙවැනි තත්ත්වයන් තියෙන කොට අපේ ගුණාත්මක ජල සැපයුමක් නොකඩවා තියෙනවා නම් යම් කිසි මිලක් වැඩියෙන් ගෙවලා හරි ජනතාව ඒවා ලබා ගන්න සූදානම්.

[ ගරු රෝස් ප්‍රනාන්දු ]

මෙවැනි මාර්ගවලින් මේ පළාත් සභාවේ ආදායම් වැඩි කර ගැනීමේ හැකියාව තියෙනවා.

ඊට අමතරව තියෙනවා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ගැන. දැන් අවුරුදු 18 ක් තිස්සේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුව සාකච්ඡා කරනවා. නමුත් ඊයේ පෙරේදාත් මගේ කොට්ඨාශයේම එළිමහනේ කුණු ගොඩවල් රාශියක් ගැන ජනමාධ්‍ය මගින් පවා පෙන්නුවාට පස්සේ ඒ කුණු ටික අරගෙන ගිහිල්ලා කටාන ප්‍රාදේශීය සභාවේ උප සභාපතිතුමා පන්සල් වත්තක වළ දමා තිබෙනවා. මේ වාගේ තත්ත්වයක් හමුවේ මම පෙන්වා දෙන්නේ, ආදායම් උපයන්න පුළුවන් ප්‍රභවයන් රාශියක් තියෙනවා. මේ කුණු ඉවත් කිරීම ක්‍රමානුකූලව කරනවා නම්, ප්‍රතිචක්‍රීයකරණ වැඩසටහන ක්‍රමාණුකූලව කරනවා නම් ජනතාව ඒවට මුදලක් ගෙවන්න ඇලි මැලි කමක් දක්වන්නේ නැහැ. එය පළාත් සභාවේ ආදායමක් බවට පත් කර ගැනීමට හොඳටම හැකියාව තිබෙනවා. අපි දන්නවා රඹුටන් ලෙල්ලක් විසි කරලා තිබුණොත්, තැඹිලි කෝම්බයක් විසි කරලා තිබුණොත් උසාවියට ගිහිල්ලා මහජනතාවට දඩ ගහනවා. නමුත් ප්‍රාදේශීය සභාවලින්, නගර සභාවලින් කුණු කඳු ගහලා මදුරුවෝ බෝවෙනවා. එම අපද්‍රව්‍ය ජලාශවලට එක්කාසු වෙනවා. විධිමත් ප්‍රතිචක්‍රීයකරණ වැඩසටහනක් නැතුව. මේ ගැන සොයා බලන්න කවුරුවත් ඉදිරිපත් වන්නේ නැහැ. බැරිම වෙලාවක මනුෂ්‍යයෝ උද්ඝෝෂණය කරන තත්ත්වයට ආවොත් පමණක් කවුරු හරි ගිහිල්ලා පොඩි විසඳුමක් දෙනවා. ඒ නිසා එවැනි තත්ත්වයන් ගැන ඔබතුමිය හරහා ගරු අමාත්‍ය මණ්ඩලයේත් සියලු නිලධාරී මහත්වරුන්ගේත් අවධානය යොමු කර සිටිනවා.

ඒ එක්කම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සේවා වියුක්තිය කියන ප්‍රශ්නය මේ සභාවේ අපි කථා කරන කොට විවිධ සංඛ්‍යාලේඛණ අරගෙන අවුරුදු 18 ක් 35 ත් අතර වයස් කාණ්ඩ දක්වා විවිධ අර්ථකථන ඉදිරිපත් කළාට, අද අපි දන්නවා බස්නාහිර පළාත් සභාවේ මීගමුව කොට්ඨාශයේ පමණක් රැකී රක්ෂාවන් නැතිව බෝට්ටු මගින් ශීතරකරණ අස්සේ හැංගිලා, එහෙම නැත්නම් බැරල් අස්සේ හැංගිලා, සමහර නැව් වල-

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමියට තව විනාඩියක් පමණයි තිබෙන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

යාන්ත්‍රික කොටස්වල හැංගිලා විදේශගත වෙන්න උත්සාහ කරලා දැනට විශාල සංඛ්‍යාවක් බන්ධනාගාරගත වෙලා ඉන්නවා. රැකියා වියුක්තියක් මේ රටේ නැත්නම් මෙවැනි ජනතාවක් මේ විදියට රක්ෂාවල් හොයන්න ගිහිල්ලා හිර ගෙවල්වල නතර වන්නේ නැහැ. මෙම කාරණා සම්බන්ධයෙනුත් වැඩ පිළිවෙළක් මම යෝජනා කරනවා. සාමාන්‍ය පෙළ, උසස් පෙළ අධ්‍යාපනය අවසන් කරලා විශ්ව විද්‍යාලයට යන්න වරම් ලබන්නේ නැති සිසු පිරිසක් හැමදාම පාසලෙන් සමු ගන්නවා. අපේ අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළක් තියෙන්න ඕනෑ. වෘත්තීය පුහුණු අංශයකට පාසලෙන් අයින්වන දරුවන් බඳවා ගෙන යම්කිසි මුදලක් ඔවුන්ගේ දෙමව්පියන්ගෙන් අය කරන්න පුළුවන්. එය පළාත් සභාවේ ආදායමක් බවට පරිවර්ථනය කර ගන්න පුළුවන්. රාජ්‍ය අංශවලට සහ පෞද්ගලික අංශවලට හොඳට නිර්මාණය කළ වෘත්තිකයෙක් අපට පළාත් සභාවෙන් භාර දෙන්න පුළුවන්. මෙවැනි ක්‍රමවේද ගැන මේ අමාත්‍යතුමන්ලාගේ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපට තියෙනවා, පළාතේ නිවාස නැති ප්‍රශ්නය. රජයේ ඉඩම් රාශියක් තියෙනවා. සමහර දේශපාලන බලය උපයෝගී කර ගෙන මේ ඉඩම් බලහත්කාරයෙන් භුක්ති විඳිනවා. මම ඉතාම ගෞරවයෙන් ඉදිරිපත් කරනවා. මධ්‍යම ආණ්ඩුවේ අවසරය ඇතිව නිවාස හදලා කොටස් වශයෙන් ගෙවීමේ ක්‍රමයට මේවා ලබා දීලා එය ආදායමක් බවට පරිවර්තනය කර ගන්න උත්සාහ කරන්න කියලා. මම මේ ඇමතිතුමන්ලා කියපු දේවල් රාශියකට පිළිතුරු දෙන්න තියෙනවා. නමුත් වෙලාව නැති නිසා මා නිහඬ වෙනවා. ස්තුතියි.

[ අ.භා. 04.05 ]

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අද පොදු කටයුතු සම්බන්ධව කථා කිරීමට මට මේ වෙලාව ලබා දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. අද පළාත් සභාව අවශ්‍යයි, එපාය කියන තරමට මේ සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා විවිධ අයුරින් පළාත් සභාව විවේචනය කළා. වැරදි පෙන්නුවා. ඒ වාගේම ඔවුන්ගේ අදහස් උදහස් මේ ගරු සභාවේ කථා කළා. නමුත් ඒ කථා කරන සියල්ල මමත් අහගෙන හිටියා. ඒකෙදි සමහර මන්ත්‍රීවරුන්ට විපක්ෂය, ආණ්ඩු පක්ෂය කියලා විපක්ෂයේ කාර්ය භාරය එයාලගේ හොඳටම ඉෂ්ට කරනවා. නමුත් මෑත කාලයේ සිට පළාත් සභාව නියෝජනය කරන මම ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන අතර, ඒ තුළින් අපේ ප්‍රදේශයේ ජනතාවට ලබා දුන් ප්‍රතිඵලය ගැනත් මේ ගරු සභාවට පැහැදිලි කරන්න ඕනෑ. 2004 දී පළාත් සභාවට පත් වෙලා අවුරුදු දෙකක් විතර යන කොට මට කැලණිය ආසනයේ, වෙලේගොඩ ප්‍රදේශයේ වැසිකිළි නැතිව පාසලක් තිබුණා. නමුත් 1988 ඉඳලා වැසිකිළි නැතුව කැලණිය ආසනයේ පාසලක් පවත්වා ගෙන ගිහින් තියෙනවා. 2006 වන විට ඒ පාසලට වැසිකිළියක් හදන්න මගේ ප්‍රතිපාදන ලබා දුන්නා. ඒ වාගේම 2007 වසර වන විට බියගම ආසනයේ අවුරුදු 10 ක් තිස්සේ පොදු ජනතාව ඉඩමක් ලබා දීලා පාසලක් අරම්භ කිරීමට සූදානම් වුණා. අවුරුදු 10 ක් තිස්සේ ආරම්භ කිරීමට නොහැකිව තිබූ එක මා හමු වෙලා පාසලක් ආරම්භ කරන්න ඕනෑය කිව්වා. මටත් හැකියාවක් ලැබුණා, බියගම උලහිටිවල ප්‍රදේශයට අලුතෙන්ම ප්‍රාථමික පාසලක් ලබා දෙන්න. ඒ වාගේම එකින් එක කියන්න ගියොත් මේ පළාත් සභාවලින් මහජනතාවට තියෙන ප්‍රයෝජනය අති විශාලයි. ඉතා සමීපව ඔවුන්ට මුණගැහෙන්න හැකියාව පවා මේ පළාත් සභා තුළ

තියෙනවා. නමුත් මධ්‍යම රජයේ ඇමතිවරුන් හරි මන්ත්‍රීවරුන් හරි හම්බ වෙන්න අපට හරි අමාරුයි. ඒ අයව මුණ ගැහෙන්න කාලවේලාවක් නැහැ. නමුත් පළාත් සභාවේ මහ ඇමතිවරයා හා ඇමතිවරු ඉන්නවා නම් එයාලාට හැකියාවක් තියෙනවා. එතුමන්ලාව මුණ ගැහිලා එයාලාගේ අඩුපාඩු හදා ගන්න. ඒ වාගේම තමයි 2009 වසරේ ගරු ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමාගේ වැඩ පිළිවෙළින් ගම්පහ දිස්ත්‍රික්කයේ ඒ වාගේම බස්නාහිර පළාතේ කළුතර, කොළඹ, ගම්පහ අතර තුළ එතුමා සමග අපේ ප්‍රශ්න කථා කරලා විසඳා ගෙන තියෙනවා. ඒ වාගේම තමයි අපේ ගරු ගම්මන්පිල ඇමතිතුමාත්. කොඩිකාර ඇමතිතුමාත්. මගේ හිතේ තියෙනවා ගම්මන්පිල ඇමතිතුමා දවසක් කථා කළා අබාය ගැන. එතුමා හරියට පැහැදිලි කළා. අබාය දාන්නේ මුස්ලිම් අය විතරක් නොවෙයි. එක දවසක් එතුමා කිව්වා, ගින්දරෙන් පිච්චුනු කාන්තාවක් මුහුණ වහලා ඒ ගමන යනවා කියන වචනය කියන කොට ඒක මට කවදාවත් අමතක වෙන්නේ නැහැ. එතුමා කියන්න ඕනෑ දේ හරියට පැහැදිලි කළා. ඒ වාගේම තමයි ගම්මන්පිල ඇමතිතුමාගේ වැඩ පිළිවෙළ සාර්ථක ලෙස පක්ෂ භේදයෙන් තොරව එතුමා අපට අවස්ථාව ලබා දෙනවා. ඒ වාගේම තමයි කොඩිකාර ඇමතිතුමා. අපට නෝම්බි උත්සවයට බස්නාහිර පළාතේ මුස්ලිම් පල්ලිවලට රට ඉඳි ලබා දෙන්න අවශ්‍ය කටයුතු කළා. එතුමාටත් ස්තුතිය පළ කරනවා. ඒ වාගේම අපේ ලාන්සා ඇමතිතුමාත් අඩුපාඩු සහිත පාරවල් සම්බන්ධව කථා කරලා අපට හැකියාවක් ලැබුණා ඒවා හදා ගන්න. මීගමුව ආසනයට ලැබුණු ඇමතිවරයෙක්. ඒ වාගේම අපි සන්තෝෂ වෙනවා. එතුමාගේ වැඩ පිළිවෙළ ගැන ස්තුති කරනවා.

ඒ වාගේම තමයි අපේ ජගත් අංගගේ ඇමතිතුමා අපේ මුස්ලිම් ජනතාවගේ මරණ සම්බන්ධව රෝහල්වල ඇති වෙන ප්‍රශ්නවලට විසඳුමක් ලබා දී තියෙනවා. විශේෂයෙන් උපදේශක කාරක සභාවලට කැඳවලා එතුමා රෝහල් කමිටුවක් පත් කරලා ඒකට අපේ නියෝජනය දාලා වෛද්‍යවරුන් සමග සම්බන්ධ කරලා ලෙහෙසියෙන් මිනිය ගන්න පුළුවන් විධියට එතුමා ඒ වැඩ පිළිවෙළ සකස් කරල තියෙනවා. මේ කාලය තුළ මේ රට තුළ ඇතිවන ජාතිවාදී ප්‍රශ්නවලට - අපේ නායකත්වය දරන මහින්ද රාජපක්ෂ මැතිතුමාට ස්තුති කරන්න ඕනෑ. ඇති වන ප්‍රශ්න දුර දිග ගෙනියන්නේ නැතුව එතුමාට පුළුවන් විධියට ප්‍රශ්න විසඳලා දෙනවා. ඒ වාගේම තමයි මෑතකදී මම දැක්කා හලාල්වලට නියෝගය තහනම් කරන්න කියලා යම්කිසි කොටසක් කථා කළා. නමුත් මම කියන්න කැමතියි හලාල් අවශ්‍ය වෙන්නේ මුස්ලිම් සහෝදරයින්ට විතරයි. එතුමන්ලාට දෙවියන් වහන්සේගේ වරප්‍රසාදයෙන් තමයි හලාල් certificate එක ලබා ගන්නේ. ඒකෙදි මුස්ලිම් ජනතාවට විතරයි හලාල් අවශ්‍ය වන්නේ. නමුත් අනික් අයට විකුණන්නවත්, ලාභ ලබන්නවත් නොවෙයි හලාල් ක්‍රමය ඇති කරලා තියෙන්නේ. මේකෙදි අපි විදේශ රටකට ගියත්, කොහේ ගියත් හලාල් කෑම හොයනවා. හලාල් තිබුණොත් තමයි අපට කන්න පුළුවන්කම තියෙන්නේ. නැත්නම් අපට කන්න බැහැ. ඒ වාගේම බහුතර ජනතාව හලාල් කෑම කන්න කැමැත්තක් තියෙන්නේ, එහිදී දෙවියන් වහන්සේගේ වරප්‍රසාද අනුව තමයි ඒ කටයුතු කරන්නේ. ඒකෙන් ලාභ ලබන්නවත්, කිසි දෙයක් නැහැ කියමින් අපි ඉදිරි කාලය තුළ අපේ මහ ඇමතිතුමා ඇතුළු අමාත්‍ය අපේ මණ්ඩලයට ශක්තිමත්ව පළාත් සභාවේ වැඩ කටයුතු කරන්න හැකි වේවා කියමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. එතුමා සභා ගර්භයේ නොමැති නිසා කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා. ඔබතුමාට විනාඩි 10 ක් තියෙනවා.

[ අ.භා. 04.11 ]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

මූලාසනාරූඪ ගරු මන්ත්‍රිතුමියනි, අද දිනයේ 25 වැනි පළාත් සභා අයවැය ලේඛන අවස්ථාවේ අපට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව අපි ඉතාමත්ම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම පළාත් සභා ක්‍රමය තවදුරටත් පවත්වා ගෙන යා යුතුද නැද්ද කියන එක පිළිබඳව සංවාදයක් තියෙන අවස්ථාවක මෙම පළාත් සභා ක්‍රමය ශක්තිමත්ව පවත්වා ගෙන යන්න පුළුවන් වන ආකාරයේ අය වැය ලේඛනයක් අපේ මහ ඇමතිතුමා ඉදිරිපත් කරලා තියෙනවා කියන එක ගැන අපි විශේෂයෙන්ම සතුටු වෙන්න ඕනෑ. මොකද, මේ අයවැය ලේඛනය තුළින් ඉදිරි වර්ෂය තුළ දී මෙම බස්නාහිර පළාත් සභා ප්‍රදේශය තුළ සංවර්ධන කටයුතු ඉදිරියට ගෙන යමින් මෙම පළාත් සභා ක්‍රමය තුළින් රටේ සංවර්ධනය ඉදිරියට ගෙන යන්න විශාල උත්සාහයක් ගන්න අවස්ථාවක් හැටියට විශේෂයෙන්ම සළකන්න ඕනෑ.

ඒ වාගේම මධ්‍යම රජයේ අය වැය ලේඛනය තුළිනුත් අතිගරු ජනාධිපතිතුමාත් අපේ පළාත් සභාවලට යම් යම් ප්‍රතිපාදන ලබා දෙන්න කටයුතු කිරීම තුළින් අපට පේනවා, මෙම 13 වැනි සංශෝධනය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තියේ කිසිදු වෙනසක් නැති බව. විශේෂයෙන් පළාත් සභා ක්‍රමය පිළිබඳව එවැනි අවිනිශ්චිත තත්ත්වයක් පවතින්නේ නැතෙයි කියන විශ්වාසය අප තුළ පවතිනවාය කියන එක විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. මොකද? මෙම පළාත් සභා ක්‍රමය, මේ රටේ දීර්ඝ කාලයක් තිස්සේ පැවතුණා. ජාතික ප්‍රශ්නයකට විසඳුමක් හැටියට තමයි මේ බලය බෙදීමේ ක්‍රමය ආරම්භ කරලා තියෙන්නේ කියන එකයි අපේ විශ්වාසය වන්නේ. අද පළාත් සභා ක්‍රමය අංග සම්පූර්ණ විධියට ඉදිරියට ගෙන යන්න, අවශ්‍ය ශක්තිය, අවශ්‍ය බලය පිළිබඳව කිසියම් ගැටළුවක් තිබුණත්, මෙම පළාත් සභා ක්‍රමය ජාතික ගැටළුවට කිසියම් විසඳුමකට හොඳ වාතාවරණයක් සැලසෙන අවස්ථාවක් හැටියට අපි විශ්වාස කරනවා.
[ ගරු කීර්ති කාරියවසම් ]

විශේෂයෙන්ම පළාත් සභාව පවත්වා ගෙන යන්න අපි මන්ත්‍රීවරුන් හැටියට දිවුරුම් දෙන අවස්ථාවේම ව්‍යවස්ථාවට අනුව කටයුතු කරන්න පොරොන්දු වෙලා තියෙනවා. ඒ අනුව ඒ සඳහා ප්‍රතිඥා දීලා කටයුතු කරන උදවිය හැටියට අපි සියලු දෙනා ඒ ව්‍යවස්ථාවට අනුව කටයුතු කරමින් අපි විශ්වාස කරනවා පළාත් සභාව ආරක්ෂා කර ගනිමින් කටයුතු කරයි කියලා. විශේෂයෙන් පළාත් සභාව ආරක්ෂා කර ගැනීමේ වගකීම අප කාටත් පැවරෙනවාය කියන එක අපි විශේෂයෙන්ම කල්පනා කරනවා. අද මෙම පළාත් සභා ක්‍රමය පිළිබඳව මෙවැනි සංවාදයකට යන්න හේතුවෙන්න අපි විශ්වාස කරනවා, මෙම දිවිනැගුම පිළිබඳව දෙපාර්තමේන්තුවක් ඇති කරන්න ආරම්භ කරපු පනත මේ සඳහා හේතු කාරණා වෙන්න ඇති කියලා. දිවිනැගුම පනත හරහා බලය කේන්ද්‍රීය කිරීම පිළිබඳව පළාත් සභාවට අයිති ග්‍රාම සංවර්ධනය වැනි කටයුතු සම්බන්ධයෙන් කිසියම් බලපෑමක් ඇති කරන්න ආපු අවස්ථාවේ සුප්‍රීම් උසාවිය, ශ්‍රේෂ්ඨාධිකරණය ඒක නිවැරදි කරලා කටයුතු කරන්න ඉදිරිපත් වීම නිසි මගපෙන්වීමක් කරලා තියෙනවාය කියන එකත් අපි විශ්වාස කරනවා. එම නිසි මග පෙන්වීම අද පිළිගන්නේ නැත්නම් අපට විශ්වාස කරන්න වෙනවා මේ රට තුළ ව්‍යවස්ථාව පිළිබඳවත්, ඒ වාගේම රටේ පාර්ලිමේන්තුව, අධිකරණය පිළිබඳවත් කිසියම් ගැටලුවකට ජනතාවට මුහුණ දෙන්න සිදුවෙනවාය කියලා, ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන්.

ප්‍රජාන්ත්‍රවාදය වෙනුවෙන් පෙනී සිටින උදවිය හැටියට, ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන උදවිය හැටියට මේ බල අධිකාරීන් තුළ ඒ බලය සඳහා ගැටුමකට යන්නේ නැතුව පවත්වා ගෙන යාම අද අපට අවශ්‍ය වෙනවාය කියන එක, අපි විශ්වාස කරනවා කියන එක විශේෂයෙන්ම සඳහන් කරන්න වෙනවා. එහෙම නැතුව මේ පිළිබඳව අනවශ්‍ය ප්‍රශ්නයකට ගියොත් රටේ ජනතාව තුළ අද අධිකරණය පිළිබඳව අවිශ්වාසයක් ඇති වෙනවා. ඒක රටට ගැළපෙන්නේ නැහැයි කියන කාරණාව විශේෂයෙන්ම මේ අවස්ථාවේදී සඳහන් කිරීම අපේ වගකීම හැටියට අපි විශ්වාස කරනවා. අපේ පළාත් සභා ක්‍රමය තුළින් අපි ඉතාමත්ම සතුටු වෙනවා. අපේ ප්‍රධාන අමාත්‍යතුමා මෙවර ආදායම් වැඩි කර ගන්න යෝජනා ඉදිරිපත් කරලා තියෙනවා. මෙතැන්දි අපට තවදුරටත් සඳහන් කරන්න වෙනවා, රාජ්‍ය බදු ප්‍රතිපත්තියේම කිසියම් වෙනසක් ඇති වෙන්න ඕනෑය කියන එක තමයි අපි කල්පනා කරන්නේ. විශේෂයෙන්ම අපේ රටේ ආදායම් බද්ද හැටියට පවතින්නේ 24% ක වැනි ප්‍රමාණයක්. 35% කට තිබුණු ආදායම් බද්ද තවත් 10% කින් අඩු කරලා 24% කට පහළ දමලා අද තියෙන්නේ. නමුත් එංගලන්තය වැනි රටක් ගත්තත්, 27% ක වැනි ආදායම් බද්දක් තමයි අය කරන්නේ. ප්‍රංශයේ ඊයේ පෙරේදා පත් වුණු ආණ්ඩුව 37% කට තිබුණු බද්ද 64% දක්වා වැඩි කරන්න කටයුතු කරලා තියෙනවා. අපේ අසල්වැසි රටවල් දිහා බැලුවත් එම ආදායම් බද්දේ අපට වැඩි ඉහළ ප්‍රතිශතයක් තමයි තියෙන්නේ. ඒ නිසා අපි විශ්වාස කරනවා. මේ රාජ්‍ය බදු ප්‍රතිපත්තියේ වෙනසක් ඇති කළොත් බස්නාහිර පළාත් සභාව 40% ක් ජාතික ආදායමේ කොටස් කාරයෝ වී ඉන්න අපට එම බදු ප්‍රතිපත්තියේ වෙනසක් ඇති කළොත් අපේ ආදායම් මාර්ගය වැඩි කර ගන්න විශාල ගැටලුවක් වේවි කියලා අපි විශේෂයෙන්ම කල්පනා කරනවා.

ඒ වාගේම අපි ඉතාමත්ම සතුටු වෙන්න ඕනෑ, අධ්‍යාපන විෂය සම්බන්ධව අපේ ප්‍රධාන අමාත්‍යතුමා විශාල නායකත්වයක් දීලා අද අපේ පාසල් පද්ධතිය ශක්තිමත් කරන්න භෞතික වශයෙන් වාගේම මානව පැත්තෙන් විශාල ශක්තියක් ලබලා දීලා තියෙනවයි කියන එක සඳහන් කරන්න ඕනෑ. අපි නියෝජනය කරන දුෂ්කර ප්‍රදේශවල තිබුණු ප්‍රධානම ප්‍රශ්නයක් තමයි ගුරු හිගය. අද ගුරු විභාගයක් පවත්වලා, ගුරුවරුන් අලුතෙන් බඳවා ගෙන අපට අවශ්‍ය ගුරුවරුන් සපයලා ඒ ආකාරයට පාසල් ශක්තිමත් කරන්න කටයුතු කරලා තිබීම ගැනත් අපි විශේෂයෙන්ම සතුටු වෙන්න ඕනෑ. ඒ වාගේම භෞතික සම්පත් හැටියට පාසල්වලට සුපසන් නිම්කෙර වැඩසටහන යටතේ, අපේ පාසල අපේ දැනට වැඩ පිළිවෙළ යටතේ අද අපට මුදල් ලබා දීලා ඒ ලබා දෙන මුදලට තවත් ශක්තියක් ජනතාවගේ පැත්තෙන්, දෙමාපියන්ගේ පැත්තෙන් ලබා දීලා වඩාත් හොඳ සංවර්ධනයක් පාසල් තුළ ඇති කරන්න අවස්ථාව සැලසිලා තියෙනවයි කියන එක විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ.

අපේ පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් යමක් සඳහන් කිරීමට මෙය අවස්ථාවක් කර ගන්න බලාපොරොත්තු වෙනවා. 2013 වර්ෂය වෙනුවෙන් පළාත් පාලන ආයතන වෙනුවෙන් රුපියල් දස ලක්ෂ 8000 ක පමණ මුදලක් වෙන් කරන්න අද කටයුතු කරලා තියෙනවා. අද පළාත් සභා හරහා මෙවැනි මුදලක් ලැබෙනවා වාගේම, පළාත් පාලන ආයතනවලට රජයෙනුත් තවත් විශාල ප්‍රතිපාදන මුදලක් පළාත් සභාවේ ආදායමට අමතරව ලැබෙනවා. නමුත් අද මේ පළාත් පාලන ආයතන තුළ සභාපතිවරුන් හෝ වෙන්න පුළුවන්, වෙනත් අය වෙන්න පුළුවන්, ක්‍රියා කරන ආකාරය පිළිබඳව ජනතාව තුළ කළකිරීමක් ඇති වෙලා තියෙනවා. සමහර පළාත් පාලන ආයතන තුළ දූෂණ තත්ත්වයන් පවතිනවා. වංචාකාරී තත්ත්වයන්ට අනුව කටයුතු කරනවා. මම හිතනවා අපට පළාත් සභාව හැටියට ඒවා නිවැරදි කරන්න පුළුවන් කියලා. විශේෂයෙන් ඒවා අධීක්ෂණය කරන්න, ඒ අයට නිසි මග පෙන්වීමක් කරලා ඒ තත්ත්වයන් නිවැරදි කරන්න කටයුතු කරන්න ඉදිරිපත් විය යුතුයි කියන කාරණය විශේෂයෙන්ම සිහිපත් කරමින් මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**

Hon. Presiding Member

ගරු සභාපතිතුමා දැන් මූලාසනාරූඪ වෙනවා ඇත.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය [අශෝකා ලංකාතිලක මෙනෙවිය] මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Miss Asoka Lankathilaka] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට එම්.එම්.එම්. අම්ජාඩ් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 08 ක කාලයක් තිබෙනවා.

[ අ.භා. 04.21 ]

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ගරු සභාපතිතුමනි, පස්වැනි පළාත් සභාවේ 25 වන අයවැයේදී අදහස් ප්‍රකාශ කරන්න මට අවස්ථාව ලබා දීම පිළිබඳව මම විශේෂයෙන් ස්තූතිවන්ත වෙනවා. අපි දකිනවා, පළාත් සභා ව්‍යුහය තුළ පළාත් සභා අවුරුදු 25 ක ගමන් මාර්ගය තුළ අද පළාත් සභාවේ පැවැත්ම පිළිබඳ නොයෙක් වාද විවාදයන් විවිධ තර්කයන් ඉදිරිපත් වී ඇති මොහොතක මම හිතන්නේ පළාත් සභාවේ පැවැත්ම තුළ ජනතාව අවදියෙන් ඒ පිළිබඳ කථා කරන මොහොතක තමයි අද මේ පළාත් සභාවේ අයවැය විවාදය ගැන අපි කථා කරන්නේ. අපි මේ පළාත් සභාව ශක්තිමත් කරන සංවාදශිලී අයවැය විවාදයක් බවට මෙම සභාව පරිවර්තනය කර ගන්න ඕනෑ කියන එක තමයි මගේ පළමු ඉල්ලීම. ඒ නිසා පළාත් සභාවේ ශක්තිමත් භාවය, එහි පැවැත්ම පිළිබඳව වඩාත්ම ශක්තිමත් සංවාදශිලී අයවැය විවාදයක් බවට මෙය පරිවර්තනය කරගෙන මේ තුළින් ජනතාවට විශාල සහනයක් ලබන්නට, ජනතාවට විශාල සෙතක් සිද්ධ වන අයවැයක් බවට මෙය නිර්මාණය කර ගැනීමට අප සියලුම දෙනාගේම කාලීන අවශ්‍යතාවයක් කියන එක මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. අපි දකිනවා. බස්නාහිර පළාත් සභාව ගත්තා නම්, අද බස්නාහිර පළාත් සභාව මිලියන 06 ක ජනතාවක් ජීවත් වන ප්‍රදේශයක් වශයෙන්, ඒ වාගේම මේ පළාත් සභාව තුළ සමස්ත රාජ්‍ය සේවකයින්ගෙන් 25% ක් ආවරණය වන බස්නාහිර පළාත් සභාව තුළ රාජ්‍ය සේවකයින් 82,000 ක් තමන් රාජ්‍යය සේවය කරන, රැකවරණය ලබා දෙන මහඟු ස්ථානයක් වශයෙන් මේ බස්නාහිර පළාත් සභාව අපට හඳුන්වා දෙන්න පුළුවන්. එහෙම නම්, රාජ්‍ය සේවකයින් 82,000 කට රැකවරණය ලබා දෙන ඒ සඳහා අපේ අයවැයෙන් බිලියන 40 ක් අයවැය ලෙස අපේ මේ මූල්‍ය ප්‍රකාශය තුළ සඳහන් වන විට ඉන් 35% ක් බිලියන 17.5 ක් මිලියන 16,640 ක් මේ සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ලබා දීමට සිදු වන බව අපි තමුන්නාන්සේලා මතක තියා ගන්නට ඕනෑ. ඒ නිසා අද මේ පළාත් සභාව තුළ රාජ්‍ය සේවකයින් 82,000 කට රැකවරණය ලබා දෙනකොට ඒ වාගේම අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ගුරුවරුන් 32,000 කට රැකවරණය ලබා දෙනකොට ඒ වාගේම පසුගිය කාල වකවානුව තුළ අපේ මහ ඇමැතිතුමා ගුරුවරුන් 6000 ක් ඒ අවුරුදු 4 තුළ බඳවා ගැනීමේදී මම හිතන්නේ අවුරුදු 6 තුළ 4 තුළ 20% ක ගුරු සංඛ්‍යාවක් බඳවා ගැනීමේ ඒ කීර්තිමත් ගෞරවය අපේ බස්නාහිර පළාත් සභාවේ මහ ඇමැතිතුමාට හිමි වෙනවා කියන එක අපි මේ අවස්ථාවේදී පැහැදිලිව කියන්න ඕනෑ. අද බස්නාහිර පළාත් සභාවේ 32,000 කට ආසන්න ගුරු සංඛ්‍යාවක් ඉන්නවා. මේ 32,000 න් නවක ගුරුවරු 6000 ක් පසුගිය වකවානුව තුළ බඳවා ගැනීම තුළ අපට හැකියාවක් ලැබුණා. ශක්තියක් ලැබුණා. අපේ බස්නාහිර පළාත තුළ ජීවත් වන උපාධිධාරී මහත්ම මහත්මීන්ට ගුරු ක්ෂේත්‍රයට සම්ප්‍රේක්ෂ වෙන්නට අවස්ථාව ලබා දීම මම කියන්නේ විශාල ශක්තියක් වුණා. ඒ වාගේම අද අපි දකිනවා. රාජ්‍ය බදු ලබා දීමේදී රාජ්‍ය බදු ප්‍රදානය කිරීමේදී පළාත් සභාවට මධ්‍යම රජයේ බදුවලින් 33% ක් ලබා දෙනවා. 33% ක් පළාත් සභාවට බදු ප්‍රදානය කිරීමේදී අප පළාත් සභා 9 න් මම හිතන්නේ, 33% න් 48% ක් බස්නාහිර පළාත් සභාවට ලබා දීමෙන් ගම්‍ය වන්නේ, පළාත් සභා 9 න්ම වැදගත් එකම පළාත් සභාව මම හිතන්නේ, 40% ක වටිනාකමක් තියෙන අපේ බස්නාහිර පළාත් සභාවයි. ඒ අපට මේ අවස්ථාවේදී එලෙස කිරලා මැනලා බලන්න පුළුවන් කියන එක අපි තමුන්නාන්සේලා තේරුම් ගන්න ඕනෑ. ඒ නිසා සමස්ත මධ්‍යම රජයේ බදුවලින් 16% ක් පළාත් සභාවලට හම්බ වන කොට පසුගිය වසරට සාපේක්ෂව මේ වසරේ බිලියන 4 ක් ඒ කියන්නේ මිලියන 4000 ක වැඩිපුර බදු සංඛ්‍යාවක් ලබා ගැනීමට අපේක්ෂා කරන අයවැයක් වශයෙන් අපි මේ අයවැය පොත අධ්‍යයනය කරනකොට පෙනී ගිහිල්ලා තියෙනවා.

ඒ නිසා අද අපි දකිනවා. මේ බස්නාහිර පළාත් සභාව තුළ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විතරක් නොවෙයි. මාර්ග ක්ෂේත්‍රය තුළ විතරක් නොවෙයි. කර්මාන්ත ක්ෂේත්‍රය විතරක් නොවෙයි. සියලුම ක්ෂේත්‍රයන්හි සමබර සංවර්ධනයක් වෙන්නේ එවැනි සංවර්ධනයක් සිද්ධ වන පළාත් සභාවක් වශයෙන්. විශේෂයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය තුළ අධ්‍යාපන වැඩ සටහන් පිළිබඳව ලබා දීමේදී මම හිතන්නේ අපේ කලාප ව්‍යුහ කමිටු හරහා ඒ අදාළ ප්‍රදේශයන්ගේ පාසල් සංවර්ධනය කර ගැනීමට විශාල හයියක්, බලයක්, ශක්තියක් ඒ අදාළ ප්‍රදේශවල ජීවත් වන මන්ත්‍රීවරුන්ට ලබා දීලා තියෙනවා කියන එකට මේ අවස්ථාවේදී අපි අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ප්‍රණාමය පුද කරන්න ඕනෑ. ඒ වාගේම අපේ දහම් පාසල් වැඩ සටහන තියෙනවා. සරුදම් අරුණැල්ල වැඩ සටහන යටතේ මම හිතන්නේ, බස්නාහිර පළාත් සභාව නියෝජනය කරන බෞද්ධ, කතෝලික, මුස්ලිම්, හින්දු දහම් පාසල් 2604 කට එක් දහම් පාසලකට එක් ලක්ෂයක් බැගින් මිලියන 264 ක් ලබා දුන්නු එකම රාජ්‍ය ආයතනය බස්නාහිර පළාත් සභාව කියන එක ඉතිහාසගත වෙනවා කියලා අපි මේ අවස්ථාවේදී සන්තෝෂයෙන් මතක් කරන්න ඕනෑ. අද අපි දකිනවා, සමහර දේශපාලන පක්ෂවල නායකයින් තමන්ගේ

[ ගරු එම්.එම්.එම්. අම්ජාඩ් ]

ආසනයට ගිහිල්ලා දහම් පාසලට රුපියල් 50,000 ක් දෙනකොට පෝස්ටර් ව්‍යාපාර ගහලා, විශාල ප්‍රචාරයක් ලබා දෙනවා. එහෙම නම් මේ සභාවේ සියලු මන්ත්‍රීවරු හිතාගන්න ඕනෑ. දහම් පාසල් 2604 කට එක් දහම් පාසලකට රුපියල් ලක්ෂය ගණනේ දෙනවා නම්, මම හිතන්නේ අපේ උත්සව 2604 ක් තියන්න ඕනෑ. උත්සව 2604 ක් තියලා මහ ඇමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මේවා කරන්න පුළුවන්කම තියෙනවා. මම හිතන්නේ මේවාගේ අති විශාල දැවැන්ත ව්‍යාපෘතියක් බස්නාහිර පළාත් සභාවේ විතරක් නොවෙයි, මධ්‍යම රජයටත් බැරි ව්‍යාපෘතියක් කිරීමේ ගෞරවය මේ බස්නාහිර පළාතේ පළාත් සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ට හිමි වෙනවා කියන එක අපි සන්තෝෂයෙන් මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම අපි දැක්කා, පසුගිය වකවානුව තුළත් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විශාල පිබිදීමක් සිදු වෙලා තිබෙනවා. අද ගුරු ශිෂ්‍ය අනුපාතය 1 : 20 ක් දක්වා අඩු කරලා තියෙනවා. මම හිතන්නේ ඒක තමයි අපේ අධ්‍යාපනයේ දියුණුවේ සංකේතය. එක ගුරුවරයෙකුට ළමුන් 20 ක අනුපාතයකට ගෙන ඒම මම හිතන්නේ මනා ගුරු තුලනයක් ලබා දීලා අද ප්‍රාථමික අධ්‍යාපනය, ද්විතීයික අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය යන සියලුම අධ්‍යාපනයන් සඳහා විශාල කාර්ය භාරයක් ඉෂ්ට කරලා තියෙනවා.

ඒ වාගේම මහ මාර්ග ක්ෂේත්‍රයන් පිළිබඳව අද කථා කරන්නට මට අවස්ථාව තියෙනවා, ඒ වැය ශීර්ෂය යටතේ. ඒ වාගේ සියලු අමාත්‍යාංශවල විශාල ප්‍රබෝධයක් ලබා ගත්තද බස්නාහිර පළාත් සභාවේ මේ අයවැය අපේ බස්නාහිර පළාතේ ජයග්‍රහණය, බස්නාහිර පළාත් සභාවේ අභිවෘද්ධිය, බස්නාහිර පළාත් සභාවේ වේගවත් සංවර්ධනයට මෙන්ම බස්නාහිර පළාත් සභාවේ ලබන අයවැයෙන් විශාල ප්‍රබෝධයක් ඇති වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[ අ.භා. 04.30 ]

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ අයවැය විවාදයේ විශේෂ සාකච්ඡාවේදී විනාඩි 08 ක කාලයක් මා වෙනුවෙන් වෙන් කිරීම පිළිබඳව පළමුව මගේ ස්තූතිය ඔබතුමාට පුද කරන්න මම කැමැතියි. මා මේ මගේ කථාව කිරීමට තත්පර 30 කට පෙරයි මා මේ ස්ථානයට ආවේ. මම 3.05 ට දෙහිවල බුද්ධඝෝෂ විද්‍යාලයට ගියා. එහි ත්‍යාග ප්‍රදානෝත්සවයේ ප්‍රධාන අමුත්තා හැටියට. මම 4.25 ට මෙම ස්ථානයට ආවා. ඒකේ සම්පූර්ණ ගෞරවය හිමි වන්න ඕනෑ අපේ පළාත් සභාවටත්, මධ්‍යම ආණ්ඩුවටත්. මක් නිසාද, ඉතා විශිෂ්ට මාර්ග පද්ධතියක් මේ රටේ නිර්මාණය කිරීම පිළිබඳව. එසේ නොවෙන්නට මට මේ සභාවට පහ පහුවෙලාවත් එන්න හම්බ වෙන්නේ නැහැ. මම මේ සභාවේ සිටි කාලය තුළ විශේෂ අවධානය යොමු කළා, අපේ ගරු මන්ත්‍රීවරුන් මෙම විශේෂ අවස්ථාව පාවිච්චි කරපු ආකාරය පිළිබඳව. කාලය ගැන. කාලය පිළිබඳව ප්‍රශ්න තියෙන්න පුළුවන්. නමුත් ගරු සභාපතිතුමනි, මෙම විශේෂ සාකච්ඡාව වූ කලී අපේ අමාත්‍යාංශවල තියෙන්නා වූ යම් යම් කරුණු කාරණා පිළිබඳව සාකච්ඡා කරන කාලයක් නොවෙයි. අවුරුදු 18 ක මගේ පළාත් සභා ඉතිහාසය තුළ මට මතක් වෙනවා මෙම විශේෂ සාකච්ඡාව මොනතරම් සාරගර්භ ලෙස, ඉතිහාසයේදී ක්‍රියාත්මක වුණාද කියලා. විශේෂයෙන්ම වික්‍රමබාහු කැරණාරත්න, බන්දුල ගුණවර්ධන, විමල් වීරවංශ, කරු ජයසූරිය ඒ වාගේම ඉතිහාසයේ වජිර පැල්පිට වැනි දේශපාලඥයින් මෙම අවස්ථාව ඉතාම කෘතහස්ත ලෙස අයවැය විවාදයට සම්බන්ධ කර ගනිමින් තමන්ගේ දේශපාලන මතය ප්‍රකාශ කරන්න යොදා ගත්තා.

මේ අයවැය ලේඛනය අපි දකින්න ඕනෑ, මධ්‍යම ආණ්ඩුවේ කොටසක් හැටියටයි. මධ්‍යම ආණ්ඩුවේම කොටසක් හැටියට මෙම අයවැය දකිනවා නම් මේ අයවැය විග්‍රහ කළ යුත්තේ, සාර්ව ආර්ථික මූලධර්ම මතයි. ආර්ථික විද්‍යාවේ අපි විග්‍රහයන් 2 ක් දකිනවා. එකක් තමයි සාර්ව ආර්ථික විද්‍යාව පිළිබඳව කෙරෙන විග්‍රහය. අනෙක් එක සූක්ෂම ආර්ථික විද්‍යාවෙන් කරන විග්‍රහය. බඩුමිල ගැන, පෝලිම් ගැන, කිරිපිටි ගැන කථා කිරීම තමයි සූක්ෂම ආර්ථික විද්‍යාවෙන් කරන්නේ. නමුත් සමස්තයක් වශයෙන් රටේ ජාතික ආදායම, ජීවන වියදම උද්ධමනය යනාදී සාර්ව සංකල්ප අරගෙන කථා කිරීම තමයි සාර්ව ආර්ථික විද්‍යාව තුළින් අපි මේ අයවැය ලේඛනය ගැන කථා කරන්නේ.

ගරු සභාපතිතුමනි, අද මේ රටේ ලොකු කථා බහක්, සංවාදයක් තිබෙනවා, අධ්‍යාපනයට කෙරෙන වියදම පිළිබඳව. මම ඉතාම ආඩම්බරයෙන් ඔබතුමාට කියන්න කැමැතියි. අපි ආරාධනා කරනවා විපක්ෂයේ සහ ආණ්ඩු පක්ෂයේ පිරිස අඩු වුණත් බුද්ධිමත් අයව එකතු කරලා බලන්න. අපි මධ්‍යම රජයට වඩා අධ්‍යාපනය වෙනුවෙන් අපේ දළ දේශීය නිෂ්පාදනයෙන් 4% ඉක්මවලා වියදම් කරලා තියෙනවා කියන එක අපි බොහෝම අභිමානයෙන් කියනවා ගරු සභාපතිතුමනි.

අපේ මහ ඇමැතිතුමා වැඩිය කථා කරන කෙනෙක් නොවෙයි. එතුමා ක්‍රියාවෙන් ඔප්පු කරලා තියෙනවා අපේ විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ට, ඒ වාගේම මේ රටේ අධ්‍යාපනය ගැන උනන්දුවෙන් සිටින අයට අධ්‍යාපනයෙන් පළාත් සභාවක් ක්‍රියා කළ යුතු ආකාරය කෙසේද කියා. අන්න එවැනි ගමනක් තමයි අපි යා යුත්තේ. මම ගරු මහ ඇමැතිතුමාගේ අයවැය කථාව කෙරෙහි මගේ අවධානය යොමු කළා. මේ අයවැය ලේඛනයකින් අපි බලාපොරොත්තු වන්නේ කුමක්ද? එතුමා ඉතාම විශිෂ්ට විග්‍රහයක් කරනවා. මට තිබෙන කාල සීමාව ඉතාම සීමිත නිසා මම දිගට මේ ගැන කථා කරන්නේ නැහැ. නමුත් මට අඩු තරමින් විනාඩි දෙක තුනක්වත් ලැබුණා නම් මට මේ ගැන මීට වඩා විග්‍රහයක් කරන්න තිබුණා.

එතුමා කරුණු 9 ක් යටතේ මේ අයවැය ලේඛනය විග්‍රහ කරනවා, ගරු සභාපතිතුමනි. එකක් තමයි ආදායම්

ප්‍රතිව්‍යාප්තිය. දෙක, දළ ජාතික නිෂ්පාදනය. තුන, විරැකියාව සම්බන්ධයෙන් මේ අයවැය ලේඛනයෙන් ලැබෙන ප්‍රතිඵලය. ඊළඟට දිළිඳුකම තුරන් කිරීම සම්බන්ධයෙන් මේ අයවැය ලේඛනයේ කරලා තිබෙන දේ. ඊළඟට සාක්ෂරතාවය වැඩි කිරීම සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රය විෂයෙහිලා ඇති කරලා තිබෙන ආයෝජනය පිළිබඳව එතුමා දක්වා තිබෙනවා. ඊළඟට අධ්‍යාපන දියුණුව වෙනුවෙන් මම කලින් කිව්වා වාගේම.

ඊළඟට සෞඛ්‍ය අංශය. පානීය ජලය සහ විදුලිය සම්බන්ධයෙන් එතුමා කථා කරලා තිබෙනවා. හැබැයි, එක අඩුපාඩුවක් පේනවා ගරු මහ ඇමැතිතුමනි. ඔබතුමාගේ මේ සංකල්ප 9 ට තව එකක් දාන්න ඕනෑ. නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා මෙතැන නැති හින්දා කිව්වාට කමක් නැහැ. එතුමාව මේකෙන් අයින් කරලා තියෙනවා. ඔබතුමාගේ 10 වන සංකල්පය ලෙස පළාත් මාර්ග ඇතුළත් කරලා නැහැ. හැබැයි, අපි බොහොම ආඩම්බරයෙන් කියනවා - (බාධා කිරීමක්) අනිකුත් පළාත් සභාවලටත් ආදර්ශයක් වන විධියට ඉතා විශිෂ්ට පළාත් මාර්ග පද්ධතියක් මේ පළාත් සභාව තුළින් ප්‍රතිනිර්මාණය කරන්න, අපට පුළුවන්කම ලැබිලා තියෙනවයි කියන කාරණාව. ඒ වාගේම මේ පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් පිළිබඳව සාකච්ඡාව. අපේ පුනරාවර්තන වියදම් දස ලක්ෂ 35070948 යි. අපේ ප්‍රාග්ධන වියදම දස ලක්ෂ 5119 යි. ඒ අනුව බලනකොට සමස්ත වියදමින් 12% කට අපේ ප්‍රාග්ධන වියදම සීමා වෙලා තියෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බොරු කියන්න එපා. ලයිට් ගියා.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ගරු සභාපතිතුමනි, අපට ආලෝකයට වඩා අඳුර හොඳට හුරුයි. මොකද, අපේ වැඩි හරියක් වැඩ සිද්ධ කරන්නේ අන්ධකාරයේ නිසා.

[සභාවේ සෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කථා කරන්න. ලයිට් නැති වුණාට කමක් නැහැ.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ඔබතුමාගේ අවසරය ලැබෙනවා නම් මගේ කථාව දිගටම පවත්වාගෙන යන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා විදුලි ආලෝකය සම්පූර්ණ වනතුරු මොහොතකට නවත්වන්න. ගරු මන්ත්‍රීතුමා කරුණාකර වාඩි වෙන්න.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ගරු සභාපතිතුමනි, මම කියාගෙන ආවේ මේ අයවැය ලේඛනයේ ප්‍රතිශතයක් වශයෙන් ගත් කල පුනරාවර්තන වියදම්වල ප්‍රතිශතය ඉතා අධික භාවයක් අපට දෘෂ්‍යමාන වෙනවා. නමුත් මේ සංඛ්‍යා ලේඛන පිළිබඳව මුල සිටම මගේ නම් තිබෙන්නේ, ප්‍රසාදයක් නොවේ. මේ පුනරාවර්තන වියදම් තුළ තමයි අපේ සෞඛ්‍යයට, අධ්‍යාපනයට, ඒ වාගේම පොදු පහසුකම්වලට කෙරෙන්නා වූ වියදම් තිබෙන්නේ. වෛද්‍යවරයෙකුට, සෞඛ්‍ය සේවකයන්ට, ගුරුවරුන්ට කරන වියදම් මේ පුනරාවර්තන වියදම් තුළ අන්තර්ගත වෙනවා. එසේ නම් මේ පුනරාවර්තන වියදම් පිළිබඳව විග්‍රහය යම් ආකාරයකට නිවැරදි වී තිබිය යුතු බවයි මා විශ්වාස කරන්නේ. දැන් මෙම සභාවේ අපේ උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා 13 වන ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් කළ මත පිළිබඳවත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

තවම විනාඩි දෙක ගියේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම කරන්න වෙලාව නැහැ. විදුලි ප්‍රශ්නයකුත් ආවා නේ? ඒ නිසා ඔබතුමා කථාව අවසන් කරන්න. ගරු විපක්ෂ නායක මංජු ශ්‍රී අරංගල මැතිතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[ අ.භා. 04.45 ]

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, අද දවසේ මෙම අවස්ථාවේ අදහස් ප්‍රකාශ කරන්නට කාලය ලබා දීම පිළිබඳව. විශේෂයෙන් මේ ගැන කථා කරන්න ප්‍රථම අපේ කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා මාර්ග පද්ධතිය හොඳ නිසා ඉතාම ඉක්මණින් මෙතැනට ආවායි කිව්වා. මම දන්න විධියට එතුමා හුණු ගාන්න cheque එකක් දෙන්න තමයි ගියේ. මම හිතන්නේ ඒ ගාන්න තිබුණු හුණු අරගෙන ඇවිල්ලා මහ ඇමැතිතුමාගේ ඇඟේ ගෑවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මොකද වෙන්නේ එහෙම කළාට?

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

වැරැදීමක්. ගියේ ත්‍යාග ප්‍රදානෝත්සවයට.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඊළඟට මම විශේෂයෙන්ම මෙම අයවැය පිළිබඳව මම මතක් කරන්න ඕනෑ කාරණයන් කිහිපයක් තියෙනවා. අපි දන්නවා මේ අයවැය තුළින් විශාල පුනරාවර්තන වියදම් සමූහයක් දරනවා. නමුත් අපි මතක් කරන්න කැමැතියි. කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ගුරුවරයෙකුට වැටුප් ගෙවන්න, වෛද්‍යවරයෙකුට වැටුප් ගෙවන්න, හෙදියකුට වැටුප් ගෙවන්න වාගේ මේ කටයුතු පළාත් සභාවේ පුනරාවර්තන වියදම්වලින් කෙරෙනවා වාගේම - හැබැයි වෛද්‍යවරයාට ඒ වැඩය කරන්න හොඳ පහසුකම් දෙන්න හොඳ රෝහල් පද්ධතියක්, එතැනින් ගියාම ඒ රෝහලට අවශ්‍ය මූලික අවශ්‍යතා ඉෂ්ට වෙලා තියෙන්න ඕනෑ. ඒ වාගේම තමයි ගුරුවරයෙක් පඩි ගත්තට ඇති වැඩක් නැහැ. ඒ විද්‍යාලවල භෞතික වශයෙන් දියුණුවක් නැත්නම්. දරුවෝ 50 ක්, 60 ක් දාලා පන්ති කාමරවල අවශ්‍ය පහසුකම් ටික නැති වුණොත් කොයිතරම් අපි වැටුප් ගෙව්වත් ඒකෙන් බලාපොරොත්තු වන කාරණා ඉෂ්ට කර ගන්න බැරි වෙනවා. ඒ නිසා විශේෂයෙන්ම පුනරාවර්තන වියදම ඉතාම අධික මට්ටමක තිබුණත්, ප්‍රාග්ධන වියදම පසුගිය වර්ෂයටත් වඩා අඩුයි කියන එක තමයි අපට මතක් කරන්න සිද්ධ වෙන්නේ.

ගරු සභාපතිතුමනි, 2012 ප්‍රාග්ධන වියදම මිලියන 5203 යි. හැබැයි 2013 ප්‍රාග්ධන වියදම මිලියන 5119 යි. ඒ නිසා මහ ඇමැතිතුමා ගන්න උත්සාහයට පඩි නඩි ගෙවීම් ඒ සියල්ල කරන්න පුළුවන්. නමුත් ඒ සඳහා අවශ්‍ය වටපිටාව සකස් කිරීමේ භෞතික අවශ්‍යතාවයන් සම්පූර්ණ කරන්න ගියාම මේ අනුව විශාල ගැටළුවක් මතු වෙනවා. ඒ නිසා අපි මතක් කරන්න කැමැතියි. මේ අයවැය ලේඛනය ඇහේ හැටියට මහන්න රෙදි නැහැ. රෙද්ද හැටියට මහලා තමයි මේ අද අපට ඉදිරිපත් කරලා තියෙන්නේ. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ බලය බෙදා හැරියාම එක්කෝ ඒ බලයට ගැලපෙන පරිදි විෂයන්ට මේ අමාත්‍යාංශවලට අවශ්‍ය මුදල් මධ්‍යම ආණ්ඩුවෙන් එක පැත්තකින් ලබලා දෙන්න ඕනෑ. මධ්‍යම ආණ්ඩුවට ලබලා දෙන්න බැරි නම්, පළාත් සභාවලට තියෙන ආදායම් ටික ගන්න අවශ්‍ය විධියට ඒක සකස් කරලා දෙන්න ඕනෑ. ඒ නිසා දැන් 2013 අයවැය ලේඛනය ඉදිරිපත් කරද්දී අතිගරු ජනාධිපතිතුමා කියපු එක කාරණයකුත් අපට ගැටළුවට මතු වෙනවා. එය තමයි මේ මුද්දර ගාස්තු කෙලින්ම පළාත් පාලන ආයතනවලට ලබා දෙන්න කටයුතු කරනවා කියලා කියද්දී මුද්දර ගාස්තු පිළිබඳව පනත් කීපයක් තියෙනවා. පනත්වලින් මොන මුද්දර ගාස්තුවද, කෙලින්ම පළාත් පාලන ආයතනවලට ලබා දෙන්න සූදානම් වෙන්නේ කියන ගැටළුව තවම භාණ්ඩාගාරයවත් තේරුම් අරගෙන නැතුව ඇති. මේ පිළිබඳව දැනුමක් අවබෝධයක් ඇති අයගෙන් විමසද්දී ඒ අයටත් තවම මේ පිළිබඳව හරි උත්තරයක් දෙන්න පුළුවන්කමක් ඇති වෙලා නැහැ. ඒ නිසා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔහොම යනකොට දැනෙයි.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඔව්. දැනෙන කොට කාටත් ඇණේ වෙලා තියේවී.

[සභාවේ ඝෝෂා]

ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ කාරණයේදී අපි මතක් කරන්නේ, මේ තියෙන සංඛ්‍යා ලේඛන පිළිබඳව මම දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. විවිධ අමාත්‍යාංශ හරහා අපට කථා කරන්න පුළුවන්කම තිබෙන නිසා. දැන් අද දවසේ අපේ ගරු සභානායක සුනිල් ජයමිණි මැතිතුමා මතක් කළා, අතිගරු ජනාධිපතිතුමා පළාත් සභා මන්ත්‍රීවරු මුණ ගැසුණාම කිව්වලු, පසුගිය දවසක මන්ත්‍රීවරු හැටියට විවිධ ඉල්ලීම් කළත්, හැබැයි මේ පළාත් සභාවේ ආදායම් මාර්ග පිළිබඳව ඉල්ලීම් කරලා නැහැ. මේ පළාත් සභාවේ ඉඩම් බදු දීම පිළිබඳව අපි තීන්දු තීරණ අර ගන්නේ නැත්තේ ඇයි කියලා. ගරු සභාපතිතුමනි, මම මතක් කරන්න කැමැතියි. එක පැත්තකින් මම කියනවා, එලිෆන්ට් හවුස් එකේ කොළඹ Cool Room එක අද බදු දීලා තියෙන්නේ. මේ වනකොට මධ්‍යම ආණ්ඩුවේ කැබිනට් එක තීන්දුවක් අරගෙන තියෙනවා, ඒක සම්පූර්ණයෙන් නිදහස් කළ යුතුයි කියලා. අන්න ඒ නිසා එක පැත්තකින් මේ අභියෝගයන්ට පළාත් සභාව මුහුණ දෙනවා. අනික් පැත්තෙන් මම මතක් කරන්න කැමැතියි. දැන් මෙතැන කියැවුණා සෙසු පළාත් සභා අතුරින් මේ පළාත් සභාව තමයි රටේ පෙර ගමන්කරුවා විධියට ඉන්නේ කියලා. වැඩිම ආදායම තියෙන්නේ අපට. වැඩිම වැඩ කොටසක් කරන්න පුළුවන්කම තියෙන්නේ අපට. එක පැත්තකින් අපි කනගාටු වෙනවා. ආඩම්බර වෙනවා නොවෙයි. අද බලන්න පළාත් සභාවේ අනන්‍යතාවය සඳහා අනික් පළාත් සභා හැම එකක්ම තමන්ටයි කියලා හොඳ වටිනාකමකින් යුක්ත ගොඩනැගිලි සාදාගෙන තියෙනවා. අද අපි අභිකුණ්ඨකයෝ වාගේ. දැන් උදාහරණයක් විධියට සෞඛ්‍ය අමාත්‍යාංශයත් සභා ලේකම් කාර්යාලයත් පැවතුණේ ඔබතුමාගේ කාර්යාලය තිබෙන ටොරින්ටන් එකේ. මේ වනකොට අනියම් වශයෙන් තර්ජනය පවා පැමිණෙමින් තියෙනවා. තර්ජනයක් නොවේ. ඒක බලපෑමක්. වහාම මෙතැනින් යන්න කියලා. ගොඩනැගිල්ල රජයේ. අද සෞඛ්‍ය අමාත්‍යාංශය ගිහිල්ලා තියෙනවා වෙනත් ගොඩනැගිල්ලකට. වියදම මාසයකට කුළිය ලක්ෂ 6 යි. අනික් පැත්තෙන් දැනට සභා ලේකම් කාර්යාලයට යන්න තිබෙන ගොඩනැගිල්ල මේ බත්තරමුල්ලෙන් හොයලා තියෙනවා. ලක්ෂ 12 යි. අපි ඒක ගත්තොත් ලක්ෂ 20 යි. මේ රටේ මිනිසුන්ගේ සල්ලි. ඒ නිසා ආණ්ඩුවේ ගොඩනැගිල්ලක ඉන්න අපි ආණ්ඩුවේ අයිතිය තියෙන අපි ආණ්ඩුවේ පාර්ශවයක් වුණු අපි අද අපව එළියට දානවා පුද්ගලික තැන්වල ගිහිල්ලා ඉන්න කියලා. ඒ නිසා මම හිතන්නේ මේ වනකොට අද අපේ තියෙන ගොඩනැගිලි - පසුගිය පාර්ලිමේන්තුවේ තිබුණ අයවැය කථාවේදී අතිගරු ජනාධිපතිතුමා

පැවසුවා විදේශිකයන්ට මේ ඉඩම් කවදාවක්වත් විකුණන්නේ නැහැයි කියලා. හැබැයි ඉඩම් විකුණන්නේ නැහැ. අද ටොරින්ටන් එකේ තිබුණු පැරණි රේස්කෝස් ගොඩනැගිල්ලට කෝටි ගණන් වියදම් කරලා අද පුද්ගලික ආයතනවලට 99 බද්දට දෙනවා. ඒ නිසා මේ රජයේ ආයතන සියල්ලම අද අරගෙන ඒ ගොඩනැගිලි පුද්ගලික ආයතනවලට 99 බද්දට විකිණීමේ තත්ත්වයක් තමයි තියෙන්නේ. ඒ වාගේම මහ ඇමැතිතුමාගේ පොතේ තියෙනවා ඉඩම් කට්ටි 80,000 ක් මේ වනකොට හඳුනාගෙන තියෙනවා කියලා. අපි දන්නේ නැහැ මහ ඇමැතිතුමා ඒකෙන් ගම්‍ය කරගෙන තියෙනවාද කියලා කොළඹ නගරය ඇතුළත තියෙන ආණ්ඩුවේ ඉඩමුත් මේකට අයිතියි කියලා. මොකද, දැන් කච්චේරිය පිච්චුණාම, එක්කෝ පිච්චුවාම කොළඹ නගරයේ තියෙන ඉඩම්වලට මොකද වෙන්නේ කියලා අපට හිතාගන්න පුළුවන්කමකුත් නැහැ. ඒ නිසා අද බිංකුඩ්ඩෝ වාගේ ඉඩම් හොයන තත්වයකට පත් වෙලා තියෙන මොහොතක අද ඒ වාගේ තත්ත්වයක් ඇති වෙයි කියන එකත් අපට අවිශ්වාස කරන්න පුළුවන් තරමේ තියෙන්නේ. ඒ නිසා මම මේ අවස්ථාවේදී මතක් කරන්නේ, අනික් පැත්තෙන් හෙක්ටර් බෙත්මගේ මැතිතුමා (බාධා කිරීමක්) මෙතැන හිටියේ නැහැ. එතුමා මතක් කළා, දැන් මේ රටේ තාක්‍ෂණය කොපමණ දියුණුද කිව්වොත් මේ තාක්‍ෂණික යුගයේ චන්ද්‍රිකාවල් අහසට යවන්න ගගනගාමීන් පවා ජනාධිපතිතුමාගේ පවුලෙන් බිහි කළා කියලා. එතුමා දන්නේ නැහැ. චන්ද්‍රිකාව උඩට අරින්න ගිහිල්ලා තමයි එතුමාට තිබුණු ඇමැතිකමටත් කෙළව ගත්තේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ වුණාට එතුමාට එහෙම -

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නැහැ, නැහැ. එතුමා කියපු කථාවකට මම මේ අදහස් ප්‍රකාශ කළේ. එතුමා කිව්වා දැන් චන්ද්‍රිකාවල් උඩ අරිනවා කියලා. පසුගිය කාලයේ එතුමා චන්ද්‍රිකාවල් උඩ අරින්න හදපු විත්තිය මම හිතන්නේ අතිගරු ජනාධිපතිතුමා දන්නවා. අන්න ඒ නිසා තමයි මම හිතන්නේ ඒ තිබුණු ඇමැතිකම නැති වුණේ කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අන්න එහෙම කියන්න කෝ? අර වචනය හරි නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මම විශේෂයෙන් අද මතක් කරන්නේ, පළාත් සභාවේ රාජ්‍ය නිලධාරීන් බොහොම ශ්‍රේෂ්ට ගෞරවාන්විත සේවාවක් කරනවා. අපි දන්නවා. අපේ පළාත් සභාවේ ආදායම් දෙපාර්තමේන්තුව හරියට කොන්ද කෙළින් තියලා පණ ගස්සලා ගත්තොත් කාර්යක්‍ෂම නිලධාරි පිරිසක් ඒකේ ඉන්නවා. මේ පිරිවැටුම් බද්ද පිළිබඳව මම හිතන්නේ, ආණ්ඩුව ලබා දෙන දෙයට වැඩිය අපට විශාල වශයෙන් ආදායමක් හොයා ගන්න පුළුවන්කම තියෙනවා. අදත් අපේ ඉඩම්වල තත්ත්වය පිළිබඳව නැවත වර සමීක්‍ෂණය කරමින් කෝටි ගණනක මුදලක් අද මේ පළාත් සභාවට ලබා දෙමින් අද ඒ අය කටයුතු කරනවා. ඒ නිසා මම මීට වැඩිය දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. කියන්න ඕනෑ තරම් දේවල් තියෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය මදියි එතුමාට.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ නිසා මම මීට වැඩිය දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. මේ අයවැය ලේඛනයේදී අපට තියෙන්නේ, අපි දකින විධියට වැඩ කරන්න පුළුවන්කම තියෙනවා නම් මේ අයවැය ලේඛනයකින් ඒකට අවශ්‍ය මූලික වියදම් ටික අවශ්‍යයි. නමුත් අපට තියෙන මුදල් අරගෙන මහ ඇමැතිතුමාට වෙලා තියෙන්නේ, ඇගේ හැටියට රෙද්දෙන් මහන්න නොවෙයි. මීට පෙර සඳහන් කළා වාගේ තිබුණු රෙද්ද ගැළපෙන විධියට මහගන්නයි.

[සභාවේ ඝෝෂා]

ඒ නිසා මම මීට වැඩිය දීර්ඝ ලෙස කථා නොකර මගේ කථාව මින් සමාප්ත කරනවා.

[ අ.භා. 04.56 ]

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, පොදු සාකච්ඡාවේදී අපි බලාපොරොත්තු වෙන්නේ, මුදල් ප්‍රකාශය පිළිබඳ කරුණු අධ්‍යයනය කරලා, මේ පළාත් සභාවේ ඉදිරි කටයුතු කරගෙන යන්න ගරු මන්ත්‍රීවරුන්ගෙන් අදහස්, විවේචන - විශේෂයෙන් සාධාරණ විවේචන. ඒ වාගේම ආදායම් වැඩි කර ගන්න ක්‍රම මාර්ග, අඩුපාඩු තිබෙනවා නම් ඒ ගැන සාකච්ඡා කරන්න මමත් මේ කොළ ටික අරගෙන ලෑහැස්ති වුණා. මේ මන්ත්‍රීවරු කියපු දේවල් අරගෙන, මේවායේ අඩුපාඩු බලලා, ඒ කියන දේවල් සටහන් දාගෙන ඒ අනුව කටයුතු කරන්න. නමුත් අවසානයේදී ගරු සභාපතිතුමනි, අපේ උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා කිව්වා වාගේ, කරුණු ඉදිරිපත් කරපු මන්ත්‍රීවරු නෙයෙක් කරුණු ගැන කථා කළත් පළාත් සභාවට බලපාන කැරණු පිළිබඳව කථා කෙරුණේ නැහැ. ඒක කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ. ඒ නිසා විශේෂයෙන්ම අපේ ගරු මන්ත්‍රීවරු ඉදිරිපත් කරපු කරුණුවලට උත්තර දීලා තියෙනවා. ඒ නිසා මම කල්පනා කළා, බලපුවාම මට මේක කොළයක විතරයි ලියා ගන්න හම්බ වුණේ, දේවල් හැටියට. ඒ නිසා උත්තර දෙන්න දෙයක් නැහැ. මට මේ විනාඩි 04 හොඳටම ඇති ගරු සභාපතිතුමනි. මම කල්පනා කළා, සාමාන්‍යයෙන් අයවැය විවාදයකදී වැඩි කාල සීමාවක් උවමනා කරන්නේ විරුද්ධ පක්‍ෂයට. මොකද, මේ පිළිබඳව

විවේචනය කරන්න, කථා කරන්න. හැබැයි ආරම්භයේදීම ගණ පූරණය නැහැයි කියලා වෙලාව අඩු කර ගත්තෙත් එතුමන්ලා විසින්මයි. අපට කථාවල් අඩු වුණාට කමක් නැහැ. කොහොමත්

[ ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා ]

මේක සම්මත වෙලා වැඩ කරගෙන යනවා. එතුමන්ලාගේ කථාවල් අඩු වුණා. ඒකෙන් මට තේරුණා ඒගොල්ලන්ට කථා කරන්න දෙයක් නැහැ. මේ අයවැය පිළිබඳව කථා කරන්න දෙයක් නැති නිසා ඒගොල්ලන් ඒ කාලය මැනවින් ලබා ගත්තේ නැහැ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් ගැටළුවක් නැහැ. ඒ වාගේම කථා කළ මන්ත්‍රීවරු ඉල්ලීමක් කළා ප්‍රතිපාදන වැඩි කිරීම සම්බන්ධව. ගරු සභාපතිතුමනි, මෙතැන විවේචනයට ලක් වුණේ, කථා කළ මන්ත්‍රීවරු කිව්වේ, අපේ ප්‍රතිපාදන වැඩි කරලා දෙන්න කියලා. මම කිව්වේ, අපි හැමෝටම දෙන්නේ ලක්ෂ 35 යි. මන්ත්‍රීවරුන්ට ලක්ෂ 35 ගණනේ දීලා තියෙනවා. සමහර මන්ත්‍රීවරු අධ්‍යාපනය ගැන කථා කළා. අධ්‍යාපනයට ශත පහක්වත්. මුදල් දීලා නැහැ හැබැයි, මෙතැන අධ්‍යාපනය ගැන කථා කරනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, ප්‍රතිපාදන වෙන් කරද්දී අපි හැමෝටම සාධාරණය ඉටු කරන්න කටයුතු කරලා තියෙනවා වාගේම විශේෂයෙන් ආණ්ඩු පක්ෂයක් හැටියට රජයට රටේ ජනතාව ඡන්දය දීලා බහුතරයක් පත් කර ගත්තාම ඒ මන්ත්‍රීවරු කටයුතු කරනවා, ජනතාවගේ අවශ්‍යතාවයන් සඳහා. ඒ මොකද, අඩුපාඩු හොයන්න තමයි විරුද්ධ පක්ෂයක් ඉන්නේ. නමුත් ඒ කාර්ය භාරයටවත් උනන්දු වුණාද කියන ගැටළුව තියෙනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, දෙමළ සංගම් මාර්ගය පිළිබඳවත් පොඩි කාරණයක් කියන්න ඕනෑ. ඒ පිළිබඳව ඉදිරිපත් වුණාම ඒක හංගලා කථා කරන්න දෙයක් නොවෙයි. ප්‍රභාරකන්ගේ උපන් දිනය 26 වැනිදා තිබුණේ. 25 වැනිදාට මේක දාගෙන ප්‍රභාකරන්ගේ උපන් දිනය සමරන්න මේක කරනවයි කිව්වාම මම අනුමත කරපු දෙය මමම නැවැත්තුවා. ඊයේ පළාත් පාලන කොමසාරිස්ගේ ප්‍රධානත්වනේ කිසිම දේශපාලන නායකයකු නැතිව - සිදු වුණු කාරණාව පිළිබඳව වාර්තාවක් දෙන්න කියලා තියෙනවා. ඒ වාර්තාව ලැබුණු පසු එය විධිමත් විධියට සිදු වෙලා තිබෙනවා නම්, එය ක්‍රියාත්මක කරන්න උපදෙස් දෙනවා. විධිමත් බවක් නැතුව කරලා තියෙනවා නම් එය විධිමත් කරන්න අවශ්‍ය උපදෙස් දීලා විරෝධතාවල් බලලා අපි ඒ කටයුත්තට අවසර දෙනවයි කියන කාරණාව මතක් කරන්නට ඕනෑ. ඒ දෙමළ සංගම් මාර්ගය පිළිබඳව මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. ප්‍රභා මන්ත්‍රීතුමා, එතුමා ආණ්ඩුව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට එතුමාත් ඊයේ සහභාගී වෙලා තිබුණා මේ කාරණය ඉටු කරලා දෙන්න කියලා. ඒකත් මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒ වාගේම මුද්දර පිළිබඳව අපේ විරුද්ධ පක්ෂයේ නායකතුමා කැරණු කිව්වා. මම හිතන්නේ, එතුමාට ඒ පිළිබඳව අවබෝධයක් නොමැතිකම නිසා එහෙම කරන්න ඇති. ඒකේ නිවැරැදි කිරීමක් කරන්න ඕනෑ. මොකද, ජනාධිපතිතුමාගේ ප්‍රකාශය මෙහි පැහැදිලිව තිබෙනවා,

*"මුද්දර බදු පනත යටතේ ලැබෙන ආදායමෙන් ප්‍රාදේශීය ආයතනවලට හිමි කොටස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සෘජුව අදාළ ආයතනවලට යැවීමට මම යෝජනා කරනවා."*

මෙතැනදී කථා කරන්නේ ගරු සභාපතිතුමනි, උකස් සහ බදු. දේශීය ආදායමෙන් අය කරන බද්ද තමයි මෙතැන්ට යොමු කරන්න කටයුතු කරන්නේ. පළාත් සභාවට ලැබෙන පැවරුම් සහ තැගිවල මුළු ගාස්තුව අපේ මෙතෙක් කල් පැවතුණු ආකාරයට කරගෙන යන්න හැකියාව තියෙනවා. ඒ නිසා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ කියන්නේ නීත්‍යානුකූල මුද්දර ගාස්තු බද්ද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔව්. මේ කථා කරන්නේ ඒක ගැන. රජයට යන මුදල තමයි අපට කෙළින්ම ලැබෙන්න සලස්වන්න හදන්නේ. ඒ පිළිබඳ මෙහි පැහැදිලිව තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා කාලය පිළිබඳව සැලකිලිමත් වන්න වෙනවා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

කාලය පිළිබඳව ගැටළුවක් ඇති වෙලා තියෙනවා. එතැන ලොකු කථාවක් තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, විෂයය බද්ධව කටයුතු කරද්දීත් මම විශ්වාස කරනවා, මේ පළාත් සභාවට පසුගිය කාල සීමාව තුළදී විශේෂයෙන් මගේ ගරු අමාත්‍ය මණ්ඩලය, මේ විවාදයේදී, මේ කටයුතු කරද්දී මට ලබා දීපු දායකත්වය, මෙතැනදී මම මතක් කරන්න ඕනෑ. ඒ වාගේම ප්‍රධාන ලේකම්තුමිය ඇතුළු සියලුම නිලධාරීන්ට මාගේ ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා.

***අ.භා. 05.00 ට පොදු සාකච්ඡාව අවසන් විය.***
*General discussion came to a close at 05.00 p.m*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. අද දිනට නියමිත පොදු සාකච්ඡාව පිළිබඳ විවාදය මෙයින් අවසන් වෙනවා. ඒ සඳහා සහභාගී වුණු සියලුම මන්ත්‍රීවරුන්ට මාගේ ගෞරවය සහ ස්තුතිය පුද කර සිටිනවා.

# කල් තැබීමේ යෝජනාව
## ADJOURNMENT

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතු යැයි."* මම යෝජනා කරනවා.

***ඊට අනුකූලව පළාත් සභාව ප.ව. 05.00 ට, 2012 දෙසැම්බර් මස 06 වන දින පූ.භා. 09.00 වන තෙක් කල් ගියේය.***

*Aaccordingly, the Provincial Council was adjourned at 05.00 p.m. till 09.00 a.m, on 06.12.2012.*